

සිහිනයි
A unique expression of Love

For E - Pusthakalaya

# 1

තෙරුවන් සරණයි!

දයාබර සර්. . .

මං මේ ලිපිය ලියන්නට හුඟක් පාරම් පිරුවා. සර් ලියන හැම අකුරක්ම මම කියවන්නෙ ආසාවෙන්, ආදරයෙන්. පංතියේ දී කියන හැම වචනයක්ම මගේ හදවත පතුලෙ තැන්පත් වෙනවා. මගේ ජීවිතේට මෙච්චර බලපෑම් කරන්න ඔබට පුළුවන් වේ යැයි මා මොහොතකටවත් හිතුවේ නෑ. දැන් සේරම වෙනස් වෙලා. සතියකට සැරයක් හරි මගේ හුදකලා ජීවිතයට ඔබ සමීප වීම සතුටක්. පැය දෙකක වගේ පුංචි කාලයක් ඔබ කියන දේ මට ජීවිත කාලයක් පුරකින්න පුළුවන්. මට පුදුමාකාර සැනසීමක් දැනෙනවා. ආදරයෙන් කතා නොකළත්, සර්ට ප්‍රේම කරන්න තරම් වාසනාවක් මට නැති වුණත්, මට තේරුම් ගන්න පුළුවන්. ඔබ පන්තියේ කියන හැම වදනක්ම ලස්සනයි. පන්හිදෙන් කුරුටු ගාන හැම කවක්ම ලස්සනයි. පුංචි කෙල්ලකගේ ලස්සන ආදරය ලස්සනට දකින්නට ඔබට පුළුවන්. ඔබ වගේ අය හරිම අඩුයි. මට ඔබ ගැන හිතන්නට පුදුම හැකියාවක් තියෙනවා.

මට සර් ගැන පුදුම දේවල් හිතෙනවා.

මට ඔබ මතක් වෙනවා. තනි වෙන හැම මොහොතකම. පාඩම් පොතේ අකුරු බොඳ වෙලා ඔබේ රුව කතා කරනවා. මම ආසයි එහෙම වෙනවට සත්තයි: මට ඔබේ සොඳුරු ආත්මයේ ආදරණීය සුවඳ විඳගන්න එන්න හිතෙනවා. මනා හික්මීමකින් ලෝකය දකින ඔබට මාව තේරුම් ගන්න පුළුවන් වෙයි.

For E - Pusthakalaya

උරගෙන උරගෙන ඇවිත් මගේ ජීවිතය පෙලගෙදා ඔබට කියන්නට හිතෙනවා.

ආදරය හොරකම් කරන්න හදනවා කියා මා වරදවා තේරුම් ගන්න එපා! මා එච්චර වාසනාවන්ත නැති බව දන්නවා. හැරත්: තවත් කෙල්ලකට දෙන්න තරම් ආදරයක් ඔබ ළඟ ඉතිරි වී නැති බවත් මම දන්නවා. ඔබේ සෙනෙහස විඳගන්නට; ඔබේ කඳුළ බෙදාගන්නට මට ශක්තියක් තියෙනවා. ඔබේ කඳුළෙන්, සුසුමන් අතර පරඬලක් වෙලා මියැදුණත් මට කමක් නෑ. සන්තයි.

මට පුළුවන් ඔබ වෙනුවෙන් මියැදෙන්නට.

සර්: තව ද හරි සර් මං ගැන පුදුම වෙයි. දුක හිතයි. ඔබේ සංවේදී හිත හඬයි. ඒත් එපා ඔබ හඬන්නට. මම හඬන්නම් ඒදට. මම හිතයි ඔබ හිතේ මං කොච්චර අසරණ ද කියලා. ඔබේ හිත තියුණු මට ඒ සියල්ල විශ්වාසයි. ඉදහිටක හරි මගෙන් එක්ක කතා කරන්න. මාව සන්තියෙන් එළව ගන්න නම් එපා. මට දරා ගන්න බැරි වෙයි! මට මහපාරට පැනලා මැරෙන්න වෙන්නේ. පිං සිද්ධ වෙයි. ඔබේ පාලු ජීවිතයට ශක්තියක් වෙන්න මට ඉඩ දෙන්න. ජීවත් වෙනකල්. ආත්මයෙන් ආත්මයට මම ඔබට ආදරෙයි. ඔය දයාබර හිත මට අහිමි කරන්න එපා. ඔබ මගේ ජීවිතයයි. ඔබ මගේ ආත්මයයි. විශ්වාස කරන්න.

මම මටත් ඔබටත් අවංකයි.

ඔබේ හැම කඳුළකින්ම හඬන්නට අවැසි මටයි.

සියලු දෙවි රැකවරණ.

ඔබට දයාබර,

මං,

මධුපානි ඉද්දමල්ගොඩ.

මධුපානි ඉද්දමල්ගොඩ. මම දෙවරක් ඇගේ නම කියවීමි. ලිපිය දකුණතට ගෙන, ගුලි කොට බිම හෙලා ගිනිකූරක් ගැසුවෙමි. එයින් සිගරට්ටුවක් දල්වා ගෙන ඇඳේ හාන්සි වුණෙමි. තැන්පත් නොවූ සිත



එක්තැන් කළ නොහැකි ය. මධුපානි. ඇගේ රුව සැබෑ ලෙස ම ලස්සන ය. හැම කෙල්ලකගේ ම නැති ගැහැණුකමක් ඇගේ කුඩා සපුවේ ලාලිත්‍යයට එක් කොට ඇත. ඇය මුලින් ම පංතියට ආ දවසේ ඇඳ සිටියේ නිල් පාට ගවුමකි. කොණ්ඩය තනි කරලට පීරලා ය. හැම කෙල්ලකට ම වඩා තැන්පත් බවක්, ගැමි දැරියකගේ මෙන් සංයමයක්, මම ඇගෙන් දකිමි.

ඇය පිළිබඳව වෙන දැරියකට වඩා මතකයක් මා තුළ පිළිසිඳ ගෙන ඇත. මේ තත්ත්වයට ඇය පෙළඹවූයේ මා ද? මම මගෙන් ම ප්‍රශ්න කරමි. ඇගේ ත් චාපාගේ ත් යම් සමානකමක් තිබේ ද? තිබේ නම් ඒ කොණ්ඩයේ ත් ඇස් දෙකේ ත් ය. .

'ළමයෝ.... කාමරේ...... ළමයෝ....... මොකක්ද ඔය දුමක් නගින්නෙ කාමරේ පැත්තෙන්...?'

මම තිගැස්සී නැගිට්ටෙමි. බෝඩිමේ ඇන්ටි බෙරිහන් දී දෙරට ගසයි. මේසයේ කෙලවර ත්, ඇඳුම් රාක්කය ත් ගිනි ගෙන ඇවිළෙයි. කාමරය පුරා ම දුම් පිරී ඒ අතුරින් ගිනි දළු මතු වෙයි. බෝඩිමේ සිටි සියලු දෙනා ම පිබිදී, වතුර ගසා ගින්න නිවිවෝ ය. ඇඳුම් රාක්කය අළු බවට පත් වී ඇත.

මම දෙරට හෝත්තු වී හිස් බැල්මෙන් එ දෙස බැලුවෙමි.

'මේ ළමය නම් ගෙවත් ගිනි තියනවා. රෑ තිස්සෙ ඇහැරගෙන මොනව කරනවද මන්ද? මොකක්ද ඇත්තටම ඔය ළමයට වෙලා තියෙන්නෙ?'

මම නිහඬ වීමි. මට කිසි දෙයක් වෙලා නැත. පිළිස්සී ගිය කඩදහියේ ගින්දර ඇඳුම්වලට අල්ලා ගිනි ගෙන ඇත. එ පමණකි.

'ගිනිකූරක් විසි වෙලා....'

මම කීවෙමි. මගේ බැල්ම අළු ගොඩට ම යොමු වී තිබෙන්නට ඇත. දකුණතේ ඇඟිලි තුඩුවලින් පපුව පිරි මදිමින් මම හිස් බැල්මෙන් බලා සිටියෙමි.

For E - Pusthakalaya

ඔය ළමයා වෙන කාමරයක් හොයා ගන්න. එහෙනේ ඔය ළමය නස්පැත්තියක් කරගන්නවා. නැත්නම් අපිව විනාශ කරනවා. බලන්න තව ටිකෙන් මුළු ගෙම ගිනි ගන්නවානේ.

ඔවුන් මා දෙස බලා සිටියි. සිහියෙකුගේ දෑසට මා තේරුම් ඇණුම් ගෙනියක් නැත. මා පිස්සෙකු යි ඔවුන් සිතනු ඇත.

'කාලයක් හොයා හොයි ඉඳල ලෙඩ වුණා. එක පාරක් නිදිපෙති බිව්ව. දැන් ගිනි තියාගන්න හදනවා. පොඩි දරුවෙක් නෙමෙයිනෙ. උගේ අම්මත් නේද? නිස්කාරණේ නැතිවෙන්න හදන්නෙ.'

මම බිත්තියට වැරෙන් පහර දුනිමි. දෑතින්ම පහර දුනිමි. ඇඟිලි පරඬැල් වෙන්නට මෙන් වැරෙන් පහර දුනිමි. එහා කාමරයේ සිරි මා අල්ලා ගත්තේ ය.

'මොකද? මොකද වෙලා තියෙන්නෙ?'

'මට කරදර කරන්න එපා.'

මම මගේ හිස බිත්තියේ ගසා ගත්තෙමි.

'මේ ළමයට මොකක්ද අසනීපයක්!'

ගෙඩිමේ ඇතට තියා ගෙන යන ගමන් 'තෙල් ටිකක්වත් මදුරන්න වෙච්ද නේද?' යැයි ද කීවා ය.

'මාව පිස්සෙක් කරන්නද හදන්නේ? පිං සිද්ද වෙයි කාමරෙන් එළියට පලයල්ලා. වැරදිකරුවන් වෙදි වික ගිනි ගත්තේ. කරුණාකරලා මට ඉන්න දීපල්ලා.' සිරි මා වාරුකරවා ඇඳේ හාන්සි කළා මතක ය. සිහින සිහිනයක් මෙන් මට දැනේ. අතීතයේ සියලු නටබුන් සිත ඇතුළේ කෙළි කවටකම් කරනු මට පෙනේ. තොල කට වියළී යනු මට මතක ය. මම අමාරුවෙන් වචන ගළපා ගතිමි.

'සිරි. . . . මට වතුර වීදුරුවක්.'

පුරා වතුර වීදුරුවක් සිරි මට දුන්නේ ය. මම එක හුස්මට එය බීජ කළෙමි. සිරි ඇඳේ පහළ වාඩි වූයේ ය.

'මාව නැති කළා. මාව නැති කළා. පව්ව.....'



මම දෑතින් ම වීදුරුව පොඩි කළෙමි. සිරි නැගිට්ටා විට මම දෑත ම ඔහුට පෑවෙමි. හිරි වැටී පරඬල් වී තිබුණු රතුපාට ඇඟිලි රතු ම රතු ලේවලින් පෙඟී බේරී තිබිණි. මට වේදනාවක් නොදැනේ. ඒත් වීදුරු කැට අල්ලේ, ඇඟිලි තුඩුවල එල්ලී තිබෙනු මට පෙනේ. සිත තුළ කුරිරු සිතුවිලි ලියලා එනු යි මම බිය වීමි. ලේ පෙරෙන දෑතින් සිරිව බද ගෙන මම හඬන්නට වීමි.

'සිරි. මං හරි අසරණයි. මාව මගේ අම්මා ළඟට ගෙනියපං. මට මැරෙන්න ඉස්සර මගේ අම්මා දකින්න ඕනෑ. මගේ රත්තරන් අම්මා දකින්න ඕනෑ.'

මහ හයියෙන් ඉකි ගසා මම හැඬීමි.

ත්‍රිරෝද රථයක් මිදුලේ නවත්වනවා ත්, සිව් දෙනෙකු විසින් මා එයට ගොඩ කර ගන්නවා ත් මට මතක ය. උදේ හමු වූ වෛද්‍යවරයාගේ නිවසට ඔවුන් මා ගෙන යනවාත් මට මතක ය. මා දෙස දයා බැල්මක් හෙළූ වෛද්‍යවරයා දිග ඉන්ජෙක්ෂන් කටුවක් ගෙනැවිත් වමතේ මුදුනට ගසනවාත් මට මතක ය.

සත්තකින් ම පියවි සිහියෙන් මට මතක සිදුවීම් ඒ පමණකි.

ඉහළට ගත් හුස්ම පොද ඔහේ පා වෙන්නට හැර මම රෝහලේ සිලිම දෙස බැලීමි. මකුළු දැලකට හසු වූ කුඩා කෘමියකු ජීවිතය මුද ගැනීමට දඟලනු මට පෙනේ. මගේ හිස් බැල්මට ඒ කිසිවක් නිශ්චිත නොවේ. සියල්ල නිහඬ ය. නිසල ය. ප්ලොරසන්ට් ලයිට් එළි වාට්ටුවේ පඬු පැහැ වැඩි කරමින් විහිදේ. මගේ දෑත සීතල වී හිරි වැටී ඇත. කොට්ටයට බර දී නෙත රැඳුණු කඳුළකින් ඇයට කව්පද කුරුටු ගෑ දෑත දෙස බැලීමි. ඇඟිලි තුඩක් වත් නොපෙනෙන්නට බැන්ඩේජ් පටිවලින් වෙළී, තැන තැන ලේ බිඳු මතු වී ඇත. මම සිහි කරමි. ඊයේ උදේ වෛද්‍යවරයා කී වදන් දෝංකාර දෙමින් මට සිහි වේ.

'වැස්සේ තෙමී තෙමී සොහොන් කොත් ගානේ ඇවිදින පිස්සු ළමයෙක්.'

මේ පීඩනය මට තව දුරටත් උහුලා සිටීමට පුළුවන්කමක් නැත. සෙනෙහස පුපුරා ගිය තැන මා පිස්සෙකු වනු ඇත. වීදුරුව මා දෑතින්

ම පොවී තලේ වේදනාව පිට කිරීමට වෙනත් මගක් නොතිබුණු නිසා ම ය.

'මේ ළමයා මනෝ චිකිත්සකයෙකුට පෙන්නන්න වෙයි. මේ දෙවෙනි පාරටනේ වාට්ටුවට ඇතුල් කළේ. ටිකක් සිහි මද ගතියක් වගේ තියෙනවා.'

බැන්ඩේජ්වලින් මගේ දෑත වෙළන අතර වෛද්‍යවරයා බෝඩිමේ ඇන්ටිට කියනවා මා අහගෙන ය. සුව මසකට පමණ පෙර මෙ වැනි ම රාත්‍රියක නිදි පෙති දෙළහක් පමණ බී මා වැතිරුණේ ජීවත් වන්නට නම් නොවේ. සදාකාලිකව ම නිදන්නට ය. එහෙත් මරණය අප පතන තරම් ඉක්මනින් අප වෙත පැමිණෙන්නේ නැත. සීතල පොළොවේ මිහි තුරුලට හැදවන්නේ නැත. වද දෙමින්, කරදර කරමින්, දුක් දෙමින් අපව පෙළයි, දවයි, විඳවයි.

ඉතිං, මේ කතාව මගේ මළගමෙන් අවසන් කරන්නට මට පුළුවන. ඒත් මරණයේ සිය රැඳුණු ආත්මයේ මම අදත් ජීවත් වෙමි. මගේ පුරාංගනාවිය, ආදරණීය 'සුදු නංගි' පණ නොලබන පෙම් සිහිනයක ආරම්භ සිටි බව ද ඇත්තකි. දැනුදු මට පන්ති කාමරයේ දී මධුපානී ඉඳුවල්ගොඩ සිදුවිය මුණ ගැසේ. ඒත් මගේ ප්‍රේමය මිහිදන් කළ පොළොවේ තුමිගේ පසු විදන කුරුටු ගාන්නට මිස නැවුම් ප්‍රේමයකට මුලපුරු පුරන්නට මට පුළුවන්කමක් නැත.

'මොකද කසුන් නැගිටලා? ඔය අත්දෙක පාරවා ගන්න එපා කරුණාකරල නිදගන්න.'

හෙදිය මා සමීපයට ඇවිත් කෙපලන තෙක් මා ඇය දුටුවේ ම නැත.

'දැන් එළිවෙන්නත් ළඟයි ළමයෝ. ඔය කොට්ටේ හේත්තු කරලා නිදගන්න. ඔයාට බොහොම විදල තියෙන්නෙ. ඇහැරල ඉන්න හොඳ නෑ.'

දෙවියනි! ඇය කෙ තරම් කාරුණික ද? මගේ 'සුදුනංගි' ඒ දවස මා යාත්තමින් රෝගාතුර වූ විට ළඟ දැවටෙනුයේ ත් මෙකී සෙනෙහසින් ම නොවේ ද? හෙදිය පොරෝනය ගෙන දෙපතුල සිට මගේ සිරුර



වැසුවා ය. මම කතා නොකළෙමි. එක එල්ලේ ඇය දෙස බලා සිටියා විය හැකි ය. තොරිදෙන්නට වගේ අත් දෙක දෙපැත්තට කළ ඈ නළලට අත තබා උණ බැලුවා ය. මම දෑස පියා ගතිමි.

'අනේ මිසී, මගේ සුදු නංගි කෝ?'

හැඬුම් එන තරම් වේදනාවකින් මා ඇගෙන් එසේ ඇසුවේ ඇයි දැයි මම ම නොදනිමි. පියවී ඇති දෑස දැලේ කඳුළක් බොඳවිණි. සීතල රේඛාවක්ව කම්මුල දිගේ කඳුළට ගලා යන්නට හැර මම නිසල වීමි.

'ඔයා අසනීපෙන් කියලා සුදුනංගී දන්නේ නැතේ කසුන්.'

එක ම වාට්ටුවේ නිතර නිතර ගිලන්ව නේවාසික වූයෙන් මා ගැන බොහෝ දේ දන්නා ඇයට සියල්ල නොසඟවා කියන්නට මට සිතේ. එහෙත් ඊට පෙර මගේ මුහුණට නැඹුරු වූ ඇය ගලා ගිය කඳුළ මාපටැඟිල්ලෙන් පිස දැමුවා ය.

'අනේ මිසී....'

දෑසේ සිර වූ කඳුළු පිටතට විසි විණ.

'අඬන්නෙ නැතුව නිද ගන්න. අපි හෙට පණිවිඩයක් යවමු වාපට. කසුන් ආයෙත් ඇඩ්මිට් වුණා කියලා.'

'එපා! සුදුනංගිට කියන්න එපා.'

වාට්ටුව දෙදරුම් කන්නට තරම් වේගයෙන් කෑ ගසා හඬන්නට මට සිතේ. මම තරයේ දෑස පියා ගතිමි. තවු හකුලා ගත් කල ඉතිරි කඳුළ ත් පිටතට විසි විණ.

'ඇයි මිසී මට වද දෙන්නෙ?'

'අපි ඔයාට වදදුන්න නෙමෙයි. ඔයාමනේ ජීවිතේ නැති කර ගන්න හදන්නේ.'

'මට මැරෙන්න ඕන.'

'එතකොට සුදුනංගී?'



For E - Pusthakalaya

For E - Pusthakalaya

විදුලි කොටන වේගයෙන් හදවත සැලී මහ වැසි දෙනෙත් කෙවෙණි කුළින් ඇද වැටුණේ එ විට යි. ලෝකයා හමුවේ පෙන්වූ සිතේ යථාර්ථය කුමකට දැයි මට සිතේ. මුවින් පිට නොවූ වේදනාව හදවතේ ගැස්ම වැඩි කළේ ය. සත්තකින් ම කිසිවෙකු මගේ සිත දකී නම් මගේ සැළින් හඬනු ඇත. හෙදිය මා අසළින් ඉවත් වෙත් ම මහා පාළුවක් වාට්ටුව පුරා පැතිරිණි. පෙම් සිතකින් සෙනෙහය ඉල්ලා තැ ගෙන්නට මට සිතේ. එහෙත් මම නිහඬ වීමි.

කොළඹ නගරයේ වසන්තය සොයා තර්ස්ටන් විදුහල් සෙවණට පැමිණ ද සිට සිදු වූ ප්‍රසන්න වූ ත්, අවාසනාවන්ත වූ ත් සියල්ල මේ ගිලන් යහන මත සිට මට මෙනෙහි වන්නේ නිතැතිනි.

මගේ ආත්මයේ මියැදීම තේරුම් ගැනීමට මා නැවත පුනරුත්පත්තිය ඇති 'කොළඹ වසන්තයේ' හිමිදිරියෙහි තේරුම් ගත යුතු ය. චාපා ගංගාදරී අබේනායක නම් දෙව්දුව මට මුණ ගැසුණේ ගම් පියසේ කුඹුක් ගස් සෙවණක දී නොවේ. සත්මහල් ප්‍රාසාද පිහිටි කොන්ක්‍රීට් වනාන්තරයේ මැයි ගස් සෙවණක දී ය. ආදරණීය තර්ස්ටන් මාවත මගේ ප්‍රේමයේ වැලම් ගෙය යි. කළුබෝවිල මහ රෝහලේ තෙවන වාට්ටුවේ හත්වෙනි ඇඳේ ගිලන් මිනිසෙකු ලෙස මම අතීතය සිහි කරමි.



# 2

මා අවදිව සිටිය දී ලෝකයෙන් අඩක් නිදන්නට ඇත. තව දුරටත් මට හුරු පන් පැදුර අහිමි ය. රබර් මෙට්ටයේ නිද සිටීමට නොහැකිව මම පිබිදියෙමි. අම්මා ත් අප්පච්චි ත් මා අසලක නැත. 'මගේ අම්මා' යි මම සිතින් මිමිණුවෙමි. ටික් ටික් හඬින් මරලෝසුව නිහැඬියාව බිඳියි. කොළඹ නගරයේ වසන්තයට මම අවතීර්ණ වී සිටිමි. බෝඩිං ජීවිතයට මා හුරු වූ මුල් අවදිය ඇරඹෙමින් ඇත. එකී හිමිදිරියෙහි පාළු වූ රාත්‍රියක් බව මට හොඳට මතක ය.

මතක සන්ධියේ සිට කුඹුරේ මඩ සුවඳ ත්, හිඹුටු, දං, නාරං සුවඳ ත්, ගැමි වහර ත් මට උරුම වූයේ මගේ අප්පච්චි ගොවියෙකු වූ නිසා ය. දුප්පත් අහිංසක ගොවි ගෙදරක මා උපන් නිසා ය.

බහ තෝරන දවසේ සිට සිව්පද ගී කීවේ, වැලිපිල්ලේ පුංචි ගී සින්දු අකුරු කළේ, මා නිදි ගන්වන්නට මගේ අම්මා නැළවිලි ගී කී නිසා ම ය. උකුලේ හොවා මා සැනසූ නිසා ම ය.

දඟකාරකම ත්, කෙළිලොල්කම ත් දෝතින් ගෙන තරමක් මා මුරණ්ඩු වූයේ නම් ගෙදර හුරතල් වූ 'බඩ පිස්සා' මා නිසා විය යුතු ය.

මගේ අම්මා ත්, අප්පච්චි ත්, ගමේ නැවුම් සුවඳ ත් අතර, කොළඹ තර්ස්ටන් විදුහලට මා ඇතුළු වූයේ ඉගෙනීමට තරමක් දක්ෂ වූ නිසා ය. එකී පාපයට වන්දි ගෙවන්නට ය.

For E - Pusthakalaya

ආංශපලනේ දී යෞවනය ඇරඹුණා යැයි මට සිතේ. පොත් බෑගය පසේ එල්ලා ගෙන අපි කුඹුල්ලෙන් හැරී තර්ස්ටන් පාර දිගේ ගමන් කළෙමු. සුජාතා බාලිකාව අසළ දී අප්පච්චි මා දෙස විමසිලිමත්ව බැලුවේ ය. සකව වැටට බර දී මගේ වයසේ පාසැල් සිසුහු තිදෙනෙක් දුම් උරමින් සිටිති. 'ඊයි මයිනෝ' කියමින් එකෙක් කෑ ගැසුවේ ය. අප්පච්චිගේ මුණ බලා මම බිම බලා ගතිමි.

'ඔහොම කාලකන්නි පොඩ්ඩි කීප දෙනෙක් ඉන්නවා. හොඳට වැඩ ටික කරගත්තොත් ඉතිං වරදින්නේ නෑ.'

අප්පච්චි එසේ කීවේ අම්මාට ද ඇසෙන්නට ය. මා තර්ස්ටනයට ඇතුළු වීම පිළිබඳ අම්මා සතුටු නැත. ඇගේ මුහුණේ ඇත්තේ කහස්සුළු ස්වභාවයකි.

තර්ස්ටනයේ ගේට්ටුවෙන් ඇතුළු වෙද්දී අම්මා ත් මම ත් තරමක් පිටිපස්සට වීමු. වෙට්ටියක් හැඳ කළු පාට කෝට් එකක් දමා සිටි අප්පච්චි කඩිනමින් ගමන් කළේ ලොකු ඉස්කෝලයක දී ඇති විය හැකි නිහමානයෙන් මිදීමට යැයි මට සිතේ. කුඩා පංතිවල ළමෝ විහිළුතහළු කරමින් අප්පච්චි දෙස බැලුවේ 'මූ මොකාද' වැනි හැඟීමෙනි. මුලත් විට හපන කට පඩික්කම කර ගත් අප්පච්චි පිළිබඳව මට තරහක් උපණි. විදුහල්පති තුමාගේ කාර්යාලයට ගිය අප්පච්චි එන තෙක් මම අම්මා සමඟ කොරිඩෝරයේ ගල් ගැසී සිටියෙමි. මොහොතකින් පැමිණි අප්පච්චි 'පොඩ්ඩක් ඔහොම ඉන්නවල. මම විගසට එන්නම්...' යැයි කියා පාසැල් ගේට්ටුවෙන් එළියට ගියේ ය. කොරිඩෝරය මැද්දේ පිළිම දෙකක් මෙන් සිටීම හොඳ නැතැ යි සිතූ මම අම්මා සමඟ බිත්තිය අද්දරට වීමි. මැඩලයක් පැළඳි ශිෂ්‍යයෙක් පැමිණ 'ආච්චි ඇතුළට ගිහිල්ලා අර පුටුවෙන් වාඩි වෙන්න' කියා මා දෙස රවා බැලුවේ ය. එම ශිෂ්‍යයා දෙස මම බැගෑපත් නෙත් හෙළීමි. ඔහු නැවතත් රැව්වේ ය. මම බිය වීමි.

කඩිනමින් පැමිණි අප්පච්චි අප ද කැටුව කාර්යාලයට ඇතුළු වී ය. දහදියෙන් තෙත් වී මම බිරාන්ත වීමි. විදුහල්පති තුමා දෑස සිදුණු කොට විනිවිද යන බැල්මක් හෙළයි. ගමේ ඉස්කෝලේ ලොකු මහත්මයා කොච්චර හොඳ ද? අලුත් විදුහල්පති තුමා දුටු මට සිහි වන්නේ ඩිස්පැන්සරියේ දොස්තර මහත්තයා ය.



'ප්‍රතිඵල හොඳ නිසා බාර ගන්නම්. ඔය ඉතිරි සල්ලි බැංකුවට බඳින්න. කොලේජ් එකේ බිල්ඩිං පන්ට් එකට.'

'හොඳමයි මහත්තයෝ.'

අප්පච්චි බැගෑපත් වී ය. මම හිස කෙළින් කර ගැනීමට තැත් කළෙමි.

'එහොළහ සී බයෝ සයන්ස් ක්ලාස් එකට යන්න.'

අපි තිදෙනා ම තුෂ්ණිම්භූතව කාර්යාලයෙන් පිට වීමු. පාසැල් ගේට්ටුවෙන් පිට වෙද්දී අම්මා ත්, මම ත් එකවර දහදිය පිසදා ගතිමු.

'කොලුට බඩගිනිත් ඇති. දැන්නම් දෙළහත් පහුවෙලා මයෙ හිතේ...'

අප්පච්චි වෙලාව කිවේ නැත. ඔහු කේන්තියෙන් දැයි මම බිය වීමි. පාර පැන අපි තිදෙනා ම 'රහීමා' හෝටලයට ඇතුළු වීමු. රත්තරං බොරු දත් කුට්ටම පෙන්නා තොරොම්බල් හිනාවක් නැඟූ මුදලාලි.....

'ලොක්කෝ වැඩේ හරිද?' යි විමසී ය.

මේ මුදලාලි අප්පච්චි හඳුනන්නේ කෙසේ ද යන ගැටලුව මතු වුවත් මම නොවිමසීමි. පාසැලට මුදල් බඳින්නට සල්ලි මදිව අප්පච්චිගේ අත් ඔරලෝසුව මුදලාලිට විකුණා ඇති බව මා දැන ගත්තේ බොහෝ කාලයකට පසුව ය. මා තර්ස්ටනයට ඇතුළු කළේ අප්පච්චි ජීවිත කාලයක් සුරකි අත් ඔරලෝසුව උගසට තබා නේදැ යි සිතන විට අදත් මගේ දෑස කඳුළින් තෙත් වේ.

මිය ගිය හදවතක අතීතය පිළිසිඳ ගැනීම අවාසනාවකි. එහි අභාග්‍ය සම්පන්න කාලය රෝහලේ ඇඳ මත ගෙවී යමින් පවතී. පසු කාලයේ සොහොන් කොත්වල ත්, මුහුදු වෙරළේ ත් සක්මන් කරද්දී මම මේවා අකුරු කළෙමි. නිනව්වක් නැති අතීතය මහත් බරකි. වේදනාවකි. දුකකි. බොඳ වූ කඳුලකි. මෙය අකුරු කරද්දී වාතලයට එක් කළ සුසුම්, මා හැඩවූ බව දන්නේ මම ත්, මගේ සිත ත් පමණි. තර්ස්ටන් මාතාවගේ සෙවණින් මම නගරයේ පුනරුත්පත්තිය ලැබීමි. විටෙක එය කිහිරඳුරු දැවටු වැලි කතරකි. ඇසිල්ලකින් කෙම් බිමකි. මා සැනසුවේ ත් මා හැඬවූවේ ත් මෙකී කොළඹ වසන්තය යි.

ඉද්දමල් සුවඳ විහිදුවිනි. සීතල සුළං පොදක් මන්දස්මිත වසන්තාරය ද පලා ගොසිනි. හැඩුම් බවක් මා අසා රඳන්නේ ම නැත. ඇත් යමේ දුසි සිහිනයක් මෙන් ගත ත්, සිත ත් ව්‍යාකූල ය. පැණිරස ය. උදේ පාන්දර ම කොඩිමෙන් නික්මී, දක්ෂිණාරාම පාර දිගේ ගල්කිස්ස හැටකුම් පොළට ආ මම හාත්පස විමසිලිමත්ව බැලීමි. තර්ජනය අසළින් තවත බස් රථ අංක පිහේ පෙළ ගැසිණි. පුරහල ගසාක තැඹුණු මම වේලාව බැලීමි. කිසිදු පාසැල් සිසුවකු රථය තුළ නැත. මම රජෝලය අද්දරට වෙන්නට වාඩි වීමි. පාසැල අසල රථය නැවතුවත් එසිත කොහේ දෝ ඈතක නතර වී තිබිණි. මම කවිනමින් රථයෙන් බැස්සෙමි. බාලාංශ පංතිවල කුඩා සිසුන් කීප දෙනෙකු හැර මුළු තර්ජනය ම පාළුවට ගොසිනි. මම නියමිත පංති කාමරයට ගියෙමි. පාං ගත්ත බව ත්, නිහැඬියාව ත් මේ ගොඩනැගිල්ලේ හාත්පස පැතිරී ඇත. මා තනි වූ බවක් මට ම දැනෙන්. මම අම්මාට ලියුමක් ලිව්මි.

අම්මා සම්බුදු සරණයි!

මගේ රත්තරං අම්මාට,

අම්මාත් අප්පච්චීත් එද කරදරයක් නැතිව ගෙදර යන්න ඇතිය කියා හිතනවා. අම්මත්, අප්පච්චීත් මං දාල යනකොට පපුව හොස් ගාලා සිව්විලා යනව වගේ දැනුණේ. එද නම් මම හුගක් දුකින් හිටියේ. කොච්චිත් පුරු නැති නිසා. දැන්නම් ටිකක් හුරුයි. කොහොම හරි ළඟ කොළඹ ඉන්ට එපාය. අමාරුවෙන් හරි මම විභාගය හොඳින් කරනවා. අම්මාගේ බලාපොරොත්තුව ඒක බව මම දන්නවා. වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වෙන්න අමාරු වෙන එකක් නෑ. මෙහෙන් විභාගෙ කළාම කොහොම හරි දොස්තර කෙනෙක් වෙනකල් මම ඉගෙන ගන්නවා. එහෙම වෙච්ච දවසට අම්මාටත් අප්පච්චීටත් මං ගැන සතුටු වෙන්න පුළුවන් වෙයි. ඉස්කෝලෙ වැඩවලට අමතරව නව වැඩිපුර පෞද්ගලික පන්තිවලට යන්න වෙයි කියලා බොඩිමේ .........

අයියෝ කාටද බෝ ලියුම්? ආපු ගමන් ගමේ බඩුවට ලෙටර් එකක්නෙ?



මම තුෂ්ණිම්භූත වීමි. මැරයන් රැළක් මෙන් සිසුහු දහයක් පමණ මා වට කොට ගත් හ. එකෙක් ලියුම කීතු කීතුවලට ඉරා විසි කළේ ය. මසිත දැවිණ. මම නිහඬව බිම බලා ගතිමි.

කොහෙද උඹ කලින් ගිය ඉස්කෝලෙ?

මම ගමේ පාසැලේ නම කීමි. එය මිශ්‍ර පාසැලක් බව ඇසීමෙන් ඔවුහු මා වට කොට ගැහැණු ළමයින් පිළිබඳ තොරතුරු විමසූ හ. ගැහැණු ළමුන් සමග එක ම පේළිවල වාඩි වෙනවා ද? ඔවුන්ගේ නග්න කලවා දැක තිබේ ද? ආදී නොයෙක් ප්‍රශ්න විචාළ විට මම දන්නා තරමින් පිළිතුරු දුනිමි.

'හරි හරි කියපං සිංදුවක්' යැයි කියූ 'ප්‍රසා' නමින් හැඳින් වුණු සිසුවා මට පුටුව මතට නැගීමට අණ කළේ ය. මම පුටුවට නැගීමි. ඔවුන් එකිනෙකා හඳුන්වා ගත්තේ 'ප්‍රසා', 'මෝරා', 'බීටෝ', 'එච්චා', 'පැස්කි' ආදී නම්වලිනි. පාසැල ඇරඹෙන සීනුව නාද වුව ත් කිසිවකු එය ගණන් ගත්තේ නැත. 'කියපං වෝ සිංදුවක්' යැයි නැවත මට තරවටු කළ පැස්කි නමැති බර්ගර් සිසුවා 'ඇබා, බොනිඑම්, අ-හා, බීජීස් ඕනෑ එකක්' යැයි අලගු තැබී ය.

'ගොඩයට මැජික් බං' කියූ මෝරා මගේ කමිසය උඩට ඇද කලිසම ත් දණහිස දක්වා නැමුවේ ය. කණෙයකින් පංතියේ සියලු දෙනා ම පුටු එහෙමෙහෙ ඇද වාඩි වූ හ. මීයට පිම්බාක් මෙන් ඔවුහු නිහඬ වූ හ. මම පුටුව උඩ ම හිට ගෙන සිටියෙමි.

'ඒයි.... මෝඩය වාඩි වෙයං' යැයි කිසිවෙකු සිහින් හඬින් අණ කළත් මා වාඩි වීමට පෙර වේවැල ත් රැගත් ගුරුවරයකු පංතියට ඇතුළු වී ය.

'කවුද මේ පුටුව උඩ?'

අලුත් ළමයෙක් සර්

මොකද හිටගෙන?

පොඩි රැග් එකක් සර්...

For E - Pusthakalaya

ඒ ගුරුවරයා නියෝජ්‍ය විදුහල්පති තුමා බව මා දැන ගත්තේ ඉන් දින දෙකකට පසුව ය.

'මේක යුනිවර්සිටි එකා නෙමෙයි.'

'ඒ වුණාට සර් සමාජවාදයට යන්ඩ ඉස්සර ත්‍රිල් එකකුත් එපායැ. රුසියාවෙන් සර් දැන් ඩිස්කො දනවලු.'

'එහෙනං හොඳත්ත දෙවල්වලට කට ගහන්න එපා. රුසියාවේ හොරු, කප්පම් අනු වුණා ම ජේරම ගාල් කරනවා. කමුසෙලා එහේ හිටියත් දැනි. ඒ විකම තමයි. ඒ ජේරම පිටමං කරන්නේ සයිබීරියාවට.'

'සර් සයිබීරියාවට ගිහිං තියෙනවද?'

'පුතා' එසේ විමසීම ත් සමඟ ම පංතිය ම කොක් හඬ ලා සිනා සුණ හ. ගුරුවරයා පංතියෙන් පිට වී ය. මේ සිදුවීම මාතෘකා වීම නිසා ඒ දින මම තරමක් නිදහසේ විදුහලේ කල් ගත කළෙමි.

සඳලුතලවල යුවතියන්ට පැල්පත්වල වෙසෙන යෞවනයන් පෙම් කළේ පුරාංගනා කතාවල ය. ඒත් බොහෝ දිනවල, ඉර බැස ගිය කල් සුන්දර සැඳෑවල, මම දෙව්දුවක් සමඟ සසර සැරිමි. සිහිනෙන් හෝ පුරාංගනා කතාවක් මෙන් නොව පියවි ලොවේ දී එකී චමත්කාරය විඳිමි. දැඟිලි සුළං පොදක, සඳ සිසිලක මම ඒ ආදරයේ සුවඳ දැවටෙන සුන්දරතාව අත් විඳිමි. මට ඉන් අත් මිදිය හැකි නොවේ. ඒ හෙයින් මිළ සොහොන් ගඳ ගසන මේ දේශයේ කළු දුමට මුවා වී, යථාර්ථයෙන් වසන් වී, මම මගේ කතාව පෙළ ගසමි. මොහොතකට සමාවන්න.

සති දෙක තුනක් ගෙවී ගිය ත්, තර්ස්ටනය තුළ නිදහසේ අවකාශය කරගෙන යෑමේ හැකියාවක් මට ලැබුණේ නැත. කිසිදු සිසුවෙකු මා සමඟ මිතුරු වූයේ ද නැත. ගමේ ඉස්කෝලේ 'උක්කුවා' 'දද්දා', 'බණ්ඩා', 'පුදු මල්ලී' වැනි කිසිවෙකු කොලීජියේ නැත. මගේ ගැමිකම පළවා හැර, ගැමි ඇබිබැහිකම් ඉක්මනින් දුරු කර ගැනීමට ද මම සමත් වීමි. එකොළහ පී බයෝ සයන්ස් ක්ලාස් එකේ 'කොළඹ කොල්ලන්' මට දුන් වෙසත් දඬුවම වූයේ බදාදා පැවැත්වෙන සාහිත්‍ය සමිතියේ මට ගීතයක් ගැයීමට හෝ කතාවක් කිරීමට මා නොදැනුවත්ව



ම නම ඇතුළත් කිරීම යි. අගහරුවාදා විවේක කාලයේ දී මා මෙය දැන ගත්තේ කැන්ටිමේ දී සිසුන් කිප දෙනෙකුගේ කතාබහට ඇහුම්කන් දීමෙනි.

'පොර කලන්තෙ දල ස්ටේජ් එකේ වැටිල මළ කෙළියක් වෙයි ද දන්නේ නෑ.'

'දඩිය දල දැහැටවොත් සිරාවට තුවක් දීල බස්සමු.'

'එළුවා' ත් 'පැස්කි' ත් 'කොකාකෝලා බෝතල් දෙකක් බිබී කතා කරනු ඇසී මම කැන්ටිමෙන් ඉවත් වීමි. ප්ලේන්ටි එකක් බීමේ අවශ්‍යතාව මම බැහැර කළෙමි.

බදාදා උදේ මා පාසැල් ගියේ තරමක් තැති ගත් සිතිනි. පානදුර සිට තර්ස්ටනය දක්වා පාසැල් බස් රථයක් තිබුණත් ගල්කිස්සේ දී ඔවුන් මා 'ස්කූල් බස්' එකට ගොඩ කර ගත්තේ නැත. ඔවුන් කිවේ 'පාරේ බස්වල වරෙන්ඩෝ' යන්න පමණකි. බදාදා දවල් 12.45 ට උසස් පෙළ පංති සියල්ල ම තර්ස්ටනයේ ප්‍රධාන ශාලාවට රැස් වි ය. ආචාර්ය මණ්ඩලය ද ශාලාවේ මුල් පෙළේ අසුන් ගත් හ. පෙර දිනයක වේවැලක් රැගෙන පන්ති කාමරයට පිවිසි නියෝජ්‍ය විදුහල්පති තුමා ද එහි සිටියා මට මතකය. මම ශාලාවේ පිටුපසට ම වී සිටියෙමි. ගීත දෙකක් ද, කතාවක් ද සිසුන් විසින් පවත්වනු ලැබිණ. එක් සිසුවෙක් ගායනා කළේ බටහිර වේග රිද්ම ගීතයකි. එම ඉංග්‍රීසි සින්දුවට සිසුහු තාල තැබූහ. (එකී ගීතය මා දන්නා එකක් නොවේ) වේදිකාවේ සිටි සාහිත්‍ය සංගමයේ සභාපති සිසුවා ඊ ළඟට කී දෙයින් 'මගේ දණහිස් කවු දෙක තරමක් තිගැස්සුණා මට හොඳට මතක ය.

'මී ළඟට උසස් පෙළ විද්‍යා අංශයේ කසුන් සෙනෙවිරත්නගෙන් කතාවක්'.

ගෙම්බන් තළන්නාක් මෙන් අත්පොඩියක් දෙකක් නැඟුණ ත් මම බිය වීමි. කිලිටි ලේන්සුව ගෙන දහඩිය පිස දමා ගතිමි. අඩියට දෙකට පියවර තබා වේදිකාවට පිවිසුණෙමි. සියල්ලෝ ම මදෙස බලා සිටිති. ඔවුන්ගේ ඇස් තියුණු ය. මුවහත් ය.

[illegible] සියවරුති, [illegible] මම මගේ [illegible] මහගම්සේකර හා [illegible] නිර්මාණ [illegible] ජීවිතයේ [illegible] ඉදිරිපත් කොට, අපේ [illegible] ගුණයෙන් පිරිපුන් ප්‍රතිභාවන්ත [illegible] සේකර ..........................

[illegible] කතා කරන්නට ඇත. [illegible] ශබ්දයක් මට ඇසුණේ නැත. [illegible] මහගම්සේකරගේ [illegible] මම කතා කළෙමි. [illegible] කතා කිරීම ත්, ගමේ [illegible] කොට [illegible] එලියට එනවාත් සමඟ ම [illegible] කතා කළේ ය.

[illegible] ස්කූල් බස් එකේ?'

[illegible] එල්ලී ගමන් කළ ත් 'පුසා' [illegible] අරන් දුන්නේ [illegible] ස්කූල් බසයට ගොඩ වීමි. 'මාර [illegible] සිට ම මුල් පන්තිය [illegible] ලැජ්ජා සහගත හැඟීමක් ඇති [illegible]

[illegible] 8.15 ට පමණ අපි ප්‍රායෝගික වැඩ සඳහා විද්‍යාගාරයට [illegible] ගුරුවරයාට යමක් කියනු මා [illegible] පරීක්ෂා කරමින් සිටිය [illegible]

[illegible] ප්‍රින්සිපල් මුණ ගැහෙන්න.

[illegible] වීමි. මේ දින කීපයට [illegible] කළේ නැත. ස්කූල් බස් එකේ [illegible] 'රහීමා' එකට හොරෙන් [illegible] පාසල් [illegible] පැන රූපි, මැජස්ටික්,



ලිබර්ටි හෝ 10.30 බැලුවේ ද නැත. පන්ති කාමරයේ දී ගුරුවරයාට හොරෙන් නිරුවත් පින්තූර පොත් බැලුවේ ද නැත. මේ සියල්ල ම කළේ අනෙක් සිසුන් ය. වරදක් නොකළ මට නියෝජ්‍ය විදුහල්පතිවරයා කතා කළේ ඇයි? 'ඕන එකක්' යන හැඟීමෙන් මම ඔහුගේ කාර්යාල කාමරයට පිවිසීමි.

'එක්ස්කියුස් මී සර්.'

අනෙක් සිසුන්ගේ භාෂාවෙන් ම මම කතා කළෙමි.

'ඔය පුටුව ඉස්සරහට කරලා වාඩි වෙන්න.'

මම වාඩි වීමි.

'මොකක්ද ඔය ළමයගේ නම?'

'බණ්ඩාර මුදියන්සේලාගේ කසුන් සෙනෙවිරත්න.'

'අර සෙනෙවිරත්න බණ්ඩාර කියන ප්‍රොෆෙසර් රිලේෂන්ස්ලද?'

'අපේ ලොකු අප්පච්චි.'

'හොඳයි, මං එන්න කිව්වේ වැදගත් වැඩකට. මට ඕනෑ කරලා තියනවා අපේ ඩිබේටින් ටීම් එක හොඳට හද ගන්න. ඔය ළමයා ඒකට ඉතාම හොඳයි. ලබන සතියේ විශාඛා එකේ ෆ්‍රෙන්ඩ්ලි ඩිබේට් එකකට ඉන්වයිට් කරලා තියෙනවා.'

මම සියල්ල අසා සිටියෙමි. පුටුවේ ඉදිරි කොණේ එල්ලී සිටි මම හරිබරි ගැසී වාඩි වුණෙමි.

'හෙට ඉඳල පුහුණු වෙන්න. ලබන සතියේ විශාඛා එකට යන්න ලෑස්ති වෙන්න. රුපියල් 35 ක් දීලා ස්කූල් ටයි එකක් ගන්න. දෙමවුපියෝ කොළඹනේ ඉන්නෙ?'

'නෑ සර්, ගමේ...'

'මොකද්ද රස්සාව – ඉස්කෝලෙක ටීච් කරනවද?'

'නෑ සර්.

'හෙනා ල?

For E - Pusthakalaya

අම්ම ඉස්සර නේ වත්තෙ කුලියට දලු කැඩුව. දැං ඔයේ වැලි ගොඩ දානව.

මට සතපය නිසැවිණ. ඒ සමග ම ඇසට කඳුළු පුරෝනවා මට දැනිණ.

මගේ රත්තරං අම්මා වෙනුවෙන් උපන් කඳුළු සට සට ගා මේසය මතට හැළිණ.



# 3

උදේ පාන්දර ම පිබිදි මම යහනේ සිට ම නිදිගැට කැඩුවෙමි. සීසන් ටිකට් පත හැරුණු කොට මා ළඟ තිබුණේ රුපියල් හතකි. විශාඛා විද්‍යාලයේ සුහද විවාදය ඇත්තේ අද යි. 'ටයි' එක මිල දී ගැනීමට රුපියල් තිස්පහක් පමණ අවැසි වුව ත් එය ලබා ගත හැකි ක්‍රමයක් තිබුණේ නැත. මම දස අතේ කල්පනා කළෙමි. ලොකු අප්පච්චි හමු වී රුපියල් පණහක් ඉල්ලා ගන්නට මම හිතුවෙමි. කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු වූ ඔහු දැන් තම පදවියෙන් විශ්‍රාම ගෙන වෙනත් රැකියාවක් කරයි. කුරුඳුවත්ත මල් පාරේ තර්ස්ටනයට යාබද ඔහුගේ නිවස සොයා ගැනීමට එ තරම් අපහසු නැත. එහෙත් ඊයේ අම්මා එවූ ලිපිය මගේ සිතුවිලි වෙනස් කරන්නට පමණක් නොව, කිසි ද ඔහු මුණ නොගැසීමට තරම් මසිත පොළඹ වන්නක් වි ය.

තෙරුවන් සරණයි!

පොඩි පුතේ,

උඹේ ලියුම හම්බුණා. උඹ ගැන තමයි ගෙදර නිතරම කතාව. කොළඹ රටේ පරිස්සමින් හිටපං. ඕනෑ නැති ගමන් බිමන් යන්න එපා. කොල්ලො රංචුවලට වැටිල නාස්ති වෙන්න හදන්න එපා. උඹලැ අප්පච්චියි මමයි මෙච්චර මහන්සි වෙන්නෙ උඹල හින්ද, අපේ අන්තිම කාලෙ උඹල හොඳ මිනිස්සු වෙලා රටේ හොඳ තැනක හිටියොත් අපිට සන්තෝසෙන් ඇහැ පියා ගන්න පුළුවන්. මම කුලී වැඩ කරල උඹට

[illegible] නෑ පුතේ. උඹට [illegible]. ගාසතු ගෙවන්න ගිය සුමානෙ [illegible] මාස්ටර් මහත්තයට උගස් කෙරුවා. උඹ [illegible] ගමේ ගිහිස්සු මුලාට ගිහාවෙයි. තියෙන දේ [illegible] ගන්න බලාගෙන සේරම ඉන්නේ. නෑදෑයින් සේරම එකතු වෙලා මහගෙදර ඉඩමෙත් ආයෙම නඩු දෑ. අප්පච්චිට උසාවි යන්න [illegible] නෑ. [illegible] නෑ කියල කියනවා. සුදු වහලද කොහෙද?

මේ දවස් ටිකේම ගෙදර හිටියේ ඊයේ බිබිලිගමුවේ හාමුදුරුවන්ගෙන් [illegible] උඹ මිවා කල්පනා කරන්න එපා. ඉස්කෝලේ [illegible] ලොකු අප්පච්චි මුණ ගැහෙන්න උඹ යන්න එපා. [illegible] ඒ මිනිහා කැමති නෑ. අප්පච්චි කොළඹ [illegible] දල දෙන්න කිව්වල. හොඳටම බැනලා [illegible] ගමේ ඉස්කෝලේ යන්න කියප. [illegible] විදුහලේ යන්න යෑ? ඕන්න ඔහොම කියලා තියනවා.

ටයි එක මිල දී ගැනීමට තිබුණු නොහැකියාව නිසා ම මම ඒ දින පාසල් නොයන්නට තීරණය කළෙමි. ඇඳට වැටී තදින් ඇස් [illegible]. බෝඩිමේ හිමිකාරිය දෙහිවල පාසලක ගුරුවරියකි. ඕ පාසල් යන්නට සැරසී කාමරයට එබුණා ය.

'[illegible]... හතයි වෙලාව. මොකද අද ඉස්කෝලේ යන්නේ නැද්ද?'

'යන්නත් ඕනි'

මට කියැවිණි.

'ඉතිං ඇඳට වෙලා ඉන්නේ? ස්කූල් බස් එකත් දැං ගිහිං ඇති.'

'මිස්... මේ...'

මට සිතා කත නොහැකි ය. ඒත් බෝඩිමේ මිස් කතා කළා ය.

'ඇයි පුතා? අසනීපයක්වත්ද? නොකියා ඉන්න එපා. අම්මා [illegible] නැතේ. ඕන දෙයක් අපිට කියන්න ඕනි.'



'නෑ මිස්. මගේ ළඟ තියෙන්නේ රුපියල් හතයි. අද වෙන ඉස්කෝලෙක තරගයකට යන්න ඕනෑ. ගිය සුමානේ මාව විවාද කණ්ඩායමට ගත්ත. ඉතිං ටයි එකක් ගන්න කිව්වා. රුපියල් තිස් පහක් ඕනෑ. මිස් ළඟ තියනවා නම් මට ටයි එකකට සල්ලි දෙන්න. අප්පච්චි සල්ලි එව්වම මම නොවැරදිම දෙන්නම්.'

'මට කලින් කියන්න එපායැ. මම සල්ලි දෙන්නම්, ලැස්ති වෙලා ඉක්මනට ඉස්කෝලේ යන්න.'

ඇය කෙරේ මහත් භක්තියක්, සෙනෙහසක් මගේ සිතේ උපණි. මම කඩිමුඩියේ ලකලෑස්ති වූයෙමි. මගේ අම්මා ළඟ නැති ද, ඇය මව් කෙනෙකු යි මට සිතිණි. මුව නොසැහෙන සේ මම ඇයට පිං දී ස්තුති කළෙමි. ඕ කට කොණකින් සිනාසුණා ය. මම ගල්කිස්ස හන්දිය තෙක් දිව ගියෙමි. වෙලාව හතයි විස්ස ද පසු වී තිබිණි. පුරහල දක්වා දිව යන පෞද්ගලික බසයක එවුලෙකු මෙන් මම පා පුවරුවේ එල්ලුණෙමි. මගේ කිහිල්ලේ රුවා ගෙන සිටි සටහන් පොත් කීපය නොවැටෙන්නට අනික් අතින් තද කර ගත්තෙමි. පැයකට ආසන්න ගමනකින් පසු මම බසයෙන් බැස ගතිමි.

තර්ස්ටනයේ ගේට්ටුව ළඟ නැවතී පාසැල දෙස බැලුවෙමි. පාසැල ඇරඹී ඇත. වේලාව උදේ අට ත් පසු වී තිබිණ. විනය භාර ආචාර්ය වරයා මා අල්ලා ගත්තේ ය. (සිසුන් ඔහු හැඳින් වූයේ පශ්චාත් ප්‍රදේශය හඳුන්වන නොසරුප් වචනයකිනි.)

'කොහේ ඉඳලද තමුසේ එන්නේ?'

'ගල්කිස්සේ.'

'පස්සට එළිය වැටෙන කල් බුදිය ගත්තද?'

'නෑ සර් මේ..... මී.....'

'නෑ සර්.... අටට ද මිනිහෝ ඉස්කෝලේ පටන් ගන්නේ?'

මට හැඬුම් එන්නට තරම් වී ය. ඔහු අත වූ වේවැලෙන් මට පහර දෙතැ යි මම බිය වීමි.



For E - Pusthakalaya

For E - Pusthakalaya

දුවනවා පංතියට, බුරුවා....

පංතියේ භෞතික විද්‍යා පාඩම ඇරඹී තිබිණි. සිසුහු ගණන් හැදිමින් සිටියෝ ය. මම ඒවා පිටපත් කර ගෙන විසඳන්නට තැත් කළෙමි. එහි අගක් මුලක් මට නොතේරේ. මගේ අභ්‍යාස පොත පරීක්ෂා කළ ගුරුවරයා රතු පැනෙන් ලොකු බිංදුවක් දැම්මේ ය.

මගේ පාසැල් ජීවිතේ පළමු වරට මම බිංදුවක් ලැබුවෙමි.



# 4

උදේ එකොළහට පමණ විවාදය සඳහා අපි විශාඛාවට පිටත් වීමු. සත්ත්ව විද්‍යාව පාඩම මග හැරීම ත් උදේ භෞතික විද්‍යාවට ලැබූ බිංදුව ත් මට මහත් වදයක්, වේදනාවක් වි ය. බම්බලපිටියෙන් බැස ගත් අපි වජිර පාර දිගේ පයින් ඇවිද පෙට්ටි කඩයකට රිංගුවෙමු. අපේ විවාද කණ්ඩායම ඔළුව පීරා පවිඩර් මුණේ උලා ටයි පටි ගැට ගසා ලකලෑස්ති වූයේ එකී පෙට්ටි කඩය ඇතුළේ දී ය.

සුවිසල් විශාඛාව දෙස මම දෙවරක් බැලීමි. ගේට්ටුව අසළ දී අපව පිළිගන්නා ලද්දේ සුන්දර විශාඛාවන් දෙදෙනෙකු විසිනි. අපේ සාමාජිකයින් 'පිස්සු හැදෙනවා' 'මාරයි නේ?' යනුවෙන් කියා මා පෙළඹ වූව ත් මම කිසිත් නොකීමි. විවාදය ඇරඹිණි. අකුරු සිදුරු නැතිව විශාඛාවේ ප්‍රධාන ශාලාව සුන්දර යුවතියන්ගෙන් පිරී ඉතිරී ගොස් ය. 'සාරධර්ම හා තරුණ අසහනය' පිළිබඳ පිළිතුරු කතාවේ දී මම මෙසේ කීවෙමි.

'පුංචි එවුන්ට කැගහල කියන්න බෑ. ආච්චිල සීයලට ඉල්ලන්න දෙයක් නෑ. අයුක්තිය, අසාධාරණය තේරෙන්නේ තරුණයන්ට. ඒක අසහනය නෙමෙයි. මුහුදු වෙරළේ පදුරකට පයින් ගහපුවම ජෝඩු දහයක් පහළොවක් විසිවෙනව. කුණු කුඩෙ ඉන්න බල්ලන්ට පයින් ගහලා තැඹිලි කෝම්බෙ කන තරුණයෝ මේ රටේ ඉන්නව. බඩපොත්ත පිටපොත්තට ඇලිල වීදිවල ඇවිදින්නෙ අසහනයට නෙමෙයි.'

මම මහත් වේගයකින්, වේදනාවකින් මෙන් කතා කළෙමි. විවාදය අවසානයේ දී ඔවුහු අපට අතට අත දී සුභ පැතූ හ. ඒ සිනිඳු අත්

For E - Pusthakalaya

පාට රෙද්දා එයි ද මඩුවට පුරා පැමිනු. විශාඛාවන් සහස් කළ පාලුකට මා වාඩි වූයේ තරමක වකිතයකිනි. ගැහැණු මෙයින් සමහ සිටිමි ගා සහා කරමින් උඩුර විසුරු සිරිමට මට හුරුවක් නැත.

මේ පාර මිලට දෙක අනම උස්සන්න පුළුවන්. අලුත් මෙම්බර් කෙනෙක් ඉන්නවනේ?

යුවතියක් කීවේ මට ය. මට ලැජ්ජාවෙන් මුහුණ රතු කර ගත්තෙමි. සුදෝ සුදු රළි ලවුම් පොඩි දවටගෙන සිටිලිලියක් මෙන් සිටිමිම ගානා මේ විශාඛාවෝ කෙ තරම් සුන්දර ද?

සිය කෙහෙළම්ල් නවත්තල සිංදුවක් අහමු. මොකද කියන්නේ?

විවාද කණ්ඩායමේ නායිකාව කීවා ය. 'රාසිට. ගංගාගෙන් සිංදුවක්.

දිගු කෙස් කළඹක් ඇති, වැඩි කතාබහක් නැති යුවතියක් නැගි සිටියා ය. ඒ පිරිසේ සිටි සුන්දර ම යුවතිය ඇය බව ද ඇත්තකි. විශාඛාවන් කාල තවදී පුද්ගලාකාර සංයමයකින් සියල්ලෝ ම නිහඬ වූ හ. මම ඇසිපිය නොහෙළා බලා සිටියෙමි. ඇ 'අභිමාන්' චිත්‍රපටයේ එන හිංදි ගීතයක් මධුරව ගායනා කළා ය. මම එකී ගීතයට සම වැදීම කෙ තරම් ලස්සන ද? සුන්දර කටහඬක් උරුම වූ මෙ තරම් ලස්සන යුවතියෝ මේ රටේ සිටිත් ද? සිහින් සංගීත භාණ්ඩයක් මෙන් ලලිතව ගයන ඇගේ මුව සිප ගන්නට කිසිවකු වෙහෙසුණ ත් එය පුදුමයක් නොවේ. ගංගා... ඇගේ නම මම සිහි කළෙමි. ඇගේ සම්පූර්ණ නම මා දැන ගත්තේ පසුව ය.

චාපා ගංගාදරී අබේනායක

මා චාපා දෙස බලා සිටියා වැඩි දැයි මං ... ණේ 'නිරංග ... ඉඟි කිරීමෙනි.

මොකද? කෙල්ලට වත වැටුණද?

ඔහු මගේ කණට කර කීවේ සෙමිනි. නිරංග ශිෂ්‍යත්වයක් ලැබ තරිස්වනයට පිවිසි විද්‍යා සංකායේ සිසුවෙකි. ඔහු විවාද කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කළ අතර පසු ගිය දින කීපයේ දී වඩ වඩාත් මටෙත සමීප වී ය. නිරංග ගාල්ලේ. උණවටුනේ කෙනෙකි.



විවාදය අවසන් වී සංග්‍රහය අනති විඳි අපි සුවිසල් විශාඛාවේ ගේට්ටුවෙන් එළියට පිවිසිමු. හයිලෙවල් පාර පැත්තට කීප දෙනෙකු ගමන් කළ අතර, මම ගාලු පාර පැත්තට වසිර පාර දිගේ ගමන් කළෙමි. චාපා අපට පසු පසින් එනු පෙනේ. ඕ බිම බලා නෙත කාලයකට ගමන් කරන්නී ය. නිරංග සමඟ මම කතාවට වැටුණෙමි.

ගාලු පාරේ අනිත් පැත්තට පැන්න නිරංග මට අත වනා බසයක නැග්ගේ ය. මම ගල්කිස්ස පැත්තට යන බසයක් එන තෙක් නැවතුමේ සිටි වීමි. හංස ගමනින් පැමිණි චාපා ද නැවතුම අසල සිටිනු දුටු මම මොකක් දෝ නුහුරු බවකින් පෙළෙන්නට වීමි. විවාදයේ දී මුවරි ලෙස දෙඩමලු වූ මා ලැජ්ජා වී සිටීම නිසා දෝ චාපා දෙතුන් විටක් ම දෙස බලා බිම බලා ගන්නී ය. ඇ දෙස මා බලනවා වැඩි යැයි මට සිතිණ. මම රත්මලාන බලා යන බසයකට අත දැමීමි. නවත්වන්නට මෙන් පැමිණි බසය නැවතුම ළඟ දී ගසා ගෙන යන්නට ගියේ ය. මම චාපා දෙස බලා ලැජ්ජා සහගත සිනාවක් හෙළීමි. ඕ මට සමීප වූවා ය.

'බස් එක නැවැත්තුවෙ නෑ නේද?'

'සෙනඟ නිසා වෙන්න ඇති'

මම කීමි.

'ඔයා කොහාටද යන්නේ?'

'ගල්කිස්සට'

මා උත්තර දුන්නේ බිම බලා ගෙන ය.

'ආ.... එහෙනම් අපිත් එක්කම යන්න පුළුවන්..

ඇ එසේ කීව ත්, මට එහි අගක් මුලක් තේරුණේ නැත. ඇ අපි යනුවෙන් හැඳින් වූයේ කවු ද? මම බස් නැවතුමේ එක් කොණකට වී සිටියෙමි. මොහොතකින් සුවිශාල 'කැලිෆෝනියා' වර්ගයේ රථයක් විත් අප අසල නැවතිණ. රියැදුරු අසුනේ සිටියේ අවි කන්නාඩි පැළඳි තරුණයෙකි. චාපා ගොස් විදුරුව පහත් කොට ඔහු සමඟ ඉංග්‍රීසියෙන් කතා කළා ය. මම අහක බලා ගතිමි. ඔහු පසු පස දොර හැරියේ ය.

For E - Pusthakalaya

එන්න...

එසේ කීවේ වාපා ය. මට නුපුරුදු කුලැටි බවක් දැනුණ ත් මම අදිමදි කොට කාරයට නැග ගතිමි. විදුලි වේගයෙන් ගමන් කරන රථය තුළ දැනෙන සැප පහසුව විඳ ගැනීමට මම අසමත් වීමි. කැසට් රේඩියෝවේ ඉංග්‍රීසි වේග රිද්ම ගීතයට තරුණියා කාල තැබුවේ ය. වාපා සමග ඔහු සිනහ වෙමින් කතා කරමින් ගමන් කරනු සිටි මම වීදුරුවෙන් ඉවත බලා ගෙන යන්නට වෙර දැරීමි.

ආ..... මෙන්න...

ඒ හඬින් මම පිබිදීමි. වාපා පිටුපස බලා 'ඇපල් ගෙඩියක්' ම වෙතට දිගු කළා ය. මම එය අතට ගතිමි. ඔවුනු සද්ද නගමින් ඇපල් කන්නට වූ හ.

'මෙයා මවුනට් ලැවිනියා ඩ්‍රොප් කරන්න.

වාපා තරුණියාට කීවේ 'ඕඩියන්' සිනමා හල පසු වෙද්දී ය. ගල්කිස්සේ දී මම බැස ගතිමි. ඒ සමග ම කාරය ඉදිරියට ඇදිණ. වාපා අත වනා ආචාර කළා දැයි මම නොදනිමි. බොහෝ නොසන්සුන් සිතිවිලි ඇතිව මම බෝඩිමට ගියෙමි. කො තරම් සැප පහසු ජීවිත ඔවුන් ගත කරනවා ඇද්ද?

සවස් වරුව ම මම මහත් පීඩාවකින් ගත කළෙමි. පොතක් පතක් කියවීමට ද සිත් නොදේ. අම්මා ත් අප්පච්චී ත් මගේ සිත් කුහරයේ වද දෙමින් දුක් දෙති. මම මහගමසේකරගේ 'ප්‍රබුද්ධ' කවි පොත කියවන්නට වීමි. පාසැල් අධ්‍යාපනය පිළිබඳ මහත් බියක් මට දැනෙන්නට වී ය.

උසස් පෙළ විද්‍යා විෂයන් ඉගෙනීම මෙ තරම් අපහසු දෙයක් ලෙස මම නොසිතිමි.



# 5

මොහොතක් කල්පයක් මෙන් ගෙවූ කාල හෝරාව පියඹයි. ජීවිතයේ වැඩි යම් වෙනසක් සිදු නොවී ජීවිතය ද කාලයට සමාන්තරව වේගය සොයයි. පෞද්ගලිකව මා ජීවිතයෙන් වැඩි යමක් බලාපොරොත්තු නොවුණ ද මව්පියන් වැඩි යමක් බලාපොරොත්තුවෙන් සිටින වග මට පසක් වී තිබිණ. මම නගර ශාලාව ආසන්නයේ 'ස්ටැෆඩ්' ආයතනයට පෞද්ගලිකව ඉගෙනීම සඳහා ඇතුළු වූයේ විෂයීය කටයුතුවල තිබූ දුර්වලකම නිසා ම ය. තර්ස්ටනයට ත් වඩා ම'සිත මේ ටියුෂන් පංතිය කෙරේ තදින් බැඳිණ.

සෙනසුරාද, ඉරිද දිනවල මහජන පුස්තකාලයට ගොස් දවස ම ගත කිරීමට තරම් ම' සිත වද දුන්නේ විභාගය පිළිබඳව තිබූ අනියත බිය යි.

මේ කාලයේ සිදු වූ දෛවෝපගත සිදුවීම මගේ අනාගතය තීරණය කරනැ යි මම නොසිතිමි.

මම නිරංග සමග සමීපයේ වාඩි වී සිටියෙමි. පුස්තකාල ශාලාව පුරා ම පරණ පොත්පත්වල නැවුම් සුවඳ දැවටේ. අපි දෙදෙනා පැය භාගයක් පමණ එක දිගට පොත් දෙකක් ගෙන කියවන්නට වීමු. අපි ඉදිරියේ යුවතියෝ කිහිප දෙනෙක් ද පත්තර බලමින් සිටියෝ ය. 'භෞතික රසායනය' පොතක් ගෙන කියවා ගෙන ගිය ත් මට කිසිවක් තේරුම් ගත නොහැකි වී ය. මම කරුණාසේන ජයලත්ගේ 'ගොළු හදවත' එක හුස්මට කියවන්නට වීමි. මම පුස්තකාලයේ පොත් රාක්කය දෙස බලා සුසුමක් ද හෙළිමි. අම්මා ත්, අප්පච්චී ත් ම'වෙතින්

For E - Pusthakalaya

සිල්පාචාර්යෙකු වන්නේ මේ මහා දැනුම් සම්භාරය ද? නැතහොත් ආභාසයේ වෛද්‍යවරයෙකු වී නම්බුවක්, ආර්ථික වාසියක් පමුණුව ලෙහා කර ගැනීමට ද? මම පොත වසා දමා ඒ මත හිස තබා ගතිමි. ගොනිය රසායනය පොත නිරංග ම'වෙතට තල්ලු කළේ ය.

'කළුත් මෝඩයෙක් වෙන්නැතුව මේක කියවපං.'

'මගේ ඔළුව රිදෙනව.'

මම හිස නොඔසවා ම කීවෙමි. මගේ මනස බොහෝ සේ පීඩාවට පත් වී ඇත. හියා ගත නොහැකි වේදනාවක්, දුකක් වැනි හැඟීමක් සඳ පහළ කෙරෙයි. විශ්වයත් පංතිවලට අවශ්‍ය මුදල් ගෙදරින් ඉල්ලා ගැනීමට ද සිත් නොදේ. අප ඉදිරියේ සිටි යුවතියන් මුහුණු පසෙක ද නැඹී සිටින බව මගේ කණ වැකුණි. නොදැනුවත්ව ම මම හිස එසවීමි. එය හිතා මතා කළ දෙයක් නොවේ.

'ඇයි වාපා නේද?'

නිරංග මගේ කණට කෙඳිරුවේ ය. මම ඔවුන් පිටුපසා යන විද්මය දෑස් අලුට එකතු කළෙමි. ඇගේ දිගු වරලස, ලතාවට ගමන් කරන ගමන, මට විශාඛාවේ හමුවීම සිහි කළේ ය.

'කතා කරමුද?'

'මොකටද?'

මා නිරංගට පිළිතුරු දුන්නේ නොසැලකිල්ලෙනි.

'යන්නම් හියද දන්නෙ නෑ.'

'ඉතිං අපට මොකද?'

'නැතිමට යන්න ඇත්තේ. වරෙන් යන්න.'

'සිස්සු නැතුව හිටපං.'

'අපි යන්නෙ ප්ලේන්ටී බොන්න. උඹ වරෙංකෝ.'

ඔහුගේ වද කිරීමට මම පසු පස වැටී කැන්ටිමට ගියෙමි. පෙළවත් මේසයක වාඩි වූ මම හාත්පස බැලීමි. තැන තැන අපේ



වයසේ පෙම්වත්තු දෙවළු වී සිටිති. සමහරෙක් එක එල්ලේ ඔවුනොවුන් දෙස නෙත් නොහොල්ලා බලා සිටිති. මම දෑස එක තැන රඳවා ගැනීමට තැත් කළෙමි. !පැන්වා බෝතලයක් ළඟ තබා ගෙන දෑස මදෙසට යොමු කොට සිටින 'වාපා' දෙස නොබලා සිටීමට මට නොහැකි වී ය. ඕ මා හඳුනා ගත්තා ය. මම යන්තම් සිනාවක් ආරූඪ කර ගතිමි. මන්දස්මිතයක් හෙළූ වාපා පසුව මුව පුරා සිනාසුණා ය.

'මෙන්න ප්ලේන්ටිය. උඹ සිගරට් බොනවද?'

නිරංග මා අසලට ම පැමිණ ඇත. මම ඔහුට අවනත වීමි.

'මට සෝබනේ දල උඹ කෙල්ලට හිනා වුණා නේද?'

'ඒකි බං ඉස්සෙල්ල හිනා වුණේ.'

වරදක් කළ එකෙකු මෙන් මම ඔහුට බැගෑපත් වීමි. අප තේ බී ඉවර වන්නට ත් පෙර වාපා යෙහෙළිය සමඟ ඒ තැනින් ඉවත් වූවා ය.

'මම බෝඩිමට යනව.'

හිතේ නෙහෙට්ටුව නොපෙන්වා මම නිරංගට කීවෙමි. නිකම් ම කාලය කා දැමීම පාපයකි.

'උඹ කෙල්ල දැකල මූඩ් ගැහුවද?'

'නිකං දොඩවන්න එපා නිරංග. වැදගත් දෙයක් කතා කරපං.'

අපි දෙදෙනා ම නැවතත් පුස්තකාල ශාලාවට එන තෙක් වාද කරමින් පැමිණියෙමු.

මම නැවතත් 'ගොළු හදවත' ට නෙත් යොමු කරනවා වෙනුවට අගක් මුලක් නැති විද්‍යා විෂයයකට නෙත් රඳවා ගෙන සිටියෙමි. එහෙත් මා නොදැනුවත්ව ම මගේ නෙත් ඉදිරි පෙළේ යුවතිය වෙත රැඳෙයි. ඕ 'වාපා' යි. වාපා යමක් ලියමින් ඒ වෙත නෙත් රඳවා ගෙන සිටියි. ඇගේ රෝස පැහැති ඇඟිලි කුඩු ලතාවකට එහෙ මෙහෙ සැරි සරනවා මම බලා උනිමි. ළමැද මැදට ගලා හැළුණු දිගු වරලසෑ ඇගේ මුහුණ ආසන්නයේ සිහිල් සුළං පොදකට කියුඹු ලතාවක් සෙළවේ.

For E - Pusthakalaya

ගොසින් මොහොතක ඈ මා දෙස බැලුවා ය. ඈ මුදු සිනැත්තියක... ඔබ පුපිණ. ඇගේ බැල්ම හා ඔගේ නෙත ගැටුණෙන් මම නැති ... නිමි. අපි දෙදෙනා ම එකවර බිම බලා ගතිමු.

'නිරංග ගෙදර යමු.'

'පිස්සු නැතුව හිටපං කසුන්.'

'මගේ ඔළුව රිදෙනවා.'

'ඇයි හිත රිදෙන්නේ නැද්ද?' මම බලාගෙන හිටියෙ කෙල්ල උඹ දිහා බලනවා.'

මම නැවතත් හිස පොත මත රඳවා ගෙන කල්පනා කළෙමි. ... පැය ... නිපයක් මා එසේ සිටින්නට ඇත. මට ජී. බී. සේනානායකගේ ... නව පෙළක් මතක් වී ය.

..... දැක බිම ඔබා

පස්සට වාරු වී

නිසලව හුන්

ඇගේ ලිහිල්

කෙස් රොදක්

නිහඬව හමන

සුළඟින්

එහා වී

මා මුහුණෙහි

හැපෙත් ම.....

දහවල් හළකට පමණ අපි දෙදෙනා පුස්තකාලයෙන් බැහැර වීමට සිතා නියමිත පොත් කවුන්ටරයට භාර දුන්නෙමු. කවුන්ටරය එක පැත්තේ වාපාගේ යෙහෙළිය අපට කතා කළා ය.

'ඔයා තර්ස්ටන් විද්‍යාලයේ වීම එකේ නේද?'



'ඔව්'

'අපිට මතකයි එද අපේ ඉස්කෝලෙට ආව.'

'ඔයත් විශාඛා එකේද?'

එසේ ඇසුවේ නිරංග ය.

'මේක වාපා දෙන්න කිව්ව.'

ඕ හතරට නැමූ කොළ කැබැල්ලක් මගේ අතට ම දී කඩිනමින් එ තැනින් ඉවත් වූවා ය. අපි දෙදෙනා ම එකී කොළ කැබැල්ල දිග හැර කියවන්නට වීමු.

ඇයි ඔයා ඔච්චර අහිංසක? ඔළුව රිදෙනවා නම් පොත් බලන්න හොඳ නෑ. සිගරට් බිව්වම ඔළුව රිදෙනෙක වැඩි වෙනවා. එද කාරෙකේ දී දුන්න 'ඇපල්' ගෙඩිය රහද? අපි ලබන ඉරිදත් පුස්තකාලෙට එනවා. මට ආසයි කසුන් එක්ක කතා කරන්න. තරහක් නැත්නම් එදාට මගෙත් එක්ක කතා කරන්න.

වාපා ගංගාදරී

වරක් දුටු පමණින් මා ගැන ප්‍රේමයක් හට ගැනීමට තරම් 'වාපා' පෙළඹී දැයි සිතීමට මම වෙර දැරීමි. එක් පොහොසත්කම්වලින් කිසිදු අඩු පාඩුවක් නැති ඇගේ ජීවිතය මේ තරම් ඉක්මනින් මා වැනි පාසැල් සිසුවකු වෙත බැඳීමට පුළුවන්කමක් නැත. මම 'නිරංග' සමඟ මේ පිළිබඳ බොහෝ දේ කතා කළෙමි.

'ඒකි උඹට විහිළුවක් කරලා උඹ නිතරම බලපු නිසා ගොනාට අන්දන්න.'

'මං හිතන්නෑ.'

'උඹ හිතන්නේ උඹට ලව් කියලද? මෝඩයා.... මේක කොළඹ. උන් ඉගෙන ගන්නේ ජොලියට. උදේට ඉස්කෝලේ. හවස ටියුෂන්. ඉරිදට ලයිබ්‍රරි. රෑට ක්ලබ් ඩාන්ස්. වැකේෂන් එකට පාටි.'

'ඉති මට ලියුමක් දුන්නේ?'

... ... ... ලොකටත් යාළුවොත් එක්ක කිය

For E - Pusthakalaya

නිසා ගියාවෙනවා ඇති. පිස්සා හොයි හිටපං..... ළඹ සෙවලයා මගේ මට කලා හිටපු නිසා ඒකී තුණ්ඩුවක් එවලා...

ඒකු නොකී හඬ ඇසෙන්නට වී ය. එහෙත් චාපාගේ ලිපුලෙසු ලියාව සිංහල සිරියාව මතක් වන විට නිරංගයේ සිසිවිල්ල බැහැර සිරිට සිත් ඒ යනා ම ඇ සමඟ සාගරයේ ගමන් කළ තරුණයා මෙන්, මා ජේජාන්විත පුරුෂයකු මෙන් නැගී සිටි. ගෙදර පුන් ත්, මගේ අධ්‍යාපන අරමුණු ත් අතර නිතර ම චාපාගේ වචනුරු අත් ලෙපු සහිත පොල් කැබැල්ල මහත් වදයක් වී මසියන් සැරි සරයි මට ම නොතේරෙන මොකක් දෝ බරක් වැනි හැඟීමක් 'චාපා' ඉපින සිතට ඇසුර කොට ඇත. සසර පුරාවට දැක පුරුදු කලා පාලෙන් පසිපට සිටි, මගේ ම. මා පතු කෙනෙකු වැනි හැඟීමක් නිතර ම සිත ඇල හදියමින් පවතී. එහෙත් ඉකුත් සතියේ හැකි තරම් මම ඇය පිළිබඳ නොසිතා සිටීමට වෙර දැරීමි. සත්තකින් ම එය සිතට කොරා කළ නිරර්ථක උත්සාහයක් වී ය.

ඊයේ මම පුස්තකාලයට ගියේ සතියේ අත පසු වූ වැඩ කොටස් සම්පූර්ණ කිරීමේ අදහසිනි. චාපා දැකීමේ ආශාවක් සිත යට නොතිබුණා ම නොවේ. කියවීමේ ශාලාවට යන්නට මත්තෙන් මම නැවතීමට ගොස් සිගරට්ටුවක් පත්තු කොට ගෙන විහාර මහා දේවි උද්‍යානය දෙසට නෙත් හෙලා සිටියෙමි. කැන්ටිමේ තිබුණු නොසන්සුන් බව සහර නිසංසල වන තෙක් මා එසේ සිටින්නට ඇත. කොළඹ පැමිණ ගණ්ඨනයට ඇතුළ වීමේ අරමුණ ත් අම්මා අප්පච්චි පිළිබඳ කුළිම ත් මිනා දේවතාවකු මෙන් සිතේ ඉපුරු පැනිම නිසා මම කාලයකින් කැරුණේ කියවීමේ ශාලාවට යැමේ අරමුණිනි.

චාපා ඉුළපලා අසුනක වාඩි වී මදෙස බලා සිටියා ය. මම මහත් ලැජ්ජාවකින් ඇගෙන් මිදී ඉවතට යන්න වීමි. එහෙත් ඕ අභිසෙස ඇස සිනාසුණා ය. මම කිසිවක් කතා නොකොට ඉදිරියට අඩියක් තැබුවෙමි. ඇගේ දෙනුවන විකසිත වී තිබී. මැලවී යන්නට ඇතැයි මට සිතේ. සිටි ඒ අපහසුතාවකට ඇය පත් වී සිටින්නී නම් මා කුමක් කළ යුතු ද? නිරාශ කිරිපස් මෙන් පිස්සකු හෝ මෝඩයෙකු මෙන් මා හැසිරිය යුතු නැත.



කියවීම් ශාලාව දෙසට හැරුණු මම ඇය පසු පස එතැ යි යන බියෙන් අඩිය ඉක්මන් කළෙමි. භයානක හතුරෙකු හඹා යන කාලෙක මෙන් මම එහා හුන්මට ඇවිද ගොස් කෙළවර අසුනක හිඳ ගතිමි. දැඩි අපහසුතාවයකින් සිත එකලස් කොට පොතක් පෙරලා ඒ මත නෙත් ඉන්දවා ගත්තෙමි. අමුතු උද්දමයක් හෝ ප්‍රබෝධයක් මා ඇඟ නොවී ය. එක දිගට මම පොත කියවන්නට වීමි. පොතේ පිටුවක් පෙරළන අතරතුර මා හාත්පස විමසිලිමත්ව බැලූයේ අරමුණකින් තොරව ය. මා ඉදිරිපස අසුනේ සිටි යුවතිය හිස මේසයට ඔබා ගෙන දෑත මත හිස තබා ගෙන සිටින්නී ය. ඇගේ දිගු වරලස ලතාවකට පිට දිගේ තනි කරලකට බේරී ඇත. මා ඉදිරිපස මේ සිටින්නේ චාපා බව මෙනෙහි වීමෙන් මම කලබල වූවෙමි. සත්තකින් ම මම කලබල වූවෙමි. මා පසුපස හඹා එන මේ යුවතිය කව් ද?

ඇය දැකීමට ත්, ඇ සමඟ කතා කිරීමට ත් මා තුළ ආශාවක් නැතුවා නොවේ. එහෙත් මම බෙහෙවින් තැති ගෙන සිටියෙමි. ඒ කුමක් අරභයා ඇති වූවක් දැයි මම අදත් වටහා ගත නොහැකිව සිටිමි. චාපා සෑණයකින් හිස ඔසවත් ම මම දැස් විදහා මවිත වූ දෑසින් ඇය දෙස බැලීමි. කීකරු දෙනයන ඈ බිමට බර කර ගත්තී ය. එහෙත් මම දිගට ම බලා සිටියෙමි. නැවත හිස එසවූ ඈ නැගිටින්නට පෙර මම සිනාසීමි. 'චාපා' සිනාසුණේ නැත.

දවල් දෙළහට පමණ පුස්තකාල කොරිඩෝරය දිගේ පිය මනින අතර ශ්‍රවණාගාරය පැත්තේ සිට ඉදිරියට එන 'චාපා' මඟ හැර යා නොහැකි නිසා ම මම පැත්තකට වූවෙමි.

එහා පැත්තේ කුළුණ අසළ ඇය ද නැවතුණා ය. අපි දෙදෙනා ම ටික වේලාවක් කුළුණුවලට මුවා වී සිටියෙමු. පරිසරය නිසොල්මනේ තිබිණ.

'කසුන්ට හිතෙනවද මම මහ නරක කෙල්ලෙක් කියලා?

හිටි ගමන් චාපා හඬ අවදි කළාය. ඕ දකුණතේ ඇඟිලි තුඩුවලින් කුළුණ කුරුටු ගාමින් සිටියා ය.

'නෑ'

මට ලස්සන දැනිනී.

ඇත්තට මම කියන දේ විශ්වාස කරන්න පුළුවන්ද?

'මොනවද?'

'හැමදාම උදේට මේ පැත්තෙ ගල්කිස්සෙ හංදියේදි දකිනවා. ඔයා බස් එක එනකල් බලාගෙන ඉන්නවා.'

'ඔව් ඉතිං?'

'ඇයි මෙච්චර අහිංසක?'

'මමද?'

'ඔව්'

මම නිරුත්තර වීමි. මා දන්නා තරමින් මගේ සුවිශේෂ අහිංසක කමක් නැත. 'චාපා' අර අදින්නේ කුමකට දැයි මම තේරුම් නොගත්තෙමි. එහෙත් ඒ වෙලේ ත් මා සිතුවේ මා දැක ඇති අහිංසක ම යුවතිය ඇය බව යි. මම ඒ බවත් ඇයට නොකීවෙමි.

'ඔයා පාඩම් කර කර නේද හිටියෙ? මම හින්ද පාඩු වෙනව නේද? මම යන්නද?'

චාපා හිටි ගමන් ඇසුවා ය. යන්න හෝ ඉන්න කියන්න හැකියාවක් මට තිබුණේ නැත. එහෙ මෙහෙ කොරිඩෝරය දිගේ ඇවිදින කොල්ලෝ දෙතුන් අප දෙස බලතැ යි මම ලැජ්ජා වූයෙමි.

'මොකටද ඉතිං පුස්තකාලෙදි හමුවෙන්න කිව්වෙ?'

ඇය තේරුම් ගැනීමේ අදහසින් මම ඇසුවෙමි.

'කතා කරන්න'

'මොනවද?'

'නොවැදගත් දේවල් දැන් කියන්න බෑ. මම ඔයාට වෙන දවසක කියන්නම්. තුමයි යාළුවන්ට කියන්නෙ නෑ කියල පොරොන්දු වෙන්න ඕන. ඇත්තට පුළුවන්ද මං කියන දේවල් අහගෙන ඉන්න?'



ඈ බැගෑපත් ලෙස කිවා ය. පෙම්වතියක් පෙම්වතෙකු වෙනට මුමුණනවා වැනි හැඟීමක් ඇගේ මුහුණේ පිළිබිඹු වි ය. එක්කෝ ඈ මානසික රෝගයකින් හෝ පිළිකා වැනි රෝගයකින් හෝ වෙන යම් කරදරයකින් පීඩා විඳින තැනැත්තියක් විය යුතු ය. අර කාරයේ ගිය තරුණයා මෙයට සම්බන්ධ දැයි ඇසීමට මට සිත් වි ය.

'එදා අර ඔයාව කාරෙකේ දාගෙන ගියේ කව්ද?'

මඳක් පැකිලෙමින් මම ප්‍රශ්න කළෙමි.

'රොහාන්. නැන්දගේ පුතා.'

චත් පොහොසත්කම්වලින් පුපිරි සුඛෝපභෝගී ජීවිතයක් ගෙවන චාපා සුළු දෙයකට සිත රිදවා ගෙන ඇතැ යි මම අනුමාන කළෙමි. මම මහත් නොසන්සුන්කමකින් පෙළෙන්නට වීමි.

'මට චාපා කියන දේවල් විශ්වාස කරන්න පුළුවන්. ඒ වුණාට මම දන්නේ නෑ මොකක්ද ප්‍රශ්නේ' කියලා. අනික සල්ලි ප්‍රශ්නයක් වෙන්නත් බෑ කියලා මට හිතෙනවා. හැමෝගෙම ජීවිතේ දුකයි. ඔයාට තියෙනවා වගේ ප්‍රශ්න හැමෝටම තියෙන්න පුළුවන්. මම දන්නේ නෑ මටම මේක කියන්න හදන්නේ ඇයි කියලා. මම මෙහෙ කෙනෙකුත් නෙමෙයි. මාස තුනක් විතර ඇති තර්ස්ටන් එකට ඇවිල්ලා'

මම කියා ගෙන යන අතර ඇගේ මුහුණ බැලීමි.

ඕ දෑතින් මුහුණ වසා ගෙන ඉකි බිඳ හඬන්නට වූවා ය.

ගැහැණියකගේ නෙතින් කඳුලක් වැටෙන්නේ නිකම් ම නොවේ. එක්කෝ තමන් පිළිබඳ දුකට ය. නැත්නම් අනුන් පිළිබඳ දුකට ය. චාපා හැඬුවේ ඇයි දැයි මම නොදත්තෙමි. ප්‍රේමයක දී වැනි හැඟීමක දී හැර මේ වේලේ ඇය හැඬුවේ ඇයි? කිසිවෙකු අප දුටුවා දැයි මම විමසිලිමත් වීමි. ඉදිරිපස පාරේ ඒ මේ අතට ඇදෙන වාහන හැර කිසිවෙකු ළඟ පාතක නැත. යතුරු පැදියක් උඩ දමමින් එන තරුණයකු දැක මම දෑස යොමු කළෙමි. ඔහු රොහාන් ය.

'චාපා.....'

එසේ කියත් ම ඕ කඳුළු පිස ද පෙර මග බැලුවා ය.

For E - Pusthakalaya

'ශායා.... මොකද?'

ඔහු ඇගේ අතින් අල්ලා තමා සමීපයට ගනිමින් ඇසුවේ ය. ඇ සිනහව යමක් සෙදිරුවා ය. මම ගල්ගැසී වී බලා සිටියෙමි. ඔහු එක එල්ලේ මදෙස බලා වමතින් වාපාගේ දෑස පිස දැමුවේ ය. කම්මුල දිගේ පුරා පහළට ගෙන ගියේ ය.

වාපා කඳුළු පිස ගනිමින් ඔහු පසු පස ඇදෙනු දකින මසිත 'ෂොප්' ගා දැවෙන්නට විය. ඇය වැහැ ගෙන යාමට මනමාල මංගයකු පැමිණ ඇතැ යි මට සිතේ. වාපා හයිලෙවල් පාර පැත්තට ගමන් කළා ය. බාලදක්ෂිකා ශාලාව ඉදිරිපිට ඔහුගේ කැලිෆෝනියා රථය මැදුන් එක සෙක් මග බලමින් සිටී. අතපය විසි කරමින් දඹරගිල්ල උස් කරමින් ඔහු පෙරමුල වී ය. වාපා මුවැත්තියක මෙන් ඔහු පසු පස ගොස් කාරය අසල නතර වූවා ය. කුරුණ එහා ඉසව්වට ගිය මම ඇඹිලි නුදින් ඉස්සී එ දෙස බලා සිටියෙමි.

ඔහු රියැදුරු අසුනට නැග ශබ්ද නගා දොර වැසුවේ ය. වම් පැත්තට නැඹුරු වූ ඔහු අනෙක් දොරේ හැඩලයට අත තබා විවර කළේ ය. වාපා බිම බලා ගෙන සිටියා විනා කාරයට ගොඩ වූයේ නැත. ඔහු මොනවා දෝ කියනවා මට පෙනේ. ඇ කඳුළක් පිසින ඡායාව ද මම දුටිමි. මා නොදන්නා මොකක් දෝ භයානක කරදරයක් වාපාට ඇතැ යි මම තව දුරටත් අනුමාන කළෙමි. ඇගේ මුහුණේ පිහිටන හැඟීම වටහා ගැනීමට මට අවැසි වුව ත් කිසිවක් පැහැදිලිව නොපෙනේ. කාර් එහා මෙහා දුවන වාහනවලට මුවා වී විටෙක ඇතුළ මට නොපෙනී යයි.

කෝපයකින් ඔහු දොර නැවත විවර කරමින් බිමට බැස්සේ ය. වාපා සමීපයට ගොස් 'වටාස්' 'වටාස්' ගා කම්මුලට දෙකක් ගසා ඔහු නැවත් කාරයට නැග්ගේ ය. දූවිලි නංවා 'ක්‍රාස්ස්' යන ශබ්දයෙන් කාරය වේගවත් කොට කොල්ලුපිටිය පැත්තට ඉගිළුණි. වාපා එ තැන ම සිට ගෙන සිටියා ය.

මේ කිසිත් නොසිතූ අලුත් සිදුවීමකින් මම හිරි වැටී ගියෙමි.

කාර් දුවන වාහනයකට පැන ඕ සිය දිවි නසා ගනිතැ යි මට සිතිණි. අඩියට දෙකට මම වාපා ඉන්න දිශාවට ගමන් කළෙමි.



ඒ වන විට ත් ඕ පාරෙන් මේ පැත්තට පැන බස් නැවතුමට හේත්තු වී සිටියා ය. ඇගේ තිල්පාට දෑසේ කෙලවර රතුපාට මතු වී දිලිසෙමින් තිබේ. මා තුළ අනුකම්පාවක් ද ලියලමින් පවතී. පැය භාගයකට වඩා අප එ තැන ම සිටින්නට ඇත. වාපාට කම්මුලට ගැසූ පුද්ගලයා නැවත පැමිණ මට ත් පහර දී ඇ පැහැර ගෙන යතැ යි මම බිය වීමි. ඇගේ කම්මුල රතුපාට වී ඇත.

'කසුන් ඔයා මෙතන ඉන්න එපා. ඇතුළට යන්න. මම ඊළඟ බස් එකේ ගෙදර යනවා.'

පියවි බවට සමීප හඬකින් වාපා කීවේ බිම බලා ගෙන ම ය.

'වාපාට ප්‍රශ්නයක් තියෙනවා නම් කියන්න. මම අහගෙන ඉන්නම්.'

යම් කිසි පැහැදීමක් මා කෙරේ ඇගේ ඇති බව වටහා ගෙන සිටි මම ඇයට හවුල් වීමට සිතා පිළිවිසීමි. දින දෙක තුනක් දුටු පමණින් මොකක් දෝ කියා ගත නොහැකි යමක් කීමට තතනන බව මට වැටහී තිබිණි.

'ඔයයි මමයි මෙතන ඉන්නව රොහාන් දැක්කොත් හොඳ නෑ. ආයෙම එන්නත් පුළුවන්.'

කිසි සේත් මට අදාළ නොවූ ප්‍රශ්නයක මා මැදි වී ඇතැ යි එ වේලේ ම මට සිතිණ. එහෙත් ඒ කුමක් දැයි දැන ගැනීමේ මහත් ආශාවක් කුහුලක් උපන් නිසා ම මම කතා කළෙමි.

'ඔයා කියන්න හදන දෙයක් අද කියන්න. මටත් හිතෙනව වාපා මොනාක්දෝ ප්‍රශ්නයකට මැදි වෙලා ඉන්නව කියල. මට පුදුම ඔයදේ මටම කියන්න හදන්නේ ඇයි කියල. ඔයා මාව දැක්කෙත් දවස් දෙක තුනයි. කතාකළේ එක දවසයි.'

'ඒක පුදුමයක් නෙවෙයි.'

'එහෙනම් පුස්තකාලෙට යමුද?'

'නෑ රොහාන් එහෙට එන්න පුළුවන්. අපි පාර දිගේ ඇවිදිමු.'

එතැනට දකින අය වැඩි.

නමුත් නෑ. හරස් පාරක් දිගේ ඇවිදගෙන යමු. ඒක නිදහස්.'

මම එකඟ වුණෙමි. ඒ සමඟ ම කිසිදු පුස්තකාලයට නො ඒමටත්, වාපා මින් මතු හමු නොවීමට ත් මම එ වෙලේ ම තීරණය කර ගත්තෙමි. විශාල කරදරයකට මුහුණ පාන්නට වෙතැ යි මම බිය වීමි. ශ්‍රාවස්තිය පසු කරමින් කෞතුකාගාරය ළඟින් දකුණට හැරී යන අතර මැයි මල්ගස්වල සෙවණ අපට ලැබිණ. මල් වාරය අවසන්ව එක දෙක ඉතිරි වූ මල් පිළින වී ඉදහිට බිමට වැටේ. තරමක් ඈතින් අප දෙදෙනා ගමන් කළ අතර අපේ සිතුවිලි දෙදිසාවක තිබෙන්නට ඇත. ඇ කතා කරතැ යි සිතා මා දෙතුන් විටක් වාපාගේ මුහුණ බැලුව ත් වෙන ම කල්පනාවකින් යුතුව ඇය පිය ඔසවයි. පොඩි හොඳ අලුත් මැයි මලක් අහුලා ගෙන ඕ එක තැන නැවතුණා ය. තරමක් දුරින් මම ද නැවතුණෙමි. එහෙට මෙහෙට හරවා මැයි මල දෙස බලා සිට වාපා දෑස් විකසිත කොට මා වෙතට ඉගිළුණා ය.

'බලන්න කසුන් මේ මැයි මලේ ලස්සන...'

ඇගේ හැසිරීමෙන් හා කතාවෙන් මගේ සිත ආකූල ව්‍යාකූල වී ය. ඇය පිස්සියකැ යි සිතීමට මම නැවතත් උත්සාහ කළෙමි. මොහොතකට පෙර ඉකි බිඳිමින් හැඬූ ඕ මෙසේ හැසිරෙන්නේ ඇයි?

'ඇයි ඔයාට මේ මැයි මල ලස්සන නැද්ද?'

'ලස්සනයි. ඒ වුණාට ප්‍රශ්නෙ ඒක නෙමෙයිනේ. මට ඔයාව තේරෙන්නේ නෑ. දවසයි දෙකයි මාව දැක්කේ. මච්චර ලොකු ප්‍රශ්නයක් කියන්න තරම් ඔයාට මං ගැන තියෙන විශ්වාසේ මොකද්ද? මට ඔයාව තේරුම් ගන්න බෑ. අතීත සිහිම හිතවත්කමක් නැතුව මෙහෙම [illegible] ඇවිදින එක ඔයාට හොඳ මදි නේද?'

'මට ඔයාව විශ්වාසයි. මං කසුන්ව දන්නවා.'

'බොරු කියන්න එපා...'

ඒ වන විට අපි අනුමාත්‍ය කාර්යාලය පසු කොට ඇතුළෙ මල් පාර දිගේ පටු මාවතක ඇවිද යමින් සිටියෙමු.



'ලස්සන මැයි මලක් අකාලේ පරවෙලා යන එක පව් නේද?'

වාපා නැවතත් කීවා ය. ඒ ඇගේ මුහුණ පළමු වරට එක එල්ලේ බලා හඳුනා ගන්නට තැත් කළෙමි.

'ඔව්'

'රොහාන් මට හරියට වද දෙනවා කසුන්. මට හරී බය හිතෙනවා. මං මොකද කරන්නේ?'

මා කුමක් කරන්න ද? ඔහු හරියට ම ඇගේ කවු ද? මේ නොතේරුම් මුවැත්තියට වද දීමට තරම් කුරිරු මනසක් ඔහුට කොහෙන් ද? වාපා හඳුනන්නේ කෙසේ ද? මම කිසිදු උත්තරයක් නොදී ඇවිද ගියෙමි. සුවිශාල දෙමහල් නිවසක් අසළ වාපා නතර වූවා ය. බාලයකු මෙන් මම ද ඇය අසළ මුනිවතින් නතර වීමි.

'මේක තමයි කසුන් ඔයාලගේ ලොකු අප්පච්චිගේ ගෙදර.'

මම ඇස් උඩ ඉන්දවා ගෙන ඇය දෙස බැලීමි. සත්තකින් ම මේ මා ඉදිරිපිට සිටින්නේ කොළඹ රටේ මායම්කාරියක් ද?

'ඔයා කොහොමද දන්නේ?'

'එයාගේ දුව උත්තරා ඉන්නේ අපේ පංතියේ. එද ඔයා ඩිබේට් එකට ආපු දවසේ එයා කිව්වේ. කසුන්ලගේ පවුලේ විස්තරත් කිව්ව. ඔයාලගේ අප්පච්චිත් එක්ක තරහ බව. ඔයාව ආනන්දෙට දලා දෙන්න බැ කීව එක. ඔය සේරම මං දන්නවා. ඔයා ගමේ දී යොවුන් පහන් වැටට ලියපු කවි වගයකුත් එයාගේ පොතක් අස්සේ තිබුණා. උත්තරා ඇත්තටම ඔයාට හිතවක්. ලොකු අයගේ වැරදිවලට ඔයා පළි නෑ. නන්නාදුනන ඔයාව එද රොහාන්ගේ කාර් එකේ දගෙන මම ගියේ ඒ නිසා. මං විඳින දුක් මට මතකයි. ඒ හින්ද මට ඔයාගේ දුක තේරුම් ගන්න පුළුවන්.'

වාපා බිම බලා ගෙන කීවා ය. සත්තකින් ම මම දින කීපයක අතීත සිදුවීම් පෙළ ගසා බැලීමි. වාපා මා වෙත සමීපව සිටීමට සේතු පැහැදිලි ය.

'මට ඔයා ගැන අනුකම්පාවයි කසුන්...



පත්තල ප්‍රාදේශීය සභාවේ [illegible] පුස්තකාල
[illegible] 3
පරිග්‍රහණ අංකය 93
දිනය

For E - Pusthakalaya

For E - Pusthakalaya

මං අසරණයෙක් විදිහට හිතනවට මං කැමති නෑ.

ඒත් මං අසරණයි කසුන්

ඇයි ඕ සේරම කියන්න මාව තෝරගත්තෙ?

ඔයා කොළඹට ආවේ ලහදි. මට මගේ දේවල් කියන්න විශ්වාස කෙනෙක් නෑ. නගරෙ ඉන්න අය තරම් ඔයා නරක නැතුව ඇති කියල මට හිතෙනවා.

එතකොට ඔයාගෙ ප්‍රශ්න කියන්න කෙනෙක් නැති නිසා මට කියල පිහිටක් ලැබෙයිද?

මට මේව සේරම කාට හරි කියන්න ඕන. පංසලකට පල්ලියකට ගිහිල්ල දෙවියන්ට බුදුන්ට කියනව වගේ කියන්න ඕන.

එ කෙණෙහි ම අප අසල මන්දිරයේ සුවිශාල ගේට්ටුව විවර වී ය. පරණ මොරිස් මයිනර් රථයක් එයින් මාවතට පිවිසීමට මුහුණ රළියට දැම්මේ ය. එහි සිටියේ උත්තරා සෙනෙවිරත්න යි. රියැදුරු අසුනේ උපැස් යුවලක් පැළඳ සිටියේ අපේ අප්පච්චිගේ අයියා යි. මගේ ලොකු අප්පච්චි. ප්‍රොෆෙසර් සෙනෙවිරත්න බණ්ඩාර. චාපා ත් මම ත් මුහුණට මුහුණ බලා ගතිමු. ලෝකය ම නිසල වූවාක් මෙන් වී ය.

යාර කීපයක් ඉදිරියට ගිය රථය නැවතත් පසු පසට පදවා ගෙන ආ ඔහු වීදුරුව පහත් කොට උපැස් යුවළ යටින් ම' දෙස බැලුවේ ය.

උඹ මොකද මෙතන කරන්නෙ?

මොකුත් නෑ.

මා සැහැල්ලු ලෙස කීවෙමි. පසුව ඇතුළේ යමක් හිරවුණා වැනි හැඟීමක් මසිතට දැනිණ. ලොකු අප්පච්චි රළු ලෙස කතා කළේ ය.

කාලකණ්ණියෙක් වගේ රස්තියාදු නොගහ වැඩක් බලාගෙන හිටපං. උඹලෑ අප්පච්චි ලහදී ආවද?

නෑ. ඉස්කෝලෙට ඇතුල් කරන දවසෙ ආවට පස්සෙ ආවේ නෑ.



කොලෑ අප්පච්චිට මං කලින් කිව්ව උඹ නිකං කාලකණ්ණි නොකර ගමේ ඉස්කෝලෙම ඇරපං කියල. කවුද ඔය උඹත් එක්ක ඉන්න ගෑණු ළමය?

අඳුනන එක්කෙනෙක්...

හොඳයි මම උඹලෑ අප්පච්චිට මේක ලියල අරින්නම්.

ඔහු නැවත වරක් මා දෙස බලතැ යි සිතූ මුත් එසේ හැරුණේ නැත. උත්තරා කිසිවක් කර කියාගත නොහැකිව මෙන් බලා සිටියා ය.

චාපා, මහ වැරදි වැඩක් ඔයා කළේ.

මම මුහුණ රතු කර ගෙන කීවෙමි. ඇය නොහොබිනා වැඩක් කළා නොවේ ද? කිසි සේත් මා මේ ගමන දැන සිටියා නම් ඇයට එකඟ වන්නේ ද නැත. මම මහත් කලකිරීමකින් චාපා දෙස බැලිමි. ඇගේ මුහුණ රතු වී ය. අඳුරු වී ය. මම ඇගේ නෙත මග හැරීමට තැත් කළෙමි.

නිකමට මේ පැත්තට ආව විසක් මම හිතාමතා ඔයාව එක්ක ගෙන ආව ගමනක් නෙමෙයි කසුන්. සමාවෙන්න.

කිසිදු හැඟීමකින් තොර බැල්මක් ඈ වෙත හෙළූ මම මෙසේ කීවෙමි.

හොඳයි. වෙච්ච දේ වුණා. මට කියන්න මොකක්ද චාපට කියන්න තියෙන්නෙ?

ශුද්ධ වූ යමක්, ප්‍රේමණීය වූ යමක් ආත්මය තුළින් ගිලිහෙනවා වැනි හැඟීමක් ඇගේ මුහුණ අඳුරු කළේ ය. මම හොරැහින් ඇය දෙස බැලිමි. තොමේරූ ළදැරියක මෙන් ඇගේ මුහුණ සුන්දර ය. පවිත්‍ර ය. මසිතේ මහත් වූ ආශාවක් ඇය කෙරේ උපදින්නට වී ය. තරමක හෝ මවිතයක් පළ නොකළ චාපා හෙමි හෙමින් ඉදිරියට පිය නගන්නට වූවා ය. සුවිසල් මැදුරු හා මැයි ගස්වලින් හෙවණ ලද ඒ පටු මාවත දිගේ අපි දෙදෙනා ඇවිද ගියෙමු. රැස් කැදලි රූස්ස ගස්වලින් පෙරී මාවතට පිවිසේ. සත්තකින් ම මේ ගිනි ගහන මද්දහන කදිම සැන්දෑවක් බඳු ය.

For E - Pusthakalaya

කසුන්, මම කලින් මොනව කිව්වත් මං ඔයාව දන්නෙ නෑ නමයි. ඒ වුණාට මට පැහැදීමක් තියෙනව. ගොඩාක් කාලෙක ඉඳල ඔයාව දන්නව වගේ හිතෙනව. මගේ අම්මයි තාත්තයි දෙන්නම ලංකාවෙ නෑ. නයිජීරියාවෙ ඉන්නෙ. මම ඉන්නෙ නැන්දලගෙ ගෙදර. රත්මලානෙ සිරිමල් උයනෙ. රොහාන් ඒ නැන්දගෙ පුතා. තාත්තල එනකල් මං ඒ ගෙදර ඉන්න ඕනැ. මට එහෙ ඉන්න බෑ. වෙන කරන්න දෙයකුත් නෑ. අද තුන්වෙනි පාරටත් මහ පාරෙදි රොහාන් මගේ කම්මුලට ගැහුව. මං වහ ටිකක් බීල මැරෙනව කසුන්. නැත්නම් මූදට පනිනව. ඊට ඉස්සෙල්ල මට මේව කාට හරි කියන්න ඕනැ. එහෙම වෙලාවක ඔයාට මේව කියන එක ගැන පුදුම වෙන්න එපා. මට ඔයාගෙන් කිසි උදව්වක් එපා. මං කියන දේ අහගෙන ඉන්න. ඔයාට පව් නෑ කසුන්...

ඉඳහිට නිහඬව ගිලිහෙන මැයි මලක් පවා මාවතට පතිත වේ.

අප අතර පරතරය අඩියක් වත් නැත. ඇගේ සුවඳ මට දැනේ. මම ගෙල හරවා හෙමිහිට ඇගේ මුහුණට එබුණෙමි. විශ්වාස කළ මැනා! පුංචි ම පුංචි කඳුළු කැටයක් ඇගේ ඇහිපිල්ලමේ නළියමින් තිබේ. මට එය පිස දමන්නට සිතේ. මම ඔබට දිවුරා කියමි. ඇගේ මුහුණ උරය මත හොවා ගෙන සනසන්නට සිතේ. ඒ තරම් ම ඇගේ මුහුණ නිකැලැල් ය. අප අතර ප්‍රේමයක් නැත. මම සිතාමතා ම ඇයට තවත් සමීප වීමි. හැබැයි ඇගේ සිරුරේ ස්පර්ශ නොවීමට මම වග බලා ගත්තෙමි.

'මට ඕනැ මානසික සහනයක්. ඉස්කෝලේ ගියාට පාඩම් අහගෙන ඉන්නේ නෑ. පුස්තකාලේ එන්නේ නැන්දා ගෙදර නැති වෙලාවට තනියම ඉන්න තියන බයට. මේවා මට අම්මටයි තාත්තටයි කියලා අරින්න බෑ...'

ඉකි හඬකින් මෙන් ඕ වචන ගිල්ලා ය. මුහුණ රතු කර ගනිමින් චාපා හඬනවා නේද? මදහසකින් සැරසුණු විට චාපා කෙ තරම් සුන්දර ද?

'චාපා, ඔයා අඬන්න එපා.'



මැලවී තිබුණු මුහුණ එකවර ම ප්‍රාණය ලද්දාක් මෙන් විය. අඬන්නට එපා කී විට ඕ එක එල්ලේ මා වෙත දෙනෙත් හෙළුවා ය. විදුලි කොටන වේගයෙන් අපේ නෙත් හමු වී නැවත පරිසරය දක්වා විසිරිණි.

මෙතෝඩිස්ත පල්ලිය අසල කුඩා අවන් හලකට අප ගොඩ වුණේ කතිකා කර ගැනීමෙන් පසුව ය.

'මගේ ගානේ කෝපි බොමු.'

'කොහොමත් මං ළඟ සල්ලි නෑ.'

'අපි දෙන්නාටම මං ළඟ තියෙනවා.'

චාපා මදහසකින් යුතුව කීවා ය. ඒ සුසිනිඳු මන්දස්මිතය ඇයට ලස්සන ය. සුන්දර ය. පෙම්වත් ය.

'කෝපි දෙකක්.'

ඇගේ ආශාවට ඉඩ දී මම බලා උන්නෙමි. දකුණත මේසය මතට බර දී චාපා හිස අත මත රැඳවූවා ය. හැඬීමෙන් ද, දුකින් ද තෙත බරියම් වූ ඇගේ නෙත් යුග තඩිස්සි වෙලා ය. පුංචි ම පුංචි රවුම් මේසයක් අයිනේ අපි වාඩි වී උන්නෙමු. ප්ලාස්ටික් මල් බඳුන අප දෙදෙනා අතර මේසය මැද්දේ රැඳී තිබිණි. චාපා එය පැත්තකට කළා ය.

'ඇයි?'

'මට ඔයාගේ මූන පේන්න. මටත් කසුන් වගේ සහෝදරයෙක් හිටිය නම්.... එහෙනම් රොහාන්ගෙන් මාව බේරගනීවි.'

ඇය බොහෝ සේ මට ලෙන්ගතු වූවා සේ ය. මම ද බෙහෙවින් ඇ කෙරේ බැඳී සිටියෙමි.

'මම ඔයාගේ සහෝදරයෙක් කියලා හිතන්න.'

'එහෙනම් මම හරි වාසනාවන්ත වේවි'

For E - Pusthakalaya

[illegible] කොච්චර [illegible] ලෝකේ ඉන්නවද?

අද මේ පුංචි දවසක්, ඔයාගේ ලොකු අප්පච්චි හමු වුණා. ඊට [illegible] කියන්න ඔයාට පුළුවන් ද පැයක් [illegible] මම මුල ඉඳලා ප්‍රේම ඔයාට කියන්නම්. ඊට පස්සේ [illegible] ඔයා කියන කෙල්ල අමතක කරලා දාන්න. මං [illegible] නෑ. මට දැන් ඔයා හොඳටම විශ්වාසයි [illegible] ප්‍රේම ඔයාට කියනවා.

[illegible] සන්සුන් වී ඉරණම් කතාවකට මුල පිරුවා ය.

[illegible] විළිපදරකට මෙන් මම හරිහරි ගැසී වාඩි වුණෙමි. මගේ [illegible] ලෙස වී ඇත. සිහනව පැහැවූ මම [illegible] සිටියෙමි.

[illegible] තාත්තාගේ ගම නුවර අස්ගිරිය. අම්මා ගම්පොල - [illegible] ඒ දෙන්න පේරාදෙණිය කැම්පස් එකේ දී යාළු වෙලා බැඳලා [illegible] මම ඉපදිලා තියෙන්නේ මාර්තු එකොළොස් වෙනිදා...

[illegible] දිනය සිහි වුණේ නිතැතින් ම ය. මාර්තු දෙක [illegible] කෙටි සාරාංශයක් නම් [illegible]

[illegible] කාලේ මං ඉස්කෝලේ ගියේ නුවර පුෂ්පදානෙට. මට [illegible] ජීවිතේ ලස්සන ම කාලේ තමයි නුවර පුෂ්පදානේ [illegible] මාතලේ පාරේ. අම්මා ඉගැන්නුවේ [illegible] තාත්තා ඒ දවස්වල නුවර ඉස්පිරිතාලේ [illegible] වැඩ කළා...

[illegible] රසවත් බවක් ද, නැති නම් පුරාංගනා [illegible] ද යන්න තේරුම් නොගත් මම [illegible] කියා ගෙන ගියා ය. [illegible] මත එහෙට මෙහෙට කළා ය.

[illegible] පන්සියට. තාත්තා ඒ දවස් [illegible] ඉස්පිරිතාලෙට මාරු වුණා. අම්මා හිටියේ අපේ [illegible] සිරිමල් [illegible] මාවත් [illegible]



ඇනෙක්ස් එකක් කුලියට අරගෙන. මම ඉරිදට කොළඹ කොළොන්නාවේ වජිරාරාමයට ගියා දහම් පාසැලට. මට හිතෙන විදිහට පුෂ්පදානේ හිටියට පස්සේ මම සතුටින් ම හිටියේ වජිරාරාමේ දහම් පාසැල් ගිය කාලෙ. ඒ දවස්වල රොහාන්ලා අලුතින් ගෙයක් ගත්ත සිරිමල් උයනෙන්.'

මේ කතාවේ ප්‍රධාන භූමිකාවක් වූ 'රොහාන්' ගේ ජීවිත පැවැත්ම වෙත හිමිදීමට මම උත්සාහ කළෙමි.

'කසුන් ඔයා අහගෙනද ඉන්නේ?'

'ඔව් වාසා. ඔයා කියන්න.'

මෙ අසීමිත දයාවකින් කීවෙමි. අනන්ත සංසාරේ හමු වූ ලේ නෑකමක් ඇ වෙත ඇතැ යි මට සිතේ.

'මම හරි සතුටෙන් ඒ කාලේ හිටියේ. ගෙදර දරුවෙකුට හිටියේ මං විතරයි. අම්මගෙයි තාත්තගෙයි එකම බලාපොරොත්තුව වුණේ මං. ජීවිතේ කියනෙක හරි පුදුමයි කසුන්. මම රෑට නිද ගත්තම මගේ බඩේ ගෙඩියක් වගේ මට දැනෙන්න පටන් ගත්තේ මේ කාලේදී. මං තාත්තාට කිව්වා. සාත්තු නිවාසයක මං නැවැත්තුවේ අම්මයි තාත්තයි දෙන්නම ගිහිල්ලා. මං බෙහෙත් ගත්තේ බඩේ අමාරුවකට. ඊත් මාස තුනක් විතර යනකල් මට හොඳ වුණේ නෑ. ඊට පස්සේ මගේ කකුල් දෙකම පණ නැතුව ගියා. මම අවුරුද්දක් ඉස්කෝලේ ගියේ නෑ. අම්මා මගේ ළඟම හිටිය. තාත්තා විතරයි රස්සාව කළේ. මාව රෝද පුටුවක තියාගෙන තමයි එහේ මෙහේ ගෙනිච්චේ. අම්මා මං නිසා හරියට දුක් විඳලා තියෙනවා කසුන්.'

වාසාගේ මුහුණ දුකින් පිරී තිබිණි. ඇයට මහන්සියක් දැනුණා මෙන් කතාව නතර කළා ය. නැවතත් පටන් ගත්තා ය.

'මං හිතුව මට හොඳ වෙන එකක් නෑ කියල. ඊත් මට හොඳ වුණා. දෙවියන්ගෙ පිහිටෙන් හොඳ වුණා. මං ආයෙත් ඉස්කෝලෙ ගියේ කලින් හිටපු පංතියටමයි. අම්ම තාත්ත දෙන්නම මං ගැන හරියට සතුටු වුණා. මාව උදේට හවසට කාර් එකේ ඉස්කෝලෙ දාගෙන ගියා. ඒ කාලෙ තාත්ත හොඳටම ණය වෙලා හිටියෙ. අම්මා ඊට පස්සෙ ඉස්කෝලෙ ගියෙත් නෑ. මේ ණය දිගින් දිගටම වැඩි වුණා. අවුරුද්දකට

For E - Pusthakalaya

ඉස්සෙල්ල අම්මයි තාත්තයි දෙන්නම නයිජීරියාවට ගියා. රස්සාවලට මාව නැන්දල ගෙදර නැවැත්තුවා. මට හිතෙන්නෙ අම්මල මුලින් වෙච්ච ණය ගෙවාගන්න බැරුව රට ගියා කියල.'

මේ මුදුස්සියගේ කම්මුල සිසාරා හැඩි දැඩි අතින් පහරක් ගැසූ රොහාන් නම් පුද්ගලයා කෙරෙහි මසිතේ කලකිරීමක් වෛරයක් වැනි දෙයක් මේ වන විට ලියලමින් තිබිණ.

'රොහාන් රස්සාවක් කරනවද?'

'මාමට කාර් සේල් එකක් තියෙනව. රොහාන් ඒකෙ ඉන්නෙ.'

'තව කවුද නැන්දල ගෙදර ඉන්නෙ?'

'කවුරුත් නෑ. රොහාන්ගෙ අයිය බැඳල දැන් රොස්මිඩ් ප්ලේස්වල ඉන්නෙ.'

'ඉතිං මොකද්ද ඔයාට රොහාන්ගෙන් තියෙන කරදරේ?'

අනවශ්‍ය ප්‍රශ්නයක් ලෙසින් සිතුණ ත් මම ඇගෙන් එසේ ඇසුවෙමි. මට දැන ගැනීමට අවැසිව ඇත්තේ ඒ පමණකැ යි මට සිතේ. ඇගේ මුහුණේ සිනාවක සේයාවක් වත් නැත. තපුරු නොවුණත්, අකිකරු ගැහැණුකමක් අඳුරු පටලයක් මෙන් ඇගේ වත මඬල වසා ගෙන ඇත. මගේ හදවත වේගයෙන් ස්පන්දනය වෙද්දී මම අසා ගෙන සිටියෙමි. අපට වඩා තරමක් වයස් ගත ජෝඩු කිහිපයක් තැන තැන කතා කරමින් සිටිති. මේ අවන්හල පිළිසඳරකට කදිම නවාතැන කැයි මට සිතේ.

'රොහාන් එච්චර හොඳ කෙනෙක් නෙමෙයි කසුන්. නැන්දල වුණත් එයාව පාලනය කරන්න යන්නෙ නෑ. තුන් හතර පාරක් ම වැරදි වැඩ කරල නැන්දලට ආරංචි වුණා. ඒ අයට ඒක පුළු දෙයක්. ඔය... නැන්දල මගේ ගැනත් එහෙම හිතාගෙන ඉන්නවද කියල තමයි මට

'මොනවද?'

'රොහානුයි මමයි නරක විදිහට හැසිරෙනව කියල.'



'ඉතිං ඔය දෙන්න යාළු නැද්ද? මම හිතුවෙ එහෙම කියල.'

හිතට එකඟව ම නොවුණ ත් ඇය තේරුම් ගැනීමේ අදහසින් මම පිළිවිසීමි.

'සත්තකින්ම නෑ කසුන්. මට ඒකමයි දුක. හැමෝම හිතාගෙන ඉන්නෙ එහෙම. සමහර විට අම්මලත් එහෙම හිතාගෙන ඉන්නවද කියල මට බයයි.'

'මට ඒකෙ වරදක් පේන්නෙ නෑ. ඇත්තමයි චාපා. එද ඉස්සෙල්ලම ඔයා මාව ගල්කිස්සට කාර් එකේ දගෙන ගිය දවසෙත් මම හිතුවෙ එහෙම.'

'ජීවිතේ නැතිකර ගන්න එක මට ඊට වැඩිය හොඳයි කසුන්. මම දන්න සිද්ධි ගොඩාක් තියෙනව. තව නොදන්න දේවල් අනන්ත ඇති. ඇත්තටම මට ඒව හිතෙන කොටත් ලැජ්ජයි. මගේ අම්ම ළඟ හිටිය නම් මම මේව කියනව. ඒත් නැන්දට කියල වැඩක් නෑ. ඉස්සර නැන්දලා ගෙදර හිටිය නාවලපිටිය පැත්තේ දෙමළ කෙල්ලෙක්. අවුරුදු දහහ ත් විතර ඇති. සිංහලවත් හරියට බෑ. දවසක් රෑ දොළහට විතර සද්දයක් ඇහිලා මට ඇහැරුණා. මුළු ගේදරම ලයිට් දලා. නැන්දා දිගින් දිගටම රොහාන්ට බනිනවා. මම කාමරේ ඉඳන් ඇඳෙන් නැගිට්ටෙත් නැතුව අහගෙන හිටියා. දෙමළ කෙල්ල හොඳටම අඬනවා. පහුවද උදේ ඒ කෙල්ල ගමට පිටත් කළා. රොහාන් දවස් දෙක තුනක් ගෙදර නොහිට ආපසු ආවා. මට හිතෙන්නේ ඒ කෙල්ලට මොකක් හරි අනතුරක් වෙලා තියනවා රොහාන් අතින්.....'

'ඔයාටත් මොකුත් කරදරයක් කළාද?'

'දවසක් දෙහිවලදී කිව්ව බැහැල හෝටලේකට ගිහිං මොනවා හරි බීලා යමු කියලා. මම බෑ කිව්වා. මට ඇත්තටම බයක් තිබුණේ. එද රෑ මම දොළහ විතර වෙනකල් පාඩම් කරලා නිදගත්තා. මට හිතෙන් වගේ දැනුණා මගේ ඇඳේ කවුද ඉඳගෙන හිසකෙස් අතර ඇඟිලි යවලා ඔළුව අතගානවා වගේ. මම තිගැස්සිලා ඇහැරියා. බලන කොට රොහාන් මගේ ඇඳේ ඉඳගෙන. ටෝච් එක මූණට ගහලා කිව්වා 'කෑ ගහන්න එපා මම' කියලා. මම ඇඳෙන් බිමට බැස්සා. කාමරේ ලයිට්

For E - Pusthakalaya

ඒක දැම්මා. තැන්දට කෑ ගහනවා කියලා කට අරින කොටම මගේ කටවහලා කෑ ගහන්න එපා. මම යනවා කියලා යන්න ගියා. අද ඉඳලා එයා මට වද දෙනවා. අද කම්මුලට ගැහුව ඔයා කවුද අහලා. මම ඇඬුවේ ඇයි කියලා අහලා. කියන්න කසුන්..... කියන්න කසුන්..... මම මැරෙනවා. ඇරෙන්න වෙන කරන්න දෙයක් තියෙනවද?'

චාපා හිස මේසයේ ඔබා ගත්තී ය. ඇගේ පපුව ගැස්සෙන තාලය පිටතට පෙනේ. ඇ හඬනවා විය යුතු ය. මගේ පපුව ගිනි ගෙන දැවී තවා වැටෙන්නට මෙන් වේදනාවක් මට දැනේ.



## 6

කොළඹ වසන්තයේ සිව්මසක අතීතය මා එහි මෝරා වැඩුණු යෞවනයකු කිරීමට සමත් වී ය. තර්ස්ටන් මාතාවගේ නිඹිරි ගෙය තුළ දී ම චාපාගේ නොසන්සුන් ආත්මය ත්, විද්‍යා විෂයයන් හැදෑරීමේ පාපය ත් මට වද දෙන්නට වී ය. සාහිත්‍ය සංගම්, විවාද කණ්ඩායම් තුළ මා නිතර නිතර පුනරුත්පත්තිය ලැබුව ත්, විද්‍යා විෂයයන් සම්බන්ධව මම පන්තියේ සිටි දුර්වල ම සිසුවා වීමි. මේ කාලයේ සිදු වූ වැදගත් ම සිදුවීම නම් මා විවාද කණ්ඩායමේ උපනායකයා වීම ත්, සාහිත්‍ය සංගමයේ සහරා සංස්කාරක ලෙස පත් වීම ත් ය. තර්ස්ටන් සාහිත්‍ය දිනය වෙනුවෙන් අපි සූදානම් වෙමින් සිටියෙමු. නිරංග මම්තුරා මේ කාලය වන විට මං වඩාත් තෝරුම් ගත් තර්ස්ටනයේ කීර්තිමත් සිසුවකුව සිටියේ ය.

නියෝජ්‍ය විදුහල්පතිවරයා සමඟ නිරංග බුදුගෙය පැත්තේ සිට කතා කරමින් කාර්යාලය පැත්තට එනු මම ඈත දී ම දුටුවෙමි. සුවිශාල තර්ස්ටන් නුග රුක අද්දර මම නැවතුණෙමි. ජී. ඩී. ආරියරත්න අභියෝගතා විවාදය තිබුණේ ගිය සතියේ ය. ඔවුන් කතා කරනුයේ එහි තරගය සම්බන්ධව විය යුතු ය.

'මට බොහෝම සන්තෝෂයි කසුන් ගැන. ජී. ඩී. ආරියරත්න ඩිබේට් එක ඔය ළමයා හොඳට කතා කරලා තියනවා. මේ පාර ෂීල්ඩ් එක ගත්තොත් ඔය ළමය හොඳම කථිකයා වෙන්න පුළුවනි...

For E - Pusthakalaya

ඔහු දයාබර පියෙකු සේ කීවේ ය. නිරංග එකී සුභ පැතුමින් මට වඩා සතුටු වූ බව මම සත්තකින් ම දනිමි. නියෝජ්‍ය විදුහල්පතිවරයාට යන්නට හැර අපි දෙදෙනා නුග රුක අද්දර නතර වීමු.

'උඹ ඊට පස්සෙ පබ්ලික් ලයිබ්‍රරි ගියේ නැද්ද කසුන්?'

'ගියා. ඇයි?'

'ඇයි? මගෙන්ද අහන්නෙ? උඹේ අර පිස්සු මරගාතෙ බලන්න.'

මට නිරංග සෙරේ ඇති වූයේ කලකිරීමකි. තරමක් නිහඬව සිටි මම නුග ගසේ මුලකට නැවත සපත්තුවෙන් පහර දුනිමි. එහි පොත්තක් ගැලවී විසි වී ය.

'යකෝ, නුග ගහේ මුල්වලට නෙමෙයි චාපාගේ හොම්බට දෙකක් ඇනපං. උඹව පිස්සෙක් කරන්න හදනවට...'

'උඹට තේරෙන්නෙ නෑ නිරංග.'

'මට මොකද නොතේරෙන්නෙ? මොනව කරත් ටිකක් ආත්මාර්ථකාමී වෙයං. උඹමයි කියන්නෙ ගෙදර ප්‍රශ්න තියෙනවා. අම්මා අප්පච්චි දුක් විඳිනව. විභාගේ හොඳට කරන්න ඕනැ, කාලකන්නි වෙයිද දන්නෙ නෑ..'

'උඹට මං ඔය කිව්වෙ හිතවත්කමට'

'ඇයි – මං උඹට කියන්නෙ ඉරිසියාවටද? කසුන් මේක හිතාගනිං මේකෙ ඉන්න එවුන් එක්ක අපිට සල්ලි වලිං හැප්පෙන්න බෑ. උඹේ වැලන්ටයින් උඹ දන්න නෑ බලපං, ඇවිල්ල මාස තුනයි. මුළු ඉස්කෝලෙම උඹව දන්නව. හැබැයි ඩිබේට් කරා සොසයිටි කරා කියල නෑ විභාගෙ ඇන ගත්තොත්, හොම්බෙන් ගෙදර යන්න වෙන්නෙ. මෝඩය නොවී ටියුෂන් ක්ලාස් එකකට ගිහිල්ල සිලබස් එක කවර් කර ගනිං. සයන්ස් කරනකොට ලේසි නෑ.'

'මම ස්ටුඩියෝ එකට ගියාට මොන මළදනයක්වත් තේරෙන්නෙ නෑ. ගිය මාසෙ ෆීස් දුන්නෙත් නෑ. මම බෝඩිම පිටිපස්සෙ ක්‍රෝටන් පැළ ටිකක් දැම්ම රුපියල් 75 කට 100 කට විකුණන්න පුළුවන්.



'උඹට බිස්නස්කාරයෙක් වෙන්න හිතුණද?'

'බිස්නස් කරන්න නෙමෙයි බං. ගෙදරට කොහොමද කරදර කරන්නෙ? ඉඩං විකුණල ඉගැන්නුව වගේ නෙමෙයිනේ. මෙහෙ ඉන්න ගෑණුන්ට හබරල කොළ හරි විකුණන්න පුළුවන් මල් පෝච්චි කියල. සල්ලි ටිකක් ගන්න හදන්නෙ බැංකුවේ දාන්න නෙමෙයි. බෝඩිමෙයි, ක්ලාස් එකෙයි ෆීස් ගෙවා ගන්න.'

මොකක් දෝ මට නොතේරෙන හේතුවක් නිසා මම සියල්ල ම නිරංගට කියන්නට පුරුදුව සිටිමි. ඔහු සැබෑ දක්ෂයකු ලෙස මට සිතේ. මට ඉහළ විද්‍යා පංතියක සිටි ඔහු කුමන කටයුත්තක කළ ත් නිතිපතා පංතියේ පළමුවැනියා වී ය.

'මම උඹට කියන්නම හිටියේ. උඹ එහා පංතියේ ගිහාන් එක්ක චාපා ගැන කියල තිබුණ. චාපා කියන්නෙ කොළඹ ඉන්න එක කෙල්ලෙක් විතරයි. උඹේ ප්‍රශ්න මහමෙරක් තියාගෙන කෙල්ලෙක් හින්ද උඹ නහින්න හදන්න එපා. ගිහාන් උණත් උඹට හරි හිතවත්. උන් කියන්නෙත් උඹ මෝඩය වෙන්න හදනව කියල.'

'උඹ දන්නෙ නෑ නිරංග. කෙල්ලෙක් තමන්ගෙ පෞද්ගලික දේ තව කොල්ලෙකුට කියන්නෙ මොකක් හරි හේතුවක් නිසා. ලොකු අප්පච්චිගෙ දූ, උත්තරා මගේ විස්තර සේරම චාපට කියල. ඒ කෙල්ල මං ගැන එහෙම හිතල කතා කළේ ඒ හින්ද. කෙල්ලෙක් විශ්වාසෙට එහෙම තමන්ගෙ හැම දෙයක්ම කිව්වම කොල්ලෙක්ගෙ හිතේ ඇතිවෙන හැඟීම උඹට තේරෙන්නෙ නෑ නිරංග....'

'උඹ හිතන්නෙ චාපා උඹට ආදරේ කියලද?'

'නෑ...'

'එහෙනං මොන කෙහෙල්මලකටද උඹට ඔච සේරම කිව්වෙ?'

'අන්න ඒක තමයි මට අදත් තේරෙන්නේ නැත්තේ.'

ගඟේ ගහගෙන යන මිනිහා පිදුරු ගහක් දැක්කමත් එල්ලෙනවලු. සල්ලං වෙච්ච කෙල්ලෙක්, අහිංසකයි කියලා හිතෙන කොල්ලෙක්

For E - Pusthakalaya

ලස්සන එළඹි කැලා ගත්තම දලා ඇගේ එල්ලෙනවා. එහි ලබව කළ [illegible] කියන්න ඇත්තේ උඹ තරුණයි කියලා හිතාගෙන. අපි හිතුවට ලස්සනයි යන වයස් කියලා, කොල්ලෝ එහෙම නෙමෙයි.....

චාපා රොෂාන්ගෙන එහෙම වරදක් මොකුත් වෙලා නැහැ. ඒ [illegible] හිතන්නේ නෑ ඒ කොල්ල මට ආදරේ කරනවා කියලා. චාපා ලස්සනා මා හිත නන්නාඳුරියෙක් වගේ. දෙවියන්ට බිලිනව කියනව වගේ කියන්නල ඕනෑකම තිබුණේ..

උඹ හිත පුරාව කියන්න තිබිල්ලා දෙව්ාලේ ඔළුවේ හලාගන්න වපා වන්න ගෙල් එක ගැහුවා - යමං පන්තියට....

නිරංග පන්තිය වෙත දිව ගිය ත් මා ඉහළ මාලයට නැග්ගේ හිත හොත්තුවාවෙනි. බම්බලපිටියට ගොස් චාපා හමු වීමට ද මම වරක් සිතුවෙමි. ඒ කෙණෙහි ම පසුව දැවී ගැස්සෙනවා වැනි හැඟීමක් ඇති වී චාපා දැනටමත් රොහාන් වෙතින් අනතුරට පත් වී ඇද්ද යි මට විනස සන්තකින් ම එදින ත් සවස් වරුව ම මම පංතියේ පිටිපස අසුන් සන් නොදී චාපා පිළිබඳ ව්‍යාකූල සිතිවිලිවල ම ගිලී සිටියෙමි.

දෙකක් සැරයක් වත් චාපා මතක් නොවන එක ම දවසකුදු [illegible] ගෙවිනයෙ නැත. ඇගේ සිත ත් මා වෙනුවෙන් වේදනාවට පත් වී ඇද්ද යි මම නොදනිමි. කොල්ලුපිටියේ කුඩා අවන් හලේ කෝපි බොමින් ගත කළ මද්දහන ත්, මල් පාරේ ඇවිද ගිය මැයි ගස් සෙවණ ත් සිහිය විතුසර රූප රාමු පෙළක් මෙන් නිතර ම දිස් වන්නට වී ය.

එනිඳ්වන පිළිබඳව මට අද ඇත්තේ සුරාංගනා කතාවක මෙන් සුහද මතකයකි. ඇඹැළින් ම එහි සුරාංගනා සිහිනයේ සුරාංගනාවිය චාපා ය. මම කුඩුස් දම් පිරුවෙන් නොවෙමි. එහෙත් චාපා වෙතින් [illegible] ආශාවක් තබා ඇයට ආදරය කිරීමට වත් සිතක් [illegible] කටයුතු නැර කිසිදු අරමුණක් මා නොසිටිය [illegible] නොකෙරුණේ එකී අරමුණ ම ය.

මුළු විවාදයක් තරඟාවලියේ පවත්වා ගැනීමේ අරමුණ ද සහිතව [illegible] දිනක් මම ත් නිරංග ත් විශාඛාවට ගියෙමු. පන්තකින්



ම මේ ගමනේ මගේ අරමුණ වූයේ චාපා මුණ ගැසී කතා කිරීම ය. විශාඛාවේ කාර්යාලයට ගිය අපි විවාද කණ්ඩායමේ නායිකාව ත්, අනුශාසක ගුරුතුමිය ත් හමු වීමට අවශ්‍ය බව කීවෙමු. ටික වේලාවක් කතා කරමින් සිටි නිරංග මා නොසිත මොහොතක,

'අද චාපා නැද්ද?'

යැයි ඇසුවේ ය. මම නැති ගතිමි.

'ඒ මොකවද?'

අනුශාසකවරිය කුතුලින් ඇසුවා ය.

'හිතඳි සිංදුවක් අහන්න.'

යනුවෙන් නිරංග විහිළුවෙන් ම උත්තර දීම මට සතුටක් වූව ත් එයට පිළිතුරක් බලාපොරොත්තුව මම ශිෂ්‍යාව ත් ගුරුතුමිය ත් දෙස බැලීමි.

'ඒ ළමය සුමාන තුනකින්ම ආවෙ නෑ...'

යනුවෙන් ඕ නොසැලකිලිමත් ලෙස කීවා ය. තව දුරට ත් ඒ පිළිබඳව කතා කිරීමට මට අවැසි වූව ත් මම කිසිවක් නොඇසීමි. පාසැල් වේලාව අවසන් වන තුරු අප සාහිත්‍ය සංගම් පිළිබඳ කතා කරමින් කාලය ගෙවූයේ අවම වශයෙන් උත්තරා හෝ හමු වීමේ අදහසිනි. පාසැල් නිමවන හෝරාව විශාඛාවේ ඇති සුන්දර ම දර්ශනය යැයි මට සිතේ. මම නෙත් නොහෙලා කුමරියන් දෙස බලා සිටීමි. එහෙත් මගේ යටි සිත චාපා මේ අතර සැඟ වී ඇතැ යි යන සිතුවිල්ල තුළ ම කිඳා බැස තිබිණි. උත්තරා කඩිතමින් ගේට්ටුවෙන් එළියට යාමට සැරසෙනු දුටු මම දිව ගියෙමි.

උත්තරා... නංගි....

ඇය වෙත සිනාවක් නොවී ය. ඒ දෑස කුමක් දෝ හේතුවක් නිසා දීප්තිමත්ව තිබිණි.

චාපා බොරැල්ලෙ නර්සිං හෝම් එකේ ඇඩ්මිට් වෙලා ඉන්නේ. පුළුවන්නම් බලන්න යන්න. මම යනව - අප්පච්චි එළියෙ බලාගෙන ඇති

For E - Pusthakalaya

නිම්මෙයසින් උත්තරා නික්මුණා ය. මම නිරංගගේ මුහුණ බැලීමි. ඔහුගේ මුහුණේ අනුකම්පාවක් ලියලමින් තිබිණැ යි මට දැනී සිතේ.

මහිපාලපිටිය හංදියෙන් කිරිබත්ගොඩ බසයකට ගොඩ වූ වාපාත් නිරංග ත් බසයේ පෙලවර අසුනක වාඩි වීමු. බොරැල්ලේ සිට කිංසි පාර දිගේ තරමක් දුර පයින් ගමන් කළ අපි නිදහස් පරිසරයක පිහිටි සාත්තු නිවාසයකට ඇතුළු වීමු. දෙවන මහලේ පුංචි කුටියක ගිලන් ඇඳක වාපා ගුලි වී සිටියා ය. බිත්තිය දෙසට හැරී සිටි වාපා අප එනවා දුටුවේ නැත. අඩක් කියවූ පොතක් පුංචි ස්ටූලයක් මත පෙරළා තිබිණ. වාපා ඇහැරවීමට තිබූ නොකැමැත්තට මම පොතේ පිට කවරය පෙරළා බැලීමි. 'නංගී වෙනුවෙනි – මෛත්‍රී මූර්ති' එහි සඳහන්ව තිබිණ. සුළුමාකාර සෙනෙහසක් තිබූ එකී පොතේ සුන්දරත්වය මම මනසින් සිහි කළෙමි.

'වාපා...'

මම උද්දමයකින් කතා කළෙමි. නිරංග කොරිඩෝරයේ සක්මන් කරමින් සිටියේ මට ඉඩ ලබා දීමට විය යුතු ය. වඩාත් හැකිම්බර ලෙස මදෙසට හැරුණු වාපා තඩිස්සි වී තිබූ දෙනෙත් බිමට බර කර ගත්තී ය.

'උත්තරා නංගි කිව්වෙ ඔයා අසනීපෙන්ය කියල.'

නොසැලකිලිමත් බවක් වාපාගේ මුහුණ අඳුරු කොට තිබිණ. අණු මාත්‍රයක් තරම් වත් ඇය මගේ කියමන ගණන් ගත්තේ නැත. සෙමින් සෙමින් හිස එසවූ ඇ හිටි හැටියේ ම සෘජුව ම මා දෙස බලා දෑස විකසිත කළා ය.

'කවද්ද ඔයා අසනීප වුණේ?'

මම විමසීමි. පිළිවදන් දෙන්නට සැරසුණු ඇගේ දෑස කම්පිතව රතු වී ය. වර්ලස මුදුනේ අක්බඹරු රොදක් නිසොල්මනේ තිබිණ. ශෝකයක් දෝ වේදනාවකින් ඇ පෙළෙන්නී ය. වේදනාව අන්තයට ම සිඳී යනතුරු මගේ උණුසුම් දෑතින් වාපා තුරුළු කොට ගෙන නිසොල්මන් වන්නට මට සිතේ.

'මං දැක්ක කසුන් ඔයා ගේට්ටුවෙන් ඇතුළට එනවා.'



'ඔයාට මං ආපු එක කරදරයක්ද?'

මම වෙහෙස වී සිටිමි. වාපා තව තවත් මා අවුල් කිරීමට වෙර දරන්නී ද? මට වචන ගළපා ගැනීමට අමාරු වී ය. විනාඩියක් තරම මම වාපාගේ බොඳ වූ දෑස දෙස බලා සිටියෙමි.

'කියන්න කසුන් මේ කතාවෙ අවසානෙ මොකක්ද? මොකක්ද වෙන්න යන්නෙ කියන්න.'

වාපා මගේ දෑත මිරිකා ගත්තී ය. මොහොතකින් ඇය ම එය නිදහස් කර ගත්තී ය. මා හිස එසවූයේ එ විට යි. ඇගේ කෙස් රොද අතරින් නැවුම් ඕඩිකොලෝන් සුවඳක් නික්මිණ.

'මට සමාවෙන්න....'

'ඔයා වරදක් කරල නැ වාපා.'

මගේ හදවත එහෙත් මෙහෙත් ඉරී ඇදෙන්නට මෙන් වේදනාවකින් තෙරපුණේ ය. වාපා මායාවක් ද? බොරුවක් ද? සුන්දර වූ පවිත්‍ර වූ දෙව්දුවක් ද? මගේ අධ්‍යාත්මයේ පිරී තිබූ ප්‍රීතිය යටපත් වෙමින් පවතී.

'අනේ දෙයියනේ. මං දුප්පත් ඔයාටත් වද දෙනවා. මං ආත්ම ගාණක් පව් කරන්න ඇති කසුන්. මං පුංචි කෙල්ලෙක් නේද? ඇයි මට මගේ ලෝකෙ සතුට විඳින්න ඉඩ නැත්තේ? මගේ රත්තරං අම්මයි තාත්තයි මේව දන්නෙ නෑ කසුන්.'

'ඔයාට ආයෙත් කරදරයක් වුණාද?'

'නැන්දල හිතාමතා මාව රොහාන්ට කොටු කරන්න හදනව. නැන්දයි මාමයි දෙන්නම මාසෙකට ජපන් ගියා. මෝටර් පාට්ස් වගයක් ගේන්න කඩේට. එද උදේ මට කිව්වෙ. මගේ ඔළුවෙ ඉඳල මුළු ඇඟම ගිනි ගත්ත වගේ වුණා. 'මැගී ඉන්නවනේ. අයියත් එක්ක පරිස්සමින් ඉන්න දුවේ – අපි ඉක්මනට එනවා' කියල කිව්ව. මම නැන්දල යන්න ඉස්සර මෙහෙට ඇවිල්ල ඇඩ්මිට් වුණා.'

'ඔයාට එහෙනම් ලෙඩක් නැ.'

For E - Pusthakalaya

තියෙනවා. දැන් මගේ මුළු ආත්මෙම ලෙඩ වෙලා. මට බොස්ලා එක එක ජාතියෙ බෙහෙත් දෙනවා. මමත් බොරුවට ලෙඩ කියනවා. පෙති ටික ඔක්කොම ජනේලෙන් එළියට දානවා.'

'රොහාන් එන්නෙ නැද්ද චාපා ඔයාව බලන්න?'

'හැමදාම එනවා. ආවම මම අසනීපයි කියල නිදාගන්නවා. නැත්නම් නර්ස්ව ළඟට ගන්නවා.'

ඇය හිස ඔසවා බලා සිනාසෙන්නට තැත් කළා ය. මම නැගී වෙනටයි පොතේ පිටු එහෙ මෙහෙ පෙරළන්නට වීමි. චාපා මදෙස බලා සිටින්නට ඇත. ඇගේ වටකුරු අත් අකුරු සහිත කොළ කැබැල්ලක් පිටු අතර වී ය. මම දෑස එහි නතර කළෙමි.

ඔබ මලක් වෙලා වන අරණේ පිපේවී
මා සුළං රොදක් වී ඔබ පිස හමාවී
පුර හඳක් වෙලා ඔබ අහසේ දිලේවී
මා ගහක් වෙලා සඳ එළියේ ගලාවී....

'මොකද මේ සිංදු ලියලා....'

'හරිම ලස්සනයි කසුන්. ඒකයි....'

සත්තකින් ම පවිත්‍ර වූ යමක් මගේ හිතට වද දෙන්නට වී ය. මැයි මලක් මෙන් චාපා සුන්දර ය. එය පුදුමාකාර චමත්කාරයකි. චාපාගේ හිත පිච්ච මලක් මෙන් නිකැළැල් යැයි මම සිතමි. ජීවිතය මෙ හැතින් පටන් ගන්න ද? එ විට අපම්මත වූ කතා දෙකක් යා කළ හැකි ය. රහසිගතව සැලසුම් කරන්නට තරම් ජීවිතයක් මට නැත. මා හළන්නේ, පෙළන්නේ, රිදවන්නේ එක ම දෙයකි. ඒ දෝහින් මී ගත් දුප්පත්කම යි. විසඳුමක් නැති ප්‍රශ්නයකට එළඹීමට වඩා මවපියන්ගේ අරමුණ ඉටු කිරීම යහපත් ය. චාපාට වඩා බෙහෙවින් දුක්බර වූ කතාවක් මට කියන්නට තිබේ. මම නැවතත් අප්‍රාණික වීමි. හිත පුරාවට දුකක් ද, සතුටක් ද, රසවත්කමක් ද, නළියමින් සොරපෙමින් තිබිණ.

'ඔයාට කරදරයක් නැත්නම් මට පුස්තකාලෙන් පොත් ටිකක් ගෙනත් දෙන්න. මෙහෙ හරිම පාළුයි කසුන්.'

චාපා එසේ කියත් ම මා වෙනව නව තවත් වැට කඩොලු බැඳුණු යි සිතුණ ද මම එකඟ වීමි.

'පුළුවන්නම් මට එමලි බ්‍රොන්ටේගෙ 'වදරිං හයිට්ස්' ගෙනත් දෙන්න. මං ආසයි ආයෙත් කැතරින් ගැන කියවන්න.'

ඇගේ බැගෑපත් දෑස දුටු මට එකඟ වීම හැර කළ හැකි අන් දෙයක් නොවිණි.

චාපා සුන්දර වස්තුවකි. මා සිත ඇය හැර ඉවත යාමට අවැසි හිස්මිම ලබා දෙන්නේ නැත. මම චාපාගේ සිත්කළු දෑස දෙස මොහොතක්, නව මොහොතක්, බොහෝ වේලාවක් බලා උන්නෙමි. ඇයට මගේ දෑස දෙස බලා සිටින්නට නොහැකි වන්නට ඇත. ඕ බිම බලා ගත්තී ය.

'චාපා.... නිරංගත් එළියේ.... මම එහෙනම් යන්නද?'

'මට කසුන් වගේ කෙනෙක් ළඟ ඉන්න එක හිතට හයියක්. මං ලොකු පිනක් කරලා තියනවා ඔයාගේ අනුකම්පාව ලබන්න.'

'මට තේරෙනවා චාපා. අපි අහිංසකයි. ඒ වුණාට ලෝකේ අහිංසක නෑ. මං වෙන වෙලාවක කියන්නම්..... අපි නොහිතුවට අපේ හිත් හරි හයියයි. මේවා පේරම දරාගෙන ජීවත් වෙන්නේ අන්න ඒ හින්ද. චාපා මම එහෙනම් යන්නද චාපා?'

'හොඳයි කසුන්. පිං සිද්ද වෙනවා මාව බලන්න ආවට.'

මම සන්සුන් ලෙස ගිලන් කුටියෙන් කොරිඩෝරයට පිවිසීමි. නිරංග දොරකඩට වී රොහාන් සමඟ කතා කරමින් සිටිනවා මා දුටුවේ එ විට යි. ඔවුන් බොහෝ වේලාවක් එ තැන සිටින්නට ඇත. මම ගමන් වේගය බාල නොකර ම එ දෙසට පිය මැනීමි. රොහාන් හැඩි දැඩි රකුසු දෙනෙත් මදෙසට හෙළා තියුණු බැල්මක් හෙළුවේ ය.

'තමුසෙද මේ ඇතුළේ හිටපු මනමාළයා?'

රොහාන් කඩා පැන්නේ ය. නිරංගගේ මුහුණ රතු වී තිබිණ.

'අපි මේ චාපා ලෙඩවෙලා කිව්ව නිසා බලන්න ආව. ළඟදී කාලා උළෙලක් තියෙනවනේ, ඒ ගැන කතා කරන්නත් එක්ක.'

මේ වගේ ගොත නොගසා කිමට ප්‍රවේසම් වීම.

For E - Pusthakalaya

කතා කරන්න උඹ වගේ හාල්පාරුවෙක් දවසක් කාර් එකේ යන්න යන කොට මම හිතුවා. ඉරිදට ලයිබ්‍රරි ගිහිල්ලා උඹ තේද ජගත්මී සෙවල හලන්නේ? මං උඹට දෙපාරක් කියන්නේ නෑ. ඔළුව පැළුව මං උඹව පැක් කරනවා. තමුසේ නිකං සෙල්ලං දලා සල්ලං වෙන්න එපා.

ඔහු මගේ කොලරයෙන් අල්ලා සෙලවූවේ ය. නිරංග ගල් ගැසී බලා සිටියේ ය. ඔහු පහර දෙතැ යි මා සිතුවත් ෂර්ට් කොලරය ඇද තදින් ඔහු ක්ෂණයකින් වාපා සිටි කාමරයට රිංගුවේ ය. ඒ වන විට ත් වාපා දොරකඩට පැමිණ සිටියා ය.

මම ත් නිරංග ත් කොරිඩෝරය දිගේ විත් තරප්පු පෙළ දිගේ පහළට බැස ආවෙමු. අනවශ්‍ය කරදරයක් වෙතැ යි සිතූ මම සත්තකින් ම සිය විමි. රොහාන් ද අප පසු පස එනු දුටුවෙන් නිරංග හිටි වන ම නැවතුණේ ය. මට දුක සිතුණේ මා ගැන නොවේ. අමාරුවේ වැටෙන්නට සදන නිරංග ගැන ය.

'තමුසේ තද්දරු වුණත් අපිට කමක් නෑ. අපි ආවේ වාපා අසනීපයි කිව්ව නිසා ලෙඩ බලන්න. අපේ මනුස්සකම බල විදිහට හිතන්න තමුසේ මෝඩයෙක් නම් තමුසේ කියන දේකට අපිත් ලෑස්තියි.'

නිරංග මගේ අතින් අල්ලා නැවතුණේ ය. ඔහු කී දෙයින් රොහාන් තරමක් සැලී සන්සුන් ඇත. වාපා ඒ වන විටත් තරප්පු පෙළ බැස අවිත් මා අසළ නැවතී සිටියා ය.

'අනේ කළුත් ඔයාලා යන්න. මම මේක ඉවරයක් කරගන්නම්. [illegible] රොහාන් මාව හිතරුණේ මරා ගන්න හදන්න එපා. [illegible] යන්න දෙන්න. ඔයාට වරදක් වුණේ නැතේ රොහාන්. අපි [illegible] ඒ [illegible] අද එක වැරදි විදිහට හිතුවේ?'

රොහාන් වාපාගේ අත අල්ලා තමා අසලට ගත්තේ ය. වාපා [illegible] ය. ඔහු අත දැඩි කරන්නට ඇත. වාපා [illegible] ඇඹරුණේ ය. මම ත් නිරංග ත් හෙමින් හෙමින් [illegible] එළියට ඇදුණෙමු. කිංසි පාර දිගේ



කේරි විද්‍යාලය පැත්තට ඇවිද ආ අපි නගර ශාලාව දක්වා පයින් ම ගමන් කිරීමට කතිකා කර ගතිමු. හරියට ම 'වෝඩ් ප්ලේස්' වලට හැරෙද්දී කැලිෆෝනියා කාරය අප අසළ නැවතුණි. රොහාන් වීදුරුව පහත් කොට සිනාසුණේ ය. අප දෙදෙනාගේ කුසගින්නෙන්, දහදියෙන් තැළී තිබුණු මුහුණුවල සිනාවක් ඇඳුණේ නැත.මේ තරුණයාට සිනාසෙන්නේ කුමකට ද? ඔහු කාරයෙන් බැස අප අසළට වි ය.

'වෙච්ච සිද්ධිය ගැන කණගාටුයි. මට ඔය දෙන්න එක්ක කතා කරන්න ඕනෑ. අපි යමු 'පැන්ටැබ්' එකට. නගින්න කාර් එකට.'

නිරංග ත් මම ත් මුහුණ බලා ගනිද්දී රොහාන් කාරය පණ ගැන්වූවේ ය.

'යමු. මොනවා හරි කිව්වොත් හොම්බට දෙකක් ඇනලා අපි යං.'

නිරංග ඉස්සර වි ය. අපි දෙදෙනා ම කාරයට නැග්ගෙමු. එකී අවන් හලට යන තෙක් අපි කිසිවක් කතා නොකළෙමු. මුලින් ම කතාවට මුල පිරුවේ රොහාන් ය.

'වාපා මගේ නෑනා. එයාගේ අම්මා තාත්තා ඉන්නේ රට. මමයි එයාව බදින්න ඉන්නේ. එයා ලංකාවේ වැඩිකල් ඉන්නේ නෑ. අපි බැඳලා ලන්ඩන්වල පදිංචියට යනවා. එයාට ලොකු අසනීපයක් තියෙනවා. ඒකට ඔපරේෂන් එකක් කරන්න ඕනෑ. ඒක කරන්න පුළුවන් ලන්ඩන්වල.'

නිරංග ඇසක් වැසුවේ ය. මගේ කකුල පෑගුවේ ය. රොහාන් විශාල බොරුවක් ගොතා කියන බව නිරංගට මෙන් මට ද වැටහී තිබිණ. අපි අසා සිටියෙමු.

'ඉතිං....'

මම ඔහුට ඉඩ දුනිමි.

'එයාගේ අම්මා තාත්තා එක්ක කතා කරලා තියෙන්නෙ ඉස්කෝලේ යන නිසා බඳින ඒක කල්දලා තියෙන්නේ අපි දැනටත් ඉන්නෙ එක ගෙදර.'

For E- Pusthakalaya

'ඉතිං හොඳයිනේ. විභාගේ කරාම විවාහය කරන්න පුළුවන්. රොහාන්ට මොකුත් ප්‍රශ්නයක් නැනේ.'

නිරංග මගේ අනිත් කකුල ත් පෑගුවේ ය. මා කෑ නොගසා සිටියේ අමාරුවෙනි.

'මේ ටික දවසක ඉඳලා චාපා ටිකක් වෙනස්. මාව මග අරිනවා වගේ. කවුරු හරි කොල්ලෙක් සෙට් වෙලාද කියලා සැකයි. එද මෙයත් හිටියනේ ලයිබ්‍රරියේ දී, චාපා ඇඬුවා. අපි ලිබර්ටි ප්ලාසා යන්න හිටියේ. එද චාපා ආවේ නෑ. මට දැනගන්න ඕනෑ කවුරු හරි කොල්ලෙක් ඇ[illegible]වත් දලද කියලා.'

'අපි නම් දන්න තරමින් නෑ. එහෙමනම් අපි රොහාන්ට කියන්නම්. ඕනෑ සපෝට් එකක් දෙන්නම්. ඒ වුණාට නර්සිං හෝම් එකට අපි ආවේ එහෙම මඟුලකට නෙමෙයි. ලෙඩා බලන්න.'

නිරංග පිළිවෙළකට රොහාන් සන්සුන් කරමින් සිටී. මම මුනිවත රැක්කෙමි.

අපේ බිල ගෙව්වේ රොහාන් ය. ඔහුට ඉඩ දී මම නිරංග පසු පසට ඇද්දෙමි. අපි පුස්තකාලය ළඟ දී කාරයෙන් බැස ගියෙමු.



# 7

මම දක්ෂිණාරාම පාර දිගේ ගොස් බෝඩිම දක්වා ගියේ හිතේ පැහැදිලි නිනව්වක් ඇතිව නොවේ. බෝඩිමේ දොරකඩ අම්මා ත් අප්පච්චී ත් සිටිනු දැක්මෙන් මගේ ගමන ඉක්මන් වී ය.

සුන් වූ හෑඟීමකින් මම ආලින්දයට ගොඩ වීමි.

'අම්මල දැන්ද ආවෙ?'

මම විමසීමි. කතාවක් නොවිණ. අප්පච්චී දෙස ද හොරැහින් ම බලා ගෙන මම කාමරය තුළට රිංගුවෙමි. අම්මා මා පසු පස්සේ වැටුණා ය.

'මොකද පුතේ ඉස්කෝලෙ ඇරල මෙච්චර වෙලා?'

ඒ හඬෙහි ත් වචනවල ත් වූයේ කලකිරීම මුසු තැති ගැන්මකි.

'මම පුස්තකාලෙට ගියා.'

පොත් ටික මේසය මතට විසි කළ මම අප්පච්චී ඉන්න දිසාවට ඇදුණෙමි. අම්මා පඩිය උඩ වාඩි වුණා ය. හුස්ම පොදකින් පවා ඔවුන්ගේ සිත රිදෙනෑ යි මම තැති ගතිමි.

'මට උඹලව දකින්න තියෙන වාසනාව නැති වුණා පුතේ...'

අප්පච්චී බිමට වාරු වී සරම් පොටින් කඳුළු පිස දැමුවේ ය.

'ඇයි අම්මෙ?'

'අප්පච්චිගේ ඇස් දෙකම පේන්නෙ නැතුව ගියා පුතේ...

For E - Pusthakalaya

නුනි වී යමින් තිබූ මසිත ඇවිළී ගිහිදලු නැගෙගේ ය. මම දෙදෑස බිම හෙලා අප්පච්චි ළඟ ඇද වැටුණෙමි. මගේ හිසේ සිට උරහිස දක්වා ඔහුගේ කඳුළින් තෙත් වන්නට වී ය. දෑතින් ම හිස අල්ලා බදා ගත් අප්පච්චි වෙතින් මහත් පිය සෙනෙහසක් ලැබ මගේ සිරුර උණුසුම් වන්නට වී ය.

'අපි කොළඹින් බෙහෙත් කරල බලමුකෝ. හොඳ කර ගන්න පුළුවන් වෙයි.'

අම්මා කඳුළු සඟවා ගෙන අසව අස්වැසුවා ය.

මැලේරියා රෝගය වැළඳී රෝහල් ගත කළ අප්පච්චිට මොළේ මැලේරියාව වැළඳී ඇත. එයට ප්‍රතිකාර කිරීමේ දී අප්පච්චිගේ දෑස ම අන්ධ වී තිබිණ. කොළඹ මහ රෝහලේ ඔහු නතර කර ගැනීමට අපි කතිකා කොට ගතිමු. අප්පච්චි බලා ගැනීමේ සම්පූර්ණ වගකීම අම්මා මවෙත පැවරුවා ය.

'පුළුවන් විදිහකට අප්පච්චි බලාගනිං පුතේ.... උඹලගේ ඇස් පාදන්න උන්දෑ කොච්චර මහන්සි වුණාද? අපේ වෙලාවෙ නරකකට පොඩි පුතේ!'

ඒ දින බෝඩිමේ සිටි අපි උදේ ම කොළඹ නයනාරෝග්‍ය ශාලාවට ගොස් අප්පච්චි එහි නතර කළෙමු. අම්මා පිටකොටුව බසයකට ඇරලීමට මම සලාකා නැවතුම් පොළෙන් බසයකට නැග්ගෙමි.

'ලොකු අප්පච්චි ගෙදරට ලියුමක් එවල තිබුණා උඹ කවුද ගෑණු ළමයෙක් එක්ක රවුම් ගහනව කියල. අපිටයි දොස් කියල තිබුණේ. එයාගෙ නම්බුව උඹ කොළඹ ඇවිල්ල නැති කරනවලු.'

'එහෙම එකක් නෑ අම්මෙ. උත්තරා නංගිගෙ යාළුවෙක්.'

'මය මිනිස්සු ඉරිසියාවට කියනවද කවුද දන්නෙ? උඹ හොඳට ඉගෙනීමෙ වැඩ කරපං. දෑ ඕයේ වැලි ගොඩ දන්නෙත් නෑ. නංගිලගේ එන්නෙ දුෂු කඩලා ලැබෙන සොච්චම තමයි පේරටම. බෝඩිමේ සල්ලි මාස අහකින් දුන්නෙත් නැතේ. මොකක් හරි කියපං පස්සෙ දෙද්දි. පරණ බිත්ති ඔරලෝසුව විකුණලා තමයි කොළඹ එන්න සල්ලි හොයා ගත්තෙත්.'

'අම්මල මීට පස්සෙ මට සල්ලි එවන්න එපා. බෝඩිමේ සල්ලි මං ගෙවුවා. මං මෙහෙදී මල් පැළ පෝච්චි කරල විකුණනවා. යාළුවෙකුත් එක්ක....'

මම වීරයකු මෙන් කීවෙමි. අම්මා මහත් ඔනෑකමකින් ම'දෙස බලා නිහඬ වූවා ය. බදුල්ල බසයක අම්මා ගමන් කළ අතර මම බුලත් විටක් ද, කඩල ගොටු දෙකක් ද මගේ මුදලින් අම්මාට අරන් දුනිමි. අම්මා මට පිං දුන්නා ය.

අම්මා ළඟ මුදල් නැති බව මම දනිමි. අප්පච්චිගේ වියදමට රුපියල් හැත්තෑ පහක් අම්මා මට දුන්නී ය. මම එය ආපසු අම්මාට දී මගේ ළඟ සල්ලි තිබෙන බව කීවෙමි. දැන් ඉතිං උදේ හවස අප්පච්චි බලන්නට නවයේ වාට්ටුවට යා යුතු ය. ඔනෑ එපාකම් බැලිය යුතු ය. බෝඩිමට හා ටියුෂන් පංතිවලට මුදල් බැඳිය යුතු ය. මම දස අතේ කල්පනා කරමින් පිටකොටුව බෝගහ අසළ මහපාර දෙස බලා උනිමි. ඇස ගැටෙන ගැටෙන තැන මුදල් ය. තරගය ය. මේ ඇවිස්සුණු කඩි ගුල දෙස මම පැය ගණනක් බලා සිටියෙමි. අපේ දුප්පත්කම ගැන මට ම දුක සිතිණි.

මම බොරැල්ල බසයකට නැග ටිකට්ටුවක් ගත්තේ තලංගම මගේ පාසැල් මිතුරෙකු වූ ගිහාන් ශ්‍රීනාත් අල්විස් හමු වී මුදල් කීයක් හෝ ඉල්ලා ගැනීමේ අදහසිනි. මගේ ජීවන තොරතුරු නිවැරදිව දැන සිටියේ තර්ස්ටනයේ මිතුරන් දෙදෙනෙකි. ඒ ගිහාන් හා නිරංග ය. පාසැල ඇරෙන වේලාව තෙක් ම බොරැල්ලේ මැලිබන් හෝටලය අසළට වී සිටියෙමි. මහත් බඩගින්නක් දැනුණත් මා එය උහුලා සිටියේ අතේ මුදල් නැතිකමට ය. අත ඇති මුදල වියදම් කරනවාට වඩා හවස අප්පච්චිට එයින් බත්මුලක් ගෙන ගොස් දීමට මම තීරණය කළෙමි.

හවස එක පමණ වන විට මහා වැස්සක් වැටෙන්නට වී ය. කැලි කසළ සේදී දිය වී පිටාර යන්නට තරම් වැස්ස තද වී ය. මාවත ඇවිද්දෝ තොතෙමෙන තැන් බලමින්, සෙවණ ඇති තැන් බල බලා රිංගුවෝ ය. මද වේලාවකින් වයස දහතුන පමණ යුවතියක් තෙත බරිත වී මා සිටි කඩයට රිංගා ගත්තී ය. මල් වැටුණු අල්ලි සහිත ගවුමක් ඇඳ සිටි ඇය තෙත බරිත වී සිටියා ය. නොතෙමී සිටි මම ඇය දෙස බැලීමි. ඔබ විශ්වාස නොකරන බව මම දනිමි.

For E - Pusthakalaya

එහෙත් ඒ වාපා ය. මා දකින් ම ඇය දැන පෙරවා අඩවින් තිබ් බැල්මක් හෙළුවා ය. වැස්ස නැවතුණේ නැත. වාපා බෙහෙවින් තැති ගෙන ලැජ්ජාවට පත් වී සිටියා ය. නොසිතූ මොහොතක ඇය හමු වීමෙන් මම සසල වී ගියෙමි.

'කසුන් ඔයා මොකද මේ වෙලාවේ?'

'කොහේද ඔයා මේ තෙමීගෙන?'

'ඔයා කොහේ යන ගමන්ද?'

'හොස්පිට්ල් එකේදී ඔයා ටිකට් කපා ගත්තද?'

අපි දෙදෙනා ම අතුරු ප්‍රශ්න ඇසුවා මිස උත්තර නොදුන්නෙමු. දියබත් වූ වාපාගේ නොඉඳුල් නාරී දේහය ගවුමට යටින් මතු වී තිබිණ. මම අඩ බැල්මක් හෙළා ඇය පැත්තකට කොට ගතිමි.

'මොකද වාපා වුණේ?'

'මොකුත් වුණේ නෑ කසුන්. මට කොහොමද ඔයාව මෙහෙදී මුණ ගැහුණේ? බලන්නකෝ වැස්ස..... මම හොඳටම තෙමුණා.'

ඕ දෙදරියක මෙන් පිබිදී කියා ගෙන ගියා ය. මම ඉතා ම සුන්දර ලෙස වාපා දුටුවෙමි. මගේ හිත් පතුල දක්වා ඕ කිමිදී සිටියා ය.

'අපේ අප්පච්චි අද හොස්පිට්ල් ඇඩ්මිට් කළා.'

මම කීවෙමි. වාපා දෑස උඩ ඉන්දවා මා දෙස බැලුවා ය.

'ඔයාල අප්පච්චි කොළඹ ඇවිල්ලද? මට එහෙනම් කසුන්ලගේ අප්පච්චි බලන්න පුළුවන්...'

බලාපොරොත්තු නොවූ පිළිතුරෙන් මම මහත් සේ තොසත්පුත් වීමි.

'මහ පුදුම මනුස්සයෙක්නෙ!'

'ඇයි ඉ?'

'මම අප්පච්චි බලන්න ඕන. කිව්ව. විත 7යි මණ බෙරීකාර ගත්තෙ?'



'විහිළුවක් නෙමෙයි වාපා. මට අප්පච්චි බලාගන්න වෙලා. ඔයාට තේරෙන්නෙ නෑ, මම ඒවා සේරම කියන්නම්.... ඉස්සෙල්ල කියන්න මොකද මේ ඔයා තෙමීගෙන? ඉස්පිරිතාලෙන් පැනල නේද ආවෙ?'

'පැනල ආව? එහෙනම් එන්නෙ දොස්තරත් එක්කනේ....'

දියබත් වී සිටි වාපා මගේ අතේ එල්ලුණා ය. මම සීතල වී ගියෙමි. වැරදීමක් වුණාක් මෙන් ඕ දෙනෙත බිමට හරවා බේරෙමින් තිබූ දිය බිඳු කොණ්ඩ කරල දිගේ බිමට වැටෙන්නට හැරියා ය. වටේ සිටි මිනිසුන් ද අප දෙස බලා සිටින්නට ඇත. වාපා සිමෙන්තියේ තිබූ පුංචි පුංචි වැලිකැට ඇඟිලි අගින් ගෙන ගොස් දිය පහරට දැම්මා ය.

'අපි යමුද වාපා?'

'මේ වැස්සෙ?'

මා බලාපොරොත්තු වූයේ ඇ 'කොහාටද' යනුවෙන් මගෙන් විමසාවි යන්න යි. ඇගේ උත්තරයෙන් මම දිරිමත් වුණෙමි.

'තෙමීගෙනමනෙ ආවෙ. තෙමීගෙනම් යමු. 'ලිඩෝ' එකට මෙහා පැත්තෙ කැබින් එකට ගිහිල්ල කෝපි බොමු.'

අහඹු ලෙස ඇ බොරැල්ලට පැමිණීම මොහොතකට අමතක කළ මම ව්‍යාජ ලෙස සැහැල්ලු වුණෙමි.

'අනේ යමු කසුන්. මට පුළුවන් ඔයත් එක්ක කතා කරන්න.'

'අද ඔයාට නෙමෙයි කතාකරන්න ඕන. මට.... ඔයාට පුළුවන්ද වාපා අහගෙන ඉන්න?'

'පුළුවන් කසුන්. මට පුළුවන්. ඔයා ඕනදෙයක් කියන්න. මම අහගෙන ඉන්නම්.'

වාපා මගේ දෑසට එබුණා ය. මේ වන විට මට වාපා කෙරේ තිබුණේ අපැහැදීමකි. ඇ අකීකරු යුවතියකැ යි මම සිතුවෙමි. සමහර යුවතියන් අහිංසක ලෙස හැසිරී ඉතා ම කපටි ලෙස ජීවිත ගෙවන බව මම අසා ඇත්තෙමි.

For E - Pusthakalaya

'මේකත් අහන්නකෝ කසුන්. ඊයෙ ඔයාල යනකොට තිරංග ලයිබ්‍රරිය ළඟින් බස්සගෙන ගියානේ. ඉතිං ඔයාල 'පැන්ටැබ්' එකෙදි කතා කරපුවා තිරංග ඇවිත් මට කිව්වා ආයෙමත්. මම උදේ රොස්මිඩ් වලට ගිහිල්ල රොහාන්ගෙ අයිය බැඳල ඉන්න අක්කට කිව්ව ජේරම, එයා කිව්ව නැන්දල එනකල් මට එහෙ ඉන්න කියල.'

මම නොසැලකිල්ලෙන් අසා සිටියෙමි.

'ඔයා බොරැල්ලේ ආවෙ මොකටද?'

'ඇයි උත්තරා එනවනේ 'ගේට් වේ' එකට ක්ලාස් යන්න. මං මේ එයාව බලන්න. වෙලාවට වැස්සක් වැටුණානේ. ඒකත් හොඳයි, දැන් මට ඔයාව හමුවුණානේ.'

කුසගින්න ත්, සීතල ත් දෙගිඩියාව ත් නිසා මම දැඩි ලෙස පීඩා විඳිමින් සිටියෙමි. අම්මා හිතනවාට වඩා ලොකු මුදලක් කොළඹ නගරයේ මා අතින් වියදම් වී ය. දැන් ඉතිං උදේ පණ්ඩිතකමට කීවා මෙන් අප්පච්චිට අවශ්‍ය සියලු දේ මා සපයා දිය යුතු ය. පාසැල් යා යුතු ය. ටියුෂන් යා යුතු ය. කලා උළෙල ද අත ළඟ ය.

'යමු.'

මම පාරට පැන්නෙමි. චාපා මා අනුගමනය කළා ය. වාහන අතරින් කඩිනමින් ගමන් කොට තරප්පු පෙළ දිගේ ඉහළ මාලයට ගිය අපි කෙළවරේ අසුනක වාඩි වුණෙමු. අපේ තෙත අඩිපාර පෙළට සිමෙන්තියේ සටහන් වී ය. චාපා දැතින් ගවුම අල්ලා රැළි පොඩි නොවන්නට මෙන් සිරුවට පුටුවේ වාඩි වූවා ය. පොඩි වන්නට රැළි ඇගේ ගවුමේ නැත. මා මෙන් දෙගුණයක් චාපා තෙත බරිත වී හමාර ය.

'ආ ලේන්සුව. ඔළුව පිහදගන්න.'

සාක්කුවේ පොඩි වී තිබූ ලේන්සුව මම චාපාට දුනිමි. ඕ හිස යන්තම් තෙත මාත්තු කොට ගෙන කෝපි දෙකකට ඇනවුම් කළා ය.

සත්තකින් ම මට ඕනෑකම තිබුණේ කෝපි බොන්නට නොවේ. බඩපුරා බත් කෑමට ය. සීතලය නිසා දෙගුණයක් වැඩි වූ කුසගින්න



මගේ දැන දෙපා අවුළුවන්නට සමත් ය. එම මගේ නොහික්මුණු පුරුද්දට සිගරැට්ටුවක් පත්තු කළෙමි.

'චාපා, අපි දෙන්නා විවෘතව කතා නොකළට අපි ගොඩාක් සමීප වෙලා කියල ඔයා පිළිගන්නව ඇති....'

'ඔව් කසුන්. ඔව්.'

'ඔයා දන්නවද මේකෙ අවසානෙ මොකක්ද කියලා?'

'සත්තකින්ම නෑ.'

'කොහොම වුණත් මගේ ගැන මං ඔයාට කියන්න ඕනෑ. ඒක මගේ යුතුකමක්. වරදවා හිතන්න එපා.

මම මේව කියන්නෙ අනුකම්පාව දිනා ගන්න නම් නෙමෙයි චාපා. මං කැමති නෑ මං අසරණයෙක් විදිහට හිතනවට.'

'කවදවත් නෑ. මට ඔයා ගැන අපැහැදීමක් නෑ.'

'අනික මං මේවා කියන්නෙ ඔයාගෙ ජීවිතේට ඇඟිලි ගහන්න නෙමෙයි. තවත් සමීප කරගන්නත් නෙමෙයි. මේ කෙටි කාලෙට අපි හමුවුණා, කතාකළා වැඩි වගේ. මගේ ජීවිතෙන් මං වැඩියමක් බලාපොරොත්තු වෙන්නෙ නෑ. ඒත් නංගියෙක් නැති මට, අයියෙක් නැති ඔයාට, සහෝදරත්වය තියා ගන්නවත් මේවා දැනගෙන ඉන්න එක හොඳයි.'

'මං වරදවා හිතන්නෙ නෑ කසුන්.'

තව දුරට ත් චාපා බැගෑපත් වූවා ය. ඇගේ නෙතු තාරකා නිමා දමන්නැ යි අයදින්නට මට සිතේ. ඇගේ දෑස දෙස බලා මට කටුක වූ දේ වේදනාවෙන් හඬ ගා කීමට නොහැකි ය. ඒත් මම කතා කළෙමි.

'ඔයාට පේනවද චාපා මේ මගේ අත් දෙක. ඔය ඇඟිලි මුල ගෙඩි ගැහිල පුපුරු ගහල තියෙන්නෙ උදැල්ලටයි දැකැත්තටයි. මං ගමේදී කුලී වැඩ කළා. මම සාමාන්‍ය පෙළ විභාග ප්‍රශ්න පත්‍රය හවස තියෙද්දී උදේට ගොයම් කපල තමයි බස් ගාස්තුව හොයා ගත්තෙ. හවසට ඉස්කෝලෙ ගිහිං ඇවිල්ල හැතැප්ම දෙක තුන තේ දළු ගෝනි

For E - Pusthakalaya

උස්සගෙන යනව ඉස්ටෝරුවට සත පනහක් හොයා ගන්න. මොකද, හේතුවක් නිසා මං කොළඹ ආව ඉගෙන ගන්ඩ කියල. ඒත් මේ මාස හයකට ඉගෙන ගත්තු දෙයක් නෑ. බෝඩිමේ ඇන්ටි වියන්දෙට කරන්නෙ සාරි එසෑ කරන එක. ඒත් අපේ අම්මට තියෙන්නෙ තුල් ඇදිවිව එක සාරියක් විතරයි. උදේ දහයට හවස තුනට අපි මෙහෙදී වෙලාවට කෑ හොනවා. මට මගේ අම්ම මතක් වෙනවා. අම්ම උදේ ඉදල හවස් වෙනකල් මයෙ වැලි ගොඩදනව. වතුර උගුරක්වත් නැතුව අම්මයි අප්පච්චියි විඳින්න ඕන හැම දුකක්ම විඳල තියනව අපි හින්ද. ඉතිං ඒ අප්පච්චි ඉස්පිරිතාලෙ නැවතුණාම බදු බල්ලෙක් නැති මේ නගරේ මං මොනවා කරන්නද? මං මේ ගිහාත් හමුවෙන්න යන්නෙ. බත්තරමුල්ලෙ. තලංගමට. සල්ලි කීයක්හරි ඉල්ලගෙන එන්න.'

වාපා ඇස් උඩ ඉන්දවා ගෙන අසා සිටි. මගේ දෑසින් ලෝකයා කෙරේ තිබූ වෛරයේ ගිනි පුළිඟු පිට වෙන්නට ඇත.

'ඔයාට තේරෙනවද? ඔයාට තේරෙනවද මේ ලෝකේ සුන්දර නැතත් නොමෙයි කියලා? මං තවම දවාලට කෑවේ නෑ... තවම උදේට කෑවේ නෑ... ජීවිතේ ගැන සැහැල්ලුවට හිතලා නාස්ති වෙන්න එපා සුදු නංගී... මගෙ සුදු නංගී... කියන්න. මං කියන දේ ඔයාට තේරෙනවද කියලා?'

ජීවිතේ ප්‍රථම වතාවට මම අනන්ත සෙනෙහසකින් වාපාට 'සුදු නංගී' යනුවෙන් ඇමතුවෙමි. වාපා මේසයට නැඹුරු වී මගේ දෑත ගෙන සිහිලුවට පිරි මැද්දා ය. සීතල කඳුළක් එහි වැටුණා දැයි මම නොදනිමි. එසෙත් වාපා ඉතා ම මුදු ස්වරයෙන් මෙසේ කීවා ය.

'කියන්න කසුන්. ඔයාගේ සුදු නංගිට බැරිද ඔයාගේ කසුන් අයියට පිහිට වෙන්න?'

මම මගේ අත මේසයේ කෙළවර දක්වා දිගු කළෙමි. වාපා ඇගේ නිකට මගේ අල්ල මත රැඳවූවා ය.

'කසුන්, ඔයා ගිහාත්ගෙන් සල්ලි ඉල්ලන්න එපා. මං ඔයාගේ නංගී. මං ඔයාගේ සුදු නංගී. මගේ ළඟ ඕන තරම් සල්ලි තියනවා. කසුන් වරදවා තේරුම් ගන්න දෙයක් නොමෙයිනේ අප්පච්චි කොළඹ ඉන්න කල් අපි දෙන්න එයාව බලාගමු.'



මම මගේ අත මෙහෙට ඇද ගත්තෙමි. 'ටක්' ගා ඇගේ නිකට මේසයේ වැදුණි. දත් දෙපෙළට වාපාගේ දෙතොල තද වී රිදෙන්නට ඇත.

'ඔයාට තරහා ගියාද?'

දෙතොල තෙමා ගනිමින් වාපා ඇසුවා ය. මම ම'සිතේ තිබූ වාකුල වූ වෛරය වාපා වෙතින් පිට කිරීමට උත්සාහ ගත්තාක් වැනි හැඟීමක් ඇති වී ය. ඇගේ මුහුණ රතු වී තිබිණ.

'මම කෙනෙකුට යටත් වෙන්න කැමති නෑ වාපා. ඔයාගෙන් සල්ලි ගත්තොත් මට ඒක මදිකමක්. මං අභිංසකයෙක් වින්තිය ඇත්ත. ඒත් මං අසරණයෙක් වෙන්න කැමති නෑ. ඇයි ඔයා මගේ ප්‍රශ්නවලට මැදිවෙන්න හදන්නෙ?'

තරමක වේගයකින් මම ඇසුවෙමි. දවල් නොකා නොබී සිටීමේ කුසගින්න ද මට දැනෙමින් තිබිණ. වාපාගේ තෙත් වූ වත මඩල වියළී යමින් තිබිණ. ඇගේ ගෙලේ තරමක දහදිය බිඳු කීපයක් නැඟිණ. සංසාරගත බලාපොරොත්තුවක මෙහෙසිය මා ඉදිරිපිට වාඩි වී සිටී ද? ඈ කෑම දෙකකට ඇනවුම් කළා ය. අපි දෙදෙනා ම කුස පිරෙන්නට කෑම කා පාරට බැස්සෙමු. මැලිබන් හෝටලයෙන් බත් පාර්සලයක් ද, කෙසෙල් ඇවරියක් ද, මාමයිට් බෝතලයක් ද මිල දී ගත්තේ වාපා විසිනි. මම කිසිවක් නොදෙඩුවෙමි. සුදු නංගී සියල්ල ම බ්‍රවුන් පේපර් බෑගයකට දමා පාර්සල් කළා ය.

'දැන් හරි, යමු.'

වාපා මගේ අතේ එල්ලුණා ය. මා සිතට සැහැල්ලුවක් දැනිණ. මම තදින් සුසුමක් පිට කළෙමි.

'ඇයි කසුන්?'

'නෑ, තව වෙලා තියනවනේ අප්පච්චි බලන්න යන්න. ඒකයි කල්පනා කළේ.'

'අපි වෙන කොහේ හරි යමු.'

For E - Pusthakalaya

වාපා ඉක්මන් වූවා ය. ඇය මගේ අත, අත හැරියේ ද නැත. වනිතයෙනින් තොරව මම මගට ප්‍රවිසියෙමි. බොරැල්ලේ සිට නගර ශාලාව දක්වා බසයකින් ගමන් කළ අපි මහජන පුස්තකාලය දක්වා පයින් ගමන් කළෙමු.

'අපි මෙහෙම ගියා වගේ නෙමෙයි. රොහාන් එහෙම දැක්කොත් විප්ලවක් වෙන්නේ නෑ.'

සුදු නංගි එසේ කීවේ මා වරදක් කළ පරිද්දෙනි.

'මම වරදක් කරලා නෑ වාපා. එහෙම එකේ මම කාටවත් බය නෑ. බයගුල්ලෙක් වගේ ජීවත්වෙන්න බෑනේ.'

මම ඇගේ අත දැඩිව අල්ලා ගතිමි. අපි දෙදෙනා නිහඬවකින්, අරමුණකින් තොරව 'කලා භවන' පැත්තට ඇවිද ගියෙමු. විහාර මහා දේවී උද්‍යානයේ අරුලතා යට මුමුණන, උණුසුම් වන පෙම්වත්තු ලතා මඩුල යට සැඟවී සිටිති. කතා බහකින් තොරව ම අපි එහි ඇතුළු වීමු. එළිමහන් රංග පීඨයට මෙහා මාර ගසක් මුල තණ නිල්ලේ අපි වාඩි වුණෙමු.

පත්තනින් ම අප අතර ප්‍රේමයක් වී ද?

'කසුන් ඔයා වැඩියම ආදරේ කාටද?'

වාපා හිටි ගමන් විමසුවා ය. 'මට' යනුවෙන් මම උත්තර දුනිමි.

'ඔයා කවදාහරි කෙල්ලෙකුට ආදරේ කළොත් එයා කවුරු වගේ කෙනෙක් වෙන්න ඕනැද?'

'කොණ්ඩය දිග, හුරතල් මූණක් තියන ලස්සන ඇස් දෙකක් තියන, ලෝකයක් වටින හදවතක් තියෙන කෙල්ලෙකුට.'

මම සුදු නංගීගේ මුහුණ දෙස බලා උත්තර දෙන ගමන් ඇගේ අත ලිහිල් කළෙමි.

'හරියට මම වගේ....'

වාපා මගේ දෑසට කිමිදී විමසී ය.

'ඔව් වාපා. සත්තකින්ම ඔව්. මම ඔයා වගේ රත්තරං සිරි නංගියෙකුට ආදරේ.'



මම කීවේ ඇත්තට ම ය. වාපා වැනි ළඳක් කෙරේ මසිතේ සංසාරගත ප්‍රේමයක් මතු වෙමින් තිබිණ.

'කසුන් ඇයි අපි හිතට හොරා ඇත් වෙලා ඉන්නෙ? මං නොකීවාට ඔයාම දන්නවා දැන් අපි - අපි ගැන දන්නවා. මට රටක් රාජ්‍යයක් අල්ලන්න ඕන නෑ කසුන්. සත්තකින්ම මම ඔයාව නිතරම හීනෙන් දකිනවා. මට දැන් ඔයාව නොදැක ඉන්න බෑ. මම මේවා සේරම අම්මලට ලියලා අරිනවා. එතකොට රොහාන්ගේ ප්‍රශ්නේ වුණත් අම්මලා මැදිහත් වෙලා විසඳයි.'

සුදු නංගි මගේ දෑත තරයේ අල්ලා ගෙන කීවා ය. මම ගහක් ගලක් මෙන් නොසෙල්වී සිටියෙමි. සුදු සුමුදු පහසක් මගේ සිතේ ඇතුළාන්තය සකිය වන්නට වි ය. කල්ප කාලයක් නිදි ගැන්වී තිබූ ආත්මීය හැඟීම් පොකුරක් ක්ෂණයකින් අවදි වි ය. මම සුදු නංගීගේ සුරත් පැහැ අත අල්ලා ගතිමි. කිසි ද නොවූ විරූ සෙනෙහසක උණුසුම එහි කැටි වී තිබිණ. මම අත ගෙන දෙතොලට තබා තද කර ගත්තෙමි. වාපා දෑස අඩවන් කළා ය. මම වැරෙන් ඇය මගේ ළමැදට තබා තද කර ගතිමි. හුස්ම හිර වී ගියාක් මෙන් වි ය. නොදෙඩා නොකියවූ කතාවක හෝරාවක් පමණ එසේ ගෙවී යන්නට වි ය. පපුවට මුහුණ තද කර ගත් සුදු නංගි ඉකිලන්නට වූවා ය. මම දකුණතින් ඇගේ හිස පිරි මැද්දෙමි. පිට ත් පපුව ත් තිගැස්සෙන රිද්මය මට දැනේ. මගේ පපුව දැවී යන්නට වි ය. නෙත කඳුළක සීතල මසිත සිසිල් කළේ ය.

'හැමදම මාව මෙහෙම ළඟ තියාගන්න කසුන්....'

වාපා හඬමින් කීවා ය. මම හෙමි හෙමින් ඇගේ හිස පිරි මැද්දෙමි. ඇගේ වමත හරවා මම වේලාව බැලීමි. 4.55 යි.

'සුදුනංගී..... වෙලාව හරි. අපි යමුද? පහට අප්පච්චී බලන්න ඕන.'

නිදි ගැන්වී සිට කලෙක මෙන් වාපා අවදි වූවා ය. හිසකෙස් රොද ත් ඇඳුම ත් සකස් කර ගත්ති ය.

'යමු කසුන් ඉක්මන් කරලා.'

For E - Pusthakalaya

මිත් සෙනෙහස උතුරා යන ලෙන්ගතුකම අපේ දෑත් පටලා සිපින. ඉතින් මම අත ලිහිල් නොකළෙමි. උද්‍යානය මැද්දෙන් ගිය පිළිමය ඇති දෙසට ඇවිද ආ අපි රෝහල් කොරිඩෝරයේ නතර වීමු.

'කසුන් මම මෙතන ඉන්නම්. ඔයා ගිහිං අප්පච්චි බලල එන්න. මම එතරම් හරි නෑ වගේ නේද?'

මම අප්පච්චිට පාර්සලය දී කතා කරමින් පැය භාගයක් පමණ වාඩිවී සිටියෙමි.

'ඔපරේෂන් කරන්න ඕන කිව්වා පොඩි පුතේ. උඹ අම්මාට ලියුමක් දාං සිස් වෙනිද ඔපරේෂන් කරනව කියලා...'

අප්පච්චි කීවේ ය. සද්දන්තයකු වූ මගේ අප්පච්චි රෝහල් ඇඳක් මත දිගැදී සිටිනසුරු මට ඉහිලුම් නොදෙන්නක් වී ය. මම බත් පාර්සලය ලිහා මගේ අප්පච්චිට බත් කැව්වෙමි.

'උඹ කාලද පුතේ?'

'ඔව් අප්පච්චි.'

අප්පච්චිගේ අඩුපාඩු සියල්ල විමසා මම කඩිනමින් කොරිඩෝරයට වැදුණෙමි. සුදු නංගී මා එන තෙක් එහි මග බලා සිටියා ය.

ඇස් පුංචි කොට සුදු නංගී මාව තේරුම් ගැනීමට මෙන් මා දෙස බලා සෙමි අව් කඩින්නට වූවා ය. අපි මහපාරට වැදුණෙමු.

'ඔයාගෙ විභාගෙ ඉවර වෙලා රස්සාවක් ලැබුණම අපිට බඳින්න පුළුවන්. මම අම්මලට මේව සේරම කියල ලියුමක් අරිනව. අම්මා එකට කැමති වෙයි නේද කසුන්?'

'මම හිතන්නෑ.'

'ඇයි ඒ?'

'අපිට ඕනෑ විදිහට ලෝකෙ කැරකෙනව නම් මෙලෝකට පිච්චිලා යෑ වෙලා. සුදු නංගී දන්නෙ කොච්චර පුංචි සීමාවක් විතරද—



අම්මල, තාත්තල, නැන්දල, මාමල, රොහාන්ල අපේ සම්බන්ධයක් තියනව කියල දැනගත්ත ගමන් පොලිස් බල්ලෝ ටික වගේ මගෙ පස්සෙන් එළවයි. උන් මාව හප කරල දමාවි. ඒ නිසා මං ඔච්චර දුර හිතන්නෙ නෑ සුදු නංගී.'

'අනේ කසුන් ඔයා මට ආදරේ නැද්ද?'

'ආදරේ.... මගේ පණටත් වැඩිය මං ඔයාට ආදරෙයි චාපා.'

'ඉතිං?'

'මේ ලෝකෙ හැම දෙයක්ම තීරණය කරන්නෙ මුදල්. මං මස් කඩ මුදලාලියෙක් වුණත් ඔයා මට බන්දල දෙයි සල්ලි තියෙනවනම්. ආදරේ තියෙන හැම කෙනාටම තමන්ගේ අදහස් මුදුන්පත් කර ගන්න පුළුවන් නම් මේ රටේ පෙම්වතුන් වහබීල, බෙල්ලෙ වැල දාගෙන මැරෙන්නෙ නෑ සුදු නංගී.'

'ඔයා මාව බය කරනව.'

චාපාගේ දෑස තිගැස්සී නතර වෙන ගමන් මගේ අතින් අල්ලා එසේ කීවා ය. මම ඒ අත සුරැකිව අල්ලා ගතිමි. නොඉදුල් උණුසුමක පෙම්වත් පහසක් එහි සිට මගේ සිරුරේ ඇතුලාන්තය දක්වා ගිලා බැසී.

'මං ඔයාව බය කරනව නෙමෙයි චාපා. මේ ලෝකෙට සෙත සැලසුණේ මහ ප්‍රාසාදවල බුමුතුරුණු මත්තේ විල්ලුද සිහින දැක්ක තොරොම්බල් පණ්ඩිතයන්ගෙං නෙමෙයි. ශ්‍රේෂ්ඨයෝ බිහිවුණේ මහපාරේ අගුපිල්වලින්. සල්ගස් යටින්, ගව ගාල්වලින්. ඒත් ලෝකෙ පාලනය කළේ හුරතලේට හැදිච්ච පියරු බබාල. උන් කවදවත් මං වාගේ හිඟන්නෙකුට ඔයා අයිති වෙන්න දීල නිකං ඉන්නෙ නෑ.'

'ඔයා මහ පුදුම දේවල් කියන්නෙ.'

'මම ඇත්ත කියන්නෙ. මහ පොළවෙ පයගහල ඉඳල, දැකල,කියවල මං ලෝකෙ ඇත්ත දැක්ක. මම මනුස්සයෙක්. ඔයා මනුස්ස දුවක්. මට ඔයා ගැන සත්තකින්ම ආදරයක් හිතුණ. සමහරවිට ඔයා ඒක වැඩිවෙන විදිහට හැසිරෙන්න ඇති. මට මේව ඔයාට කියන්න උවමනා වුණේ නෑ. එච්චරයි....'

For E - Posthakalaya

'ඔයා හිතන්න අම්මල මාව රොහාන්ටම බන්දල දෙයි කියලා? මම වග වීකක් කාල මැරෙනව ඊට හොඳයි.'

'රොහාන්ට කොහොම වුණත් රොහාන් වගේ කෙනෙකුට.'

මම කතාව නැවැත්තුවෙමි. වාපාගේ මුහුණ අව්වට මැළ වී, වියැකී යනු මට පෙනේ. එහෙත් ඇය ලතාවකට ගමන් කරයි. ඇය බෙහෙවින් කල්පනාකාරී ය.

'අපි මේ ගැන කාටවත් නොකිය ඉමු කසුන්. මම අම්මටත් දැන්ම ලියල අරින්නෙ නැ. අපි දෙන්නාම හොඳට විභාගෙ කරමු. ඊට පස්සෙ මම ගෙදරට කියන්නම්. එහෙම හොඳයි නේද?'

දෙපා වෙව්ලා එකට ගැටෙතැ යි යන බියකින් මෙන් වාපා මග හරහ වූවා ය. නගර ශාලාව වටා මග බෙහෙවින් කරදරකාරී වී ය. මඟතොට ඇවිදින කිසි කෙනෙකුට තව කෙනෙකුගේ වගතුගක් නැත. නගර ශාලාව ඉදිරිපිට තණකොළ ගොල්ලේ හිඟන දරුවන් දෙදෙනෙකු ගුටි ඇන ගන්නවා මට පෙනේ. අහසින් වැටුණු ඒ සොදුරුවන් දෙස මම නෙත් නොහෙළා බලා උනිමි.

'ඔයා ඔච්චර මොනවද කල්පනා කරන්නෙ?'

වාපා වට වඩාත් මවෙතට ඇදෙමින් ඇගේ දෑවටී කීවා ය. මම ක්ෂණයකින් ඇය දෙසට හැරුණෙමි. සුදු නංගීගේ දෙනෙතින් කඳුළු ගලයි.

'මට හරි බය හිතෙනව. අපිට මොකුත් කරදරයක් ප්‍රශ්නයක් වෙන එකක් නැ කසුන්. ඔයා මාව බය කරන්න එපා. මාව පිච්චෙනවා වගේ දැනෙනවා. මං මහ ගිනිගොඩක ඉන්නෙ. කවම කවදාකවත් මං ඔයාව අමතක කරන්නෙ නැ. මං හෙවණැල්ලක් වගේ ඔයා ළඟින් ඉන්නම් කසුන්.'

'කාලාන්තරයක් ඔයා ගැන බලාපොරොත්තුව ඉඳල නිකංම නිකං බිත් බැලයෙක් ඔයාව ඩැහැගෙන ගියොත් එහෙම මං මුළු ලෝකෙටම වෛර කරයි...'

විහාර මහා දේවී උයනේ ලස්සන් මැයි මල් ඇතින් පෙනේ. මල් වාරය දැන් අහවර වීමට ළඟ ය. මල් පිපෙන ලෝකය කො



තරම් සුන්දර ද? මල් සුවඳට ආදරය කරන අප සිත් කෙ තරම් පිවිතුරු ද? එහෙත් විෂ දෙබරුන් මලට ත් හෝරා මලේ සුවඳ උදුරා ගන්නා ලෝකය කෙ තරම් පවිටු ද? අපි ආදරයෙන් බැඳී සිටිමු. එහෙත් එය අනියත හෙට දිනක සිහිනයක් දැයි අපි ම නොදත්තෙමු.

බොහෝ සේ ව්‍යාකූල වූ වික්ෂිප්ත සිතුවිලි සහිතව අපි දෙදෙනා රොස්මිඩ් පෙදෙස දක්වා පයින් ඇවිද ආවෙමු. වාපා රොස්මිඩ් පෙදෙස ළඟින් වමට හැරෙත් ම කැලිෆෝනියා කාරය අප අසළ නැවතිණ. රොහාන් මුලින් ම ඉන් බිමට බැස්සේ ය. ටී ෂර්ට් ඇඳ සිටි තවත් එ වැනි තරුණයෝ තිදෙනෙක් අනතුරුව ඉන් බිමට බැස මා ඉදිරියට ආ හ. රොහාන් කඩිනමින් ගොස් වාපාගේ අත අල්ලා ගත්තේ ය. 'ඩිග්' 'ඩිග්' යන හඬින් මට හතර වටින් ම පහර වදින්ට වි ය. මගේ දෑස නිලංකාර වී ගිය අතර මම පහර වළකන්නට උත්සාහ කළෙමි. එහෙත් මට බේරුමක් නොවිණි. හැඩි දැඩි තරුණයෝ තුන් පැත්තකින් මට පහර දුන් හ. මම බිම ඇද වැටුණෙමි. දැස් පියා ගතිමි. නළල පුපුරා ලේ බිංදු බිංදු ගලා යනු මට යාන්තමට දැනේ.... සෙනඟ වට වෙනවා ත් මගේ ඇස් නිලංකාර වනවා ත් මට මතක ය. මගේ වම් අත 'ටකස්' ගා අඹරා දමද්දී මම විලාප දුනිමි.

# 8

ඇයට සෙනෙහස පුද කළ සිතින්, කඳුළු සෙනෙහසින් සිප ගත් නැවුමින්, දොත මත දෙත තබා ගෙපර කළ ආදර සිහිනයෙක් මම අවදි වීමි. මගේ වම් අත රොහාන්ගේ බත් බැලයන් විසින් තඩා දමා තිබිණ. දින දෙකක් මම සිහිසුන්ව සිටියෙමි. ඔවුනට අවැසිව තිබුණේ මා මරා දමන්නට දැයි මම අදත් නොදනිමි. ජීවිතය ඇති තෙක් මලක් මෙන් මා අත රැඳෙන්නට ඇය පිළිණ දුන් කල, සුදු නංගී මිරිකුවකු යි මට නොසිතුණේ ඇයි? මේ සියල්ල ගැන ම මා කලකිරුණේ නැත. මම ගිහාන්ලාගේ බත්තරමුල්ලේ නිවසේ නතර වී තේගිරිස් වෙද මහතාගෙන් අතට බෙහෙත් කළෙමි. තළල තවමත් බැන්ඩේජ්වලින් වෙළා ඇත. මැලුම් සපා නැවතත් තුවාලයට බෙහෙත් දැම්මේ පෙරේද ය. බිලත යහනේ සිට වාසාගේ ඇඟිලි තුඩු පිරි මදිමින් සියල්ල නැ සපා කියන්නට මට අවැසිව තිබේ. එහෙත් අත සොවන්නට බැරි දුකට අපට වෙන් කොට තිබිණ. සුදු නංගී තඩා වැළපෙන බව මම දුටිමි. තුවාලවලට වඩා දහසක් වේදනා මට වාසාගේ රත්තරං ඇත්මය වෙනුවෙන් උපදී. ඇගේ රත් පැහැ දෑසට උණුසුම් සුසුමක් කළා සිත සනහා ලන්නට, මේ සියල්ල කියා ගන්නට මට අවැසිව තිබේ.

මට පහර දුන් රොහාන් මැරවරයන් සමඟ වාසා රැගෙන ගොස් තිබිණ. ඔවුන් වැලිසිස් මෙන්ෆීරාම් පෙදෙසේ අංක තුන දරන බෝඩිම කාමරයට ගෙන් රහ සිත්කලුවන්ට මා එළවා දමන්නැයි තර්ජනය කොට තිබිණ. මත මත වැඩී සිටි මා කොළඹ රෝහලට ඇතුළත්



For E - Pusthakalaya

කොට තිබුණේ මරදානේ ත්‍රී රෝද රථ රියැදුරෙකු විසිනි. සිහිය ලත් විගස මා මිතුරන්ගේ නම් කී හෙයින් ගිහාන් හා නිරංග මා සමීපයට වූ හ. අප්පච්චිගේ ඕනෑ එපාකම් සියල්ල ඉටු කර තිබුණේ ගිහාන් හා නිරංග ය. එහෙත් අප්පච්චි ආරංචිය දැන ගෙන තිබුණේ බෝඩිමේ ඇන්ටිගෙනි. අම්මා ද කලබල වී කොළඹට නැවත දිව ආවා ය. නැ ගසා, හඩා, විලාප දී මගේ අම්මා මට ගමට එන මෙන් නැවත නැවතත් ඉල්ලා සිටියා ය.

'උඹට මේකේ ඉඳලා හරි යන්නේ නැ පුතේ. ගමේ යමං. එහේ ඉස්කෝලේ උඹට හොඳයි. මුංට හෙණ හත ගහන්න එපැයි මේ කරපු අපරාදෙට. ඕකුංගේ හතර හංදි බිඳෙනවා පුතේ කවද හරි.... අතක් පයක් නොකඩ මං මගේ කොල්ල හැදුවේ ඕකුංගෙන් ගුටි කන්න නෙමෙයි.'

අම්මා ඇදේ පහළ කෙළවරේ වාඩි වී ගිහාන්ගේ මව සමඟ තිවා ය. අප්පච්චි තිස් වෙනි ද ඔපරේෂන් කළ බව මට කීවේ නිරංග යි. ගිහාන් අවශ්‍ය මුදල් පමණක් නොව හැම ද ම කෑම පාර්සලයක් මගේ අප්පච්චිට ගෙන ගොස් දී තිබිණ.

'අප්පච්චිට නම් සනීප වෙන එකක් නැ. ස්නායු දුර්වල වෙලාලු. ඩොක්ටර් කිව්ව කරදර නොවී ගෙදර එක්ක ගිහිං හොඳින් බලා ගන්න කියලා. දැන් හොඳ කරන්න බැරිලු.'

දින තුනකට පසු නිරංග කීවේ ය. එ දින මම පිය සෙනෙහස වෙනුවෙන් හදවතින් හැඬුවෙමි. මගේ දෙනෙත් පෑදූ අප්පච්චි මගේ අනාගතය දකින්නේ කෙසේ ද? උත්තරා නංගී ද පියාට හොරෙන් පැමිණ මගේ පියාගේ සුව දුක් බලා තිබිණ. උත්තරා නංගී මට නිරංග අත ලියුම් කැබැල්ලක් එවුවා ය.

වෙච්ච සිද්ධිය ආරංචියි. මට හරි දුකයි. මට පුළුවන්කමක් නැ ඔයාව බලන්න එන්න. රොහාන්ගෙ අම්මලා ඇවිල්ලලු. වාසා දැන් ආයෙත් රොස්මිඩ් ප්ලේස්වලින් ගිහිල්ලා. රත්මලානේ සිරිමල් උයනේ ඉන්නේ. මම එහේ ගියා. එයාගේ වැඩේ මී හරකි වගේ අඩන එක. රොහාන්ලා අම්මා කියනවා 'මේකිට පිස්සු' කියලා. ඔයා ගැන කියවනවා. රොහාන් ගෙදර නැ. ලන්ඩනවලට ගිහිල්ල. මං ගිහාන්ගෙන්

For E - Pusthakalaya

නිත්‍යස් වැඩකට. එන ගමන් නයිජීරියා ගිහිල්ල චාපාගේ අම්මා තාත්තා හමුවෙනවා කියලත් කිව්වා. ඔයා ඉක්මනින් සනීප වෙන්න. මං අප්පච්චිට හොරෙන් මේ ආවේ. 'ගේට් වේ' එකේ ක්ලාස් යන ගමන් තොරතුරක් දැන ගත්තොත් මං පණිවිඩේ එවන්නම්. ඔයා ඉක්මනින් සනීප කරන්න කියලා මම බුදුන්ට කියනවා නිතරම. එතකොට මං ඔයාට චාපා මුණ ගස්වන්නම්....

මං උත්තරා නංගී.

පාසැල පිළිබඳව ත්, මා වැටී ඇති අගාධය පිළිබඳව ත්, මම කල්පනා කරමි. විභාගයට හරියට ම නව මාස දහයකි. මගේ මනසේ විෂය කරුණු කිසිවක් නැත. බොහෝ දේ මගෙන් දුරස් නොවී ද? තව දුරට ත් මට ගිහාන්ගේ නිවසේ නතර වී සිටින්නට පුළුවන්කමක් නැත. මා හුදෙකලා වන්නේ කෙසේ ද? ලෝකය ම තරඟකාරී ලෙස දිව යයි. අඳුරු අවන් හලකට ගොඩ වැදී හෝරා ගණන් ඇඟිලි තුඩු පිරි මදිමින් චාපා කතා කළ සුන්දර වචන මට සිහි වේ. මද්දහනේ මුසල මහා වැස්සකට තෙමෙමින් තෙත බරිත වී මහමග ඇවිද ගිය හැටි මට සිහි වේ. උයන් තෙර ලතා මඩුල්ලක සැඟ වී කුරුලේ, නිසංසලේ, මගේ ළමැදේ සිරස හොවා ගෙන සුදු නංගී දැස පියා ගෙන සිටි අයුරු මට සිහි වේ. ඒ සියල්ලට ම වැට කඩොලු බැඳුණේ නොවේ දැයි මම සිතමි. ඈ ඉතිරි කළ පුවඳ පිඩ පමණකින් මම හදවත පතුලින් ම සුරකිමින් සිටිමි.

මා අවබෝධ කොට ගෙන ඇත්තේ මේ පමණකි. සුදු නංගීගේ සුමුදු දෙතොලක, ආදරණීය වදනක, අවිහිංසක බැල්මක දිය වී තිබූ ආදරය පිවිතුරු ය. ඇගේ දැසින් නැඟුණු හැම කඳුළක් ම උත්තරීතර ය. නැහුම්බර ය. මා පෙම් කළේ එකී පාරිශුද්ධ ආත්මයට නොවේ ද? දුසිසින් දැන් තීරණය වෙනස් නොකළ යුතු ය. චාපා කෙසේ හෝ දිනා ගත යුතු නොවේ ද? බත් බැලයන් මට පහර දුන්න ද ඔවුන්ට අපේ ප්‍රේමය බිඳ දමන්ට ඉඩ දිය යුතු නැත.

බැන්ඩේජ් පටියකින් අත වෙළා කරේ එල්ලා ගෙන හිස කෙළින් කොට ගත හැකි වූ විගස මම ගිහාන් හා නිරංග සමඟ ගල්කිස්සට ගියෙමි. බෝඩිමේ සියලු දෙනා විස්මිත්තව මා දෙස බැලූ හ. බෝඩිමේ



ඇන්ටි කුස්සියේ සිට සියල්ලන් ම පසු කර ගෙන අප ඉදිරියට ආවා ය. මගේ මුහුණු දෙස කෙලින් ම බලා එක දිගට කියා ගෙන ගියාය.

"ඔයා නම් ඉගෙන ගන්න ළමයෙක් නෙමෙයි. එහෙම අය මෙහේ තියා ගන්න අපි කැමති නෑ. කලුන් වෙන බෝඩිමක් හොයා ගන්න. දැන් යාළුවෝ එහෙම ඉන්නවනේ."

මම බෝඩිමේ ඇන්ටි දෙස දයාන්විතව බැලීමි. සත්තකින් ම ඇය මගේ අම්මා වගේ ය. ළෙන්ගතු ය. දයාබරිත ය. ඔවුනට මං අප්‍රසන්න මිනිසෙකු වූයේ කෙසේ ද? පළමුවෙන් ම තර්ස්ටනයේ තිබුණු විවාදය සඳහා ටයි එක ගැනීමට පවා මුදල් දුන්නේ ඇය නොවේ ද? මගේ දෑසේ මා වෙනුවෙන් උපන් කඳුළු සැඟවිණ. හිතට දිරි ගත් මම ඇඳුම් කැලි කීපය සිලි සිලි බෑගයක දමා පොත්පත් විස්කෝතු පෙට්ටියක අහුරා ඔවුනට ආචාර කොට සමු ගතිමි.

9

සියල්ල වෙනස්වීම කරමින් මගේ ජීවිතය පුපුරා හැලෙමින් තිබිණ. අතරිං පූර්වකු සේ නිබන්ධන හා සටහන් ද පොදි ගසමින් මාසයක් පමණ මම එක් එක් මිතුරන්ගේ ගෙවල නැවතුණෙමි. එහෙත් ජීවිතයට සදාකාලික නැවතුම්පළක් තබා ඉගෙනීම කරන තෙක් මට තාවකාලික බෝඩිමක් පවා නොතිබිණ.

මහජ දත්වා විත් ජීවිතය සකසියවන්නට පෙර ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට මම අසමත් වීමි. අවසානයේ විභාගයට සිව් මසක් පමණ තිබිය දී මම පිරදෙන් සිරිටම්ම මාවතේ ලැලි ගෙදරක නැවතුණෙමි. ජීවිතය මෙන් ම එහි පරිසරය ද බෙහෙවින් කටුක ය. මානසික වධහිංසා පමණක් නොව බොහෝ අප්‍රසන්න සිදුවීම් මා පසු පස හඹා එන්නට වී ය. අප්පච්චී සදාකාලික රෝගියෙක්ව රෝහලින් පිට වී ගම බලා ගියේ ය. අම්මාට අප්පච්චී බලා ගන්නවා හැරෙන්නට කුලී වැඩක් වත් කිරීම අපහසු වී ය. උදේට පෝරසේ කඩෙන් ඉඳිආප්ප දෙක තුනක් බිල දමා තර්ස්ටනයට ගිය මම මුළු දවස පුරා කුසගින්නේ සිටියෙමි. වතුර රද මෙද තුර මට හමු වූයේ නැත. එ තැන් පටන් ජීවිතය අපායක් වී ය. කොල් විකා ගනිමින් මම බොහෝ දිනවල රාත්‍රි මැදියම දක්වා නිදි වරමින් පාඩම් කළෙමි. කාලකන්නි රස්තියාදුකාරයකු මෙන් මම දිවි පුරා පවස් වරු මගේ ඇවිද ගියෙමි. විද්‍යා විෂයන් ඉගෙනීම මට මහත් වදයක් වී ය. පුස්තකාලයට ගිය ත්, ඉඳහිට කවි පොතක්, නවකතාවක් කියවීම හැර විෂයීය කටයුතු කිසිවක් නොකළෙමි. සාහිත්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස ත්, තර්ස්ටනයේ ශිෂ්‍ය



නායකයකු ලෙස ත් බොහෝ වගකීම් සම්භාරයක් මගේ කර මත තිබූ හෙයින් නිතිපතා මම පංතියේ විෂය කටයුතු මග හැරියෙමි. නියෝජ්‍ය විදුහල්පතිවරයා සමග සැලසුම් කොට කලා විෂයයන් කිරීමට ත්, කලා අංශයෙන් විභාගය ලිවීමට ත් මම තීරණය කළෙමි. විද්‍යා විෂයන්ට අදාළ සියලු ම පොත්පත් රාත්තල් ගණනට පුංචි බොරැල්ලේ රටකජු වෙළෙන්දෙකුට විකුණා කලා විෂයන් සම්බන්ධ පුනරීක්ෂණ පන්තිවලට ඇතුළත් වීමි. මමිතුරන් මට බොහෝ සේ සමච්චල් කළේ එ විට ය.

'යකෝ සයන්ස් කරල 'එෆ්' හතරක් ගත්තත් වටිනව ආට්ස් කරල ගන්න 'ඒ' හතරට වැඩිය...'

'මට උඹලට වගේ දුවන්නන් වාලෙ දුවන්න ඕනෑ නෑ...'

මම පිළිවදන් දුනිමි. උත්තරා නංගී හොර රහසේ ලොකු අප්පච්චීගේ කලා විෂයනට අදාළ පතපොත මට ගෙනැවිත් දුන් අතර මම ඇයට පිං පෙත් දුනිමි. බොහෝ විට උත්තරා මට අතේ තියෙන හැටියට මුදල් ද දුන්නී ය. උනන්දුව හා උද්යෝගය දෝරේ ගලද්දී ජීවිතය ශක්තිමත් වනවාක් මෙන් මට දැනිණ. මම දවල් රෑ නොබලා පාඩම් කළෙමි. මේ දිනවල කලා පංතිවල බොහෝ සිසුහු ද මගෙන් විෂය කරුණු, ගැටලු විසඳා ඉගෙනීමට උත්සුක වූ හ. මමිතුරෝ නැවතත් මා පිළිගත්තෝය.

'උඹ නම් මාර පොරක්....'

ඔවුන් කීවේ එ පමණකි. මේ දිනවල මා රාත්‍රි බෝඩිමට ගියේ බොහෝ රෑ බෝ වීමෙන් පසුව යි. ලුම්බිණි හෝ නවරංගහලේ නාට්‍යයක් බැලීමට ත්, පුස්තකාලයේ දී වෙලාව කා දැමීමට ත් මම පුරුදු වීමි. ලැලි බෝඩිම මිහිපිට අපායකි. රාත්‍රියට බීමතින් ඔවුහු කුණුහරුප කියා ගනිති. කෑ කෝ ගසති. පයිප්පයට ගිය ත්, වැසිකිළියට ගිය ත් තරගයකි. පෝලිමකි. පිළුණු පුස් ගඳක් මේ නිවහන පුරා විසිරේ. දැලි කුණු නිවස පුරා පිරිලා ය. මම සුදු ඇඳුම් සිලි සිලි බෑගයක දමා පරෙස්සම් කළෙමි. බෝඩිම හිමි මිස්ට සොයිසා මා පාඩම් කරන විට මිදුලේ කෑ කෝ ගසන කොලු කුරුට්ටන් එළවා දමයි.

For E - Pusthakalaya

'ජීවත ඔක ඔක නොගා පල්ලෝ..... බෝඩිමේ කසුන් මෙය පාඩම් කරනව.'

ඔහු හිමීට කියයි. කොලු හඬය ඉවත්ව නොගියොත් මිස්ට සොයිසා බෙරිහන් දෙයි.

'දුවසියව් එහා වත්තට, තොපේ අඩු බිඳින්න ඉස්සර....'

මා පොත පාඩම් කරද්දී සොයිසා රේස් කොළය පාඩම් කරයි. මගේ පොතපතට ත් වඩා ඔහු රේස් කොළය සුරකියි. පරෙස්සමට නමා කොහේ හෝ මුල්ලක සඟවයි. අශ්වයන්ගේ ජාතකය ත් සමඟ නම්, ගම්, වාසගම් කීමට ඔහු හපනෙකි.

අම්මාගෙන් ලිපි ලැබීම ප්‍රමාද වූ අතර මුදල් එවීම සම්පූර්ණයෙන් ම නතර වී ය. පාසැලට ඇතුළු වූ පසු මා ගෙදර ගියේ ද එක් වරකි. ඒ අප්පච්චී ගමට ගිය දවසේ ය. මුදල් හිඟ ම වූ විට නියෝජ්‍ය විදුහල්පති වරයාගෙන් හා පංති භාර ගුරුවරියගෙන් ද මම මුදල් ඉල්ලා ගතිමි. විවාද තරඟවලට යැමේ දී මා සතුව කෝට් එකක් නොතිබූ හෙයින් විදුහල්පතිවරයාගේ පරණ සුදු කෝට් එක නිරන්තරව ම මාවෙත තිළිණ කිරීමට තරම් ඔහු කාරුණික වී ය.

මේ දිනවල චාපා පිළිබඳ සිහිවිලි අළු යට සැඟවුණු ගිනි පුපුරු මෙන් නැවත නැවත මතු වී මා දවාලීමට සමත් වුව ද දෙතුන් විටක් හැර ඇය මුණ ගැසීමට මම උත්සාහ නොකළෙමි. චාපා පුරුදු පරිදි රෝහාන් සමඟ විහාරයට උදේට එයි. ඔහුගේ කාරයෙන් හවස යයි. මා පුස්තකාල ගමන නවතා දැමූ අතර උත්තරාට ද කිසිවක් කියා සිටියේ නැත. උත්තරා හමු වී දෙතුන් විටක් සුදු නංගී පිළිබඳ විමසීමේ දී උත්තරා බොහෝ පැකිලීමෙන් උත්තර දුන්නී ය. උත්තරා කීවේ මා තවත් බිය ගන්වන දේ ම ය.

'අනේ මන්ද කසුන් අයියේ. චාපට මොනව වෙලාද කියල. උදේ තාලු වෙලාවේ ඉඳන් මිනේ බලාගෙන ඉන්නවා. වෙනදනම් ඉන්ටවල් එකට සෙල්ලම් කරනව. දැන් එහෙමත් නෑ. එක්කො පොතක් කියවනව. සිංහලෙනුත් මහා අමුතු පොත්. විරාගය කියෙව්වා. ඇනා කැරනිනා කියෙව්වා. වදරිං හයිට්ස් කියෙව්වා. මහ පුදුම දෙයක්වෙලා තියෙන්නෙ. සිඳුපු ගමන් කරට අත දල හිනාවෙනවා. ඊට පස්සේ



බෙරිහන් දීල ඉකි ගගහ අඩනව. ඉස්සර වගේ දැන් කිසි දෙයක් කියන්න නෑ.'

මා නිසා චාපා පීඩා විඳිනැ යි සිතෙන විට මගේ හද දැවී යයි. මේ මුවැත්තිය තේරුම් ගැනීමට සත්තකින් ම කිසිවකුට නොහැකි වී යැයි මම සිතමි. ඇගේ ලෝකයේ රතු රෝසමල් පිපෙන දිනෙක මට මගේ කුටියේ සිට හුදෙකලාව බලා සිටින්නට පුළුවන. එහෙත් ඇ හඬද්දී සිනාසීමට තරම් මා කුරිරු වන්නේ කෙසේ ද? උණුසුම් හාදුවකින් උණුසුම් වූ දෙකොපුල හරහා කඳුළක් රූරා වැටෙද්දී ඇයට සමු දීමට මසිත ඉඩ දෙන්නේ නැත. රුදුරු ගිම්හානයක දී පවා ඇයට වසන්තයක් වීමට මම සිහින මවමි. මගේ හදවතේ ගැඹුරු ම තැනෙක චාපා නිදන්ගත වී සිටී. වරක් දෙවරක් නොව සිය දහස්වර සුදු නංගී දණහිස් මත දෑත ඔබා, හිස එහි රඳවා ඉකි ගසනවා දැක මම සිහිනෙන් පිබිදෙමි. ළඟ පාතක ඇය නැත. සත්තකින් ම ඇගේ සුවඳ පොදක් පවා මා අසලක නැත. ඈත ඈත අනන්ත ක්ෂිතිජ රේඛාවේ ම සැඟ වී ගියා වත් ද?

අපට හමු වීමට මගක් නොතිබූ කල තර්ජනයේ කලා උළෙල ළඟ ළඟ ම සූදනම් වී ය. එක ම එක වතාවක් හෝ ඇ දැක ගැනීමට මම පාරමී පිරුවෙමි. පළමු වතාවට මම උත්තරා අත ඇයට ලියුම් කැබැල්ලක් ඇරියෙමි.

ආදරණීය සුදු නංගී,

මම බලා සිටිමි. අප අසම්මත මිනිසුන් කළ අපට එරෙහි වූ ලෝකය තුළ ම අපේ ලෝකය ගොඩ නඟන්නට මම බලා සිටිමි.

ආදරණීය කසුන්.

For E - Pusthakalaya

# 10

කලා උළෙල අවසන් වුයේ සවස පහ ත් පසු වී ය. මම ගොළුවකිලිමත් වීමි. සියල්ලක් ම සතුටින් විසිර යද්දී මම චාපා සොයා ඇවුණෙමි. ඇගේ අභ්‍යන්තරය දැවී යන්නට මෙන් චාපා දිලිසෙන දෑසින් ම දෙස බැලුවා ය.

'හරි ලස්සනයි කසුන්. ඇත්තමයි.'

ඇගේ නෙත් සගල මගේ මුහුණ මත පතිත වී එහෙ මෙහෙ දුවයි. හරියට කලා උළෙලේ සාර්ථකත්වය මගේ මුහුණේ සැඟ වී ඇතුවාක් මෙනි. සසල නොවී මම ඈ දෙසට බැලුම් හෙළමි. ඇගේ දෑසට මගේ දෑස අල්ලා ගත් සුදු නංගී.....

'ලස්සනට කලා උළෙල කළා. ඔයා හරි වාසනාවන්තයි.'

සතුටින් කීවා ය. එයින් මසිතට ඇති වුණේ දුකක් ද සතුටක් ද යන්න නිශ්චිත නොවුණ ත් සුදු නංගී වැළඳ ගෙන නළලත සිප ගන්නට නම් මට සිත් වී ය. මදක් නිහඬ වූ අපි දෙදෙනා සෙනඟ අතරේ ම සැඟ වී පාරට වැටුණෙමු. යාන වාහනවල අමුත්තෝ එහෙ මෙහෙ යද්දී මම සුදු නංගීට දෑසින් ඉඟි කොට පාර පැන බඟකලේ පාර දෙසට ඇවිද ගෙන ගියෙමි. සැඳෑ වලාවලට ඉඩ දුන් හිරුමඬල ක්ෂිතිජයේ අහස රේඛාවේ සැඟ වී යමින් තිබුණ ද, ඉන් මතුවන් කළ චමත්කාරය විඳ ගන්නට මම අපොහොසත් වීමි. යාර සියයක් පමණ පාලු බඟකලේ පාරේ ගමන් කළ අපි හුදකලා වීමු. අනුදැනුමකින් තොරව මම සුදු නංගීගේ අතින් අල්ලුවෙමි.

දුකට පත් වූවෝ මිදු මොලොක් බවින් සහනය ලබති. මම කතා කළෙමි.

'කතා කරන්න සුදු නංගී, දුකෙන් ඉන්න එපා.'



'වැඩිකල් දුකින් ඉන්න බෑ කසුන්, හදවතේ තියෙන දේ එළියට පනිනවා. දුකට අඬන්න කඳුළු තිබුණාට මදි, දුක දරා ගන්න ශක්තියත් තියෙන්න ඕනෙ. මගේ ඒ ශක්තිය ටික ටික නැති වෙනවා.'

අපේ ගමනට වේගයක් නැත. සැඳෑව ගෙවෙනවා දැනුණේ ද නැත. පාසැල් ඇඳුම් පිටින් මහමග පෙම්බස් දෙඩීම වරදකැ යි සිතුණේ ද නැත.

'ඔයාගෙ හිත මට තේරෙනවා සුදු නංගී. ඔයාගේ ආත්මෙ අහිංසකයි. මම ඊට වඩා මුරණ්ඩුයි. මම දැන් මේ ගෙන්දගම් පොළවේ අඩිය ගහල ඉන්න බය නෑ. රොහාන් මගේ අත කැඩුවා. නළලේ මැහුම් දාන්න තුවාල කළා. ඌ කළේ මාව ශක්තිමත් කළ එක. කැළල මකන්න ලේසි නෑ. මට හැම දෙයකින්ම ජය ගන්න ඕනෑ. විද්‍යා විෂයන් නොකර මම කලා විෂයන් තෝර ගත්තෙ ඒකයි. බය වෙන්න එපා. දුක හිතන්න එපා. ශක්තිය නැතිකර ගන්න එපා. අපේ හිත් හරි හයියයි. සුදු නංගී. ආත්ම ගාණක් මෙහෙම පෙරුම් පුරල හමු වුණේ වෙන් වෙන්න නෙමෙයි. එකතු වෙන්න....'

මම සිනාසෙන්නට උත්සාහ කරමි. එහෙත් ඒ ව්‍යාජ සිනාව සුදු නංගී දකින වරක වියැකී යයි. අඳුරට ඉඩ දෙමින් අපි ඇවිද ගියෙමු.

'තාත්තලා එනවා ලබන සුමානේ.'

හිටි ගමන් චාපා කීවා ය. මම සතුටු වුණෙමි. ඇයට මවුපිය සෙනෙහස උරුම වනු ඇත. ඉතින් කෙ තරම් සතුටු ද?

'ඉතින් කොච්චර හොඳද?'

'මම ලියුමක් දැම්මා. පේරම විස්තර කියලා. ඔයා ගැනත් මම ලිව්වා හිතවත් කෙනෙක් කියලා. ඒත් අම්මයි තාත්තයි එන්නේ අසුභ ආරංචියක් අරගෙන. රොහාන් කියලා ගියේ ලන්ඩන් යනවා කියලා. ඒත් එයා සති දෙකෙන් ආවා. ලන්ඩන්වලට ගිහිල්ලා එන ගමන් තාත්තයි අම්මයි හමුවෙලා. මට කියලා එවලා නෑ දුක හිතයි කියලා තාත්තා අසනීපෙන් ඉඳලා මාස හයක්. අම්මා විතරයි වැඩ කරලා තියෙන්නේ. මෙහෙට ගෙනල්ලා වෙදකම් කරනවලු. මං හිතන්නේ රොහාන් ගොඩාක් බොරු කියන්න ඇති අම්මලට.'

For E - Pusthakalaya

ඕ පොඩි දැරිවියක මෙන් නෙපළයි. මම බලා සිටිමි. විටෙක නිසොලමන් වෙමි. ඈ අයිති සමාජයෙන් මා ඈ මුදා ගන්නේ කෙසේ ද? ඇගේ වාසනාව හෝ අවාසනාව ඇත්තේ ඔවුන් අත ය. පහත් පිළකට වැටුණු පතෙරුටියකු මෙන් මා ජීවිතය යදින්නේ ඇයි? මේ සියල්ලට ම මට ලැබෙනුයේ එක් පිළිතුරකි.

සුදු නංගී කෙරේ ඇති අපරිමිත ලෙන්ගතුකමයි ඒ.

'තාත්තලා වෙන ගෙයක් ගත්තම ඔයාලා එහේ. එතකොට ප්‍රශ්නේ විසඳෙයිනේ.'

මම කීවෙමි.

'නෑ. විසඳන්න බැරි දේවල් තියෙනවා. මට කියලා ජීවිතයක් නෑ. මම මොකක්දෝ පවක් කරලා තියෙනවා ගිය ආත්මේ. අපිට වෙනම ගෙයක් ලැබෙන්නේ නෑ. රොහාන්ලගේ ඇනෙක්ස් එකේ ඉන්න වෙන්නේ. ඒත් මට නිදහස ලැබෙයි. සුමානෙකට සැරයක්වත් මාව හමුවෙන්න කසුන්.'

'ඔයාට ප්‍රශ්නයක් නොවන විදිහට.'

'මට ඔයාට කියන්න ගොඩක් දේ ආයෙත් ගොඩ ගැහිලා. මට ඕවා ජෙරටම අම්මගෙන් විසඳුමක් ඕනේ. අම්මා මට බොරු කරන එකක් නෑ. මට අම්මා විශ්වාසයි. අම්මලා ආවාම මං ඔයාව හොයාගෙන එනවා ඔයත් එක්ක කතා කරන්න. විසඳුමක් හොයා ගන්න. ඒත් මං ගැන වැඩිය බලාපොරොත්තු තියා ගන්න එපා කසුන්. අපි මෙහෙම ඉමු. ඉස්සරහා ගැන වැඩිය නොහිත ඉන්න.'

'මම ඔයාට ආදරේ සුදු නංගී. මට ඒ වෙනුවෙන් ජීවත් වෙන්න ඉඩ දෙන්න. මගේ ඒ අයිතිය උදුරා ගන්න එපා.'

'මගේ හිතේ ඉස්සර ඔයා ගැන තිබුණේ පැහැදීමක් විතරයි. දැන් ලොකු ආදරයක් හිතේ ගොඩ ගැහිලා. මම පහුගිය කාලෙම ඔයා මුණ නොගැහී හිටියේ හේතුවක් නිසා. ඔයාට ආදරේ කරන්න මට අයිතියක් තියෙනවා. ඒත් ඔයාට ආදරේ කරලා ඔයා කාලකන්නි කරන්නට මට අයිතියක් නෑ.'



අඳුරින් වෙළෙන පටු මාවත අප දෙදෙනා ඡායාවන් බවට පත් කොට ඇත. මගේ සිත ද ගත ද අඳුරින් තෙමී යයි. මම වාපා තේරුම් ගැනීමේ ව්‍යාකූල සිතිවිලි දහරාවක අතරමං වීමි.

'හොඳටම රෑ වෙලා සුදු නංගී. ඔයාව හොයනවා ඇති.'

'කමක් නෑ – අද විතරනේ.'

වාපා හැඬුම්බරව කියයි. ඒ හැම වචනයක ම ඇත්තේ දුකකි. වේදනාත්මක හැඟීමකි.

'ඇයි අද විතරක්?'

'අපි වෙන දවසක කතා කරමු. එකමෙක දවසක්. ඉස්සර වගේම මගේ ළඟට වෙලා ඔයා අහගෙන ඉන්න.'

ඇය අතරමං කොට පළා යාමේ සිතක් මට නැත. එහෙත් දෛවය විසින් තීරණය කළ, අප නොදත් දේ සෙවණැල්ලක්ව හඹා එමින් පවතී. ගාලු පාරට අප සේන්දු වන විට රාත්‍රී හතට විනාඩි කිහිපයක් තිබිණි.

'හොඳටම රෑ වෙලා සුදු නංගී.'

'කමක් නෑ.....'

ඕ කීවා ය. රත්මලාන දක්වා මම ද ඇය සමඟ ගියෙමි. පාසැල් ඇඳුමෙන් රාත්‍රී සැරි සරන නිශාචර වූ අප දෙදෙනා දෙස උකුසු නෙත් යොමු වේ. සුදු නංගීගේ සිරුර දහදියෙන් ඇලලී ගොස් ය. අපි සිරිමල් උයන දෙසට පයින් ගමන් කළෙමු. ඇගේ නිවසට යන පටු පාර අද්දර දී මම නැවතුණෙමි. මගේ උරහිස් දෙක අල්ලා ඕ මහා හයියෙන් හඬන්නට වූවා ය.

මම දකුණතින් ඇගේ නිකට අල්ලා දැස මා වෙතට හරවා ගතිමි.

'හොඳටම රෑ වෙලා.... පාරේ අඬන්න එපා. අපි ලබන සතියේ මුණ ගැහෙනවනේ.'

'අඬනව නෙමෙයි කසුන්..... හිතේ දුක එළියට පනිනවා. අම්මා ආවම මම ඔයාව මුණ ගැහෙන්න එනවා. සහතිකයි. මං ඔයාව තනි

For E - Pusthakalaya

කරන්නේ නෑ. මං දිවුරලා කියන්නම්. මං ඔයා ළඟට එනවා. එකම දෙයක් ගැන මට අම්මල එක්ක කතා කරගන්න ඕනෑ. මට අම්මා ගෙන් ඒක දැන ගන්න ඕන. පොඩි කාලේ ඉස්පිරිතාලෙදී මට මොකද්ද වුණේ කියලා... වැඩිය බලාපොරොත්තු තියා නොගෙන ඉමු කියල මම කිව්වෙ ඒකයි. ඒ ගැන හිතලයි මට ඇඬුණේ. කමක් නෑ පරිස්සම්. යන්න කපුන්..... මම යනවා.'

ඒ සියල්ල වාපා කිවේ මගේ දෑසට එබී ගෙන ය. ඉන්පසු ම බිම බලා ගත්තී ය.

'හොඳයි. එහෙනම් යන්න....'

මගෙන් මිදී වාපා දුව ගෙන ගියා ය. ඇ පටු පාරේ කෙළවරට යන තෙක් මම බලා සිටියෙමි. ගේට්ටුවෙන් ඇතුළට පැන සුදු නංගී නැවතත් පාර දෙස බැලුවා ය. අත ඔසවා සුභ පැතූ මම ආපසු හැරුණෙමි. පටු පාරේ මා මුවා වන තෙක් සුදු නංගී බලා සිටින්නට ඇත.

මා ඇගෙන් ඈත් වී බොරැල්ල දක්වා ආවේ සිත නොසන්සුන් කොට ගෙන ය. මගේ උරහිසට කම්මුල තබා දැස් පියා ඕ ඉකි ගසා හඬනවා මෙන් මට නිරන්තරව දැනේ. එ දින රාත්‍රී බොහෝ වේලා නිදි වරා මම වාපා සිහි කළෙමි. දෙතොල විවර වී, මදහස පාමින් යහනේ කෙළවරක සුදු නංගී වැතිර සිටිනවා මම සිහිනෙන් දුටිමි. විශ්වාස කළ මැන! ආදරණීය වූ සියල්ල සැපවත් ය. මම දිවුරා කියමි. කිසි ද නොවූ තරම් සෙනෙහසක් සුදු නංගී කෙරේ මසිතේ ලියලා වැඩෙමින් තිබේ.



# 11

විභාගය ඉතා ම ආසන්න ය. උදේ හවස නිදිවරා මම පාඩම් කළෙමි. ජීවිතය ජය ගැනීමට නම් විභාග කඩ ඉම පසු කළ යුතු බව මම තේරුම් ගෙන සිටියෙමි. සිතට ත් කයට ත් වද දෙමින් ම වන පොත් කළෙමි. ජරාජීර්ණ වූ ත්, අපිරිසිදු වූ ත්, සිරිධම්ම මාවතේ බෝඩිම එක ම වදයක් වී ය. වැසිකිළියට ගිය ත් පයිප්පය ළඟට ගිය ත් ගෙට ගොඩ වුව ත් අපිරිසිදු දේ විසින් අප්පිරියාව දෙගුණ තෙගුණ කරයි. ඇසෙන්නේ ත්, කතා කරන්නේ ත් අප්‍රසන්න දේ ම ය. උදේට ත්, දවාලට ත්, රෑට ත් එක ම කන්කරච්චලයකි. ගහ බැණ ගැනීම්, කෝලාහල, බජව්, බීමත් මිනිස්සු, වෙසඟනන්ට මේ කාමර පෙළ තම රජ දහන ය. රාත්‍රී නින්දට පමණක් බෝඩිමට යාමට මම පුරුදු වීමි. මහජන පුස්තකාලයට උදේ ම යන මම රාත්‍රී බොහෝ වේලා යන තුරු එහි රැඳුණෙමි. පිටි අල්ලෙන් දෑස පොඩි කර ගනිමින්, පයිප්ප කරාමයට අල්ලා මුහුණ දොවා ගනිමින්, අඩක් නිරාහාරව හිඳිමින්, ලෑලි බෝඩිමේ ලණු ඇඳේ සැතපෙමින් මම වනපොත් කළෙමි.

සති එකහමාරක් පමණ ගෙවී ගිය ද සුදු නංගී මා හමු වීමට පැමිණියේ නැත. ඇයට කරදරයක් වත් වී ද? මම පුස්තකාලයේ රැ දී ඇ එන මග බලා උන්නෙමි. නිති පතා ම මගේ පැකුම පුන්නද්දූලි වේ. කොරිඩෝරයේ සිමෙන්ති කණුවකට බර දුන් මම අත්ල මත නිකට තබා තනිව ම පාර බලා උන්නෙමි. නිරංග පාර පැන මා වෙතට පිය

For E - Pusthakalaya

මතිනු මා දුටුවේ එ විට යි. සිමෙන්තියේ ලේන්සුව එළා මා අසල ම වාඩි වූ ඔහු මොහොතක් මා දෙස බලා දෑත දණහිස් මත රඳවා ගෙන පාර දෙස එක එල්ලේ බලා සිටින්නට වි ය. කතාබහකින් තොරව ඔහු දෙසට මා හැරෙත් ම.....

'උඹ කිසි දෙයක් ගණන් ගන්න එපා! විහාගේ කරලා හිටපං. සති දෙක තුනනේ විහාගෙට තියෙන්නෙ.'

යනුවෙන් කී ය.

'උඹ මොකක් ගැන ද මය කියන්නේ?'

මම පිළිවිසීමි.

'වාපාගේ තාත්තා...'

'ඇයි මොකවද වෙලා තියෙන්නේ?'

'ඒ මිනුස්සය ගිය සතියේ ලංකාවට එන්නනේ ඉඳලා තියෙන්නේ.'

'ඔව් ඉතිං?'

'මෙහෙට එන්න ඉස්සර හයිපීරියාවේදී ඔපරේෂන් එකක් කරන්න ගිහිං මළාලු.'

'නෑ– ත්... ත්...'

මම දෑස් උඩ ඉන්දවා ඔහු දෙස බැලුවෙමි.

'ඉං හිතුව උඹට ආරංචි වෙලා කියලා වාපගේ අම්මා විතරක් ලංකාවට ඇවිල්ලා. කාත් කවුරුවත් නැතුව එහෙදී භූමදාන කටයුතු කළාලු. උත්තරා 'ශෙට් වේ' ක්ලාස් ගිහිං එන ගමං බොරැල්ලේදී හමු වෙලා කිව්වෙ. රොහාන්ලගේ ඇනෙක්ස් ඒකේ අම්මත් එක්ක වාපා නැවතිලා ඉන්නවලු. පහුගිය ටිකේම ඉස්කෝලේ ඇවිත් නෑ.'

කිසි ද දැක නොසිටුණු වාපාගේ පියා පිළිබඳව මොකක් දෝ නොපැහැදුලි දුකක් ම' සිතේ පිරෙන්නට වි ය. දුක වඩා තීව්‍ර වූයේ වාපාගේ අනාගතය පිළිබඳ සිතීමෙනි. දැං ඉතින් ඕ තව දුරට ත් අසරණ වූවා නොවේ ද? කෙසේ හෝ ඉක්මනින් වාපා මුණ ගැසීමට අවැසි බව මම නිරංගට කීවෙමි.



'උත්තරා ගිහිං තියෙනවා බලන්න. විහාගේ ඉවර වෙනකල් උඹ මුණ ගැහෙන්නේ නෑ කිව්වලු. අම්මයි දුවයි දෙන්නම අඬ අඬා ඉන්නවලු.'

'යමුද රත්මලානේ?'

මම නිරංගගේ අතින් අල්ලා ගෙන අනුමැතිය පැතිමි. ඔහු සැහැල්ලු ලෙස අදහස ඉවත් කළේ ය.

'ඇයි එක පාරක් තළලේ මැනුම් දන්න කැව උඹට මදිද?'

'උඹ බයයි නම් මම තනියම යනවා.'

'මේ බොරු චණ්ඩි පාට් නැතුව හිටපං. කරන දෙයක් කරපං විහාගේ ඉවර වෙලා.'

රොහාන් උදේ වරුවේ ගෙදර නැති බව මම දනිමි. ලැජ්ජාවක් චකිතයක් වැනි යමක් තිබුණ ත් වාපා මුණ ගැසීමේ අවශ්‍යතාව විසින් සියල්ල යටපත් කොට තිබිණි. මරණයක් ගැන ආරංචිය ලැබී පැමිණියා යැයි කියන්නට පුළුවන. කුමක් හෝ ප්‍රශ්නයක් දමා රොහාන් කලබල කළොත් ඔහුට පහර දීමට ද මම දැන් සූදනමින් සිටිමි. සිහින් වෛරයක් ඔහු කෙරේ මසිතේ ලියලමින් තිබේ. මැරයන් තිදෙනකු ලවා මට පහර දුන් ඔහුට පහර දීමේ වරද කිමෙක් ද? මම වැර වෑයම් කොට නිරංග ගමනට කැමති කරවා ගත්තෙමි.

සිරිමල් උයනේ පටු පාර දිගේ කඩිනමින් ගමන් කළ අප වාපා දුර දී ම දකින්නට ඇත. සුදු නංගී පිටියේ අම්මාගේ උකුලේ සිරස හොවා ගෙන ය. මව ඔහේ බලා සිටියා ය. මව වාපා මෙන් පැහැපත් ය. තරමක් තරබාරු ය. ගේට්ටුව ළඟ අප නතර වෙද්දී වාපා හිස ඔසවා බලා සිහින් ලෙස මවට යමක් කීවා ය. නිරංග ඉස්සර වී ය.

'ආවනම් දැන් ඉතින් යමන් ඇතුළට...'

නිරංග ගේට්ටුව විවර කොට ඉස්සර විය. වාපා මගේ මුහුණ දෙස වත් බැලුවේ නැත. ඇගේ මුහුණ ඉදිමී, රතු වී, තඩිස්සි වී තිබෙනු

For E - Pusthakalaya

මෙ දුටිමි. අප දෙදෙනා ඔවුන් අසලට ඇදෙද්දී කෂණයකින් නැගී සිටි පුංචි නංගී ගෙට වැදුණා ය. දවස් ගා කාමරයේ දොර වසා ගත්තා අප දෙදෙනාට ම ඇසිණ. දෙරකඩින් නැගී සිටි මව වික වේලාවක් නිසලව සිට ගෙට ඇතුළු වන ගමන් ම,

'ඇතුළට ඇවිල්ල වාඩි වෙන්න.'

යනුවෙන් කී ය. සැලකිල්ලෙන් සාලයට ගිය නිරංග ත් මම ත් වේවැල් පුටු දෙකක වාඩි වීමු. වාපාගේ ත්, මවගේ ත්, පියාගේත් ලොකු ඡායාරූපයක් කැබිනෙට්ටුව මත වී ය. වාපා ගේ ලොකු වර්ණ ඡායා රූපක් ද ඒ අසල ම වී ය. නිරංග හොරැහින් මදෙස බලයි. දොර අසළ උළුවස්සට හේත්තු වී සිටි මව අප දෙසට හැරුණා ය.

'කවුද කසුන් කියන්නේ?'

ඕ සන්සුන් වූ සිහින් හඬකින් විමසුවා ය.

'මම'

යනුවෙන් තනි වචනයකින් උත්තර දී මම මව දෙසට හැරුණෙමි. ඕ නැවතත් බිත්ති දෙස බැලුවා ය. වාපා කාමරයට වී හින් හඬින් ඉකි බිඳිනු මට ඇසේ.

මගේ උත්සාහය ත්, තීරණය ත් වලංගු කිරීමට අම්මා ඉඩ දුන්නේ නැත. ජීවිතයේ පළමු වරට මත්පැන් බී ගෙදරට අසු වුණා වැනි හැඟීමක් මසිතේ වී ය.

'ඔය ළමයි දෙන්න ආවේ වාපගේ තාත්තා නැතිවුණු දුක බෙදා ගන්න නම් ඒකට පිං සිද්ද වෙනවා. මිනිසුන්ට හුඟක් දේවල් නැති වෙන්නෙ කලින් තීරණය නොකර, සැලසුම් නොකර, ප්‍රශ්න ඉහට ගත්තම... අපි දෙන්න ලංකාවේ හිටිය නම් තියෙන විදිහකට ජීවත් වෙලා. මේ ප්‍රශ්න මුකුත් නෑ. දැන් ඉතිං විසඳන්න බැරි හුඟක් දේවල් මටයි, දුවටයි තීරණය කරල විසඳා ගන්ඩ වෙනවා. කසුන් ගැන මං ගොඩක් විස්තර දන්නවා. ඔය වයසේ ළමයින්ගෙ හිතුත් මං හොඳට අඳුනනවා. අවුරුදු දහයක් පහළොවක් මමත් කලේ ළමයින්ට උගන්නපු එක.



වාපාගේ කාමරයෙන් නැඟුණු හින් ඉකි බිඳීම නැවතිණ. හාත්පස නිහඬ ය. හඬා දොඩා හෙම්බත් වූ මනැසින් ද, දුර්වල වූ කයින් ද යුතුව මව කියන දෙයට අපි දෙන්නා ම විමසිල්ලෙන් ඇහුම්කන් දීමු.

'මම දුවත් එක්ක පහුගිය සුමානෙම කතා කළා හුඟක් දේවල්. සමහර දේවල් ඔය ළමයට කිසි සේත්ම කියන්න පුළුවන්කමක් නෑ. රොහාන් මට බැනා වෙනව නැද්ද කමට. ඒත් එයා වැඩ කරල තියෙන්නෙ හරියට දුව කසාද බැඳපු මහත්තය වගේ. කෙල්ලගේ හිත හොඳටෝම රිදවලා. අම්මයි තාත්තයි දෙන්නම නැති වෙලාවෙ හැසිරිලා තියෙන විදිහ බොහෝම නින්දිතයි.'

'කසුන් එක්කත් මිනී මරාගන්න ගිහිල්ල දවසක් ටවුන් හෝල් එකේදී....'

රොහාන් මට සගයින් සමඟ පහර දුන් සිද්ධිය මවට මතක් කර දීමට නිරංග ඉදිරිපත් වී ය.

'මං දන්නවා.'

මව නොසැලකිල්ලෙන් උත්තර දුන්නා ය.

'වාපාට පුංචි කාලේ බොහෝම දරුණු අසනීපයක් හැදිල ඉස්පිරිතාලෙ හිටියා අවුරුද්දකට විතර කිට්ටු කාලයක්. දුවවත් දන්නෙ නෑ මොකක්ද එයාට තිබුණ අසනීපය කියලා. එතකොට දුව ලොකු ළමයෙක් වෙලත් නෑ. එයාට ඉස්සරහට හොඳ ජීවිතයක් ගෙවන්න නම් ලොකු මුදලක් ගෙවල එංගලන්තයේදීම ශල්‍යකර්මයක් කරන්න ඕනකම තිබුණා. මහත්තයා දොස්තර කෙනෙක්... එයාට දුක හිතුණා හරියට. අපි දෙන්නට ඉන්න එකම දරුව. එයාගෙ අනාගතය අඳුරු කරල අපට ජීවත්වෙලා වැඩක් නෑ. අපි දෙන්නම රට ගියේ ඒකයි. රස්සාවල් කරන්න. සල්ලි හොයන්න. අපිට නෙමෙයි දුවට. දුව ලංඩන් වලට ඇරල ඔපරේෂන් එක කරන්න ලක්‍ෂ පහ ක් ඕන. ඔක්කොම වැඩ ඉවර කරන්න. මහත්තයා උදේ හවා වැඩකළා. අන්තිමට අසනී'

For E - Pusthakalaya

වෙලා එහෙදිම මහපොළව බද ගත්තා වුව හිතද. වුව මේව මොකටද දැනගෙන හිටියෙ නෑ. ඒත් එයා දැන් පොඩි ළමයෙක් නෙමෙයි. බොහොම තේරුම් ඇතිව මං ඵේරම දෑ එයාට කියල තියෙන්නෙ.

දුක බෙදා ගන්නට, වාපා සමඟ එකට හඬන්නට මට පුළුවන් කමක් ඇත. සුදු නංගිගේ හිතේ තෙරපෙන දුක බෙද ගැනීම තරම් තවත් සතුටක් වේ ද? සුදු නංගිගේ අම්මා මගේ අම්මා වගේ ය. සාගරයක ගැඹුර තරම් ආදරයක් මවක් තුළ දරුවකු වෙනුවෙන් උපදී. මගේ අම්මා ත් එසේ නොවේ ද?

'අම්මි කියන හැම දෙයක්ම මට තේරෙනවා. මටත් පුළුවන් හැම දේකටම හවුල් වෙන්න.'

මම බැරෑරුම් ලෙස කීවෙමි. තරමට වඩා පැහිච්ච කතාවක් කළාක් මෙන් හිරංග මට රැව්වේ ය. ඒත් වාපා වෙනුවෙන් මසිතේ ගුලි ගැසී තිබෙන සියල්ල මවිසින් මවට කිව යුතු නොවේ ද?

'විහිළු කරන්න එපා ළමයෝ. ඔය ළමයත් ජීවත් වෙන්නෙ අනුන්ගෙන්. තවම ඉස්කෝලෙ යනවා. බෝඩිමක ඉන්නේ. ඔය වයසේ ගෑණු ළමයි එක්ක මිත්‍ර වුණාම ලෝකෙම ජයගන්න පුළුවන් කියල හිතන්නෙ..'

මව තරවටුවක ස්වරූපයෙන් කීවා ය.

'අම්ම දෑ ඵේරම දන්නව ඇති කියල මං හිතන්නෙ. වාපා මගෙත් එක්ක...'

මට සම්පූර්ණ කිරීමට ඈ ඉඩ දුන්නේ නැත.

'සුළු දෙයක් ළමයෝ. ප්‍රශ්න කියන්නෙ ඕව නෙමෙයි. ඉස්කෝලෙ යන කාලෙ ප්‍රේම සම්බන්ධ කොච්චර ඇති වෙනවද? දැක්ක පළියට – කතා කළ පළියට... ඒක ස්වභාවිකයි. ඔය ළමයින්ගේ මෝඩකම් වලට මං හිනාවෙනවා නෙමෙයි. ඒත් මට වාපාගෙ අම්ම විදිහට එයාගෙ අනාගතේ තීරණය කරන්න වෙනව...'

පන්නල ප්‍රාදේශීය සභාවේ
පුස්තකාලය

මම තුෂ්ණිම්භූත වීමි. වාපා අප අතරට විත් කෑ ගසා හඬා මවගෙන් අභය අයදිනු යි මම සිතුවෙමි. මව සූදනම් වන්නේ අපේ ප්‍රේමය මරා දැමීමට නොවේ ද? ඒත් සුදු නංගී පේන ඉසව්වක නැත. කාමරයේ දොර සිර කර අගුළු දමා ඇත. ඇගේ හදවත කෑ ගසන බව මම සත්තකින් ම දනිමි. ඒත් සුදු නංගී අප අතරට ආවේ නැත.

'ඔය ළමයි කියයි ජීවිතේට හවුල් වෙන්නම් කියල. ඔය ළමය තවම විභාගෙවත් ලියල නෑ නේද? බොළඳ විදිහට අපි පොල්සම්බෝලයි බතුයි කාල හරි ජීවත් වෙමු කියල කියයි. ඒත් දැන් පොල් ගෙඩියක් කීයද? මිරිස් කිලෝ එකක් කීයද? හොඳ රස්සාවක් කරන කෙනෙකුට මිසක් පොල් සම්බෝලයි බතුයි කන්නවත් බෑ.'

'අපි තවම පුංචි ළමයි අම්මෙ.... මම කිව්වෙ අද ගැන නෙමෙයි...'

මම පිළිතුරු දුන්නේ මෝරා වැඩී ගිය යෞවනයකු බිරිඳක් සරණ කර ගැනීමට සූදනම් වූ විටක මෙනි.

'ඔව්. ඔය ළමය පුංචියි. ඒත් වාපා ගැන මගේ ඇහැ පියවෙන්න ඉස්සර තීරණයක් ගන්න වෙනවා. එයාගෙ ඔපරේෂන් එක මම මැරෙන්න ඉස්සර කරන්න ඕන. එයා සතුටින් තියන්න ගිහිල්ල තමයි මහත්තය අකාලෙ නැති වුණේ. එයාගේ යුතුකම මම කරන්න ඕන.'

ඈ කියන්නේ වාපා ඉක්මනින් විවාහ කර දෙන බව ද? එ විට සුදු නංගී වෙනුවෙන් මා මනැසින් මැවූ පිවිතුරු ලෝකයට වන්නේ කුමක් ද? වීදුරු පාත්තරයක් ගල් පරයක වැදී යන කලක මෙන් මසිත තිගැස්සිණ.

'මට පුළුවන්....'

මම ගොත ගැසීමි.

'මොනවද පුළුවන්? ඉස්කෝලේ උසස්පෙළ කරන ළමයෙක් විභාගේ කරන්න ඕනේ. ඊට පස්සේ විශ්ව විද්‍යාලේ ගිහිල්ලා උපාධිය කරන්න ඕනෑ. විවාහය කරන්නේ ඊට පස්සේ. වාපා එච්චර දුර අරින්න මට පුළුවන්කමක්වත් ඕනෑකමක්වත් නෑ....'

For E - Pusthakalaya

'ඔව් මං නිරංග ඊට පස්සේ විශ්ව විද්‍යාලේ ගිහිං....'

මම නොපෙනෙන දුරක සිහිනය දිග හැරියෙමි. සැබෑ නොවෙනස් මම දුර්විය පිළිබඳ චිත්‍රයක් දිගැරීමට උත්සාහ කළෙමි.

'වැඩිම වුණොත් තව අවුරුද්දකින් වාපා ලන්ඩන් ගෙනියලා ඔපරේෂන් කරන්න ඕනෑ. එයාගේ අනාගතේ තීරණය වෙන්නේ ඊට පස්සේ. සෙල්ලමක් නෙමෙයි ළමයෝ මම අම්මා කෙනෙක්. ලක්ෂ පහක් හොයන්න ඕනෑ. මමයි මහත්තයයි රට හිටිය දවස්වල එයාගේ හිතේ දුක පිරිලා තියෙන්න ඇති. රොහාන්ගෙන් නිතරම කරදර තිබුණ නිසා අඩුව පුරව ගන්න ඔය ළමයට මේවා කියලා සමීප වෙන්න ඇති. දැන් මම දුවගේ ළඟ ඉන්නවා. එයාට ආදරේ අඩුවක් නෑ. අම්මා කෙනෙකුට වැඩිය කවුරුවත් දරුවන්ට ආදරේ කරන්නේ නෑ නේද?'

මම විනිර්මුක්තව බලා සිටියෙමි. මවගේ අවසන් වචන මා පළවා හැරීම දක්වා ම යොමු කිරීමට තරම් පෙළඹී තිබිණ.

'ඔය ළමයා විභාගේ කරල හොඳට ඉගෙන ගන්න. දුව ඔය ළමයට එක එක දේවල් කියලා කරදර කළා නම් සමාවෙන්න. මම දුකාම් හොඳින් මේ ළමයත් එක්ක කතා කළේත් දුවගේ අතින් වරදක් වෙලා තියන හැකිම උඩ. මට කියන්න ඕනෑ මෙච්චරයි. ඔය ළමයගේ හිතේ වාපා ගැන මොන වගේ හරි අදහසක් තිබුණ නම් ඒක අයින් කරගන්න. නොකෙරෙන දේවල් ගැන බලාපොරොත්තු තියාගෙන ඉන්න එපා... පස්සට පසු තැවෙන්න වෙනවා. හොඳයි, බොහෝම ස්තූතියි මේ ගැන කතා කරන්න ආවට. දෙවියන්ගේ පිහිටයි. ගිහින් එන්න...'

ඒ අවසන් විධානය නොවේ ද? මම දෙපා වෙවුල වෙවුළා නැගී සිටියෙමි. ඒසක වේගයෙන් කාමරයේ දොර විවර වී ය. හඬා වැළපී නෙම්බත්ව සුදු සුදු නංගී කඩා බිඳ ගෙන පැමිණ මගේ දෙපා මුල වැද වැටුණා ය. මගෙ හදවත පැළී යන්නට තරම් සැඩ පහරක වේදනාව දැනුණි. වාපා මගේ දෙපා අල්ලා හඬා වැටුණා ය.



'මට සමාවෙන්න කසුන්. අනේ මට සමාවෙන්න කසුන් අනේ මගේ රත්තරං අම්මේ! මට අයියා කෙනෙක්වත් නෑ. මගේ කසුන් අයියට මෙහෙම කරන්න එපා.'

සුදු නංගීගේ සුදු අත් දෙකින් මගේ දෙපා තරයේ වැළඳ ගෙන ඇත. මා නැළුම් කෑවේ, සිත රිදවා ගත්තේ, පීඩා වින්දේ ඇගෙන් මෙසේ සමු ගන්න ද? සට සට ගා මගේ දෑසින් වැටුණු කඳුළු සුදු නංගීගේ පිට දිගට හැලිණ. ඇය උරහිසින් අල්ලා නැගී සිටු වීමට ඇත් නම්! මගේ සුදු නංගී සනසා ලීමට ඇත් නම්!

නිරංග මා සමීපයට විත් කතා කොට දොර දක්වා ගියේ ය. වාපාගේ මවගේ දෑසේ ගිනි පුළිඟු දිලිසෙනු මම දිටිමි. මම සුදු නංගී වෙතින් මිදී මිදුලට පා එසවීමි. වාපා මව ළඟ දැවටෙන්නට වූවා ය.

'අනේ අම්මේ..... ඇයි මට මෙහෙම කළේ...?'

වාපා මව ළඟ හඬා වැටුණා ය. ආපසු හැරී ඔවුන් දෙස බැලීමට පුළුවන්කමක් අප දෙදෙනාට ම තිබුණේ නැත. සිරිමල් උයනේ සිට රත්මලාන මැලිබන් හංදිය තෙක් ගමන් කළ අපි ගාලු පාර දිගේ ද තරමක් දුර පයින් ම ගමන් කළෙමු.

'උඹට දැන්වත් තේරෙනවද වාපා කවදාකවත් දිනා ගන්න බෑ කියලා?'

'මට වාපව ළඟට ගන්න බැරිවෙයි. ඒත් එයාගේ ආදරේ මගේ ළඟ...'

මම නිරංගට උත්තර දුනිමි.

'දවසක් රොහාන් 'පැන්ට්‍රි' එකේදී කියූ කතාව බොරුවක් නෙමෙයි.'

'මොකක්ද?'

'වාපගේ අසනීපෙ.'

'මටත් ඒක තමයි හිතාගන්න බැරි.'

For E - Pusthakalaya

මම හිමි හිමින් ගමන් කළෙමි. සිත විස්සෝප වීමට ආසන්න තලප මෙන් පීදුම් දෙයි. එය දරා සිටීමට අපහසු ය. අපි හෝටලයකට ගොඩ වැදී, ජෝන් බී. සිගරට්ටුවක් පත්තු කර ගතිමු.

'එතන මහ ප්‍රශ්න ගොඩක්. තාත්තා මැරුණේ වාපගේ අසනීපෙට සල්ලි හෙන්න ගිහිං. දැන් ඒ වගකීම අම්මා අතේ. ඉතිං ඔය දේවල් ඔක්කොම අරන් බලන කොට උඹ බොහෝම ඈතයි. නිකං මෝඩයෙක් වෙලා දුක් විඳින්නේ නැතිව දැන්ම ගිහිං අයින් කරල දාපං....'

නිරංග උපදෙස් දුන්නේ ය. මම ඇහුම්කන් දිමි.

'හොඳට මතක තියාගනිං විභාගෙට තියෙන්නෙ දවස් කීයද කියල. මෙච්චර කල් මැරිගෙන කරපුවා ඔක්කොම ඉවරයි. 'එෆ්' හතරක් ගොනාවොත්.'

'විභාගෙ කරන්න ඕනෑ තමයි නිරංග. ඒත් කෙල්ලෙක් ළඟට වෙලා දැවි දැවී තමන්ගේ ජීවිතේ පේරම දේවල් කොල්ලෙක් එක්ක කිව්වාම... එහෙම කියල අතට අත තියල.... පපුවේ මුණ තියා ගෙන අඬල පොරොන්දු වුණාම... කොල්ලෙක්ගේ හිතේ ඇති වෙන හැඟීම උඹට තේරෙන්නෙ නෑ. මට සුදු නංගී ලේසියෙන් අමතක කරන්න බැරිවෙයි. මේ නගරේ මං ජීවත් වුණේ සුදු නංගී නිසා. උඹල හිතනවට වැඩිය අපේ හිත් හරි සමීපයි.'

රෑ පැය කීපයක් කතා කොට අපි සමු ගතිමු. විභාග අරමුණ ජය ගැනීම සඳහා පසුබිම නිරංග සකස් කලේ ය. විභාගයට හරි යට ම එක් දිනක් තිබිය දී සිරිධම්ම මාවතේ කාමරයට සුභ පැතුම් පතක් ලැබිණ.

ආදරණීය සදුන්,

ඔයාගේ විභාගය හොඳින් ජය ගැනීමට දිරියයි, ශක්තියයි මම ප්‍රාර්ථනා කරනවා.

ආදරණීය සුදු නංගී.



සත්තකින් ම මම සියල්ල අමතක කොට විභාගයට මුහුණ දුනිමි. හිතුවාට වඩා ප්‍රශ්න පත්‍ර සියල්ල ම පහසු ය. ජීවිත ප්‍රශ්න තරම් විභාග ප්‍රශ්න අමාරු නැත. එදා සවස අපි සියලු දෙනා ම මධු පානය කලෙමු. එක ම පාසැලේ සිසුන් සමඟ සතුට බෙදා ගැනීමක් හෙයින් මම ද එයට විරුද්ධ නොවී එකඟ වීමි. එච්චා, පැස්කි, නිරංග, ගිහාන්, ලකී, බුවා ඇතුළු තර්ස්ටන් මිතුරෝ සියල්ලෝ ම එදා එක ම බීමක දී විනෝද වූ හ. විභාගය අවසන් වීමේ ප්‍රීතිය ත්, පාසැල් ජීවිතයෙන් සමු ගැනීමේ වේදනාව ත් අප සියලු දෙනාට ම එක හා සමාන දුකක් ද සතුටක් ද එක්කොට දී තිබිණ. දැන් ඉතින් කොළඹ නගරය දමා ගෙදර යනවා ද? රැකියාවක් කරනවා ද? සුදු නංගී මිරිඟුවක් ද? මගේ ආත්මය තැළී, පෙළී, විඳුම් දී මේ තරම් අද්දැකීම් ගොඩක් මේ ටික කාලයට මා විඳවූවේ ඇයි? සිරිධම්ම මාවතේ බෝඩිම පවා එක ම අපායකි. බම්බලපිටිය මුහුදු වෙරළට වී අපි ඇති තරම් මත්පැන් බිවෙමු. හිස බමන්නාක් මෙන් ද, මුහුදු රළ මා දෙසට ඇදෙන්නාක් මෙන් ද මට දැනිණ. මගේ මිතුරන් තුළ මේ කෙටි කාලයට මා වීරයකු වී ඇති තරම්! එක ම කුස හොත් සහෝදරයන් මෙන් අපි රෑ දෙගොඩ හරියක් වෙන තෙක් මුහුදු වෙරළේ මධු බිබී ගත කළෙමු. අවසානයේ 'පැස්කි' නාට්‍යෝචිත කතාවක් ද කලේ ය. ඔහු බීමතින් වැනෙමින් මෙසේ කීවේ ය.

'රෝමවරුනි, මිත්‍රවරුනි, රට වැසියනි, තර්ස්ටන් කොල්ලනි! ඉස්කෝලෙ ගියා. වල දැම්මා. ගහ ගත්තා. ගුටි කෑවා. රගර් ගැහුවා, බිග්මැච් ගියා. දැන් ඉතිං විභාගෙත් කළා. ඉතිං අපි අද හොඳට බිව්වා. එන්ජෝයි කළා. දැන් යමු ගෙවල්වලට. ගෘහ මූලිකයෝ විභාග පෝතකයෝ එනතෙක් මග බලාගෙන ඇති. අපි ඉස්සරහටත් මේ වගේ වලකදී සෙට් වෙමු.'

ඔහු ගල් කුළෙන් බිමට බසිද්දී ගිහාන් ගීතයක පද ඇල්ලුවේ ය. අපි අත්පොළසන් දෙමින් ගාලු පාර දක්වා ආවෙමු.

මම බෝඩිමට ආවෙමි. ගෙදරට ලියුමක් දැම්මෙමි. ප්‍රතිඵල එන තෙක් කොළඹ රැඳී ඉන්නා බව ත්, ඒ කාලයට මුදල් අනවශ්‍ය බව

For E - Pusthakalaya

ත් මම ලිවෙමි. පාසැල පාලු වී ගොසිනි. මම උදේ සිට හවස දක්වා පාලු වී ගිය තර්ස්ටනයේ ගත කලෙමි. පුස්තකාලයට වී නවකතා, කවි කියවන්නට විමි. නාට්‍ය බලන්නට ගියෙමි. මේ කාලයේ චාපා පිළිබඳ හිත යට තෙරපෙමින් තිබූ සියලූ යටගිය පැතුම් යළි විකසිත වන ලිපියක් ඇගෙන් මට ලැබිණ.

ආදරණීය කසුන්,

මම පාසැලට ආයුබෝවන් කිව්වා. අම්මා මාව ඉස්කෝලෙන් අස් කළා. මම ගෙදර හිරකාරියක් කරලා. ලියන්නට බොහෝ දේ තියෙනවා. අහස වුණේ වලාකුළුවලින් තොරයි. සැඳෑ එළිය මගේ කාමරයට එබෙනවා. විචිත්‍රයි. සුන්දරයි. චමත්කාරයි. මට අලුතින් යමක් ගැන හිතන්නට ඕන. මෙහෙම ජීවිතෙන් හෙම්බත් වෙන්න දෙන්න බෑ. මම මගේ අසනීපය ගැන දැන් සේරම දන්නවා. වෛද්‍ය වාර්තා ඔක්කොම මගෙ ඇඳ උඩ. මම සේරම බැලුවා. ටික කාලෙකට ඉස්සර මේව මම දැක්කනම් ඔයාට බලාපොරොත්තු දෙන්නෙ නෑ. මට ඕනකම තිබුණෙ ලස්සන, සුන්දර පෙම්කවක් ඔයාගේ මුවට උඩින් පාත්වෙලා මුමුණන්න. ඒක දැන් බොහෝම ශෝකාකුල දුක හිතෙන රැහැයි හඬක් වෙලා. මං මේ කියන්න හදන කතාව ලස්සන එකක් නෙමෙයි. දුක හිතෙන මිලගෙදරක නැමෝම හඬවපු අවමංගල සභාවක ස්තුති කතාව වගේ එකක්.

කසුන්,

මම ඔබ දකින්නේ කවදද? මට නිතර දැන් ඔබව දකින්න ඕනෑ. ඔබේ ප්‍රේමය මම හොඳට අඳුනනවා. මම පසුගිය ටිකේම 'මනෝ විද්‍යාව' ගැන පොත් කියෙව්වා. 'වදරිං හයිට්ස්' ආයින් කියෙව්වා. ලස්සනයි කසුන්. ඒ ලස්සන දේවල් වගේම දුක හිතෙන දේ ඔක්කොම මම ඔයාට කියනවා. අහගෙන ඉන්නව නේද? ඔබ කෙරේ ඇති මගේ ප්‍රේමය අවංකයි. මම ඔබට ආදරෙයි. එකට කතා කරන්න, පාර දිගේ ඔයත් එක්ක එකට ඇවිදගෙන යන්න මට ආසයි. එකට වාඩිවෙලා පුංචි අවන්හලේ කෝපි බිව්වා මතකද? ඔබ මා ළඟ නැති නිසා මං ඔබේ මතකයට ප්‍රේම කරනවා. ඒක හරිම සැපදයක මතකයක්



මට දැන් ලෝකේ ගැන පුදුම දේවල් හිතෙන්නේ. මුළු ලෝකෙම කඳුළු ගුලියක්. මම තව මාස තුනයි ලංකාවේ ඉන්නේ. අම්මා සියල්ල සූදානම් කරලා. මා වෙනුවෙන්. ලන්ඩන්වල රෝහලකට මාව ගෙනියනවාලු. ගිය සතියේ ග්ලාස් හවුස් ගිහිං මා නැවත පරීක්‍ෂණවලට ලක් කළා. හෙට ආයෙමත් යනවා. රේඩියම් අල්ලන්න. හරිම කටුකයි, කියන්න බැරිතරම් ලැජ්ජයි. මම ගෑණු ළමයෙක් නේද දෙයියනේ?

අනාගතය කොහොම වුණත් මට ඔබ දකින්නට, කතා කරන්නට ඕනෑ. මගේ ඉල්ලීම අහක දන්න තරම් ඔබ නපුරු නෑ කියලා මම දන්නවා. මට කසුන් එක්ක සතුටු වෙන්න ඕනෑ. අපි ජීවිතේට මුහුණ දෙමු. මගේ බර වෙච්ච, රතු වෙච්ච, කඳුළු පිරිච්ච දෑස් දැක්කොත් ඔයාට දුක හිතෙයි. මම නොහඬා ඉන්නේ ඔබ හමුවන තෙක්. 'අපි මේ කරන හැම දෙයක්ම සිහිනයක් නම්, අවදි වීම – මරණය' කියලා මට හිතෙනවා. ඒත් උපදින්න තියෙන අයිතිය මැරෙන්නෙ නෑ. දුක් විඳ විඳ ජීවත් වෙනවා.

දෙසැම්බර් 24 ද නව රඟහලේ 'අරංගේත්‍රම්' තියෙනවා. පංතියේ යාළුවෙක්ගේ. පුළුවන් නම් එන්න. මම උත්තරා එක්ක එන්නේ. ඔබ එනවා නම් මට හයියක්. ශක්තියක්. එක දවසකට හමුවෙලා මාව සනසන්න. එදාට මම ඔක්කොම කියන්නම්.....

මං සුදු නංගී.

For E - Pusthakalaya

## 12

කොළඹ නගරයේ නිශාචරයකු වෙතැ යි මම බිය වීමි. කොළඹ නගරයේ ජීවත් වීම මට මහත් ගැටලුවක් වි ය. මම මරදාන, ගල්කිස්ස, දෙහිවල ආදි නොයෙකුත් ප්‍රදේශවල නිවෙස්වලට ගොස් ළමයින්ට පෞද්ගලිකව ඉගැන්වීමට පෙළඹුණෙමි. නිරංග හා ගිහාන් මට සිසුන් එකතු කර දීමට ඉදිරිපත් වූ හ. මේ නිසා මේ කාලයේ දී බෝඩිං ගාස්තු ගෙවීම එ තරම් ගැටලුවක් වූයේ නැත. මගේ වියදමට සරිලන මුදල් ළඟ තබා ගත් මම ඉතිරි සියලු ම මුදල් අම්මාට ත් අප්පච්චිට ත් පිටත් කළෙමි. මේ නිසා ගෙදර දුක් විඳිමට සිදු වී තිබුණු අම්මාට යම් සහනයක් ලැබී තිබිණ. එකී සහනය ගැන සිතා මම තුටු පහටු වීමි.

උදේ වරුව මම නිකරුණේ කාලය ගත කළෙන් පොතපත හා මහජන පුස්තකාලය මගේ තනි නොතනිය නැති කළ හිත මිතුරන් බවට පත් වී තිබිණ. මම සුවිශාල පොත්පත් සම්භාරයක් මේ කාලයේ දී පරිශීලනය කළෙමි. ජීවිතය පිළිබඳ බොහෝ දේ මම පොතපතින් උගත්තෙමි. ජීවිතය හැදෑරුවෙමි. එහෙත් සහනය නිතිපතා සිත තුළ ඇඟුම් ගත්තේ නැත.

ඇතැම් උදේ වරුවක මම උත්තරා හමු වීමට බොරැල්ලට යාමට පුරුදු වීමි. 'ගේට් වේ' පන්තිය අහවර වී එන උත්තරා නැංගී එයින සැනසීමට නිරතුරුව ම ගත්තා වෙහෙස මම අවබෝධ කොට ගෙන සිටියෙමි.



'කසුන් අයියට චාපගේ හිතේ තියෙන ආදරේ මම දන්නවා. මම ගොඩක් දවස්වලට රත්මලානේ ගිහිං චාපාත් එක්ක කතා කරනවා. එයාගෙ ඇස් හොඳටම රතු වෙලා. හැම තිස්සෙම ඇඬුව වෙලාමයි ඉන්නේ. මූණත් එක්ක සුදුමැලි වෙලා. හිතලම දැං එයා ලෙඩ පාට වෙලා..... මං දන්නෙ නෑ මේක කොතනින් ඉවර වෙයිද කියලා.'

'උත්තරා නංගී හිතන්නේ මට චාපව ලබාගන්න බැරි වෙයි කියලද?'

'කසුන් අයියගේ හිත මං දැං දන්නවා. අයියට තියෙන්නේ පුදුම තරම් සංවේදී හිතක්. එහෙම හිතක් කෙල්ලෙකුට ලැබෙන්න පිං කරන්න ඕනෑ. මේක චාපා වුණත් තේරුම් අරන් ඉන්නේ. ඉතිං මට අයියගේ හිත රිදවන්න බෑ. අපි වෙන දෙයක් ගැන කතා කරමු.

උත්තරා බිම බලා ගෙන කීවා ය. මා වෙනුවෙන් සුදු නංගි පමණක් නොව උත්තරා පවා දුක් වන්නී නොවේ ද?

'මම සුදු නංගී ගැන මිසක් වෙන මොනවා ගැන කතා කරන්නද උත්තරා? මගෙ හිත කියවන්න සුදු නංගී උත්සාහ කළා. එයා මගේ හිත ඉක්මනට කියෙව්වා, මම සුදු නංගීට ආදරේ කළේ ඊට පස්සේ මම නිකං අහසින් වැටිච්ච මිනිහෙක් වගේ කොළඹ ජීවත් වෙන්නේ. මේක නිකම්ම නිකං ගොන්දගම් පොළවක්. මට කෘත්‍රිම මිනිහෙක් වෙන්න බෑ. මට ඇත්තට මූණ දෙන්න ඕනෑ. ඒත් සුදු නංගී මගෙන්...ඈත් වුණොත් මට ඒක දරා ගන්න බැරි දුකක් වේවි.'

මම උත්තරා දනිමි. උත්තරා දෑසේ කඳුළු පිසිමින් කතා කළා ය. උත්තරාගේ සිතේ සහෝදර සෙනෙහසක් පුදින්නට ඇත.

'කසුන් අයියේ, විසිහතර වෙනි ද අරංගේත්‍රම් බලන්න එනවද?'

'ඔව්.'

'එදට ඔය දෙන්නා කතා කරන්න. මං හිතන්නෙ විසඳුමක් ලැබේවි. මං ප්‍රාර්ථනා කරනවා හැම දෙයක්ම සුබ ඵල දෙන විදිහට විසඳෙන්න කියල. මං දන්නව කසුන් අයියට කවමදකවත් වරදින්නේ නෑ කියල...'

මගෙන් සමු ගැනීමට මොහොතකට පෙර උත්තරා නැගණිය එසෙ කීවා ය. මම කඳුළ මුවා කොට නැගණියට සමු දුනිමි.

For E - Pusthakalaya

නව රඟහලට යාබද රාජකීය විද්‍යාලයීය බාලාංශ පංති අසබඩ වී මම පාර බලා උණිමි. ශාලාව තුළට එකිනෙකා ඇතුළු වනු බව පෙනේ. සුදු නංගී එන පෙරමග මම බලා සිටිමි. ඇ තවමත් ප්‍රමාද ඇයි? මසිත තුළ ව්‍යාකූල වූ නොයෙක් සිතිවිලි පොර බදන්නට වී ය. මල් විසිරුණු ලා නිල්පාට රැළි ගවුමක් එන දවටා ගත් සුදු නංගී ඈතින් පිය මසවනු මට පෙනේ. මම නිහඬ මුනිවතින් ම වාඩි වී සිටියෙමි. ඕ හට තනියම මා වෙතට ඇදුණා ය. මම නැඟී සිටීමට වෙර නොගත්තෙමි. එහෙත් මගේ දෙනෙත ඇ එන ඉසව්වට තාරකා එළි පෙන්නු බව මා මෙන් ම සුදු නංගී ත් වටහා ගන්නට ඇත. මා අසලට වී සුදු නංගී සිනාසුණා ය. මම ඇයට දෑත පෑවෙමි. ඕ ගවුමේ රැළි විසිරීමට ඉඩ නොදී මා අසළින් ම ඇගේ දැවටෙමින් ඇද ගත්තී ය. සිත්කළු දෙනෙත බිමට බර වී ය. රැළි ගවුමේ රැළි ...තින් ම සුදු නංගීගේ ලස්සන දිගු කොණ්ඩය තනි කරලකට ගොතා ...ට දිගේ ඇදී ගොසිනි. මම මහත් සෙනෙහසකින් කතා කළෙමි.

'සුදු නංගී.'

එකී හඬ පිට වෙනවාත් සමඟ ම එහි වූ ආදරණීය බව ත්, ...ශෝකාකුල බව ත් ඇයට දැනෙන්නට ඇත.

'මච්චර ආදරෙන් මට කතා කරන්න එපා කසුන්. මගේ හිත පාරන්න උත්සාහ කරනව වගේ. විකක් රළු විදිහට මේ දවස්වල ඉන්න. ඔය දුක පිරෙන ඇස් දෙකින් මගේ දිහා බලල ආදරෙන් කතා කළාම මගේ දුක ඇවිස්සෙනවා.'

'මගේ හිතේ ඔයා ගැන තියෙන දුක මට පිට කරන්න ඉඩ දෙන්න. මං පැවිදි මිනිහෙක් කළේ ඔයා. මම හැමදම ඔයාට ආදරෙයි. ඒක නැති කරන්න උත්සාහ කරන්න එපා. මට ඔයා වෙනුවෙන් ජීවත් වෙන්න ඉඩ දෙන්න.'

'අනේ රත්තරං කසුන් අයියෙ. මට ඔයා වෙනුවෙන් ජීවත් වෙන්න ඉඩක් නැතිකොට... ඔයා මං වෙනුවෙන් දුක් විඳින එකේ තේරුම මොකක්ද?...'

ඉස් ඉස්සෙල්ලාම හිත පතුලෙ පූදින ආදර හැඟීම ජීවිත කාලයටම වද දෙන පිළිකාවක් කරන්න එපා. ඒක හරිම පිච්චුරු



දෙයක්.... අපිට සදාකාලයම මෙහෙම ඉන්න පුළුවන්. ඔයා මගේ ළඟ නොහිටියට කමක් නෑ. මං සුදු නංගිට ඈතින් ඉඳගෙන ආදරේ කරන්නම්....'

මේ අපේ අවසන් හමුවීම යැයි මම බිය වමි. එසේ සිතා සුදු නංගීගේ දෙකොපුලට අත තබා පුංචි දෙනෙත මවෙත හරවා ගතිමි. ඇය නුවන් මුවා කොට මා රැවටීමට උත්සාහ කළේ නැත. දෑසට එබී මිමිණුවා ය.

'කසුන් අයියගේ අතේ සීතල....'

'ඔව් සුදු නංගී. මුළු ජීවිතේම හිරිකඩ සීතලක් වෙයි ඉස්සරහට. මගේ හිත මළ මිනියක් වගේ සීතල වෙලා....'

'නපුරු කතා කියන්න එපා...'

සුදු නංගී බිම බලා ගත්තී ය. මම තණතිල්ල දිගේ දෑස නොපෙනෙන ඉසව්වකට යා කළෙමි. මිතුරු සුළඟ අපේ පෙම් පණිවිඩය රැගෙන යාමට මෙන් අප අසළ දැවටේ. ඇගේ සිහින් කෙස් රොද මා මුහුණේ දැවටේ. සුදු නංගී සුදු සුමුදු දෑතින් මගේ ඇඟිලි තුඩු අල්ලා ගෙන සිටියා ය.

'කසුන්, ඔයාට මාව නැතුව කොච්චර කල් ඉන්න පුළුවන්ද?'

'මොහොතක්වත් ඉන්න බැරි තරමට ඔයා මට සමීපයි. ඒත් ළංකර ගන්න බැරි තරමට හැමදම මගෙන් ඈත් වෙනවා.'

මම සිහින් ලෙස කීවෙමි.

'මට මාස තුනක් ඉන්න වෙනවලු ලන්ඩන්වල. රොහාන්ල කැමති වෙලා අම්මට ඉතිරි සල්ලි දෙන්න. මට ඒවට වන්දි ගෙවන්න වෙයි කසුන්. සල්ලි දීල මගේ ලෙඩේ හොඳ කරල මාව අයිති කරගන්න හදන්නේ....'

'මම ඒක දැනගෙන ඉන්නේ...'

'ඉතිං ඔයා ඒකට ඉඩ දෙනවද?'

For E - Pusthakalaya

'නෑ. පල්ලිවලට හැම දෙයක්ම තීරණය වෙන හන්ද මං දන්නවා. ඒකට ඉඩ සැලසෙනට. මහෞෂධය වගේ සඳුන් කැටක් මිටින් අරන් මං ඉපදුනේ නැති නිසා.'

මම ඒක එල්ලේ උත්තර දුනිමි

'ඔයා හදවත ගලක් කරගෙන. දුක ඒක අස්සේ තෙරපගෙන. දුක ඉවසන්න නේද හදන්නේ?'

චාපා මගේ මුහුණට එබී ඇසුවා ය. ඇගේ කඳුළ නළියන දැසට මම කතා කළෙමි.

'ඉවසනව කියන්නෙ දුක තව තවත් එකතු කිරීම විතරයි. මට ඒ ඉවසීම ක්‍රෝධයක් කරගන්න ඕන. ඔයා මගෙන් ඈත් කරන්න හදන දුප්පත්කමට ශාප කරන්න ඕන. මගේ හදවත ගලක් වගේ තමයි. ඒත් සීතල අයිස් කුට්ටියක් වගේ....'

ඕ මගේ පපුව මත දෑත ම තබා ගෙන තද කළා ය.

'මිය අත් දෙකට ඒ සීතල දැනෙනව නේද සුදු නංගී?'

මම විමසීමි.

'මං දන්නව මං වෙනුවෙන් ඔයා දුක් වෙනව කියල. දුක අපේ ආදරේට සීමාවක් කර ගන්න එපා කසුන්...'

'සීමාවල් තියාගෙන ආදරේ කරන්න බෑ. මට මගේ හදවතේ සිදුරු තියාගන්න බෑ. කවම කවදකවත් තවත් කෙනෙකුට රිංගන්න පුළුවන් විදිහට කවුළු තියාගෙන මම ආදරේ කළේ නෑ. සුදු නංගී මගේ හදවත ඇතුළට වෙලා කවුළු වහගෙන ඉවරයි...'

අරමුණකින් හෝ නිතව්වකින් තොරව අපි බලා සිටිමු. තව දින කීපයකින් ඕ ශල්‍යකර්මය සඳහා රට හැර යනු ඇත. නන්නාඳුනන දුරු රටක දී රෝහල් ඇඳක් මත සිට මසිත පිරි මදිනු ඇත. රෝහාන් නිරන්තරව ඇයට සමීප වීමට උත්සාහ දරනු ඇත.

'මම ලන්ඩන් නොයා ඉන්නම් කසුන්. අපි කොහේ හරි යමු'

චාපා හිටි ගමන් කීවා ය.



'ඇයි?'

මම ප්‍රශ්න කළෙමි.

'ඔයා දන්නෙ නෑ නේද මගේ අසනීපෙ? එකක් නෙමෙයි අසනීප තුන හතරක්. මට කවමදකවත් පිරිමියෙක් එක්ක විවාහ වෙන්න බැරිලු. කවදකවත් විවාහ වුණත් ළමයෙක් ලැබෙන්නේ නැතිලු. මගේ 'මිවරිස් ඔපරේෂන් කරන්න ඕනලු. තව අවුරුද්දකට ඉස්සර මේව නොකළොත්....

'මටත් ටික දවසකට ඉස්සර හීන කියලා ජාතියක් තිබුණ සුදු නංගී. ඔයා වගේම දුවෙක් ඔයාගෙන් ලබන්න. ලස්සන දිග කොණ්ඩයක් තියෙන. ලස්සන ඇස් දෙකක් තියෙන. පුදුම තරම් ලස්සන කටහඬක් තියෙන. මම මහ පාරේදී වුණත් පුංචි පැටියෙක් දැක්කම අනාගතය ගැන එහෙම හිතුවා....'

'මගේ අතින් ඒක කවමදවත් ඉටුකර ගන්න බැරි වෙයි.'

'නෑ. මම පස්සේ හිතුව ඉස්සෙල්ලා ලැබිච්ච ඔයා පස්සෙ ලැබෙන දරුවෙකුට වඩා අගේ කියලා...'

නව රඟහලේ 'අරංගේත්‍රම්' ඇරඹී තිබිණ. අපට නෘත්‍ය ප්‍රසංගය නැරඹීමට තරම් අවැසි බවක් නොතිබිණ. එහෙත් දෙදෙනා ම ශාලාවට පිවිස පිටු පස ම පේළියේ හිස් පුටු දෙකක වාඩි වීමු. සුදු නංගී අසුන් ගත් සැණින් ඇගේ හිස මගේ ළැමට තබා තද කොට සුවය සොයන්නට වූවා ය. මම ඇඟිලි තුඩු ඇගේ කෙස් රොද අතර ඇවටූවෙමි. තාල තබන බෙර පද තාල හඬට මෙන් මගේ පපුව අතර රිදුම් දෙන්නට වී ය. නිසොල්මන් අඩ අඳුරේ අපි දෙදෙනා තනි වීමු.

'කසුන්, මට මෙහෙම හැමදම ඉන්න ඉඩ දෙන්න. මං ඔයාගෙන් ඈත් වෙන්නේ නෑ. ආත්මයක් ආත්මයක් පාසා මම ඔයාව හොයාගෙන එනවා.'

සුදු නංගී කඳුළු කැට හළමින් මුදු ලෙස කීවා ය. මම ඇගේ මුව දෙතුන් විටක් සිප ගතිමි. අප දෙදෙනා ආත්මීය ලෙස සම්බන්ධ වී ඇතුවා නොවේ ද? ඉතිං සුදු නංගීට මා හැර යන්නට ඉඩ දෙන්නේ කෙසේ ද?

For E - Pusthakalaya

ඩා පාට අඳුරත් නව රඟහල පුරා පැතිර තවත් අප දෙදෙනා හුදෙකලා කළේ ය. සොහොස මෝරා වැඩී අපි අපට ම අහිමි වීමු. මම මගේ දෙතොලින් ඇගේ කම්මුල් සිපි මදින්නට වීමි. ආදරය පිළිබඳ කුඩුම්හත් බලාපොරොත්තු පමණක් ඉතිරිව තිබියදී සියල්ල මගෙන් ඈත් වූවා මෙන් වී ය. ඇය මුහුණ උඩුකුරු ලෙස මදෙසට හරවා මගේ බෙල්ලේ එල්ලුණා ය. ඇගේ කඳුළු මුසු ඉකි බිඳුම් විසින් චිත සන්සුන් වී ඉතිසතිති නොසන්සුන් මගේ මුහුණ දෙස බලා ගත්මි ය. මසිත ගැහී වෙව්ලා ඉරිතැලී ගියේ ඉන් පසුව යි. මේ සිසිල් සිරි මුදු සඳ මඬල මා අප ගැටසෙන අවසාන හෝරා කීපය මෙය යැයි මට සිතුණි. සුදු නංගී සදාකාලයට ම ආත්මගත අපේ සුසුම් පොද අද සමු ගන්වන්නේ ද? මම ඇගේ නොසන්සුන් දෑස දෙස බලා ඇසිපිය හෙළීමි. මගේ දෑසින් වැටුණු ලොකු කඳුලක් සුදු නංගීගේ නිල් පාට රළි ගවුමට වැටී සෙත උරා ගත්තේ ය. අපි අපගේ අසුන්වල ම වාඩි වී වචනයකුදු නොදෙඩා බොහෝ වේලා සිටියේ එකිනෙකා වැළඳ ගෙන ය. මම වැරෙන් සුදු නංගීගේ අත මිරිකා අල්ලා ගතිමි. අනේ සිතල..!

සුදු නංගී...

ඇයි මගේ කසුන්...

හැඟීම් අඳුරු වූ සුදු නංගීගේ නිල් නුවන් මත මසිත වැතිරිණ. [illegible] ය. [illegible] ය. එහෙත් අචල ය.

'සොහොයුරු ළඟත් මට ඔයා නැතුව බෑ සුදු නංගී..... මාව සොහොයෙක් වෙයි. මං ජීවත් වුණේ ඔයා හින්ද... මට ඔයා වෙනුවෙන් මැරෙන්න ඉඩ දෙන්න රත්තරං....'

වියෝගය පිළිබඳ ක්ෂණික හැඟීමක් මාසිත පතුලේ වැදී විසිරිණ. මම බොහෝ බොළඳ වදන් ඇගේ සවනට මිමිණුවෙමි.

'ඔයාට කුසුරුවන්ගේ සරණයි කසුන් අයියේ. හොඳ කසුන් අයියා වගේ මගේ හිත අඬවන්නේ නැතුව ඉන්න. අපි අද සතුටින් ඉමු. සමහර විට අපේ අන්තිම හමුවීම මේක කසුන් අයියේ. නන්නාඳුනනා රටක සීතල ඇදක මම මැරෙන්නත් පුළුවන්. ඔපරේෂන් එක අපි හිතන තරම් අපි නැතුව ඇති. මම සේරටම මුහුණ දෙන්නම්. මට තනි



වුණොත් ගොඩක් හිත රිදවගෙන අඬන්න තියෙනවා. මම පහුගිය විතර අඬන්නේ නැතුව හිටියේ අඬන්න කඳුළු නැතුව නෙමෙයි. රතු වෙච්ච ඇස් දෙකින් ඔයාගේ සුදු මුහුණ දිහා බලන්න දුකට...'

ඇය හිස පහත් කර පපුවට ළං කොට ගත්තී ය. සුදු නංගීගේ උණුසුම් සුසුම් පොද පපුවේ දැවටී ආත්මයට කිඳා බසී. අපරිමිත සොහොසේ උත්තරීතර බව මා සිතේ නිනාද වේ. අපි දෙදෙනා මාරුවෙන් මාරුවට දෙකොපුල් සිප ගතිමු. සුදු නංගීගේ සුදු මොළොක් මුහුණ මගේ උරහිස මත රැඳිණ. කෑ ගසා විලාප දීමට තරම් ප්‍රකම්පිත මගේ හද ගැස්ම තෙරපී තෙරපී හිනියට ගැස්සිණ. මම ඇගේ හිස සිපි මැදිමි.

'මගේ රත්තරං සුදු නංගීට සියලු දෙවි දේවතාවුන්ගේ පිහිට ලැබෙනවා. ඔයා ඉක්මනට සනීප වෙයි. අඬන්න එපා සුදු නංගී. මට වාව ගන්න බෑ. ඉතිං අඬන්නේ නැතුව ඉන්න.'

'අපි දෙන්නම අඬනවා කසුන්. ඒක නවත්තන්න කාටවත් බෑ. දුරින් ඉන්නවට වැඩිය ළඟට වෙලා අඬඅඬා ඉන්න එකත් සැපක්. හිතට හොරා අපි හඬාවී කසුන්....'

ලේන්සුව ගෙන සුදු නංගී මගේ මුහුණ, දෙඇස් පිස දැමුවා ය. මම දෙතොලින් වාපාගේ කඳුලක් සිප සීතල දෙකොපුලේ තැවරීමි.

'චිරි·····' යන හඬින් අපි දෙදෙනා ප්‍රකෘතියට පත් වීමු. නව රඟහල ආලෝකවත් වී ය. කඩිනමින් ශාලාවෙන් පිටවීමට තරම් අපි දෙදෙනා ම කඩිසර වීමු.

එහෙත් ශාලාවෙන් පිට වී මල්පාර දිගේ ඇවිද පටු මාවතට වැටෙත් ම වාපාගේ කෙළිලොල් බව වසත් වී ය. මා ළඟින් අඩි කබා සම්පව දැවටී දැවටී ගමන් කිරීමට තරම් ඈ ළබැඳි වූවා ය. හරියටම ඉරට මුවා වූ කළුවර විසින් හෙවණැලි ගහකොළට සමීප කළා වගේ ම ය. ඒ පහසින් මිදීමට මහත් වූ ලෝභකමක් මසිතේ දැවටී තිබු අතර මගේ සුදු නංගී මට බෙහෙවින් කීකරු වූවා ය. හිටි ගමන් සුදු නංගී උරහිසට වාරු වී ගමන නැවැත්තුවා ය.

'කසුන්...'

For E - Pusthakalaya

'ඇයි?'

'ඔයා මට කොච්චර ආදරේද?'

'ඒකෙ සීමාවක් නෑ සුදු නංගී. මෙච්චර මෙච්චර කියල කියන්න මං දන්නේ නෑ. ඒක මහ පුදුම අසීමිත දෙයක්....'

මම නැවත කීවෙමි.

'අපි හමුවෙන අන්තිම දවස අද. මට ආයෙත් ලන්ඩන් යන්න ඉස්සර ඔයාව හමුවෙන්න බැරි වෙයි. ඒත් මට හැම මොහොතකම ඔයාට ලියන්න ඉඩදෙන්න. ඉස්සරහට මට හැම දෙයක්ම ඔයාට ලියන්න වෙයි. ගමනට සල්ලි බාගයක්ම වියදම් කරන්නෙ රොහාන්ල. ඒ මගේ ජීවිතේ උසස් ගන්න. ඒත් මට ලංකාවට එන්න ලැබුණොත් මම ඔයා ඉන්න තැනක් හොයාගෙන එනවා. මට හැම හීනෙකම මගේ කසුන් අයියව පෙනේවි. හැම හුළං පොදකම ඔයාගේ සුවඳ දැනේවි.'

ළා අඳුරු කළු පැහැය තුරු පත් මත නැවතී තිබිණ. අපගේ ඡායාවන් දැකීමට මෙන් මම නෙත් බිමට පතිත කලෙමි.

'අදත් හොඳටම රෑ වුණා.'

'කමක් නෑ, ඔයාට ඇති වෙනකල් අද මාව තියාගන්න.'

'මට ඔයාව හැමදම තියාගන්න ඕන.'

මම කීමි. එහෙත් සුදු නංගී කතා කලේ නැත. ඕ මට ත් පෙර පල්ලිය ළඟ අවන් හලට ඇතුළු වූවා ය.

'කොහේද යන්නෙ?'

මම විමසීමි.

'කෝපි බොන්න. කෝප්ප දෙකක් නෙමෙයි එකක්. දෙන්නම ....' වාපා සිනාසීමට උත්සාහ කළා ය. මයිතේ සිනාව ගව් ගණනක් ඈතට පාවී තිබිණ. මුල්ලේ පුංචි රවුම් මේසේ අපි දෙදෙනා ම වාඩි වීමු. කෝපි කෝප්පයකට ඇනවුම් කළ සුදු නංගී මගේ අතින් දින පොත ඉල්ලා ගත්තී ය. පසුව රන්වන් මුතු අකුරින් එහි සටහනක් කළා ය.



පසුව මගේ වෙදැගිල්ල පෙන ඇවිදි තුඩින් තද කොට අල්ලා ගත්තී ය.

'චුට්ටක් රිදෙයි. නොහොල්ලා ඔහොම ඉන්න.'

මම ඇගේ මුහුණ දෙස බලා සිටියෙමි. ඇය අල්පෙනෙත්තක් ගෙන වෙදැගිල්ල සිදුරු කළා ය. පසුව හෙමිහිට මිරිකුවා ය. පුංචි රතුපාට ලේ බිංදුවක් ඒ මත මතු වී ය. ඇය මාපටැගිල්ලේ එය තවරා දිනපොතේ රතුපාටින් ඇඟිලි සලකුණු තැබුවා ය. තමාගේ වෙදැගිල්ල ත් සිදුරු කොට මගේ මාපටැගිල්ලේ තවරා ඇඟිලි සලකුණ ඒ මත තැබුවා ය.

'මේක ගිවිසුමක්. ආත්මයක් ආත්මයක් ගානේ මං මගේ කසුන් අයිය ළඟ ඉන්න බවට ගිවිසුමක්.'

එ දින හවස් වරුවේ වාපා බොහෝ සතුටින් ගත කලේ එකී ලේ සලකුණු මගේ දිනපොතේ තැබීමෙන් පසුව යි.

අපි කෝපි බී පුරුදු පරිදි ගාලුපාරට පැමිණ රත්මලානට ගියෙමු. මම එද ත් පටු මාවත දිගේ සිරිමල් උයනට ඇවිද ගියෙමි. මාවත කෙළවර දී වාපා මා නවතා නළල ත්, දෙකොපුල ත්, දෙතොල ත්, දෑත ත් එකවර බැගින් සිප දෙපා මුල වැඳ වැටී දෙපා සිප සිරස දී නමැද්ද ය. මම උරහිසින් උස්සා සුදු නංගී බද ගෙන හැඬුවෙමි. අපේ අවසන් සමු ගැනීම සිදු වූවා යැයි මට සිතුණි. මම බොරැල්ල බසයකට නැඟී පිටු පස ම අසුන මත හිස ඔබා තනිව හැඬීමි. කාමරයට ගොස් මගේ හිස බිත්තියේ ගසා ගතිමි.

ගෙල වැල ලාගෙන මිය යන්නට මට සිතේ.

බියකරු සිහින දකිමින් මම රැය පහන් කලෙමි. විටෙක සිත හැකිළෙයි. නෙත් පියවේ. දෙබැම ගැස්සේ. මුළු ජීවිතය ම වේදනාවෙන් මිරිකෙන්නා සේ මට දැනේ. මම දිනපොත ගෙන සුදු නංගී එහි සටහන් කළ මුතු අකුරු පෙළ කියවීමි. අප දෙදෙනාගේ ම ලේ තැවරුණු ඇඟිලි සලකුණු මම දෑසින් පිරි මැදිමි.

For E - Pusthakalaya

ආදරණීය කසුන්,

ඔයා අවංකයි. අව්‍යාජයි. ආත්මයක් ආත්මයක් පාසා මගේමයි.

සුදු නංගී

යනුවෙන් ඈ සටහන් කළේ කුමන අරමුණකින් මුළුත් පත් කර ගැනීමට ද? මේ සිදුවීම් සියල්ල ම කාට හෝ කියා සිතේ තෙරපෙන බර ලිහිල් කර ගැනීමට මම සිතුවෙමි. සත්තකින් ම මේ සියල්ල මට නෑ ගසා කියා ගැනීමට අවැසි සුදු නංගී හමුවේ ය. එහෙත් චාපා හමු වීම කළ නොහැක්කකි. නිරංග විභාගයෙන් පසු ගමට ගියේ ය. ඔහු රැකියා සඳහා ඉල්ලුම්පත් පුරවන බව මට දන්වා තිබුණේ ය. මම ගිහාන් හමු වීමට බත්තරමුල්ලට ගියෙමි.

'ගිහාන් ගෙදර නෑ ළමයෝ කැන්ටිමේ හිටපු අශෝක හමුවෙන්න මතුගම ගිහිල්ලා...'

ගිහාන්ගේ මව කිවා ය. තර්ස්ටන් කැන්ටිමේ සිටි අශෝක රණතුංග සමග හවුල්ව නාට්‍යයක් නිර්මාණය කිරීමට වෙහෙසෙන බව ගිහාන් මට පෙර දිනෙක කිවේ ය. මම ගිහාන් හමු වීමේ අවශ්‍යතාවද බැහැර කොට බොරැල්ල දක්වා ආවෙමි. රුදුරු වනයෙක අතරමං වූවෙකු මෙන් මම කොළඹ නගරයේ එහෙට මෙහෙට ගමන් කළෙමි. මට මේ සියල්ලට විසඳුමක්, සිත සනසා ගැනීමට පිළිවදනක් අවැසි බව මනාව තේරුම් ගොස් තිබිණ. මම උත්තරා නංගී හමු වීමේ අටියෙන් 'ගේට් වේ' පන්තිය අසල රැක සිටියෙමි. මා දුටු මතින් උත්තරා නංගී මා වෙතට ඉගිලී ආවා ය.

'කොහොමද කසුන් අයියේ, ඊයේ අරංගේත්‍රම් බැලුව කියලා ආරංචියි. අනේ බලන්නකෝ, අප්පච්චි මට එන්න දුන්නේ නෑනේ.' උත්තරා නෝක්කාඩු ලෙස කිවා ය. මම කිසිත් නොදෙඩුවෙමි.

'මට උත්තරා නංගීත් එක්ක කතා කරන්න ඕනෑ. මං මේ කාලකන්නි තත්ත්වෙකට පත් වෙන්න යන්නේ නංගී. කොළඹ නැවතිලා ඉන්නත් බෑ. චාපා ඊයේ මගෙන් ලන්ඩන් ගමනට සමුගත්තා. මට එයා කවද්ද දකින්න ලැබෙයිද මන්ද.'

'ඉතිං එයා ලෙඩේ සනීප කරගෙන ආපහු එයි...'



උත්තරා ගණනක් නොගෙන කිවා ය. එහෙත් යටැසින් මදෙස බැලුවා ය. මම ඇය හඳුනා ගතිමි.

'ඔගොල්ලෝ ඔක්කොම දන්නවා මට සුදු නංගී දිනා ගන්න බැරි විත්තිය. මාව රවට්ටන්න එපා උත්තරා. දන්න දේවල් මට ඔක්කොම කියන්න.'

අපි දෙදෙනා හිමි හිමින් බොරැල්ල දක්වා පයින් ගමන් කළෙමු. උත්තරා බොහෝ වේලාවක් නිහඬව සිට කතා කළා ය.

'ඇත්තටම කසුන් අයියේ මේවා ඔයාට නොකිවේ තවත් ඔයාගේ හිත රිදවන්න බැරි හින්ද. අද උදේම මට බොරැල්ලේදි චාපගේ අම්මා හමු වුණා, රොහාන් එක්ක. චාපාට 'ග්ලාස් හවුස්' එකෙන් බෙහෙත් කරන්නෙ පෙරී දියලගොඩ කියලා ඩොක්ටර් කෙනෙක්. එයා ඉන්නේ කොටා රෝඩ්වල. ඊයේ ඔයත් එක්ක අරංගේත්‍රම් බලලා ගෙදර යන කොට හොඳටම රෑ වෙලා. රොහාන් අම්මත් එක්ක නව රඟහලට ඇවිල්ලා. එතකොටත් චාපා ඉඳලා නැතිලු. පස්සේ ගෙදර ගිහිල්ලත් නැතිලු. පස්සේ හොඳටම බයවෙලා. ගෙදර එනකොට රෑ අටත් පහු වෙලාලු. චාපගේ අම්මා හොඳටම අඬනවා. රොහානුත් ඔයා ගැන හොඳටම වෛරෙන් ඉන්නේ. ඒ අය දැනගෙන ඔයත් එක්ක කොහේ හරි ගියා කියලා. ඊයේ රෑ නිස්සේ චාපාට හොඳටම අමාරු වුණාලු. උදේම කොටා රෝඩ් ඇවිල්ලා තියෙන්නේ ඩොක්ටර්ව එක්ක යන්න.

සුදු නංගී ඊයේ මගෙන් සමු ගන්නා විට අසනීප තත්ත්වයක් තිබුණේ නැත. ඕ අසනීප තත්ත්වය මා ඉදිරියේ වසන් කළා වත් ද? ඈ කෝපි බී අවන් හලෙන් පිට වී රත්මලානට යන තෙක් එකදු කඳුළක් වත් හෙළුවේ නැත. ඇය දින පොතේ ගිවිසුමක් පෙම් සිහින් සටහන් කොට බොහෝ සතුටින් සිටියා ය. මගේ සිත සතුටින් තියන්නට සුදු නංගී තමාගේ රෝගී වේදනාව යටපත් කොට උඩු සිහින් සිනාසුණා යැයි දැන් මට සිතේ.

'මට තේරෙන්නේ නෑ උත්තරා සුදු නංගී මට හරියට කියන්නෙත් නෑ මොකද්ද එයාට ලන්ඩන් ගිහිං කරන්න තියෙන ඔපරේෂන් එක කියලා. මේ රටේ කරන්න බැරි තරම් ලොකු ඔපරේෂන් එකක් කරන්න සුදු නංගීට තියෙන ලෙඩේ මොකද්ද? මොනාක් වුණත් ලොකු අසනීපයක්.

For E - Pusthakalaya

'ඇයි එයා මට ඒවා නොකියන්නේ?'

'ඔයාට කියන්න තියා එයාවත් හරියට ඒ ගැන දන්නේ නෑ කසුන් අයියේ. එයා මේ ළඟදී වෛද්‍ය වාර්තා සේරම ඇඟ ළඟ තියාගෙන තියෙව්වා. ඒකේ තියෙන්නේ පුංචි පුංචි දේවල් විතරයි.'

උත්තරා බොහෝ දේ දැන මගෙන් වසන් කරතැ යි මට සිතිණ.

'ඇයි උත්තරා නංගිට බැරි සේරම මට කියන්න?'

'මමත් සේරම හරියට දන්නේ නෑ. දැන් නම් ඔපරේෂන් එක මෙහෙ කරන්න පුළුවන්ලු. ඒත් භයානක නිසා තමයි ලන්ඩන් යන්න හදන්නේ. පුංචි කාලෙ නිතරම වාපට සෙම් ගෙඩි හැදිල. ඒකාලෙ තමයි ඇවිදින්න බැරුව ඉස්පිරිතාලෙ ඉඳල තියෙන්නේ. වාපා විශාකා එකට ආපු අලුත පුංචි කාලෙ. මේ දවස්වලම එයා කැඟහල බඩ රිදෙනවා කියලා. වාපාගේ ඔවරිස්වල පුංචි පුංචි ගෙඩි තියෙනවලු. රූමැටිසියාව හින්ද එයාගේ සපුවෙ ලේ ගමන හරියට සිද්ද වෙන්නෙ නැලු. එයා සමහර වෙලාවට හතිදන්නෙ ඒ නිසා වෙන්න ඇති.'

මම බොහෝ දේ කල්පනා කරමි. රූමැටිසියාව වැළඳුණු විට හැදවත් කපාට පුංචි වී ඇකිළී රුධිර වහනය සිදු නොවන බව මම දනිමි. රූමැටිසියාව වැළඳුණ විට එක්කෝ ද්විතුණ්ඩ හා ත්‍රිතුණ්ඩ කපාට හැකිළෙයි. එක්කෝ විශාල වේ. බයෝ සයන්ස් පංතියේ උගත් බොහෝ දේ මම වාපාගේ රෝගය සමග සමීකරණය කළෙමි.

'එකත් හෙමෙයි. වාපට ලෙඩ දෙකක්. ඒ නිසා ඔපරේෂන් දෙකම කරන්න තමයි වාපා යන්න හදන්නේ. මහන්සි වුණාම මේ ලෙඩේ වැඩි වෙනවලු. ඊයෙ හොඳටම අමාරු වෙලා.'

මගේ දෑසින් කඳුළු පිට පැනීමට තැත් කරයි. මම උත්තරා නංගි ඉදිරියේ කඳුළු වසන් කළෙමි.

'ඒ කාලෙම ඩොක්ටර්ස්ල කියල තිබුණලු හැම මාසෙම වාපට පෙනිසිලින් එක එක විදින්න කියල. ඒත් පෙනිසිලින් රිදෙන නිසා අන්තිමට වාපා බෙහෙත් විදගන්න එක අත් ඇරල. දැන් ලෙඩේ වැඩි වෙලා තියෙන්නෙ ඒ හින්ද කියල ඩොක්ටර් ටෙරී කියල. මං හිතන්නෙ ජනවාරි දහඅට ඒ අය ලන්ඩන් යනවා.'



මම තිගැස්සීමි. වාපා සුවපත් වේවා යි සිහින් මෙත් පැතුම පැතිමි.

'ඔයා දන්නවද උත්තරා වාපා ලන්ඩන්වල ගෙනියන්නෙ මොන ඉස්පිරිතාලෙටද කියල?'

'ඩොක්ටර් ටෙරි දියලගොඩ නම් කියල තියෙන්නෙ මේ ලෙඩේට හොඳම ඩොක්ටර් ජාකොබ් පීටර්සන් කියන ශල්‍ය වෛද්‍යවරයාලු. එයා ඉන්නෙ ගයිස් හොස්පිට්ල් එකේද (Guy's Hospital) හැමර් ස්මිත් හොස්පිට්ල් එකේද (Hammer Smith Hospital) කියල දන්නේ නැතිලු. කොහොම හරි ඒ දෙකෙන් එකකට තමයි ගෙනියනව කියන්නෙ.'

උත්තරා මා නොදත් බොහෝ දේ නොසඟවා මවෙත හෙළි කළා ය. මසිතේ උත්තරා නැඟණිය වෙනුවෙන් අපමණ සෙනෙහසක් උපදී.

'පිංසිද්ද වෙනවා උත්තරා. මට ඕනකම තිබුණෙ මේකෙ අග මුල දැන ගන්න. දැන් හිත ටිකක් නිදහස්. ඒත් මට දැන් වාප දකින්න ආයෙත් ආසයි. මට දැන් තේරෙනව වාපගෙ ලෙඩේ මොකක්ද කියලා. මම කලින් මේව මොකවත් දැනගෙන හිටියෙ නෑ උත්තරා. මට පුළුවන් කමක් තිබුණ නම් සුදු නංගි ළඟට වෙලා ඉන්න...'

උත්තරා කිසිවක් නොකීවා ය. එහෙත් දෑස බිමට ඔබා ගෙන ම ගමන් කළා ය.

'හැම දෙයක්ම හොඳින් සිද්ද වෙයි කසුන් අයියෙ. ඔයා මොකවත් වැඩිය හිතන්න එපා. ඔක්කොටම ඉස්සර වාපගෙ අසනීපෙ හොඳ කරගන්න එකට අපි උදව් කරන්න ඕන. හැම දෙයක්ම සිද්ද වෙන්නෙ වාපගෙ ජීවිතයත් මරණයත් අතර. ඉතිං ඊයෙ එයා මහන්සි වෙලා. ඒකයි අසනීපෙ වැඩිවෙලා තියෙන්නෙ. මට නිකම් හිතෙනවා ඔය දෙන්න දවසක් බොරැල්ලේදී වැස්සෙ තෙමුණු එකත් හොඳ නෑ කියල. මොකද එහෙම වුණාම ලෙඩේ නියුමෝනියාවට එනවලු. වාපා මේව දැනගෙන ඉඳල නෑ. එයා හැම මාසෙම පෙනිසිලින් අරගෙනත් නෑ. එයා දැනගෙන ඉඳල නෑ තමන්ගේ ලෙඩේ ගැන. ඉතිං මේ ටික චුට්ටක් ඉවසලා ඉන්න. වාපා හමුවෙන්න යන්න එපා. රෝහාන්ල උනත් පුදුම වෛරයකින් ඉන්නෙ ඔයත් එක්ක. ඒ අය හිතන්න ඔයා නිසා ලෙඩේ වැඩි වුණා

For E - Pusthakalaya

තියල. වාපාගේ හිත රිදවන්නත් එපා. ඒයෙත් හොඳටම අමාරු වෙලානේ.

උත්තරා මට උපදෙස් දුන්නේ මා මෙල්ල කිරීමට මෙනි. මා සියල්ල උපේක්ෂා සිතින් විඳ ගතිමි.

'අරමුණක්වත් බලාපොරොත්තුවක්වත් තිබුණා නම් මට ඉවසන්න තිබුණා උත්තරා. නංගිට තේරෙන්නේ වාපාගේ ලෙඩේ ගැන විතරයි. වාපාගේ අම්මගේ වේදනාව ගැන විතරයි. මට වාපාගේ හිත තේරෙනවා. එයාගේ හිත දුකින් පිරිලා තියෙන්නේ. රොහාන් එහෙ ඇවිලෙනවටවත් එයා කැමති නැතුව ඇති.'

මම මහත් වේගයකින් උත්තරාට කීමි. එහෙත් උත්තරා කීවේ හාස්පසින් ම වෙනස් කතාවකි.

'මය කියන දේ තරමක් ඇත්ත කසුන් අයියේ. ඒත් අපි දැක්කේ වාපගේ පැත්තෙන් විතරයි. රොහාන් ලක්ෂ තුන ක් වියදම් කරනවලු. එයා වාපා ඉස්කෝලෙට එක්ක ආවේ කාර් එකේ. හවසට එක්ක ගියේ කාර් එකේ. ගෙදරින් පිට කොහේවත් ඇරියේ නෑ. පුස්තකාලෙට ආවත් කාර් එක අරන් එනවා. දවසක් වාපාගෙ කම්මුලට ගහලත් තියෙන්නේ ඒකලු, මහන්සි වෙනවා කියලා. ඉතින් රොහාන් නිතරම එයාව ආරක්ෂා කළා කියලා කියනවා. වාපගේ අම්මා වුණත් මේ නිසා තරමක් පැහැදිලා ඉන්නේ.'

මසිත ගිනි ගත්තේ ඉන් පසුව යි. මම දිලිසෙන දෑසින් උත්තරා දෙස බැලීමි.

'හැබැයිම පේන්නේ උඹු යටිකුරු වෙලා උත්තරා. ඔයා නොදන්න දේ කොච්චර තියෙනවද?'

මට කීමට අවැසි වූයේ රොහාන් තරුම ජව පැවැත්මක් ඇත්තකු බව යි. මම පුදු නංගීගේ ආත්මය ගැන සිතා කිසිවක් නොකීමි. ගෙදර වැඩට හිටපු කෙල්ල ගිය හැටි ත්, බෙල්ලන්විල පැත්තේ රොහාන්ගේ අනියම් බිරිඳ පිළිබඳව ත් මම සියල්ල දනිමි. වාපාගේ කාමරයට රාත්‍රී පැමිණ අනතුරු ඇඟවූයේ ත් මේ ගැත්තා නොවේ ද? ඉතිං මුදල් මත හා රැවටීම මත වාපාගේ මව පැහැදීමකින් සිටී මට විසඳා ගත නොහැකි ගැටලුවක් වී ය



විසඳුමක් පතා උත්තරා නංගී හමු වී මා උත්තරාගෙන් සමු ගත්තේ ප්‍රශ්න දෙකුන් ගුණයක් වැඩි කොට ගනිමිනි. සිත වඩ වඩා රෝගී වී මට වද දෙන්නට වී ය. ඒ දින දවස පුරා මම නගරයේ මං මුළා වූවෙකු මෙන් ඇවිද ගියෙමි.

නොඉවසිල්ලෙන් වකිතයෙන් හා විමතියෙන් දවස් ගෙවී යමින් තිබිණ. පුදු නංගී පිළිබඳ තොරතුරක් දැන ගැනීමට ලැබුණේ උත්තරා හමු වූ දිනවල පමණි. උත්තරා බොහෝ විට මට සැබෑව හෙළි කළේ නැත. වාපා ලන්ඩන් යාමට පෙර ගත කළ දින කීපය තුළ ඇගේ රෝගය උත්සන්න වී තිබූ බව මම පසුව දැන ගතිමි. ඒ බොහෝ සාඃ වී නොකා නොබී දවස් ගත කර ඇත. මේ නිසා ලන්ඩන් ගමන කඩිනම් කිරීමට වෛද්‍යවරයා ත්, වාපාගේ මව ත් තීරණය කරන්නට ඇත. උත්තරා අත ජනවාරි දහහත මට ලිපියක් ලැබිණ. බොහෝ අපහසුවෙන් අකුරු කරන්නට ඇතැ යි සිතෙන තරම් එකී ලිපියේ පුදු නංගීගේ අත් අකුරු අපැහැදිලි ය. අඳුරට තෙත් විවර කරමින් මම පහන් සිත් දල්වා ලිපිය කියවීමි.

ආදරණීය කසුන්,

මේ මොහොතේවත් ඔයාව දකින්න නැතුව මගේ හිත හඬනවා. දැන් දැන් මට ඔයාගේ සිත වඩ වඩා පිරිමදින්ට ඕනෑ. මගේ ලේ නැවත පරීක්ෂා කළා. ටී.සී.පී. ගත්තා. එක්ස් රේ කළා. මම ගිය අවුරුදු දෙකේ නිතරම පෙනිසිලින් විදගත්තේ නෑ. ඔයා දන්නවද කසුන්? පෙනිසිලින් විද්දම හරියට රිදෙනවා. මේ ලෙඩේ මට හරියට වද දෙනවා. දැන් දැන් මට තේරෙනවා මට හොඳටම අමාරුයි කියලා. ඇඳෙන් බහින්නවත් බෑ හතිය. ඇඳුම හැඳිල වගේ. ඔයාට ලියන්න පෑන අතට ගත්තම දෙපාරක්ම පෑන බිමට වැටුණා. මං දෑ, මගේ ලෙඩේ හොඳටම දන්නවා. ඔයාගේ සියුමැලි සිත මට පිරිමදින්න ඕනෑ මෙහෙම වෙලාවට. මගේ හිත ඔයා වෙනුවෙන් කැප වෙලා කසුන්. මේ ලෙඩ ඇඳේ ඉන්න කොට මට වැඩි වැඩියෙන් ඔයාව ඕනෑ වෙලා. මගේ සිත ඔයා වෙනුවෙන් හඬා වැටෙනවා කසුන්. මගේ ඇඳ ළඟට වෙලා ඔයා ඉන්නවා නම්... අනේ කසුන් ඔයා ළඟ පාතක හිටියා නම්...

For E - Pusthakalaya

මගේ ගමනට සියල්ල ලැස්ති කරනවා. ගෙදර යුද්ධයක් වගේ මට දැනෙනවා. අම්මා හැම දේම උවමනාවෙන් කරනවා. මගේ කාමරේ දොර නිතරම වහල තියෙන්නේ. මට අහස පොළව කොහේද කියලාවත් හිතා ගන්න බෑ. යාළුවො ආවත් මට කතා කරන්න දෙන්නේ නෑ. මේ ලියුම ලියන්නෙ අම්මට හොරෙන්. මගේ හිතේ ඔයා හොල්මන් කරනවා. මට මහා පුදුම සනීපයක් දැනෙනවා ඔයා මතක් වුණාම. මං ඔයා දිහාම බලාන ඉන්න කොට මගේ හිත ඔයා හොයාගෙන ඈත ඈත ලෝකෙකට පියඹනවා. මට හිතෙනවා ඔයා දෙවි කෙනෙක් කියලා. මගේ ජීවිතේ ඔයාට ආදරය කරන්න තරම් මම වාසනාවන්ත වුණා නේද කසුන්? ඔයාගෙ ආදරය මට බව දැනෙන කොට සියුම් උද්දාමයක් මගේ හිතේ පුදිනවා. ඒක හරි පූජනීයයි. මට ඔයා ඉදිරියේ පහන් වැටක් වගේ දැල්වෙන්න ඕනෑ. ඒත් ඒ පහන් වැට නිවියාමට ආසන්නද කියලා මං දන්නේ නෑ.

කසුන් හැම තිස්සෙකම ඔයාව දකින්න මං ප්‍රාර්ථනා කරනවා. පියෙවි ලොවෙන් නැති උණුසුම හිතෙන් මසිනට ලගා වෙනවා. එහෙම හිතන කොට හැම මොහොතකම මං ඔයාට ආදරෙයි. මං මහන්සි වෙනවා මට පුළුවන් හැම වෙලාවටම ඔයාව සිහි කර කර ඉන්න. මගේ රෝගයේ වේදනාව මම යටපත් කරන්නේ ඔයාව සිහි කරලා. ඔයා ගැන හිතන හැම මොහොතක්ම මගේ රෝගය යටපත් කරන දිව් ඔසුවක් වගේ. මගේ හිත සිසිල් වෙනවා. මං හැම මොහොතකම ඔයාට ආදරෙයි.

සත්‍යය කටුක වුවත් මං ඒකට මුහුණ දෙන්න සූදානම්. ලොකුවට දෙයකට මුහුණ දෙන්න ලැස්තියි. මම හැම කටුක දෙයකටම ලැස්ති වෙලා ඉන්න නිසා හිත සන්සුන්. මට පොත් කියවන්න ඉඩ දෙන්නෙ නෑ. මම උත්තරා ලවා පොත් කියවා ගන්නවා. ශේක්ස්පියර්ගේ 'ගිම්හානයේ රැයක සිහිනයක්' (Mid Summer night's dream) කියවා ගත්තා. මේ සියල්ල මම කරන්නේ හිත නිසල කරගෙන හැම දෙයටම මුහුණ දෙන්න. ඉතිං මම දැන්මම මගේ ගලපකමියට ලැස්තියි. සත්‍යය කටුකයි. ඒත් මට බයයි අපේ අනාගත සැලසුම් සියල්ලම බිඳ වැටෙයිද කියා. මට හොඳටම හොඳ වෙයි කියල ඩොක්ටර් නාම් කියනවා. ඒත් මං හීනෙන් වගේ මරණය දකිනවා.



ඔයාගෙ ආදරය ගැන මට සැකයක් නෑ කසුන්. මට මුළු ලෝකෙටම වැඩිය ඔයාගෙ ආදරේ ගැන වටිනාකමක් දැනෙනවා. මම රෝගය ගැන තවම දන්නේ නෑ. අම්ම ළඟ ඉඳිවි. හැමදේටම අම්ම මහන්සි වෙනවා. සමහර වෙලාවට තාත්තා ගැන කිය කියා අම්ම සාලෙට වෙලා අඬනවා. ඒත් මගේ ඉස්සරහ මේ මොකවත් අම්ම පෙන්නන්නෙ නෑ. මගේ හිත සතුටින් තියන්න දැන් දැන් හැමෝම උත්සාහ කරනවා.

මගේ දෑස් රතුවෙලා කියල නිතරම උත්තරා කියනවා. සමහර විට මම ඔයා මතක් වුණාම අඬන නිසා වෙන්න ඇති. මම අඬන්නේ දුක නිසා නෙමෙයි. මම කන්නාඩියෙන් මගේ මූණ බැලුවා. මගේ දෑස රතුවී ඉදිමී තිබුණා. කමක් නෑ. ඒත් මං හින්ද ඔයා නම් කවදාකවත් අඬන්න එපා. මට දරාගන්න බෑ. ඉතිං හදිසියට ලියුම ලිව්වෙ. මටත් ආසයි ලස්සනට ලියන්න. ඒත් හිත එහෙ මෙහෙ දුවන හින්ද ලස්සනට වචන ගලප ගන්න බෑ. මං හෙට උදේ පිටත් වෙනවා. අම්මා, ඩොක්ටර් වෙරී යන අයත් අපි එක්ක යනවා. මං ලංකාවෙන්ම සමුගන්නවා හැම සමුගැනීමක්ම නැවත එකතු වීමක් කියල මං හිත හදගෙන ඉන්නේ. ඒත්.....

මට අන්තිම මොහොතේ හරි ඔයාව දකින්න ඕනෙ. ගෙදර එන්න එපා. කටුනායක එයාර්පෝට් එකට එන්න. උදේ 8.15 ට ෆ්ලයිට් එක තියෙන්නේ. උදේම ඔයා එන්න. මගෙත් එක්ක කතා නොකළට කමක් නෑ. මට ඔයාව දකින්න ඕන. එකම එක වතාවක් ඔය මූණ දැක්කොත් ඇති. හෙට උදේම ඔයා හමුවෙයි කියා සිහිනය හිතේ තද කරගෙන මං නවතින්නම්.

මගේ කසුන්ට තුනුරුවන් සරණයි!

මං,

සුදු නංගී.

මම උදේ ම කටුනායක යාමට සූදානම් වීමි. නිරංග හමු වීමට මඟිවෙලක් ද නැත. ගිහාන් තව ම පැමිණ නැති බව ද මම දැන, තනිව ම කටුනායක යෑමට තීරණය කොට උදේ 5.45 ට පමණ මීගමු

For E - Pusthakalaya

ඔසයකට නැගී කවුනායකට ගියෙමි. අමුත්තාගේ කුටිය තුළ බොහෝ වේලාවක් රැඳී සිටිය ත්, නා නා විධ මිනිස් රූප දුටුව ත් මට සුදු නංගි දැක ගත නොහැකි වී ය. මා අවසර ලැබ තිබූ සීමාව තුළ ඔබමොබ ඇවිද ගියේ සුදු නංගී දැක ගැනීමට තිබූ නොඉවසිලිමත්කම නිස යි. එහෙත් හඬන දොඩන හිනා නගන නා නා සමූ ගැනීම අතරේ මට සුදු නංගීට සුභ පැතීමට ඉඩ ලැබුණේ නැත. උදේ 7.30 ට පමණ ගිලන් රථයක් ඇතුළු වනු දැක මම නිකමට මෙන් බැලුවෙමි. රෝහාන් රියැදුරු අසුන ළඟ වාඩි වී සිටියේ ය. වාසා අසල වාසාගේ මව ඉඳ ගෙන සිටියා ය.



# 13

දින හත අටක් ම මම සිදු වූයේ කුමක් දැයි වටහා ගත නොහැකිව සිටියෙමි. බොහෝ දිනවල නපුරු සිහින දැක මම මැදියම පිබිදියෙමි. ආහාර ගැනීමට පවා සිත් නොදෙන තරම් මානසික වේදනාවක් හිත් පතුලේ ගිලී මට වද දෙන්නට වී ය. එක ම සතුටකට තිබුණේ අම්මා ත් අප්පච්චී ත් වෙනුවෙන් මුදලින් යම් උපකාරයක් කිරීමට ලැබී පමණි. මම පෞද්ගලික පන්ති කිහිපයක ම ඉගැන්වීමේ න... යෙදුණෙමි. ඉන් ලද මුදල් අම්මාට ත් අප්පච්චීට ත් පිටත් කළ... දෙමාපියන් මා වෙනුවෙන් ජීවත් වෙද්දී ඔවුනු ජීවත් කිරීමට ලැබී... පිළිබඳව මම බොහෝ සේ තුටු පහටු වීමි. ... සුදු නංගී වෙනුවෙ... අපමණ දුක් සමුදයක් හදේ තෙරපා ගෙන උදේ ... ... ඇවිද ගියෙමි. මිතුරන් මා අස් වැසීමට තැත් කළ ද සහනයක ලැබුණෙ... නැත. පංති කාමරයේ දී පවා බොහෝ දිනවල සුදු නංගී සිහි වේ.

ව්‍යාජ සිනාවක් නගා මම සියල්ල යටපත් කරමි. ලිපියකින් පවා සුදු නංගී ඇමතීමට නොහැකි වූ කල මම මගේ සිතිවිලි කුරුටු ගෑවෙමි. මගේ දිනපොතේ සුදු නංගීට ලිව් කවි පද කීපයක් සොරා ගෙන ගිහාන් පුවත් පතකට තැපැල් කොට තිබිණ. මා එය දුටුවේ පුවත් පතේ පළ වූවාට පසුව යි. එකී පත් ඉරුව දුටු මනකින් මසිත හඬා වැටිණ. සුදු නංගීට එය ඇස ගැසී නම් යන සිතිවිල්ල මසිතට නැගිණ.

For E - Pusthakalaya

තැළුණු සිත ළඟ හෙමින්
කඳුළු ඉකි බිඳ නිතින්
කළුවරේ තනි යහන අත ගගා
ඇස් ලබා ජීවිතය හොයනවා
පණ ලබා සෙනේ සිත සතපන්නා
ඇය එනු යි පෙරුම් දම් පුරනවා

එන වදුළු තුරු ලකා අස පෙමින්
පැහැසරව අරවින්ද කුසුම් මෙන්
සිනා මල් මිටක් දෝතට රැගෙන
ජීවිතය රැගෙන මා වෙත එඩින්

ගං දැල කෙකටියා මල් සුදුයි
අපට සුභ දවසක්ම ගෙන එයි
ප්‍රේමයයි සුවඳ පොකුරයි නුඹයි
නිම් වළල්ලේ මුවා වී කිමැයි?

පපුතුරෙහි ආදරේ තොටුපළින්
පිහිනමින් අපුරු සැණකට කලින්
කුසුමක්ව පිපෙන්නට ආදරෙන්
ජීවිතය රැගෙන මා වෙත එඩින්.....

ගිහාන්ගේ පෙළඹවීම මත නිතිපතා මම සුදු නංගි සිහි වන ඇසිල්ලක යමක් කුරුටු ගෑමට සිතා ගතිමි. ඒවා පුවත් පත්වලට යොමු කළේ මනු ය. කුඩා කල ළමා පිටුවල කවි හා ලිපි පළ වී තිබුණ ත් කොළඹ නගරයට පැමිණි පසු මුලින් ම පළ වූයේ 'සුදු නංගී' ට ලියූ කව යි. නගරය තුළ පුදුමාකාර කාන්සියක් දැනෙන්නට වූ සැණෙකින් මම පොත් ගොන්නකට මුවා වීමි. මේ කාලයේ පතපොත වඩ වඩාත් ම වෙතට සමීප වන්නට වී ය. දිනක් ගිහාන්ට මම මෙසේ කීවෙමි.

'ගිහාන් යළිද රත්මලානෙ?'

'උඹට ඇත්තටම පිස්සුද කළුනා?'



'දැනට නම් පිස්සු නෑ. ඒත් පිස්සු හැදෙයිද මන්ද

'උඹ මොකටද රත්මලානේ යන්නෙ?'

'වාපලෑ ගෙදර.'

රත්මලාන, ටෙම්පල් පාර, ලුම්බිණි මාවත මස්සේ සතියකට වරක් වත් මම වාපාගේ නිවස පැත්තට යන්නට පුරුදු වීමි. තොරතුරක්, අලුත් යමක්, සිදුවීමක් හමු වෙතැ යි සිතා සිටිය ත් කිසි ද එකී පැතුම් ඉටු වූයේ නැත. බයිසිකලයේ නැඟී අපි ආපසු ආවෙමු. වල් බිහි වී යන තරමට වාපාගෙ නිවස ජරාජීර්ණ වෙමින් පවතී. නිතර ම ගේට්ටුව වසා දමලා ය. අපි බොහෝ දිනවල මේ ගේට්ටුව අසලට ගොස් බලා සිට නැවතත් හිස් සිතින් පැමිණියෙමු. එක් දිනක් පමණක් රොහාන්ලගේ ගෙදර මෙහෙකාරිය අපට කතා කළා ය.

'ඔයගොල්ලො කාව හම්බු වෙන්නද?'

'රොහාන්ලගේ ගෙදර මේකද?'

'ඔව්. ඒ වුණාට ගෙදර අය නෑ. රට ගිහිල්ල.'

'මෙහා ගෙදර ඇනෙක්සියේ හිටපු කට්ටිය ගැන තොරතුරක් කියන්න පුළුවන්ද?'

'ඒ ගෙදර බේබිගේ අසනීපෙට තමයි රට ගියේ. තවම ආවෙනෑ. රොහාන් මහත්තයත් එහෙ. මොකුත් පණිවිඩයක් තියෙනව නම් කියලා යන්න. ලොකු නෝන ආවම කියන්නම්.'

'පණිවිඩයක් මොකුත් නෑ. වෙන දවසක අපි එන්නම්කෝ.'

ගිහාන් උත්තර දුන්නේ ය. එහෙත් මේ කිසිවකින් සැහීමට පත් වීමට මට නොහැකි වී ය. උත්තරා නංගී හමු වීමෙන් ද මා ලැබුවේ මානසික වදයක් පමණකි. දින දහය ත් ගත වී ත් වාපා වෙතින් කිසිදු පිළිතුරක් ලබා ගත නොහැකි වී ය.

උසස් පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වී ඇති බව දැන ගැනීමෙන් පසු මම ඉරණම විසඳී ඇති අයුරු දැන ගැනීමට තර්ස්ටනය වෙත පියඹා ගියෙමි. කාලයකට පසු ආදරණීය තක්සලාවේ මිතුරු සුවඳ

ගෙපා ත් සිතට ත් ප්‍රබෝධයක් ගෙන දෙන්නට වී ය. ප්‍රතිඵල තැන උසන්දු වූයේ ගිහානු ත්, මම ත්, නිරංගා ත් පමණි. නිරංග විද්‍යා අංශයෙන් උසස් ලෙස සමත් වී තිබිණ. ඔහුට වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වීමට තරම් ලකුණු ප්‍රමාණයක් තිබිණ. ගිහාන් විභාගය සමත් වූ ත් සරසවි යාමට තරම් ලකුණු තිබුණේ නැත. අසමත් වූ සිසුන් කෙළිදෙළෙන් කටට කමින් තම තමන්ගේ ජය පරාජය විමසන අතර මම ප්‍රතිඵල බලාපොරොත්තුව නියෝජ්‍ය විදුහල්පතිවරයා අසළට ගියෙමි. වසර දෙකක් විද්‍යා අංශයෙන් ඉගෙනීම කොට සිවු මසකටත් අඩු කාලයකින් කලා විෂයන් කළ එක ම ශිෂ්‍යයා මා වූයෙන් තැති ගත් සිතින් මම ප්‍රතිඵල විමසීමි. නියෝජ්‍ය විදුහල්පතිවරයා ප්‍රතිඵල ලේඛනය විමසා බලා උපැස් යුවළ ගලවා මේසය මත තැබී ය. නළෙ රැළි ගැන්වී ය. ස්ථිර ලෙස ම මා උසස් පෙළ අසමත් වී ඇතැයි සිතූ හෙයින් මම බිම බලා ගතිමි.

'සඳුන් සෙනෙවිරත්න, අපරාදේ ඔය ළමයා කලා විෂයන් කළේ. විද්‍යා විෂයන් කළා නම් විභාගෙ පාස් වෙලා වෛද්‍ය විද්‍යාලයට යන්න තිබුණා.'

ඔහු එසේ කියා නළල රැළි ගන්වා නැවතත් මදෙස බැලී ය. හැඬුම් එන්නට තරම් දුකක් මට දැනිණ. දණහිස වෙවුළා ගියේ ය. නළලේ ද බිඳු එකිනෙක මතු වෙන්නට වි ය.

'අහගන්න ප්‍රතිඵල. A සමර්ථ 2 යි. B සමර්ථ 2 යි. කලා අංශයෙන් හොඳම විභාගෙ සමත් ඔය ළමය...'

නියෝජ්‍ය විදුහල්පතිවරයා මගේ අතින් අල්ලා ගත්තේ ය. සතුට හා දැළිණි කඳුළු බිඳු විභාග ප්‍රතිඵල ලේඛනය පුරා බොඳ වන්නට ඇත. ජීවිත ප්‍රශ්නය තරම් විභාග ප්‍රශ්න අමාරු නොවන බව මම දැන සිටියෙමි. සිංහල විෂයයට මා ලද සාමර්ථ්‍යය ත් ආර්ථික විද්‍යා විෂයයට ලද සාමර්ථ්‍යය ත් වෙනුවෙන් මට බොහෝ පැසසුම්, තෑගි ලැබිණ. මම උත්තරා නංගී හමු වීමට ගියෙමි.

'නංගියේ .... උත්තරා නංගියේ.... මං විභාගේ පාස්.... කොලේජ් [illegible] මගේ.'



උත්තරාගේ මුහුණ රත් පැහැ වී සතුට ඉසිරී පිරී දෝරේ යන්නට වී ය. ඒ සුදුමානාර සහෝදර බැම්මකි.' මා බද ගෙන මුහුණ සිප ගත්තී ය. මගේ දෑසින් කඳුළු සැලිණ. මම හැඬුම් අතරින් මෙසේ කීවෙමි.

'නංගියේ, ඔයා ඇත්තට සන්තෝස වෙනවා. ඒත් මගේ ලොකු අප්පච්චි, ඔයාගේ අප්පච්චි මාව ඉස්කෝලෙට දලා දෙන්න එපා කිව්වා. අල බතලයක් කාලා ගමේ ඉස්කෝලෙකට පලයං කිව්වා. ඔයා ගිහිං කියන්න මං විශ්ව විද්‍යාලෙට යනවා කියලා...'

කාලයක් මුළුල්ලේ සිතේ තෙරපී තිබූ ආවේගයක් නොසිතා ම එළියට පිපිසිණ. උත්තරා එයින් බොහෝ සේ ලැජ්ජා වූවා ය. මට දුක සිතිණ. හවස් වෙත් ම මට සතුට බෙද ගැනීමට කිසිවෙකු ඉතිරි නොවිණ. මම 'තනි' වීමි.

සුදු නංගීගේ දෙවුරින් අල්ලා මහත් සෙනෙහසකින් දෙවුර සොළවා මගේ ජයග්‍රහණය කියා ගැනීමට මට ඕනෑකම් තිබේ. සතුට බෙද ගෙන සුදු නංගී සමඟ මහත් සොම්නසකින් තුටු පහටු වන්නට මට ඕනෑකම් තිබේ. මගේ දෑතින් සුදු නංගී ඔසවා රවුමක් කැරකී, බිම හිඳුවා, මුහුණ සිප අනාගතය ගැන කතා කරන්නට මට ඕනෑකම තිබේ. අනාගතය අප හිතන තරම් අඳුරු නැතැයි සුදු නංගීගේ මුහුණට ළංව කොඳුරා කියන්නට මට අවැසිව තිබේ. ඒත් සුදු නංගී මා අසළක නැත.

එදා රාත්‍රී තැපැල් දුම්රියේ නැගී මම ගෙදර ගියෙමි. මගේ විභාග ප්‍රතිඵල හමුවේ වඩාත් සතුටු වූවේ ත් දුක් වූවේ ත් අප්පච්චි ය.

'උඹලට වරදින්නේ නෑ පුතේ. මගේ පුතාට දිව්‍ය සළු දිව්‍ය මාළිගා පහළ වෙනවා. උඹ බය වෙන්න එපා. උඹට හරි යනවා. උඹට ඉරිසියා කරපු එවුංට වගතුවක් වෙන්නේ නෑ, පුතේ.... ඒත් ඉතිං උඹලා ලොකු මහත් වෙනකොට උඹලව දකින්න තරම් මං පිං කරලා නෑ.'

අප්පච්චි හඬමින් කීවේ ය. මගේ අප්පච්චි සදහට ම අන්ධයෙකු වූයේ කිනම් පාපයකට දැයි මම නොදනිමි. මම දින දෙකක් මවුපිය උණුසුමේ රැඳී සිටියෙමි. අම්මා අතිරස, කැවුම් හැදුවා ය. සාමාන්‍ය ප්‍රමාණයට වඩා තරමක ලොකු අතිරසයක් හද ඒගේ දකුණත තැබුවා ය. ඇඟිලි හැඩුවා ය.

For E - Pusthakalaya

රටක් වටිනා දේවල් ලියන්න උඹේ අතට හයි හත්තිය ලැබෙන්න ඕනෑ.

මගේ අත අතිරස කැවුම් ගෙඩියකින් තවන අතර අම්මා මට කීවා ය. වෙන දට වඩා වැඩි සැලකිල්ලක්, ගෞරවයක්, හිමිකමක් මට ගෙදර දී ලැබුණි. මා නැවතත් කොළඹ එන්නට පිටත් වෙද්දී අම්මා ත්, අප්පච්චී ත් බොහෝ වේලාවක් හැඬුවෝ ය. මම දෙදෙනාට ම මුදල් දුනිමි. දෙපා අල්ලා වැන්දෙමි.

'අපියි උඹට වියදම් කරන්න ඕන. උඹ තවම ඉගෙන ගන්නවා. කමක් නෑ. උඹ ටියුෂන් පංති කර කර ඉන්න එපා. දැං ඉතිං විශ්ව විද්‍යාලේ ගිහිං හොඳටම ඉගෙන ගන්න බලපං...'

මා කොළඹට එන තෙක් සිහිවිලි රඳවා ගෙන ආවේ ගෙදර තුළ ය. අම්මා කෙරෙහි ය. අප්පච්චී කෙරෙහි ය. නවාතැන් මේසය මත වාසාගේ අකුරු සහිත රට ලියුමක් තිබෙනු දුටුවෙන් මම සියල්ල පසෙක දමා එය විවර කළෙමි.

*Room No. 07,*
*Hammer Smith Hospital,*
*Duncon Street,*
*London.*

චිරං ජීවතු!

ආදරණීය මගේ කසුන්ට,

හැම හීනයක්ම බොඳ වෙද්දී මම පියවි සිහිය ලැබුවා ඒත් පියවි ලෝකෙ සිද්ධවෙන හැම දෙයක්ම හීනයක් වගේ. මම තේරුම් ගන්න උත්සාහ කරනවා කසුන්. මට නුහුරු නුපුරුදු දේවල් ඔක්කොම හැම දෙයක්ම සිද්ධ වෙද්දී මට සිහිය තිබුණා යාන්තමට. ඔයා විශ්වාස කරනවද කසුන් සිද්ධ වෙච්ච බොහෝ දේ මම දැනගෙන හිටියා මම හිතුවෙ සදාකාලික නින්දට ඉස්සර මට ඔක්කොම එකතුවෙලා වද දෙනව කියල. මට පුදුම ඉවසීමක් තිබුණා. වේදනාව දැනි දැනී මම ඉවසුවා. ඔපරේෂන් එක අන්තිම හරියේදී මට යාන්තමට සිහිය තිබුණා. හැම දෙයක්ම සිහිනයක් නම් මම හිතුවෙ අවදි වීම මරණය



කියල. ඔයා දන්නවද මට සිහිවෙච්ච දේවල්. යාන්තමට පද එකතු වෙලා යාන්තමට හිත පිරිමැද්ද. ඒවා ඔයාම ලියපු දේවල්.

'ළයට තුරුළුව හොරෙන් සිතූ සේ
රහස් කොඳුරන ආදරේ
සොහොන් කොත ළඟ පාලු නිම්නේ
සුවද වෙනවද සීත සුළඟේ...?'

ඔයා පරණ දින පොතේ ලියල තිබුණ සිංදුවක පදපේළි නේද ඒ? පුදුමයි කසුන්. මට හිතුනා මරණය සුන්දරයි කියල. ඒත් මට සිහිය ලැබුණා. මට සුවවෙලා වගේ කසුන්... ඔයාගේ සුදු නංගී සනීප වෙලා... අවිශ්වාස කරන්න එපා! මට දැන් හොඳටම විශ්වාසයි ඔයාව හොයාගෙන ජීවිතේ සුන්දරම දේ ලබා ගන්න මට එන්න පුළුවන් කියල. බලාපොරොත්තුව අපිව ජීවත් කරවයි. අනේ මගේ කසුන්. බලාපොරොත්තුවට දැස් විවර කර ගෙන ඔයා බලා ඉන්නව නේද?

ගිලන් වෙලා ලෙඩ ඇඳක ඉන්න මට සුන්දර සිහිවිලි නෑ. මහා කඳුළු ගංවතුරක අපිට රුවල් ඉරිගිය ඔරු පදින්න වෙයිද කියල හිත කියනවා. සමහර දේ ලස්සනට සිද්ධ වෙනවා. ඒත් ඒ හැම සිද්ධියක්ම ඇතුළෙම හිත කීරි ගැහෙන මොකක්දෝ සැක සංකාවක් නළියනවා. ඒක හරිම අමරණීය විඳුමක්. මගේ නර්ස් ඇන්. මේරි ඇන්. එයා මේ දැනුත් මගේ ළඟ. එයාට මම ගොඩක් දේ කිව්වා. මම ප්‍රේම ඔයාට ලියනවා. මගේ හිත කියවන්න රත්තරං.

අද උදේ මට තරමක් සනීපවෙලා තිබුණා. පහුගිය ටිකේම මට නිදිපෙති දීල තිබුණේ විවේක ගන්න. මට උදේ හවස *Piriton* එක්ක *Sleeping tablets* දුන්නා. අද උදේම ඇන් කාමරයට ආවා. ලස්සන රෝස පොකුරක් අරන්. මෙහෙ වැවෙන රෝස හරිම ලොකුයි. ලස්සනයි. ළා රෝස පාට රෝසමල් විස්සක් විතර ඒ පොකුරේ තිබුණා. එයා ඇඳ ළඟ වාඩිවෙලා *Good morning* කියලා රෝස පොකුර දීලා මාව සිප ගත්තා. මාව මේ කාමරේට ගන්න ඉස්සර *Intensive Care* දල තිබුණේ. මාව දැන් කාමරේට දලා. මම ඇන්ට කිව්වා ඔයාට ලියන්න ඕන කියල. ඉතිං මං ලියනවා වේදනාවෙන්. දුකින්

For E - Pusthakalaya

මට 17 ද රාත්‍රී හොඳටම අමාරු වුණා. මට දැන් හිතෙන්නේ මම 18 වෙනි ගමන එන්න හිටපු නිසා වැඩිපුරම හිතේ අමාරුවට මම ලෙඩ වුණේ කියලා. 18 උදේ සිද්ධවෙච්ච කිසි දෙයක් මම දන්නේ නෑ. මම ඔයාට එයාර්පෝට් එකට එන්න කියල කිව්ව මතකයි. ඔයා ආවද එන්තරං? මට ඔයාගේ සුදු මූණ එක මොහොතකට දකින්න ඇරුව නියා. මට සිහිය හරියට ලැබුණේ මේ ලස්සන කාමරේදී.

මේ වීදුරු කාමරේ එහා ඉම මට පේනවා. නිල් පාට ආකාසේ දැක්කත් මට හරු ගණින්න වරම් නෑ. මේක ඉස්පිරිතාලයක්ද කියලා මම දන්නේ නම් කියලා කියෙන හිත්ද විතරයි. කිසිම ලෙඩෙක් මගේ ඇහැට දැක්කේ නෑ. අසාධ්‍ය ලෙඩ්ඩු ඔක්කොම මම වගේ කාමරවල හිර වෙලා ඇති. හරිම පරිස්සාරකමක් කසුන්. මම කිව්වා මට නැගිටලා එළියට යන්න ඕනෑ කියලා. බලන්නකෝ. මට කිසි දේකට ඉඩ දෙන්නේ නෑ. ඇත් නම් කිව්වා හොඳට සනීප වුණාම එළියෙ ඇවිදිමු කියලා. මම කිව්වා මට කියවන්න ඕන කියා. එයා මට ඉඩ දෙන්නේ නෑ. ඇත් කාමරයෙන් එළියට යන්නේ ඩොක්ටර් ආවොත්, නැත්නම් රොහාන් ආවොත්. නැත්නම් අම්මි ආවොත්... ඇත් නැම වෙලාවෙම මගේ ළඟ. එයා උදේම මට 'මුක්තත්' පොතේ කවි ටික කියල දුන්නා. මගේ හිත සතුටින් තියන්න වෙන්න ඇති. දරන්න බැරි දුකක් තියෙන මගේ හිතට සතුට කාන්දු වෙන්නේ කොහොමද?

මම මගේ මැන් එකේ ඔයාව මතක් වෙන්න ගොඩක් දේ දගෙන ආවා. ඔයාගේ පරණ දිනපොත, කවි එකතුව, තර්ස්ටන් කලා උළෙලේ ෆොටෝ එක, පරිසලෙන් ගත්ත කැටයම් පෑන වගේ දේවල්. ඔක්කොටම මම ආදරෙයි. තියපාර උපන් දිනේට ඔයා මට දුන්න කාඩ්එක මතකයි නේද? රතු රෝස පොකුරක් සුදු පාට හදවතක් මැද තියන, කළු පාට පසුබිමක් තියන. මම උදේම ඒක අතට ගන්නවා. ඒක විවර කරද්දි නැගිටින ලස්සන වාදනය අදත් ඇහෙනවා. ඔයාගේ උපන්දින ගැයුම

"Happy Birthday to you

Happy Birthday to you"



නැම උදේකම මම ඒ කාඩ්එක විවර කරල ඒක අහනවා. ඔයා දන්නවද කසුන් අද රොහාන් එනකොට මම ඒක අහඅහ හිටියේ. මගෙන් ඇහුව කොහෙන්ද කියල. මම උත්තර දුන්නෙ නෑ. දෙපාරක්, තුන්පාරක් ඇහුව. මම උත්තර දුන්නෙ නෑ. අන්තිමට මම කිව්ව කසුන් දුන්න කියල. එයා කිව්ව මට ඒක ඉරන්න කියල කෑලිකෑලි වලට. මම බෑ කිව්ව. එයාගෙ ඇස් ඉස්සරහ ඒක ඉරන්න මට බලකළා. රොහාන් යකෙක් වගේ මම ඉරුව කෑලි කෑලිවලට. හරියට මගේ හදවත ඉරනව වගේ. ඒත් මං ඉරුවෙ ඔයාගෙ ලස්සන Birth Day කාඩ් එක. මගේ හදවතේ ලෙඩේට බෙහෙත් කරන්න මාව මෙහෙ ගෙනැල්ල රොහාන් මගේ හදවත කීතු කීතුවලට ඉරල දැම්ම. මට අඬන්න කඳුළු නෑ. එයා සාක්කුවෙන් ගත්ත පුංචි පෙට්ටියක්. ඒකෙ තිබුණේ පුංචි දියමන්තියක් අල්ලපු පුංචි මුද්දක්. මගේ අත අරගෙන එයා ඒක මගේ ඇඟිල්ලේ දැම්ම. ඔයාගෙ තෑග්ග කුණු කූඩෙට දල මගේ අතේ එයාගෙ දියමන්ති මුද්ද දැම්ම..... මට කෑ ගහන්න බෑ. දහලන්න බෑ. ඇඳෙන් නැගිටලා නිදහස් ලෝකෙ හොයාගෙන එන්න බෑ. ටික ටික මගේ අත්තටු සිඳල බිඳල දන්න රොහාන් උත්සාහ කරනවා. අම්ම ආව ටික වේලාවකින්. මම අමාරුවෙන් කෙඳිරි ගගා අම්මට කිව්ව. අම්ම මගෙ හිත නොතලා මෙහෙම කිව්ව.

'එයා ඔය මුද්ද ගත්තෙ ලන්ඩන්වල පරණ බඩු කඩේකින්. බොහොම වටිනවා. දුවට සන්තෝසෙන් තියන්න රොහාන් පුතා උත්සාහ කරන්නේ. දුව එයාගෙ හිත රිදවන්න එපා. බලන්න කොච්චර මහන්සි වෙලා වියදම් කරල අපිට උදව් කළාද? අපි එයාට කළගුණ සලකන්න ඕන. දුවට රොහාන් ආදරෙයි. මට ඒක හොඳටම විශ්වාසයි. ඔය මුද්ද ඇඟිල්ලේ දගෙන හිටියට ඔයාට ඒක වදයක් වෙන්නෙ නැහේ.'

අනේ මගේ කසුන්! මට කියන්න මම මොනවද කරන්නේ කියල රොහාන්ලගේ නෑන්ද කෙනෙක් ඉන්නව ස්ට්‍රැට්ෆර්ඩ්වල. ෂේක්ස්පියර් ගම්මානය ළඟ. මාව හොඳ වුණාම එහෙ නතර කරනවලු. මෙහෙ ටික කාලයක් ඉන්නලු ලෙඩේට තව බෙහෙත් කරන්න ඕනලු. රොහාන් මෙහෙ නවතිනවලු මට සේරම දැන් හිතාගන්න පුළුවන්. මේ සේරම එකතු වෙලා කතා කරල ගන්න තීරණ වෙන්න ඕන

For E - Pusthakalaya

කසුන්, මට ඉවසන්න බෑ. මට හිතාගන්න බෑ. තවත් මගේ හිත හිරවුල් නෑ. මට හරියට ගළපල මේ දේවල් ලියන්න තරම් සිහිය දෙයක් මම දන්නෙත් නෑ. මට ඇහෙන දේ මගෙන් එක්ක කතාකරන දේ මම මේ ඔයාට ලියන්නේ. පුදුමයි... මගේ ජීවිතේ සතුට හොරා ගන්න මේ අය මෙච්චර මහන්සි ගන්න එක. මම මේ ලියුම ලියන්න ගත්ත වියෙ. ඉවර කරන්න බැරි වුණා. අද මේ ලියුම සම්පූර්ණ කරන්න ඕන කියල හිතුණා. ඒත් ජීවිතේ අසම්පූර්ණ වෙමින් තියෙන්නේ. ඔයාට හිතාගන්නවත් පුළුවන්ද මගේ හිතේ පිරිල තියෙන දුක. මගේ හිත ඇතුලෙ තියෙන ලෙන්ගතුකම ඔයාගේ හිත ඉල්ලල කෑ ගහනවා කසුන්. මං හිතන්නේ දැ' විභාග ප්‍රතිඵල ලැබිල ඇති. ස්ථිරවම ඔයා පාස් වෙයි. විශ්ව විද්‍යාලයට යාවි. මාව ජීවත් කරවන්න ඔයාට පුළුවන් කියල මට විශ්වාසයි. මට ඕන ජීවිතේ සතුට. සතුට තමයි මාව ජීවත් කරවන්නේ. මගේ මේ ගිලන් කය ජීවත් කරවන්න බැරිවෙයි. මේ ගිලන් කයට සැප සම්පත් ඕන කියල කෑ ගහන්නෙ නෑ. මගේ හිතටයි සතුට ඕන. මාව මලක් වගේ බලාගන්න පුළුවන් ඔයාට විතරයි. මගේ හිතේ දුක අතු කරල සතුට වපුරන්න පුළුවන් ඔයාට විතරයි. මට සම්පූර්ණ ප්‍රේමයක් පුදන්න පුළුවන් ඔයාට විතරයි. එහෙම හිතන කොට මාව ගැස්සිලා ඇහැරෙනවා කසුන්. අද දවසම රොහාන් මගේ ළඟ. මම ඇත්ව කියලා එළියට ඇවිය රෙදි මාරු කරගෙන ඕන කියල ඒ අතරේ මේ ලියුම ලියන්නේ.

කසුන්: හැම හිතෙකම ඔයා එන්න. මගේ හිත අද්දර ඉඩ තියෙනවා ඔයාගේ සංවේදී හිත සනසවන්න. මං දන්නවා එතකොට මම සුවපත් වෙනවා කියලා. මම ඔයාට ඇත්තම කියන්නම්: මට බයයි. මැරෙයි කියලා නෙමෙයි. මං හොඳටම දන්නවා මම දැන් නොමැරෙන විත්තිය. මට බය රොහාන් ගැන. ඔයාට හිතා ගන්න පුළුවන් ද මට රොහාන්ව කොච්චර අප්‍රසන්නද කියලා? කපුරු සතෙක් දැක්කම වගේ හිත ඇකිලෙනවා. ඒත් එයා හැමදේම කරන්නේ මාව බිරිඳ කරගන්න කියලා මම දැන් හොඳටම දන්නවා.

අද උදේ මහ ඔය පෙදිල් හිතලා ආයෙත් ඇඳුව. කරස්වන් පාර. ගැටි මල්, මල් පාර, අපේ පුංචි අවන් හල, විගාඩ් කලා ලාලෙ, බොයිල්ල, රස්මලාන, පවු මාවත, මේ සේරම මගේ හිතේ හොල්මන්



කරනවා. මගේ රතු වෙච්ච ඇස් දැකලා ඇත්ව හරිම දුකයි. එයා කිව්වා ටික දවසකින් 'ලන්ඩන් ට්‍රිප්' බලන්න යමු කියලා.

දැන් මගේ අත වෙව්ලනවා. මාව ගැහෙනවා වගේ. හිත විතරක් හෙමින්. ඒත් ඔයාට මේවා ලියන්න පැන මාරු කර ගත්තේ අමාරුවෙන්. මම අකුරු ගළපලා මේ ලියන්නේ. මාපට ඇඟිල්ලේ ඉඳලා හිස් මුදුන දක්වා රිදෙනවා කසුන්. මට නැගිටින්න හොඳ නෑ. මම නිදාගෙන මේ ලියුම ලියන්නේ. මේ රහස දන්නේ ඈන් විතරයි. ඔපරේෂන් එකේ අන්තිම වෙලාවේ මට සිහිය තිබුණා. මම ඇස් දෙකත් ඇරලා බැලුවා යකඩ අඬු කතුරු, පිහි, බෙහෙත්, පුළුන් අතට ගත්තු හතර පස් දෙනෙක් සුදු ඇඳගෙන මගේ වටේ හිටියා. ඒ සද්ද, කතාබහ මතක් වෙනකොට මට දැනුත් බයයි.

මං ඔයාට ලියනවා මෙහෙම. කසුන්: මගේම කසුන්: මගේම ආදරණීය කසුන්: ඔයා දෙවි කෙනෙක්. ඒත් මට ඔයාගේ සෙවණ අහිමි ද කියලා මම දන්නේ නෑ: ඔයා හොඳ ළමයෙක් වෙන්න. මට හිතා ගන්න පුළුවන් ඔයාවයි මාවයි ඈත් කරන්න හදන මේ ලෝකේ තීරණය වෙන්නේ කොහොමද කියලා. අම්මලා විතරක් නෙමෙයි. මුළු ලෝකෙම බලන්නේ සල්ලි දිහා. ලෝකය මතින වැරදි සහගත මිනුම් දඬුවලට ශාප වේවා!

තවත් දිගට ලිව්වොත් මම අසාධ්‍ය වෙයි. ඔයා ලියුමත් එවන්න 'මේරි ඈන්' කියලා දලා. මාව සතුටින් තියන්න ඔයාගේ අකුරු පෙළක් දකින්න මං පෙරුම් දම් පුරනවා.

ඉතිං: පාරමී පුරන සිත් ඇතිව මම තනිවෙලා. කසුන් මට හැම දේම අහිමි වෙමින් යනවා වගේ. කොළේ බොඳ වෙලා තියෙන්නේ ලන්ඩන්වල පිනි වැස්සට නෙමෙයි. දෙතුන් විටක් මගේ ඇස් දෙකට කඳුළු ඉනුවා. කෙල්ලෙක්ගේ හිත තේරුම් ගන්න පුළුවන් මිනිස්සු හරි අඩුයි. මගේ හිත කියවලා ඔයා මාව තේරුම් ගත්තා. මම සදාකාලයෙන් සදාකාලයට ඔයාට ආදරෙයි කසුන්. දෙවියනේ මම කෙල්ලෙක් නේද? මගේ පැතුම් නිකම්ම නිකං පුළුං රොදවල් වගේ ඈතට පාවෙයිද මන්දා? ඔයාට සම්මා සම්බුද්ධ සරණයි!

මං ඔයාගේ,

ආදරණීය සුදු නංගී.

For E - Pusthakalaya

හාදියක් මෙන් නිදි ගත් සිතේ ඇතුළාන්තය සැඩ පහරට හසුව සසල වන්නට වී ය. මගේ උඩු කය නිරාවරණ ය. හිස් බැල්මකින් මම කාමරයේ වහල දෙස බලමි. හරු මඩල ශක්තිමත් ය. අසල මකුළු දැලකට හසු වූ කුඩා කෘමියෙක් ඉන් මිදීමට තැත් කරයි. මම මේසයට අත පොවා ඔරලෝසුව ගෙන වෙලාව බැලුවෙමි. රාත්‍රී දොළහ ද පසු වී ඇත. රාත්‍රී චිත්‍රපට දර්ශනයක් නරඹා පැමිණෙන කොලු රංචු උරුහම් බානු මට ඇසේ. ඔවුන්ගේ සිතුවිලි කො තරම් සැහැල්ලු දැයි මම සිතමි. රාත්‍රී කඩය තව ම වසා දමා නැත. කඩ කාමරයේ කැසට් යන්ත්‍රයේ හින්දි ගීයක් වාදනය වනු මට ඇසේ. සුදු නංගීට තරම් ලස්සනට හින්දි ගීත කීමට හැකියාවක් එ දවස කිසිදු විශාඛාවකට තිබුණේ නැත. 'අභිමාන්' චිත්‍රපටයේ ගීත ඇගේ හසරැලි මුවින් නිස්මෙන්නේ කෙ තරම් මධුරව ද? මාවතේ ප්ලොරසන්ට් එළියේ මඳ ආලෝකය බිත්තිය මත යාන්තමින් පරාවර්තනය වේ.

රොහාන් සුදනම් වන්නේ අපේ පෙම් කතාව මිහිදන් කරන්නට ද? මම හද කොට දැස පියා ගන්නට උත්සාහ කළෙමි.



## 14

මා නව ම ප්‍රේමයේ පෙරවදන කුරුටු ගානවා පමණි. මිහිදන් කළ ප්‍රේමයකට මා පෙරවදන ලියන්නේ කෙසේ ද? ජීවිතය අගියසේ නොව මල් වයසේ මා වියපත් වේ දෝ යන බිය මට දැනේ. අපේ පෙම සොහොන්ගත හූමියේ පසුවදන කුරුටු ගාන්නට නොවේවා යි මම පැතිමි. ආදරය යන අකුරු හතර සමීකරණයක් නොවේ. හද පිරි සොම්නසින් සදතනිකව ළඟ දැවටෙන සුවඳ පොකුරකි.

මේ පාළු රාත්‍රියම සීතලයි.
ළඟ පාත පෙම් සිහින කිසිත් නෑ
පහන් දෙර පහන් වැට දිලි දිලී නිවෙනවා
පහන් සිත ළඟ ඉන්න වරම් නෑ.

රෑහැයියෝ සිලෝ ගී සර ගයත්
සඳ එළිය හොරෙන් ඉඟි කරනවා
සීතලට මුළු හිතම කිළිපොළන මේ රැයේ
ඔබ ළහම දැවටෙන්න හිතෙනවා.

කෝ එන්න සුදු නංගි
ඔය කඳුළ පිසින්නට
දැන් ඉතින් හඩන්නට වරම් නෑ
සුසුමකින් හුගේ දුක නිවනවා.

මම අරමුණකින් තොරව කොළ කැබලිවල කුරුටු ගාමි. ප්‍රේමය වෙනුවෙන් හඬා වැටෙන්නට තරම් මම මෝඩයෙක් වීමි. හිස පිරි

For E - Pusthakalaya

දෙපතුළ දක්වා කිරි ගැසෙන, ඇඟ කිළිපොළා යන වේදනාවක් මා දැනේ. එහෙත් දැනේ සුරතල් වූ පුංචි කුමාරිය මට සිහි වේ. මගේ මෙලද හිස ඉඹා, හිස නොමසවා කියූ බොළඳ පෙම් වදන් මට සිහි වේ. මම සොළු නැබලි ගෙන ඔහේ කුරුටු ගාමි.

කඳුළු බිඳු තාරකා
සුදු සිහින පතාගෙන
පාරවයි මල් සුවඳ හදවතේ

නිවා නොකු තාරකා
සඳකල් නොහඬන්න
රහස් කොඳුරමු අපේ ආදරේ

ඉනි බිඳුම ළඟ මෙහෙම
කඳුළ වී නැමදුම
ළඟ ඉන්න ඉඩ දෙන්න ජීවිතේ

කාසි මල් කටු පඳුර
වෙත් සලත් අපි මෙහෙම
සඳකල් ඔබට මම ආදරේ. . . .

නැවතෙනුට දෙන්නට තරම් පෙම් සිතක් මා ළඟ නැත. අපේ අහිංසක පෙම් සිත් වෙනුවෙන් මම සුදු නංගිට ලිපියක් ලිව්මි.

චිරං ජීවතු!

මගේම ආදරණීය සුදු නංගී,

ලෝකයම නිදිගත් මහ රෑ මං ඔයාට ලියනවා.මේ ලියුම විතරක් නොමෙයි අපේ මුළු කතාවම මගේ මරණයෙන් අවසන් කරන්නට මට හිතෙනවා. මං දන්නවා ඒකෙන් සුදු නංගියේ හිත පැරෙනවා විනා වෙන විය හැකි යහපතක් නෑ. ඔබ මෙන්ම මමත් ජීවත් විය යුතුයි. ඒත් එක ආත්මයක් දෙතැනක ඵල ලබන්නේ කොහොමද? සුදු නංගී, ඔයාගේ ආත්මය මගේ ජීවිතේ ඇතුළේ දිය වෙලා ඉවරයි. සොම්නසින් සිහි කරන අපේ පෙම් කතාවේ අවසාන පිටු ලස්සනට ගළපන්න මට ඉඩ දෙන්න. මම විභාගය සමත් බව ඔයා දන්නවා ඇති. ලකුණුත් ගිය සතියේ ලැබුණා. කොළඹ විශ්ව විද්‍යාලයට මම ඉල්ලුම් කළා.



මම ආපු පේරාදෙණියට. ඒත් අප හමු වූ මේ කටුක නගරයේ අතර මං වීම සැපදායකයි කියලා මට හිතුණා. ඒත් මං පෙරුම් පුරනවා. මගේ ජීවිතය රෝස මලක් ළඟ නැවතුණු කඳුළු බිංදුවක් කරන්න එපා. කොළඹ වයන්තයේ රළු දූවිල්ලේ ගිමන් හරින්නට මට බෑ. මම වැලපෙනවා. ඔයාට හිනැහෙන්නට නොහැකි බැව් මා දන්නවා. ඔයාට සෙනෙහසින් තිළිණ කළ උපන් දින කාඩ්පත ඔබේ දෑතින් කිතු කිතු වලට ඉරූ බව ලිපියේ තිබුණා. රොහාන් අණ කළේ මගේ හදවත ඉරා දමන්න නේද? මගේ හිතට දැනෙන වේදනාව ඔයා දන්නේ නෑ සුදු නංගී. මට මේ ඔක්කොම ඔයාට ලියාගන්න බෑ. පැහැදිලිවම මම දන්නේ එකම එක දෙයයි. මට සුදු නංගීගෙන් තොරව හෙට දවසක් නැති බව විතරයි. ඒත් මං පිළිගන්න දෙයක් තියනවා. රොහාන් වං. හපන් මිනිස්සු අනුන්ගේ හිත් රිදවන්නේ තමන්ගේ අභිමානයට සුදු නංගි. රොහාන්ගේ අභිමානය හා ජයග්‍රහණය වෙනුවෙන් මගේ හිත රිදවන්න ඔයා හවුල් වෙන්න එපා...

හිරු සඳු එකවර පායන්නේ නෑ. ඒත් හිරුට හොරා මල් පිපෙන්නේ කලාතුරකින්. හිරුට පිපෙන මලක් වෙන්න පෙරුම් පුරන්න එපා සුදු නංගී. සඳ මඬලේ මුව පොව්වෙක් ඊට වඩා සුන්දරයි. මගේ හිතේ තවරපු සුන්දරත්වය මිය ගිය සිහිනයක් නොමෙයි නේද? මගෙන් ඈත් වෙන්න හිතපු සුළඟට අනු වෙච්ච වලා රොදක් වගේ ඔයා ඈතට ඈතට පා වෙනවා. ඒත් මං දන්නවා ඒ ගොරවලා, කළු කරලා අසනි වැස්සක් වස්සන වැහි වලාවක් කියලා. ඔයාගෙ කඳුළු වැස්සේ තෙමන නොහික්මුණු මිනිහෙක් වෙන්න මට බෑ. මට ඕනෑ ඔයාට යාත්‍රාවක් වෙන්න. කඳුළු ගං වතුරක් මැද්දේ හරි මට එගොඩ බලා යන්න ඕනෑ. ඒත් දැනටමත් රොහාන් ඔයාව ඩැහැගෙන ද මන්දා?

අහස උසට නැගිච්ච සුරාංගනා සිහින මගේ නෑ. ඒත් ඔයා සුරාංගනාවක්. ඒ ආදරය සිහිනයක් කරන්න එපා. එහෙම වුණොත් ඔයා අවදි වන රත්තරං හිනයක මම මියැදී සිටිවි. සුදුම සුදු මල් වඩමක් අරගෙන මගේ මළගමට එන්න තරම් ඔයා පවුකාර නෑ. මගේ සීතල මළ මිනියට ඔය තාරකා නෙතු අගින් කඳුළු හෙළා මා අවදි කරන්න එපා. මම ඊයේ හිනයක් දැක්කා. තමන්ගේ මළගම දැක්කා. ඒත් හිනෙන් අවදි වුණාම ඇඬුවේ ඔයා නොමෙයි මම: මගේ හිත: මොකක්දෝ හේතුවකට මං කවි ලියන්න පුරුදු වෙලා. මගේ

For E - Pusthakalaya

ජීවිතය නැවියන් කරන්න සුදු නංගී. අපේ ප්‍රේමය නොලියවුණු සුන්දර කවියක් වගේම චමත්කාරයි. මම මගේ මරණය දැකලා හිතල කඳුළු බිඳුවලින් බොඳ කළ සිත්තම් කවි ඔබට ලියන්නේ මගේ වේදනාව ඔයාට දනවන්න නෙමෙයි. අවාසනාවන්ත සිදුවීමක් නොවේවායි පැතීමට.

සුවඳ සුදු මල් සුවඳ අරගෙන
තාරකා නෙතු පියවලා
පුං සිරින් කර මගේ මළ දින
ඉකි බිඳිනු ඇයි තනිවෙලා?

සසර ගමනේ පුරුදු සෙනෙහේ
පිරුවටයක දවටලා
ඔබේ ආසිරි සුසුම් දෙනු මැන
කඳුළු බිඳුවක තවරලා

ලයට තුරුළුව හොරෙන් සිතුසේ
රහස් කොඳුරනු ආදරේ
සොහොන් කොත ළග පාළු නිම්නේ
සුවඳ වෙනවද සිත සුළඟේ?

දුක අකුරු කරන්න මා පොළඹවන්න එපා සුදු නංගී. ජීවිතේ ලස්සන පෙම් කවක් ලියන්න මට ඉඩදෙන්න. මගේ හිතේ සුන්දර හැඟීම් ප්‍රේම මියැදෙව් මෙහෙම ගියොත්, මගේ කඳුලින් රතු වෙච්ච ඇස් දෙක වෛරයෙන් ලෝකය දිහා බලන නපුරු දැසක් කරන්න එපා. පැතුම් මාලිගාවක මා හිර කරල දොරගුළු දල යතුර රොහොන් අතට දෙන්න රුකුල් දෙන්න එපා. හඬා වැටී වැටී වසන්තය පස්සෙ යනු බිඳින්න මට බෑ. වසන්තය දැක දැක මං දැනටමත් ගිම්හානේ තනිවෙලා. ඒත් වස්සානය ළඟයි. ඔයා වස්සානයට පෙරුම් පුරනවා වත්ද? මේඝ වලාවක් වගේ ඔයා ඈතට ඇදෙනවා. මම තනිවෙච්ච පුංචි තාරකාවක් වගේ. වහින්නේ මල් වැහි කියලා කඳුළු වැස්සෙ මාව නාවන්න නම් එපා. මට ඔයාගෙන් තොරව හිනැන්න හිතෙන් නෑ. කඳුළු හළන සීමාව ඉක්මවන්න ඕන. හැමදම හඬන්න බෑ. මගේ ආත්මය කඳුලින්ම දියවෙලා යාවි. වස්සාන හිනයක් වගේ බොඳවෙන්න එපා සුදු නංගී.



දුරු රටකට ඔයාව ගෙනියලා මට හිතාගන්න බෑ. උත්තරා නංගී වුණත් මහ නපුරු කතා කියනවා. සත්තකින්ම මට සුදු නංගීගේ ආත්මයේ සැබෑ හිමිකාරයා වෙන්න බැරිද? අපේ හමුවීම අසුන්දර නෑ. අපි කතා කලේ නපුරු ලෝකයක් ගොඩනගන්න නෙවෙයි. මම සුරාංගනා ලෝක මවන්න හදනවා නෙමෙයි. ජීවිතය මොනතරම් දුකක්ද කියල මං දන්නවා. ඒත් සුදු නංගී අපේ ප්‍රේමය ඒ දුක තරමටම සුන්දරයි. පවිත්‍රයි. නිර්මලයි. ඒ නිසාම බොළඳයි. ඉතිං ඒ නිර්මල වූ පවිත්‍ර වූ දේ හැම හිතෙකම මගේ ළඟ දැවටෙනවා!

මං දන්නවා තියන හැම පියවරකම මල් පිපෙන්නෙ නෑ කියලා. ඒත් මං මල් නෙලා ගන්න උත්සාහ කරනවා. මං තනි වූ දිනක පාළු සොහොන් කොතක කඩිනමින් මිහිදන් වෙන්නට මග බලාගෙන ඉන්නවා. බලාපොරොත්තුවක් නැති තැන අරමුණක් කොයින්ද? මගේ අරමුණත් බලාපොරොත්තුවත් මගේ සුදු නංගීව. චන්ද්‍ර මණ්ඩලේ සා පැටවෙක් වගේ මගේ ජීවිතේ අසළ දැවටෙන්න සුදු නංගී.

ගිලන් ඇඳේ වෙහෙසී මට ලිපි අකුරු කරන්න එපා. දුක දිගින් දිගටම ලියන්න එපා. එකම එක සතුටුදයක ආරංචියක් දවටලා එවන්න. රෝස ඉන්න ලැබුණා. මං ඒක පැළ කළා. තවම දලුදලා නෑ. මං සුදු නංගී වගේම ඒක බලා ගන්නවා. ඉක්මනින් මල් පුදීවි. ආදරෙන් රැකබලා ගත්තම, ආදරෙන් ආරක්ෂා කළාම ඉක්මනින් සුවඳැති මල් පුදිනවා. රතු රෝස පොකුරක් වගේ ඔබවත් රැක ගන්නට පෙරුම් දම් පුරනවා. හැම හිතෙකම සුන්දර සිහිවිලි පහළ වේවා!

තිසරණ සරණ!

මං,

ආදරණීය කසුන්.

For E - Pusthakalaya

# 15

දින, සති, මාස, කාල හෝරාවට ත් හොරා ගෙවුණේ නිශ්චිත සිදුවීමකට මා මැදි කොට නොවේ. අනියත බව මිස කිසිදු පැහැදිලි තීරණයක් හෝ වෙනසක් ජීවිතයේ සිදු වූයේ නැත. මගේ ලිපිය සුදු නංගී අතට පත් වී දැයි මම නොදත්තෙමි. එහෙත් මට පිළිතුරු ලිපියක් නම් ලැබුණේ නැත. එක් මොහොතක් වත් අපට අප ගැන නොසිතා සිටීමට නොහැකි වී ය. මම සුදු නංගී ගැන හැම මොහොතක ම සිතමි. සුදු නංගී ද අපේ පෙම් මතකය හැම මොහොතක ම සිහි කරන බව මම දනිමි. ඉතින් මා වෙනුවෙන් අකුරු දෙකක් වත් සටහන් නොකර සිටීමට සුදු නංගීට පිළිවන් වන්නේ කෙසේ ද? ඇය නැවතත් අසනීප වී ඇතැ යි මම සිතුවෙමි. ඇගේ රෝගය උත්සන්න වූවා වත් ද? සුදු නංගීට මම නිරන්තරව තෙරුවන් සරණ පැතිමි. අප ගිය මාවත තුරු ලතාවලට පවා කතා කොට මම මගේ දුක කීවෙමි. මගේ සුදු නංගීට දෙවියන්ගේ පිහිටයි! මගේ ඒකායන පරම පැතුම මම නිරන්තර කොඳුරමි. සිත් පහන් කොට මෙත් සිත් වඩා නින්දට යමි. මම සිහින ගංගාවක මෙන් අපේ පෙම් මතකයේ කිමිදෙමි.

සුදු නංගීට සුව වී ඇතැ යි මා සිතුවේ උත්තරාගෙන් තොරතුරු දැන ගැනීමෙන් පසුව යි. එහෙත් උත්තරා කියූ යථාර්ථය, යථාර්ථයක් ලෙස පිළිගැනීමට මම අපොහොසත් වීමි. මම වංකව මෙන් ම අවංකව ද උත්තරාගෙන් ප්‍රශ්න කළෙමි. කෝපයට ත් වඩා කලකිරීමක් මසිතේ වැඩිණ. පසුව මම මා පිළිබඳ දුක් වීමි. දෙවනුව සුදු නංගී වෙනුවෙන් දුක් වීමි. උත්තරා නංගීට හොරා මම කඳුළක් සඟවා ගතිමි. උත්තරා සිදු දෑ කො තරම් වසන් කොට කීවා දැයි මම නොදනිමි.



'කියන්න උත්තරා, මාව තවත් අසරණ කරන්න එපා නංගී. මම දන්නවා උත්තරා මුල ඉඳලම මගේ හිත ළඟ මට ආශිර්වාද කළා කියලා. මං කොළඹ නගරෙට ඇවිල්ලා ගොඩක් දේ ජයග්‍රහණය කළා. කමක් නෑ නංගී හැම දෙයක්ම දිනන්න බෑ. කියන්න නංගී වාපාගේ අම්මා ඔයාට කිව්ව හැම දේම කියන්න ඔයා මට මොකුත් වසන් කළා කියලා හිත පෑරෙන එක වළක්වන්න බෑ. කියන්න නංගී. එක කුසේ ඉපදුණේ නැති වුණාට මං ඔයාගේ අයියා. ඇයි මට සමහර දේවල් වසන් කරන්නෙ? මාසෙකුත් දවස් දහයක්. මට සුදු නංගීගෙන් කිසිම තොරතුරක් නෑ.'

'මම හරියට දන්නෙ නෑ වාපගේ අම්මා කවදද ආවේ කියලා. ඒත් වාපා ඇවිල්ලා නෑ කියලා ආරංචි වෙලා මං ගියේ. ඉස්සෙල්ලා වාපගේ අම්මා සන්තෝසෙන් කතා කළා. 'දුවගේ අසනීපේ හොඳ කළා. දැන් ඉතිං මගේ හිතේ බයක් නෑ. මගේ ඇස් දෙක දැන් පියවුණාට කමක් නෑ' කියලා කිව්වා. පස්සේ ඉකිගගහ ඇඬුව...'

'මොකටද නංගියෙ වාපගේ අම්මා ඇඬුවේ?'

'වාපා ලංකාවට එක්ක එන්න ඔක්කොම අකමැති වුණාලු. රොහාන්ලගෙ නෑන්ද කෙනෙක් ඉන්නවලු ලන්ඩන්වලට ටිකක් ඈත. එයා එහේ නැවැත්තුවලු. වාපගේ අම්මා කියන විදිහට නම් එයා ලංකාවට එක්ක ඇවිල්ලා නැත්තේ ඔයා හින්ද කසුන් අයියේ...'

'මං වාපගේ හතුරෙක් නෙමෙයි. සුදු නංගීට වරදක් වෙන්න මම ඉඩ. තියන්නේ නෑ. සුදු නංගීට ඇයි මාව හතුරෙක් විදිහට පෙන්නන්න ඒ අය උත්සාහ කළේ?'

'මම හාර හාර විස්තර ඇහුවේ නෑ. ඒත් වාපා යන්නම් සිහිය ආවු හැටියේ ඔයාගේ නම කියලා කතා කරලා. ළඟ ඉඳලා තියෙන්නේ රොහාන්. ඇස් දෙක වහගෙන රොහාන්ගේ මූණ අල්ලගෙන ඉකි ගහලා. 'මගේ කසුන් මගේ ළඟින් ඈත් වෙන්න එපා කිව්වලු. රොහාන් අත දම්ලා ගහලා පැත්තකට වෙලා. එතකොට තමයි වාපා ඇස් ඇරලා තියෙන්නේ. එයා කාමරය දෙවනක් වෙන්න විලාප දීලා. මගේ කසුන් ගෙන් මාව ඈත් කරපු හතුරෝ ළඟ ඉන්නවා කියලා...'

For E - Pusthakalaya

'එයා හරි අහිංසකයිනෙ උත්තරා. ඒ අහිංසක හිත තැළෙනවා නේද මාව වෙන්කළාම. ඒක ඇයි චාපගේ අම්මට තේරෙන්නෙ නැත්තේ?'

'රොහාන් හැම උත්සාහයක්ම අරන් තියෙන්නේ චාපාව දිනා ගන්න කියලා මට හිතෙන්නේ. රොහාන් තරුණ ගැණු ඇසුරු කරනවා කියලා රොහාන්ලගේ අම්මලත් හරි කැමතියි චාපා එක්ක එයා විවාහ වෙනවට.'

'ඇයි මගේ සුදූ නංගී උදුර ගන්න ඌ උත්සාහ කරන්නෙ?'

'සඳුන් අයියේ, ඔයා කියන්නේ අවුරුදු දෙකක චාපාගේ ආදරේ ගැන. අම්මා කතා කරන්නේ එයාගේ එකම දරුවා ගැන.'

'මට සුදූ නංගී නැතුව ජීවත් වෙන්න බැරි වෙයි උත්තරා.'

'අවුරුද්දක් විතර චාපා ලන්ඩන්වල නවත්තන්න හිතාගෙන අම්මා ඇවිත් තියෙන්නේ. සති දෙකකට සැරයක් හොස්පිට්ල් ගිහිල්ලා ආයෙත් ඩොක්ටර්ට පෙන්නන්න ඕනලු. රොහානුත් එහේ නැවතිලා.'

'සුදූ නංගී වගේ මටසිළුටු කෙල්ලෙක් රොහාන් වගේ දරදඬු මිනිහෙකුට ගැළපෙන්නේ නෑ උත්තරා.'

'අම්මා කතා කරන්නේ සැප සම්පත් ගැන. දුකක් නොදී චාපාව බලාගන්න පුළුවන් කෙනෙක් ගැන.'

'ඒත් ඒ හැම දේම මගේ සුදූ නංගීට බයක් ඛේදයක්. වේදනාවක්.'

මම තොල් පට පෙරළා සපා ගතිමි. ඇස් පිල්ලම් ගැහි ගැහී තටන්නේ කඳුලකට බව දත් මම මුහුණ රැකිමි.

'ඇයි සුදූ නංගී මට මේවා ලියලා එවන්නැත්තේ?'

'එයා දැන් ඉස්පිරිතාලේ නෑ. ඉන්න තැන ලිපිනය අපි දන්නෙත් නෑ. එයාට ලියුමක් එවන්න පිළිවෙළක් නැතුව ඇති සඳුන් අයියේ.'

'මම යන්නද චාපගේ අම්මා හමුවෙලා කතා කරන්න.'

'මොනවටද? නිකං ප්‍රශ්න වැඩිකර ගන්නෙපා...'

'ඒත් මට මේ වේදනාව විඳ ගන්න බෑ උත්තරා. මේක කොහොම පුපුරල පිටවෙයිද කියලා මම දන්නේ නෑ. පංතිවල වැඩත් තියනවා.



මම කොළඹ කැම්පස් එකට සිලෙක්ට් වෙලා. මාර්තු මාසේ කැම්පස් එකත් පටන් ගන්නවා. මට සුදූ නංගී ගැන නොහිතා මේ මොකවත් තීරණය කරන්න බෑ. ඇයි මේ මිනිස්සු මාව පිස්සෙක් කරන්න හදන්නේ?'

සුබ පතා වෙන් වීමකින් තොරව මම ඒ දින උත්තරාගෙන් සමු ගතිමි. මිද්දල් වූ මනස ත්, පීඩා ගින්නෙන් දැවෙන කය ත් මට පාලනය කර ගත නොහැකි වී ය. දකින දසුනක් හා සිතෙන සිතුවිල්ලක් පාසා සුදූ නංගී මෙනෙහි වීමට තරම් මගේ හිත විස්සෝප වී තිබිණ. මම පිස්සකු මෙන් වැඩ කිරීමට ත් සිතීමට ත් පෙළඹුණෙමි. ප්‍රේමය පිළිබඳ බොහෝ කවි, කෙටිකතා ලියා ඒවා පුවත්පත්වලට තැපැල් කළෙමි. බොහෝ ඒවා පුවත්පත්වල පළ වී ය. ඒවා කපා අලවා පොතක් සාදා දීමට උත්තරා පොරොන්දු වී ය. සතියකට වරක් වත් උත්තරා මා හමු වී කතාබහ කොට මගේ සිතේ ගිමන් නිවූවා ය. එහෙත් මොහොතකින් සිත ඇතුලේ ගිනි ඇවිළී මම පිස්සකු මෙන් හැසිරෙමි. අපිළිවෙළට අඳින්ට පළඳින්නට ත්, නගරයේ ඔහේ ගමන් කිරීමට ත්, නාට්‍ය ශාලා වල රස්තියාදු වීමට ත් මම පෙළඹී සිටියෙමි. එනි මාසය ගෙවී ගිය ත් මට නිශ්චිත තොරතුරක් ලබා ගත නොහැකි වී ය. ගිහාන් ද, නිරංග ද මා සොයා ආවේ මේ කාලයේ ය. මම නගර ශාලාව අසළ නැවතුමේ ඔහේ බලා සිටියෙමි.

'මොකද උඹ අහස පොළව ගැට ගහන්න කල්පනා කරන්නේ?' නිරංග කරට අත දමා විමසී ය. ගිහාන් අසලට වී නිහඬ වී ය.

'උඹලා නොහිතුවට කොහේ හරි ඈත ඉසව්වක අහසයි පොළවයි එකතු වෙනවා. එතන හරි ලස්සනයි. උඹලා ඒකට කියන්නේ ක්ෂිතිජ රේඛාවේ මිරිඟුව කියලා. මං ආසයි ඒ මිරිඟුවට.'

මම උත්තර දුනිමි. නිරංග ගිහාන්ගේ මුහුණ බලා පසුව වික්ෂිප්ත දෑස මා වෙතට එල්ල කළේ ය.

'උඹ කලාකාරයෙක් වෙලානේ?'

'ඇයි? පිස්සෙක් වෙලා කියලා හිතෙන්නේ නැද්ද?'

'උඹ මෝඩයෙක් නොමෙයි කියලා අපි දන්නවා.'

For E - Pusthakalaya

උඹලා පිස්සෙක් කියන හැම පිස්සෙක්ම හිතන්නේ අනිත් උන්ට පිස්සු කියලා. මිනිස්සුන්ගේ හිත පිරි මදින්න තරම් උඹල දෙන්නගේම හිත් දැන් සංවේදී නෑ. මමත් නිරංග වගේ ගෙම්බො, කැරපොත්තෝ කප සපා සමීක්ෂණවලට යට වෙලා හිටියා නම් මෙහෙම වෙන්නේ නෑ. උඹලා දෙන්නම නගරෙට සම්පයි. උඹලට මේ නාගරේ කවුන බව හුරුයි. ඒත් මුං මාව විනාශ කළා. නිරංග.... මගෙ අභිජාත මිත්‍රයා, උඹ දොස්තර කෙනෙක් වෙයං. මං පිස්සෙක් වෙන්නම්. සමහර විට අපි දෙන්නම එකම වාට්ටුවේදී මුණ ගැහෙයි.'

නිරංග දැත ම දමා මගේ උරහිස් දෙක අල්ලා ගත්තේ ය. 'යමු' ඒ ගිහාන් ය. අපි තිදෙනා ම කොල්ලුපිටිය පැත්තට පයින් ඇවිද ගියෙමු. බොහෝ දේ ඔවුන් දෙදෙනා මා වෙනුවෙන් කිය කියා ගියෝ ය. කිසිවක් මගේ මනසට වැදුණේ නැත. මම බොරැල්ල බසයකට අත දමා නතර කළෙමි. ගිහාන් ද නිරංග ද මා සමඟ ම බසයට ගොඩ වූ හ. අපි තිදෙනා ම බෝඩිමට ගියෙමු.



# 16

නිරංග බොරැල්ලට ගිය අතර ගිහාන් මගේ කාමරය අස්පස් කළේ ය. නිරංග පැමිණි විගස මගේ කිළිටි ඇඳුම් සෝදා දුන්නේ ය. කාමරයේ අලුත් බවක්, නැවුම් බවක් බාහිර වශයෙන් පෙනෙන්නට වී ය.

'උඹ විහින්ම නැති වෙන්න හදනවා. ටිකක් පිළිවෙළකට හිටපං. වරෙන් වරෙන් කාලෙකින් හමුවුණේ. පොඩි ඩිරින්ක් එකක් දල එන්ජෝයි කරමු. උඹ ඔය පොත් ගොඩට යටවෙලා. නැත්නම් පිස්සෙක් වෙනවා.'

මම එකහ වීමි. පළමු මත්පැන් උගුර මගේ මුළු සර්වාංගය දවා ලීමට සමත් වී ය. එහෙත් ඉන් පසුව මා පාලනය කිරීමට නිරංගට හෝ ගිහාන්ට නොහැකි වන්නට ඇත. ගිහාන් පළමුව කතාවට මුල පිරි ය.

'කසුන් උඹ ඩිග්‍රිය ගනියි. නිරංග උඹ ඩොක්ටර් වෙයි. මමයි කාලකන්නි වුණේ. උඹල දෙන්නටම නැති ප්‍රශ්න මට තියෙනවා.'

'ගිහාන් උඹ ඉපදුණේ කොළඹ. උඹට විභාගෙ මිස වුණේ නිකමට. ටික කාලෙකින් අපි මෝඩයෝ වගේ උපාධිය කරන කොට උඹල තමයි බිස්නස් කරල අපිට බෙහෙත් සාප්පු දල දෙන්නෙ.

නිරංග ද බී මතින් ම හවුල් වී ය.

'හරි හරි උඹල දෙන්නටම ප්‍රශ්න තියෙනවා. හැබැයි මතක තියා ගනිල්ල මට ඔව ප්‍රශ්න නෙමෙයි. උඹල වගේ ප්‍රශ්නවලට මම බය

For E - Pusthakalaya

නෑ. මේ මහපොළවෙ පය ගහල ඉන්න කොට මං දන්නව කොහොමද ඉන්න ඕන කියල.

ඒ කොණෙහි මිතුරෝ දෙදෙනා හොක් හඬලා සිනා සෙන්නට වූ හ. මගේ කාමරයේ කාලයකට පසු සිනාව විකසිත වී ය.

'සන්තෝෂයි මිත්‍රයා. සන්තෝෂයි...'

ඔවුහු දෙදෙනා මා බඳ ගෙන සතුට පළ කළෝ ය. සියල්ල ම අමතක කළ මම හැකි තරම් මධුවිත පානය කළෙමි. තිදෙනා ම එක යහනකට වැදී නිදන්නට වීමු. මම මහත් සිහින් හඬින් කතා කොට ඔවුන් පුබුදුවා මගේ සිත දිග හරින්නට වීමි.

'උඹල කියවල තියෙනව නේද වදරිං හයිට්ස්? ඒකෙ ඉන්න හිත් ක්ලිෆ් කළු චරිතයක් නෙමෙයි. කැතරින් යම් පමණකට ගුප්තයි. මං දන්නෙ නෑ සුදු නංගි ගුප්තද කියල. ඒත් මං ඒ සැඟවුණු හිතට ආදරේ. උඹල දෙන්නටම හිතාගන්න බෑ කොල්ලෙක්ගෙ හිතේ කෙල්ලෙක්ට ඇත්තටම ආදරයක් ඇති වුණාම ඒක කොච්චර ලස්සනද කියල. උඹල හිතපල්ල ඒ ලස්සන විනාශ වුණොත් මොකද වෙන්නෙ කියල. මිනිස්සු කියනව යථාර්ථයට මුහුණ දෙන්න කියල. මේ මහපොළවෙ තියෙන ප්‍රශ්නවල හැටියට ඕකත් ප්‍රශ්නයක්ද කියල. ඔය කියන හැම පණ්ඩිතයෙක්ම ආදරේ ඉස්සරහ බොළඳයි. ඒක පෙන්නන්න කැමති නෑ, තමන්ගෙ හෙළුව මතුවෙයි කියල. මට බෑ එච්චර වංක වෙන්න. මගේ සුදු නංගිගේ ආදරේ සුන්දරයි. ලස්සනයි. පවිත්‍රයි. ඒ ආදරේ ඉස්සරහ මම බොළඳයි. ඒ හින්ද මගෙ හෙළුව තියාගෙන මට බෑ අනිත් මිනිස්සුන්ගෙ පරදි ලස්සන්න. උඹල දන්නවද? උඹල දන්නවද මගේ සුදු නංගී මට නැතිවෙන්න යනව කියල? උඹල කියන්නෙ මට ඉවසන්න කියලද? උඹල දැනගනිල්ල කවදහරි මං ඇති වෙන්නෙ හරි නැති වෙන්නෙ හරි සුදු නංගිගේ ආදරේ හින්ද.... තිරංග.... ගිහාන් උඹල නිදිද? දැනට නිදගනිල්ල. ඒත් මං සදාකාලිකව නිදගන්න දවසට උඹල එක්කෝටම ඇහැරල ඉන්න වෙයි...'

මා කාලකන්නියකු වීමේ පෙරනිමිති ආත්මය තුළ පමණක් නොව බාහිර පෙනුමින් ද පෙනෙන්නට වී ය. කිසිවක් කිසිවෙකුගෙන් වසන් කිරීමට මම උත්සාහ නොකළෙමි. එක ම ලිපියක් හැර මට සු



නංගීගෙන් වෙනත් තොරතුරක් ලැබුණේ නැත. මම රෝහලට ලිපි හයක් පමණ තැපැල් කළෙමි. උත්තරා මඟින් තොරතුරු විමසීමි. එහෙත් සිත සනසන පිළිතුරක් නොවිණ.

මම කොළඹ සරසවියට ඇතුළත් වීමි. එහෙත් එහි සුන්දරත්වයක් මම නොදුටුවෙමි. පළමු මාසයට ම මම සරසවි ගියේ දින තුනකි. සුදු නංගී පිළිබඳ සිහින ලෝකය විසින් පෙරමග යථාර්ථය වසන් කොට තිබිණ. මේ කාලයේ මගේ පෞද්ගලික පන්තිවලට මා වැඩි මහන්සියක් ගත්තේ ආර්ථිකය පිළිබඳ සිතිමෙනි. ගෙදරට අවශ්‍ය වියදම් හා ඉදිරි සරසවි ජීවිතයට අවශ්‍ය වියදම් ද මවිසින් සපුරා ගත යුතු වී ය. දිනක් පංති කාමරයේ දී මම ළමයින්ට ලියා ගැනීමට සටහනක් කියවමින් සිටියෙමි. හිස බිමට ඔබා සියල්ලන් ම සටහන් ලියන අතර එක් සිසුවියක් හිස ඔසවා මා දෙස බැලුවා ය. මම විස්මිත වීමි. සුදු නංගීගේ බොඳ නෙත්වලට යම් සමානකමක් මම ඉන් දුටිමි. ඇය හැඳ සිටියේ නිල් පාට රැළි ගවුමකි. මම විමසිලිමත් වුවා දැයි නොදනිමි. එහෙත් සුදු නංගීගේ මෙන් ම දිගට වැඩුණු වරලසක් ද ඇයට වී ය. සති කිහිපයකින් ම ඇය මා හා කුළුපග වූවා ය. නමින් ඕ මධූපානි ඉද්දමල්ගොඩ ය. යෙහෙළියන් ඈ ඇමතුවේ මධූ නමිනි. පංති කටයුතු හා සරසවි යාමේ පහසුව සඳහා මම නවාතැන දෙහිවල දක්වා මාරු කළෙමි. උදේ දෙහිවල සිට නුගේගොඩට විත් මගේ ගමන් යාමට මම පුරුදු වීමි. නාවල රාජගිරියේ පදිංචිකාරියක වූ මධූපානි නිරන්තරව මට මුණ ගැසීම මහත් හිසරදයක් මෙන් ම මට කරදරයක් ද වී ය. බාහිර වශයෙන් මධූපානි තුළ ඇති සංයමය හා පෙනුම සුදු නංගී පිළිබඳ මතක වැඩි කරන්නක් වී ය. ඇගේ සිනාව මට යට ගිය මතකය හාරා හාරා අවුස්සන්නක් වී ය. මට පසු කාලයේ දී ඇය මුණ ගැසෙන විට මග හැරියෙමි. සිනාසෙන විට රවා සිටියෙමි. දිනක් පංතියේ දී මම ඇයට බැණ වැදීමි.. ඒ අහිංසක දැරිය ඉන් මහත් පීඩාවක් ලබන්නට ඇත.

මම මගේ මිතුරන් ද මග හැරියෙමි. ජීවිතය බෙහෙවින් තනි වී ය. ගෙදරට මුදලක් යවනවා විනා මම ගෙදර සමඟ තිබූ සියලු සම්බන්ධතා බිඳ ගතිමි. මිතුරන්ගෙන් ද, මවුපියන්ගෙන් ද, සිසු සිසුවියන්ගෙන් ද ඈත්ව හුදකලා වූ මම වඩ වඩා සුදු නංගීගේ ආත්මය

For E - Pusthakalaya

වෙත නැඹුරු වන්නට වීමි. සරසවිය මට සරසවියක් නොවිණ. මිතුරෝ මට මිතුරෝ නොවූ හ. මට මා හඳුනා ගත නොහැකි වී ය.

මධූ පන්ති සති කීපයක් පංති නොආවා ය. මම ඉන් මහත් පීඩාවට ලැබීමි. සිව්වන සතියේ ඇ පන්ති ආවා ය.

'මධූ මොකද පන්ති කට් කරන්නේ?'

'මං සර්ට වරදක් කරලා නැ. ඒත් සර් මගෙත් එක්ක තරහයි.'

'නැ ළමයෝ ඉගෙන ගන්න ළමයි එක්ක ගුරුවරු තරහ නැ. පංති කට් කළාම පහුගිය පාඩම් මග ඇරෙනවා. ඒකයි..... හොඳයි. පන්තියට යන්න.'

මම සිතට වංක ලෙස කතා කළෙමි. සැනසීමක් පේන තෙක් මිනයක නොවූයෙන් මම පොතපතට වඩ වඩා නැඹුරු වීමි. ගිහාන් අසනීප වී මේ කාලයේ කොළඹ රෝහලේ නේවාසික වී ය. මාස කිහිපයක් ම ගිහාන් රෝහලේ නේවාසික වූව ත් රෝගය හඳුනා ගත නොහැකි වී ය. පසුව ඔහු මහරගම පිළිකා රෝහලේ දෙවන වාට්ටුවේ නේවාසිකයෙක් වී ය. මම ජීවිතය පිළිබඳ බොහෝ දේ එහි දී උගත්තෙමි. පස්සාසින් ම මම ජීවිතය පිළිබඳ කලකිරුණෙමි. පැදු සමය මට බොහෝ පාළු සිතිවිලි පහළ වන කාලයක් වූයෙන් මම නිශාචර පැවැත්මකට අවතීර්ණ වීමි. වැස්ස අව්ව නොබලා මම මං මාවත් දිගේ ඇවිද ගියෙමි. බොහෝ දිනවල ගල්කිස්ස, දෙහිවල මුහුදු වෙරළ මගේ නිජ බිම වී ය. එහි සුළඟ මා හඳුනන තරමට මම මුහුදු වෙරළට සමීප වීමි. ඈත ඈත ක්ෂිතිජ රේඛාව දෙස බලා සිටිනා විට නිතර ම සුන්දර සිතිවිලි පහළ වේ. මුහුදු වෙරළ තුළ ඒකාකාරී බව වදයක් වූ විට මම කොහොන් බිම්වල ඇවිදීමට පෙළඹුණෙමි. දින කීපයක් ම මම මේ නිශාචර ගමන්වල දී හෙම්බත් වන්නට දෙපත් කපා ඇද හැලෙන මහා වැස්සේ තෙමුණෙමි. සෙම්ප්‍රතිශ්‍යාව හා උණ නිතර මට වැළඳෙන්නට වූව ත්, රෝගාතුර වීමෙන්, මට ම වධ දීමෙන් මම සතුටු වීමි. හැකි තරම් ජීවිතයට වධ දීමට පෙළඹුණෙමි. නොකා නොබී සිටීම මට සතුටක් වී ය. වැස්සේ තෙමීම මට සතුටක් වී ය. ඒ දෙස දයා ඇසින් බලන්නන්ට නපුරු බැල්මක් හෙළීම මට සතුටක් වී ය.



රෝගය උත්සන්න වෙන තෙක් බෙහෙත් නොගෙන මම මට ම වධ දුනිමි. ඒ තුන් හිස් පැය නිදිවරා මගේ කල්පනා කළෙමි. වැනත් කොලයක් මගේ හිත මිතුරන් මෙන් ළඟ රැඳිණ. මොනවා හෝ නිදි වරා කුරුටු ගෑමට මම පෙළඹී සිටියෙමි. මා ඉක්මනින් ඩියත් වී මිය යා යුතු ය යන සිතිවිල්ල තදින් හිතේ ධාරණය කොට ගතිමි.

For E - Pusthakalaya

## 17

වාසා ත් රොහානු ත් අතර විවාහය ලන්ඩන් නුවර දී සිදු කොට තිබිණ. පවුලේ ඥාතීන් කීප දෙනෙකු පමණක් එයට සහභාගි වී ඇත. මාසයකින් ලංකාවට පැමිණෙන තෙක් ඔවුන් විවාහ වී ලන්ඩන් නුවර පදිංචි වන බව උත්තරා වෙතින් මම දැන ගතිමි.

'උත්තරා නංගී....'

මම නැවතත් කියමින් උත්තරා වෙතට වාරු වීමි. උත්තරා සට සට ගා කඳුළු සලා මුනිවත රැක්කා ය. මගේ තොල්පට ගැහී ගිය කල මම යටිතොල සපා ගතිමි. අංග භාග රෝගියෙකුගේ මෙන් මගේ මුහුණ පැත්තකට ඇළ වී හැකිළී දැස තිගැස්සිණ. ඇස් කුහර යට මස් වැදලි නටන්නට වි ය. කාලයක් මුළුල්ලේ සිතේ තෙරපී තිබූ පීඩනය පිට වූවා සේ ය. සත්තකින් ම මා බලාපොරොත්තු වූයේ මේ අවසානය ම නොවේ ද? යටි සිත මගේ උඩු සිත කරා පිවිස විකෘතිය ප්‍රකෘතියක් කොට පෙන්වීමට සැරසිණ. සිහින ලෝකයේ කො තෙක් සැදි සැරුව ද කවද හෝ මහා පොළොවට ඇද වැටේ. මා මහා පොළොවේ සිට අගාධයකට වැටිණි ද?

'උත්තරා නංගී....'

මම නැවතත් උත්තරාගේ උරහිස් දෙක මිරිකා ගතිමි. ඇගේ මුහුණ රළු වී ය. උත්තරා බිය වී ය.

'ඇයි උත්තරා සුදු නංගී ආපහු ලංකාවට එන්නෙ මගේ ඇනු ගැහෙන්න. මට ඉතිං දැන් සුදු නංගී නැ නේද?'



වාසා වරදක් කරල නැ කියුත් ඒසේ.'

උත්තරා කී ය.

එහෙත් සිදු විය යුත්ත සිදු වී හමාර ය. මම වාවා ගත නොහී වේදනාවෙන් පාර පැන නගරය මැද්දට දිව ගියෙමි. උත්තරා මා හඬා එද්දී මම පටු පාරවල්වල ගොස් ඇය මග හැරියෙමි. දස අතේ වෙළෙන මගේ සිහිවිලි පාලනය කර ගැනීමට මම අපොහොසත් වීමි. බෙහෙත් ශාලා තුනකට පමණ ගිය මම නිදිපෙති කීපයක් ඉල්ලා සිටියෙමි. කිසිවෙකු මට නිදිපෙති දීමට ඉදිරිපත් වූයේ නැත. මම ජීවත් වීමේ අවම කාලය ගෙවා අවසන් බව තීරණය කළෙමි. මට සුදු නංගීගේ මුහුණ තව දුරට ත් දැකීමට නොහැකි ය. සුදු නංගී නැති ජීවිතයක මගේ ආත්මය පණ ලබා සිටින්නේ කෙසේ ද? මා ජීවිතයේ සියලු වගකීම් හා කරදරවලින් මිදිය යුතු ය. ඉපදීමට මිනිහෙකුට ඇති අයිතිය මැරෙන්නට තිබිය යුතු ය. මේ ලෝකයේ ජීවත් වී ඇතැ යි යමෙකු තීරණය කළ දිනට ඔහුට සිය දිවි නසා ගැනීමේ අයිතියක් තිබේ. මම බොරැල්ලේ මිතුරෙකුගේ ෆාමසියකට ගොස් කතාබහ කරන අතර තුර නිදිපෙති අහුරක් ගෙන සාක්කුවේ ලා ගතිමි. එහි නිදිපෙති දෙළහ ක් පමණ වූ බව මා දැන ගත්තේ බෝඩිමට පැමිණියාට පසුව යි. රාත්‍රි කෑම කා කාමරයේ දොර වසා ගත් මම එක හුස්මට නිදිපෙති සියල්ල කටේ දමා වතුර වීදුරුවක් බිවෙමි. තත්පර ගණනකින් සිතු දේ මට මතක යි.

'මම නිදහස් ය. දැං ඉතිං මම මරණයට ළඟා වෙමි. සුදු නංගී පැමිණෙන විට මා සොහොන් කර මාස තුනකි. මගේ සුදු නංගී දුක් විය යුතු නැත. අවාසනාවන්ත ඔබ නොව, මා ය. සතුටින් සිටින සුදු නංගීට මා කරදර කළ යුතු නැත. මගේ අවාසනාවට සුදු නංගී වන්දි ගෙවිය යුතු නැත. ඉතිං සැනසෙන්න සුදු නංගී. මම ඔබගේ ප්‍රේමය නිසා ම මේ කටුක නගරයේ ජීවත් වීමි. මේ ගෙන්දගම් පොළොවේ මට ඔබ නැතිව ජීවත් විය නොහැකි ය. ඉතිං දුක් නොවී මගේ මරණය පිළිබඳ ආරංචිය ලැබුණු විට සැනසෙන්න. මේ පාලු රාත්‍රියේ මම මරණයට කතා කරමි. ඔබ රොහාන්ගේ තුරුලෙහි මාලතී මල් යහනක සැතපේවි. ඉතිං මොහොතකින් මා මිය යනු ඇත. ආදරණීය මරණය.... එන්න මම බලා සිටිමි. අවාසනාවන්ත ලෝකයෙන් මා සමු ගන්වනු මැන.

For E - Pusthakalaya

මා පියවි සිහිය ලද්දේ ඇයි දැයි මම නොදනිමි. කෙසේ හෝ ජීවිතය එපා වී ගිය දිවි නසා ගත් කල මහු බේරා ගැනීමට ලෝකයා තැත් කරන්නේ කුමක් හෙයින් ද? මරණය අතරමග නතර කළ හැකි නොවේ. අල්ලා නවතා ගත හැකි ද නොවේ. පොලීසිය විසින් මගේ කට උත්තර ගැනීමට පැමිණි කල මම මොහොතක් නිහඬව සිටියෙමි. පසුව උත්තර දුනිමි.

'මගෙ ජීවිතය මං හිතන්නේ අයිති මට කියලා. මං ජීවත් වෙනවද නැද්ද කියලා තීරණය කරන්න ඕන මම. මට හිතුණා මං ජීවත්වුණා ඇති කියලා. එච්චරයි....'

මම කීවෙමි. එහෙත් මගේ 'ඇප බැඳීමේ' නීතිය පොලීසිය විසින් ක්‍රියාත්මක කරන ලදී. කොහුවල පොලීසියේ මාස් පතා මාස හයක් පෙනී සිටීමට මට නියම වී ය. මම එකඟ වීමි.

කළුබෝවිල රෝහලේ සති දෙකක් පමණ නේවාසික වීමට මට සිදු වී ය. මා සිහිය ලද්දේ දින අටක් පමණ නිසලව සිටීමෙන් පසුව බව හෙදිය පැවසුවා ය. පළමු වතාවට මා කොළඹ විත් රෝහලේ නේවාසික වූයේ මේ සිදුවීම නිසා යි. එහෙත් රෝහල ගුප්ත තැනක යි මට හැඟිණේ. කෙඳිරි ගාන, සුසුම් ලන රෝගීන් අතර මම කලකිරුණු මනසින් කාලය ගෙවමි. සිහිය ලැබෙන විට මම නිරන්තරව සුදු නංගී ගැන කියා කෑ ගසා තිබේ. මුළු වාට්ටුව ම මා පිස්සෙකු යි තීරණය කරන්නට ඇත. එහෙත් කාරුණික හෙදිය සියල්ල ඉවසා මා අසළට විත් අස්වසා ලීමට ඉදිරිපත් වි ය. යොවුන් හදක වේදනාව ඇය තේරුම් ගන්නට ඇත. එහෙත් වෛද්‍යවරයා මා කෙරේ කරුණාවක් දැක්වූයේ නැත. මම සිහිය ලද පසු පුංචි හෙදියට බොහෝ දේ කීවෙමි. පාසැල් කාලයේ යන්තම් උණක්, සෙම්ප්‍රතිශ්‍යාවක් වැළඳුණු විට සුදු නංගී මා අසළ ගැවසුණු අයුරු කීවෙමි. මගේ නළලතේ අත තබා සුදු නංගී දෑස් උඩ ඉහිදවා මගේ දෙස බලයි. එකී රත්තරං හීනය මම සිහි කරමි.

'ඔයාට හොඳටම උණ. අනේ මට දුකයි කසුන්. කෝ ඉන්න මගේ උකුළේ ඔළුව තියාගන්න. එතකොට සනීපයි...'



සුදු නංගී මා උණුසුම් කරයි. නළල දැඟිලි තුඩින් පිරි මදියි. කම්මුල පුරාවට දෑත යවා සෙනෙහස වපුරයි. නිල් නුවන් බිමට හෙළා මා දෙස බලා සිටියි.

'ඔයා දුක හිතන්න එපා. මට ඉක්මනට සනීප වෙයි.'

එ විට මම කියමි.

'ඒ වුණාට මං කැමති නෑ ඔයා අසනීප වෙලා ඉන්නවට.'

සුදු නංගී මුදු ලෙස තෙපළයි. සත්තකින් ම මම සුදු නංගී අසළ ම රැඳෙනුයේ එකී සෙනෙහස ම බලාපොරොත්තුවෙනි.

'අසනීප වුණාම බය හිතන්න හොඳ නෑ සුදු නංගී. මෙහෙම හිතන්න. හදිසියේ මම ඇක්සිඩන්ට් වෙලා මැරුණා. එතකොටත් ඔයා ජීවත් වෙන්න එපායැ.'

මම ඇගේ දෑසට එබී කියමි.

'කවම කවදවත් එහෙම වෙන්නේ නෑ. මගේ කසුන් මගේ ආයුෂත් අරන් ජීවත් වෙනවා. සංසාරේ කවදවත් මට එහෙම දෙයක් අහන්න ලැබෙන එකක් නෑ. ඔයාට මොහොතකට හරි ඉස්සෙල්ලා මං මැරෙන්න ඕනෑ කසුන්. නැත්නම් මට දරාගන්න බැරිව පසුව සුසුරලා මැරෙයි.'

එහෙත් මම මිය යාමට තැත් කළෙමි. කුමක් දෝ හේතුවක් නිසා බෝඩිමේ සිරි කාමරයට පිවිස, සිද්ධිය සැක කොට මා රෝහලට ඇතුළත් කොට ඇත. මා දිවි නසා ගැනීමට තැත් කළ බව සුදු නංගී දනී නම්.... මරණය වඩා දුකක් ගෙන දෙන්නේ මිය ගිය අයට නොව ජීවත්ව ඉන්නවුන්ට ය.

මම සීලිම දෙස බලා සිටිමි. බෙහෙත් ගඳ වාට්ටුව පුරා පැතිරේ. ලෙඩුන්ගේ කෙඳිරිලි හඬට හද කීරි ගැසී යයි. සිරින්ජර රැගත් හෙදියෝ එහේ මෙහේ දුවති. විදුලි පංකාව මාත් රැගෙන එහා මෙහා බමන්නාක් මෙන් මට දැනේ. සුදු නංගී පිළිබඳ මතක පොත සිත ඇතුළේ පෙරළෙයි.

For E - Posthakalaya

'මට කවදාකවත් රොහාන් තරම් සල්ලිකාරයෙක් වෙන්න බැරි වෙයි. ඔයාට යන්න කාර් එකක් ගන්න බැරි වෙයි. ගෙදර එකම වැඩකාරයෙක් වත් නැතුව තනියම ඔයාට සේරම කරන්න වෙයි. මම උදේ ගිහිං හවසට ගෙදර එයි. අපිට අනන්ත අප්‍රමාණ ආර්ථික ප්‍රශ්න එයි. පුංචි පැටියෙක් ලැබුණම ඒ ප්‍රශ්න දෙගුණ තෙගුණ වෙයි. සුදු නංගි එතකොට මං ගැන කලකිරෙයි. ඔයා දුක්වෙයි. ඒ හින්ද අමාරුවෙන් හරි හිත හදාගෙන අපි වෙන්වෙමු සුදු නංගී.'

මම දවසක් කීමි.

'මම කැමති එහෙම තමයි. සල්ලි කියන්නේ ලෝකේ තියෙන නැතම ජාතිය. මට සල්ලි නෙමෙයි ඕනෑ කසුන්. මට ඕනෑ ඔයාව.'

'ඔයා මගේ ළඟ ඉන්න කොට කොච්චර ලස්සන වේවිද? සල්ලිවලට ගන්න බැරි කොච්චර දේවල් තියනවද කියලා මං දන්නවා. මට ඔයාගේ තුරුලේ ඉන්න තිබුණොත් ඇති. ඔයා නැති නොවී හැම දේම නැති වුණත් මට කමක් නෑ. ජීවිතේ ලස්සනයි කසුන්. අපිට කවදා හරි එකතු වෙන්න පුළුවන්.'

එහෙත් එකී ප්‍රාර්ථනා සියල්ල රොහාන්ගේ දෙපා ළඟ අළු දූලි වී ගියා යැයි මට සිතේ. මා සිප සැනසූ සුදු නංගීගේ සුදු මුහුණ රොහාන්ගේ, හැඩි දැඩි රොහාන්ගේ පහස ලබතැ යි සිතත් ම පොළව පළාගෙන දිය වී යන්නට මට සිතේ. මලක් මෙන් සුරැකි මගේ රත්තරං සුදු නංගීගේ ආත්මය උදුරා ගැනීමට ඔවුන් කළ සියලු උත්සාහ සාර්ථක වී ය. පරාජය මට ය.

මම පරාජය පිළිගැනීමට සූදානමින් සිටිමි. එහෙත් එය විඳවා ගැනීමට නොහැකිව ළත වෙමි. උණු කඳුළු කැට දෙකක් දෑස අගින් ගිලිහී හිමිට කොට්ටය තෙත් කරනු මට දැනේ. මම වම් අතින් කොට්ටය උඩට උස්සා අනිත් අතින් කඳුළු පිස ද ගතිමි.

'අඬන්න එපා කසුන්. මට තේරෙනවා, ඒ වුණාට මෝඩ වැඩ කරන්න එපා. බලන්න කොච්චර ලස්සන අනාගතයක් ඔයාට තියෙනවද? ඔයාගෙ කවි කෙටිකතා මම කියවලා තියනවනේ පත්තරෙන්. ඒත් මං හිතුවෙ නෑ ඔයා මෙච්චර මෝඩ විදිහට වැඩ කරයි කියලා. සුදු නංගි රොහාන් බැඳලද කියලා හරියටම ඔයා දන්නෙ නැහැනේ. අනික සුදු නංගි ලංකාවට එනවනේ. ආවම ඔයාට විස්තර කියයි.



හෙදිය මා සනසන්නට තැත් කරයි. එහෙත් සුදු නංගි හැර කිසිදු යුවතියකට මා සැනසිය නොහැකි බව මට ප්‍රත්‍යක්ෂ වශයෙන් ම සහතික ය. සුදු නංගී එ තරම් ම ළෙන්ගතු ය. ළබැඳි ය. තුරු ලතාවක පහස ලැබූ මල් සුවඳකට කටු අතුලකින් කිනම් සැපයක් ද? දොළහට හරියට ම වාට්ටුවේ සීනුව නාද වී ය. සිතාවකින් තොර වූවෝ වාට්ටුවට ඇතුළු වෙති. කෑම පාර්සල්, කොට්ට, උණු වතුර බෝතල්, තුවා, කෑලි අතින් කටින් එල්ලා ඔවුහු තම තමන්ට අයිති ලෙඩුන්ගේ සුව දුක් බැලීමට ඇඳන් කරා යති. දන්නා හඳුනන මුහුණක් ඇතැ යි මම හිස හරවා ඔවුන් දෙස බලමි. අහඹු ලෙස හෝ සුදු නංගි වාට්ටුවට ඇතුළු වෙතැ යි මට සිතේ. එහෙත් සිහින සැබෑ නොවේ. උත්තරීතර සිහිනය මායාවක් වූ කල, අහඹු සිහිනයක් කෙසේ මල් ඵල ගන්න ද? නිරංග හෝ ගිහාන් මේ කිසිවක් නොදන්නා බව මම දනිමි. උත්තරා දන්නේ ද නැත. එ හෙයින් මා බැලීමට කිසිවකු පැමිණෙන්නේ ද නැත.

මගේ අම්මා හෝ අප්පච්චී මා මරණය සොයා වෙහෙසෙන බව දනි නම් පියාඹා හෝ කොළඹ නගරයට එන බව මම දනිමි. මට මගේ රත්තරං අම්මාගේ සෙනෙහස සිහි වේ. එහෙත් මේ කිසිවක් මගේ අහිංසක අම්මාට කීමට තරම් සැහැසි සිතක් මට නැත. ලෝකය මේ තරම් සැහැසි ලෙස මට වධ දුන් බව මගේ අම්මාට කෙසේ කියන් ද? මගේ මරණීය ආරංචිය අම්මා කෙසේ විඳගන්න ද?

නෙතට හුරු නෙතක් කොරිඩෝරය දිගේ සමීප වනු මම නෙත් හොසළා බලා සිටියෙමි. සුදු නංගීගේ ගමන් ලතාව ත් සංයමය ත් ඇති ඈ කවු ද? මම හිස එසවීමි. මධුපානි ඉද්දමල්ගොඩ. මහත් කේන්තියක් මෙන් ම වෛරයක් හිත ඇතුළේ පුපුරු ගසන්නට වී ය. මම හිස කොට්ටයට බර කොට උඩු බැලි අතට දිගා වී සිටිමි. මධුපානි මගේ ඇඳ අසළට විත් පාර්සලය කබඩ් එක උඩ තබා නිසලව මා දෙස බලා සිටී. ඇගේ ඡායාව යන්තමට මට පෙනේ. තිල්පාට රැළි ගවොම අඳත් ඈ ඇඳ සිටී. මගේ සුදු නංගිට හැර කිසිදු යුවතියකට තිල්පාට රැළි ගවුම ලස්සන නැත. මධුපානි ද කොණ්ඩය තනි කරලකට ගොතා සිටී. ඈ අත් දෙකින් ම කොණ්ඩ කරලේ අගිස්ස අතගාමින් හිස බිමට නැඹුරු කර ගත් වන ම කල්පනා කරයි. මම එක ද වචනයක් හෝ කතා නොකළෙමි. ඈ වඩාත් මා සමීපයට වූවා ය.

For E - Pusthakalaya

ඇඳේ ගැටෙන තරමට වටොර හෝත්තු කළා ය. මගේ බොහොත් සඳ ඇයට දැනෙන්ට ඇත. මම හිස් අහස සොයන්නාට මෙන් වට පිට නොබලා සිටිමි. මධු හනික ලේන්සුව ගෙන දෑස පිස ද ගත්තී ය. එහෙත් ඊට පෙර ලොකු කඳුළු ගුලි දෙකක් මගේ පපුව මතට වැටිණ. ඇ කඳුළු පිස ද ගත්තේ ඉන් පසුව යි. එහෙත් සුදු නංගීගේ කඳුළුකින් තුර වෙනත් කඳුළු ගංගාවකින් වත් මගේ හිත මෘදු කළ නොහැකි ය.

'මට බැනලා එළවා ගන්න එපා. මං වරදක් කළා නම් දස දහස් වාරයක් සමාවෙන්න. මට පේනවා ඔය ඇස් දෙකෙන් පිටවෙන්නේ වෛරය කියලා. මට වෛර කරන්න එපා... මං ආවේ හිත තලන්න නෙමෙයි. මට මේක ආරංචි වුණාට පස්සේ සර්ව නොබල ඉන්න බැරුව ගියා.'

මා ඉදිරියේ මෙසේ හොසණ්ඩාල කතා කියන්නේ මගෙන් ඉගෙන ගන්නා සිසුවියක නොවේ ද? ඇයට බැණ වැදී එළවා ගන්නට මට සිතේ.

'මධු හැම මිනිහෙකුටම පෞද්ගලිකත්වයක් තියෙනවා. කරුණා කරලා ඒකට ඇඟිලි ගහන්න එපා මේක ඉස්පිරිතාලේ නිසා මම නො බැණ ඉන්නේ. කරුණාකරලා යන්න. තවම ඔය ළමයා මගෙන් ඉගෙන ගන්නවා. ඉගෙන ගන්න කාලේ මනමාලකම ඔළුවට ගැහුවොත් ඔක්කොම ඉවරයි. ඔය ළමයා ගිහිල්ලා ඉගෙන ගන්න. මගේ දේවල් මං බලා ගන්නම්. හ්ම්...! ඉතිං යන්න.'

මම තරමක් සැරෙන් කතා කොට ඇ එළවා ගතිමි. මොහොතක් බලා සිටි මධු බිය වී යන්නට ගියා ය. එහෙත් මා ඇයට අවවාද කළේ, එළවා ගත්තේ කො තරම් වංක ලෙස ද? ව්‍යාජ ලෙස ද? ප්‍රේමය නිසා සිය දිවි නසා ගැනීමට තැත් කළ කෙනෙකු පෙම් සිතකට අවවාද දෙන්නේ කෙසේ ද? මධු මා නිසා වස බොනු යි ක්ෂණික බියක් ඉපදිණ. මම ඇඳෙන් නැඟිට කොරිඩෝරය දිගේ ඇ පසු පස හෙමි ගියෙමි. ඈත ඈත කෙටි අඩි තබමින් මධුපානී හිමින් ගමන් කළා මට පෙනේ. සත්තකින් ම මේ යන්නේ මගේ සුදු නංගීගේ අවතාරය වත් ද? ඇගේ උරහිසින් අල්ලා නතර කර ගැනීමට මට සිතේ. මම කොරිඩෝරය දිගේ දිව ගියෙමි.

'ශ්... ශ්.... ශ්..... කසුන් නොහොල්ලු පුවත්තේ?... ඕහොම ඉන්න...'

මිසී මා පසුපස ලුහු බඳී. බලා සිටිනවුන්ට එක ම විකාරයක් ලෙස මෙය පෙනෙන්නට ඇත. මම නැවතුණෙමි. මධු ගමන් කරයි. හෙදිය මා අල්ලා ගත්තී ය. ඇගේ දෑතින් මිදී පලා යාමට මට පුළුවන් කමක් නැත.

'අර යන ළමයට කතාකරන්න. මම ඇඳට යන්නම්.'

පුංචි ළමයකු මෙන් මම කීවෙමි. හෙදිය මා ඇඳට ගෙන ගොස් හිසට කොට්ටය තබා නිදි ගන්නා වාට්ටුවෙන් පිටතට ගියා ය. විනාඩි කීපයකින් මධුපානී නැවතත් මගේ රෝගී ඇඳ අසළට වී බලා සිටියා ය. ඇගේ දෑස කෙලින් බැලීමට බැරි තරම් මම සසල වී සිටියෙමි.

'මධූ මගෙත් එක්ක තරහ වෙන්න එපා නංගී. මං හිතාමතා බැන්න නෙමෙයි. මං හරිම කරදරේක වැටිල ඉන්නේ. මං බලන්න ආවට පිං සිද්ධ වෙනවා. හොඳයි ගිහිං එන්න.'

මම ඇගේ අත අල්ලා කීවෙමි. සත්තකින් ම එවේලේ මධුගේ දෑසින් වැටුණු කඳුළු නම් මගේ හිත සසල කිරීමට සමත් වී ය.

'මම ගොඩාක් දේවල් දන්නව සර්. සර් ගැන මට දුකයි. මං මොකවත් බලාපොරොත්තු වෙනව නෙමෙයි. සර්ගේ දුක නිවෙන කල් මං ළඟට වෙලා ඉන්නම්. සුදු නංගී ළඟට ආපු දවසක මං හිතනව මට හිත සතුටු කරගන්න පුළුවන් කියල. ඒත් ඔය ජීවිතේ විනාශ වෙනව දකින්න මං කැමති නෑ. ඇයි මට ඉඩ නොදෙන්නෙ ළඟට වෙලා සාත්තු කරන්න. මට කතා නොකළට කමක් නෑ. මම කිසිම දෙයක් බලාපොරොත්තු වෙන්නෙත් නෑ. කෙලෙස් නැති වූ මෙහෙණියක් වගේ මට පුළුවන් සර්ට උපකාර කරන්න. ඒක වරදක් නෙමෙයි කියල මං හිතන්නේ...'

මධූ කියාගෙන යයි. ඒවා හරියට සිතට ගන්නා දැයි මම නොදනිමි. එහෙත් මම මෙසේ කීමි.

'එහෙම කරන්න ඕනෑ කමක් නෑ. මම අසරණයෙක් නෙමෙයිනේ...'

'මං එහෙම හිතුවෙ නෑ...'

For E - Pusthakalaya

'එහෙනං...?'

'කාටවත් නොතේරෙන වටිනාකමක් සර් ගැන අපිට තියනවා. සර් හිංද නෙමෙයි වෙනත් මිනිස්සු හින්ද සර් ජීවත් වෙන්න ඕන.'

මෙ ...ල්පනා කළෙමි. මධුපානී ඉද්දමල්ගොඩ සිසුවිය නිසා මිය ගිය පසු ද කල්පනා කළෙමි. තව දුරට ත් මේ සමාජයට මුහුණ දී ජීවත් වනවා ද? සුදු නංගී වෙනුවෙන් ආත්ම පූජා කරනවා ද? මාගේ සිහිවිලි විසිරී ගිය කළ මම නිහඬ වීමි. හෙදිය ලොකු සිරින්ජරයක් ගෙනවිත් වම් අත පසාරු කළා ය. මොහොතකින් මට නින්ද යන්නට ඇත.



# 18

ලෝකය පිළිබඳ සුන්දර හැඟීම් සියල්ලක් ම දිය වී යමින් පවතී. බලාපොරොත්තු බිඳ වැටීම තරම් සත්‍යයක් ලෝකයේ තවත් නැත. අප ජීවත් කරවන සිතුම් පුබුදු වීමකින් තොරව මිලින වූ කල තව දුරට ත් ජීවත් වීම නොතේරුම් දෙයක් බවට පත් වෙයි. කළුබෝවිල රෝහලේ ගත කළ අන්තිම දවස් කීපය හිතමිතුරන් හා සිසු සිසුවියන් ද, උත්තරා නංගී ද අම්මා ද මා පිරිවරා සිටි බව සැබෑවකි. ඔවුන් සියලු දෙනා ම කීවේ එක දෙයකි. මදක් හෝ සුදු නංගී වෙනුවෙන් කතා කළේ උත්තරා නංගී පමණි.

'කොහේවත් ඉන්න කෙල්ලෙක් හින්ද උඹ උඹේ ජීවිතේ විනාශ කරගන්න එපා. කාටවත් උඹව වටින්නේ නැති වුණාට අපිට උඹ වටිනවා.'

මිතුරෝ හිත සනසවන අටියෙන් කීවෝ ය. අම්මා කළේ හිස අතගාමින් ඇඳ කෙළවරේ වාඩි වී මා සැනසීම යි. මා මේ කාලයේ වඩාත් පීඩාවට පත් වුණේ අම්මාගේ ත් අප්පච්චිගේ ත් හිත රිදවීම නිස යි. මා වෛද්‍යවරයෙකු කිරීමට ඔවුන් කළ සියලු උත්සාහ අසාර්ථක වී ය. එහෙත් සරසවි සිසුවෙකු කිරීමේ සතුට ඒ සිත්වල මෝදු වෙද්දී මා මිය යාමට තැත් කිරීම දෙමාපියන්ගේ හිත මොන තරම් රිදවීමක් ද? අම්මාගේ සෙනෙහේ වදන් මා පීඩාවට පත් කළ තරමට ම මා දිරිමත් කිරීමට ද සමත් වී ය.

For E - Pusthakalaya

[illegible]



මගේ උපන් දිනය පැමිණි සිකුරාදා මාර්තු දෙවැනි දා ය. පසුගිය උපන් දිනය [illegible] තෑගී මා වෙත පිළිගන්වූයේ 'ප්‍රේම ලේඛ කතා' නම් සුන්දර [illegible] මම උපදින දිනය [illegible]. මේ කාලයේ [illegible] ද මට ඇරැයුම් ලැබී තිබිණ. මේ 'ප්‍රේම ලේඛ කතා' නම් පුංචි [illegible] උත්තරා නංගී පුංචි කේක් ගෙඩියක් ද [illegible] ය. මගේ පුංචි කැදැල්ලේ [illegible] මේසය මත පුංචි කේක් ගෙඩිය තබා කෑලි කපා කෝප්ප දෙකක් ද [illegible] උත්තරා මා අභියස හිඳ ගත්තී ය.

'සුබ උපන් දිනයක් වේවා සහෝදර අයියේ! මේ මගේ කැල්ල. [illegible] නංගිට...'

ඉ පුංචි කේක් කැල්ලක් [illegible] නංගිට මෙන් කළා ය. 'කොහොමද මේ කෝපි එක.'

ඒ දින පුංචි උපන් දින සාදයක් පවත්වා උත්තරා නංගී මගේ [illegible] ය.

මා [illegible] දෙයක් බව [illegible] පසුව වූ. [illegible] එම නැම උත්සාහයක් ම ගෙදීම්. උත්තරා මගේ [illegible] සියලු ම [illegible] දුන්නී ය.

'ඔයා [illegible] සහෝදර අයියේ. [illegible] වුණත් ඔයා [illegible]. ඔයා [illegible] එක [illegible] කරන්න. [illegible] ඔයා [illegible]. [illegible] වෙන්න එපා. මං [illegible] ලියුමක් එවලා තිබුණා. ඒක [illegible] සහෝදර අයියට [illegible] වෙන්න ඇති. [illegible] ලියුම් එවලා තිබුණා මගේ ලියුමත් එක්ක.'

උත්තරා මගේ [illegible] පුංචි නංගීගේ ලිපිය දී [illegible] වී [illegible] ය. එම ලිපිය [illegible] ද [illegible] කියවන්නට වීමි.

For E - Pusthakalaya



ආදරණීය මගේම කසුන්,

ආදරණීය පුංචි නංගීගෙන් මෙහෙම ලියුමක් බලාපොරොත්තු නොවූ ඔයාට මේ දේවල් ලියන්න තරම් මං පව්කාර වෙලා. දෙවියන් ඉදිරියේ සමා කරන්න බැරි තරම් වරදක් මම සිදු කරලා ඉවරයි. මට මේ ජාතිය විතරක් නෙමෙයි අනන්ත සංසාරෙන් මේ වද වේදනාව විඳවන්න වේවි. පංසලකට පල්ලියකට ගිහිල්ලා කියනවා වගේ මං මේවා ඔයාට ලියන්නේ ඔයාට විතරයි පුළුවන් කසුන් මාව තේරුම් ගන්න. සිද්ධ වෙච්ච හැම දේම මේ ලියුමේ ලියන්න බැරි තරම් නින්දිතයි. මං වරදකාරි වෙලා ඉවරයි. ඔයාගේ ආත්මේ පාමුල සිරස තියාගෙන මම මේ ඔක්කොම පාපොච්චාරණය කළත් මගේ හැම ලේ බිංදුවක්ම සීතල වෙලා. ඔයා මතක් වෙද්දී ලෝකය කෙරේ ක්‍රෝධය වෛරය දිගින් දිගට ලියලනවා. ඒත් මේ සේරම දැනගත යුත්තේ ඔයාම පමණයි. හැම දෙයක්ම හැම මොහොතක්ම මම ඔයාගේ සියොලඟෙ වැටිලා කියාගන්න ඕනෑ කසුන්. එදා වගේම අදත් මාව විශ්වාස කරන්න. මගේ ආත්මෙන් මම කවදා හරි ඔයාට වන්දි ගෙවනවා සහතිකයි.

හැම බලාපොරොත්තුවක්ම බිඳ වැටුණම, අන්ත අසරණ වෙලා මම සුසුම්ලන කොට මේවා ඔයාට ලියනවට වැඩිය මැරෙන එක සැපක් කියලා මට හිතෙනවා. ඒත් ඔයාම මගේ හිත දිරිමත් කරලා දුන් ටිකක් ශක්තිමත්. කාත් කවුරුවත් නැති රටක මට මැරෙන්න බෑ. ඔයාගේ දෙපා ළඟ වැටිලා මං කවදා හරි මියැදෙනවා.

අහස වුණත් මේ වෙලාවේ වලාකුළුවලින් පිරිලා, නිල්ම නිල් පාට වෙලා ගිහිල්ලා. මම කාලකන්නි වැන්දඹු ගෑණියක් වගේ කාමරේ හිරවෙලා. මම ජනේල ඇරලා බලන කොට පේන්නේ හිස්ම හිස් අහස. මට ඔයා මතක් වෙන එක වළක්වන්න බෑ. මට පියාඹන්න අත්තටු නෑ. ඒත් මං අත්තටු මවාගෙන හිටියේ ඔයා ළඟට පියාඹන්න. මට ඕනෑකම තිබුණේ ඔයා වෙනුවෙන් ජීවත් වෙන්න. මං මෙහෙම ඉරණමකට පත්වෙයි කියලා නිකමට වත් හිතුවා නම් මං කවදාවත් මගේ ලෙඩේට බෙහෙත් කරන්න ලන්ඩන් එන්නේ නෑ. මට මේ මිනිස්සු මෙහෙම කරයි කියලා දන්නවානම් මම බෙල්ල කපාගෙන ලංකාවෙදීම මැරෙනවා. ඒක හරිම සැපයක් මේ වදයට වැඩිය. අනේ සහතිකයි



කසුන්. මට ඕනෑකම තිබුණේ ඔයා වෙනුවෙන් ජීවත් වෙන්න. ඔයාට සම්පූර්ණ ප්‍රේමයක් පුදන්න. ආත්මයක් ආත්මයක් ගානේ ඔයා ළඟට වෙලා දුකසැප බෙදාගෙන ඉන්න. ඔයා දෙවි කෙනෙක් රත්තරං. මං දන්නවා දෙවියෝ දුන්න පඬුරක් වගේ ඔයා මාව බලා ගන්නවා කියලා. සත්තකින්ම ඔයා අවංකයි. අව්‍යාජයි. ආත්මයක් ආත්මයක් පාසා මගේමයි. ඉතිං මං එනවා ඔයා ළඟට. ඒත් රත්තරං මං දැන් ඔයාගේ පුංචි නංගී නෙමෙයි. මට මගේ මුණ සිප ගන්න, මගේ අපවිත්‍ර ආත්මේ ඇතුළෙ සැතපෙන්න ඔයාට ඉඩ දෙන්න බෑ. මම අපවිත්‍ර වෙච්ච ගෑණියෙක්.

අම්මා ලන්ඩන්වල ඉඳලා ලංකාවට ආවේ මෙහෙදී මාව රොහාන්ට බාර දීලා. මං දැනගෙන හිටියේ නෑ මොකද්ද සිද්ද වෙන්නේ කියලා. ඔයා එවපු ලියුම බලලා මං කොට්ටේ යට දලා තිබුණේ. මං නිදාගන්න වෙලාවේ රොහාන් ඇවිල්ලා හොරෙන් අරං ඔයාගේ ලියුම බලලා. මං සතුටින් කුල්මත් වෙලා හිටියේ කසුන්. පස්සේ ඒක අම්මට පෙන්නලා. ඊට පස්සේ තමයි අම්මත් එක්ක රොහාන් වැඩ කරලා තියෙන්නේ මේ මඟුල තවම ඉවර නෑ කියලා. මාව ටිකට් කපාගෙන ඊට පස්සේ ලන්ඩන් ක්‍රිප්ටලින් එක්කං ගියා. මං දැනගෙන හිටියේ නෑ රත්තරං මොකවත්. අම්මා පුංචි උත්සවයක් ලෑස්ති කරලා සේරම සූදානම් කරලා මට මෙහෙම කිව්ව.

'දුව ඔයා දන්නවද මේ සේරම මහන්සි වුණේ ඔයා නිසා කියල. ලක්ෂ ගණනක් වියදම් වුණාට කාටවත් දුක නෑ. ඒත් ඉතිං එහෙම කරල ඔයාට සනීප වෙලා දුක් විඳිනවට අපි කැමති නෑ. අර කසුන් එවපු ලියුම රොහාන් දැකලා. බලන්න ඒ ළමය මොනව හිතයිද ඔයා ගැන? නරක ළමයෙක් වෙන්න එපා දුව. දුවගේ හොඳට තමයි මේ සේරම සිද්ද කරන්නේ. දැන් ඉතිං මාසයක් දෙකක් ඔයා ලන්ඩන්වල රොහාන් එක්ක ඉඳල ලංකාවට එන්න. ඔයාට දුව, රොහාන් තරම් හොඳට සලකන කෙනෙක් කවමදාවත් හම්බුවෙන්නේ නෑ. දොස්තර වුණත් කිව්වෙ ඔයා ඉක්මනට විවාහ කරන්න කියල. ඉතින් කසුන්ට ඔයාව බන්දල දෙන්න මට බෑ. අද රොහාන් ඔයාව බඳිනවා. අපි පුංචියට ඒ දේ කරමු. ටික දවසක් මෙහෙ ඉඳල දූ එන්න. ඔය දේවල් සේරම ඔයාගෙ හිතින් ඉවත් වෙලා ඔයාට සතුටින් ඉන්න පුළුවන් වෙයි.'

For E - Pusthakalaya

මම අඩල දොඩල කිව්වා. මගේ පපුවට මං ගහගත්තා. හිස අත් බැඳගෙන මොර දුන්නා. මගේ විලාපය කිසි කෙනෙක් ගණන් ගත්තේ නැ. අම්මල ලංකාවට ආව. මං තනිවුණා කසුන්. ඔයාගෙ සුදු නංගී තනිවුණා කසුන්. මං රොහාන්ගෙ දෙපා මුල වැඳ වැටිල කිව්ව මට රොහාන් එක්ක ජීවත් වෙන්න බෑ කියල. එතකොට මගේ ඔපරේෂන් එක ඉවර වෙලා හරියටම මාසයයි. ඒත් මේ ලියුම ලියන මොහොත වෙනකල් මං රොහාන්ගේ හිරකාරි වුණා. මං එයා අතින් අපවිත්‍ර වුණා. මගේ ආත්මය කැළැල් වුණා. මං රොහාන්ගේ බිරිඳ වුණා කසුන්. ඔයාගෙ සුදු නංගී රොහාන්ගෙ බිරිඳ වුණා. දෙයියනේ මේක ඔයා කොහොම විඳගන්නද? මං කොහොමද සිද්ධ වෙච්ච දේවල් ඔයාට ලියන්නෙ? ·

අද මේ මොහොත වෙනකල් රොහාන්ගෙ ග්‍රහණයෙන් මිදෙන්න මට බැරිවුණා. මේ ගෙදරින් එළියට මාව තනි කරල රොහාන් පළමු වතාවට එළියට ගියේ අද. ලංකාවට එන්න ටිකට් ගන්න. මට ඔයාට ලියන්න පුරුවන්කමක් තිබුණෙ නෑ. රොහාන් එළියට ගිය සැණෙකින් ඔයාට ලියන්න හිතුවා.

රොහාන් පුදුම තරම් රළු මිනිහෙක්. මං මෙහෙම ජීවත් වුණොත් අකාලෙ මැරිල යයි. ඔයාට කියන්න බැරි තරම් සිද්ධවෙන දේවල් අපවිත්‍රයි. කිළුටුයි. මල් පුවඳක් වගේ මගේ ළඟ දැවටෙන්න පුළුවන් ඔයාට විතරයි කසුන්.

අපි ලබන සතියේ ලංකාවට එනවා. මට දැන් ජීවිතයක් නෑ. මට ඔයාගෙ මූණ බලන්න බෑ. මං විනාශ වෙලා ඉවරයි. ඒත් මට අනාගතයක් නෑ. සතුට කියනෙක පලා ගියා කසුන්. රොහාන්ට තියෙන්නෙ නරුම ජඩ පැවතුම්. මහ විකෘති මිනිහෙක් එයා. ඒත් උඩින් කතාකරන කොට ඔක්කොම රැවටුණා. මගේ අම්මත් රැවටුණා. රොහාන් මෙච්චර විකෘති මිනිහෙක් කියල දන්නවා නම් අම්ම කවමදාකවත් මාව රොහාන්ට විවාහ කරල දෙන්නෙ නෑ. ඔයාගෙ ඇස්වල කඳුළු පිරෙනව දකින්න කියන අකමැත්තට මට මේව ලියන්න බෑ. මං ඔයාව රැවැට්ටුවේ නෑ කසුන්. මට ඔයාගෙන් තොර ලෝකයක්



නෑ කසුන්. මට ඔයාගේ ජීවිතයට වන්දි ගෙවන්න ඕන. මට තිබුණු එකම ආසාව ඔයාට සම්පූර්ණ ප්‍රේමයක් පුදල ඔයාව සතුටු කරන්න. අහිංසක ඔයා කොයි තරම් පෙරුම් පිරුවද? ඒ ලස්සන ලෝකෙ අපේ හිස් මතටම කඩා වැටුණා කසුන්. සහතිකයි. මං මගේ ජීවිතෙන් ඔයාගෙ ජීවිතේට වන්දි ගෙවනවා.

මං,

ආදරණීය

සුදු නංගී.

For E - Pusthakalaya

# 19

සුදු නංගි ලංකාවට එන බව සඳහන් ලිපිය මා දුටු පමණ දන්නේ මසිත පමණි. මහපාරේ නිද හුන් බලු කුක්කෙකු අභියස බිම බෝම්බයක් පුපුරා ගියාක් මෙන් මම සසල වීමි. නැති ගතිමි. බිය වීමි. වේදනා වින්දෙමි. සුදු නංගි ලන්ඩන් යෑමට පිටත් වූ දින මම අනන්ත ශෝකයකින් කටුනායකට ගියෙමි. ගිලන් රිය තුළ උඩුබැලිව හොවා ඈත දුරු රටකට ප්‍රතිකාර සඳහා මගේ සුදු නංගි පිටත් වෙනු මම ගල් ගැසුණු සිතින් බලා සිටියෙමි. එක ද වචනයක් වත් කතා කර ගත නොහී ගැහෙන හද මම සුසුමින් පුරවා ගතිමි. එහෙත් සුදු නංගි මේ සතියේ ලංකාවට එන්නේ මගේ පෙම්වතිය ලෙස නොවේ. රොහාන්ගේ අතේ එල්ලී ඇය ගුවන් තොටේ තරප්පුව බැස එනු මට මැවී පෙනේ. පෙම් කළ සිතකින්, පුද දුන් පිවිතුරු හදකින් මට මේ සිදු වීම සිහි කළ නොහැකි ය.

මා මගේ වුවමනාවට පිස්සෙක් වීමට තැත් කළා නොවේ. එහෙත් මා පාලනය කිරීමට මිතුරකුට තබා කිසිවකුට පුළුවන්කමක් තිබුණේ නැත. කාමරයට පිය මතින විගසින් පතපොත එහේ මෙහේ දමා මම සියල්ල අවුස්සා දමමි. සති ගණනාවකින් රෙදි සෝද නැත. දළ රැවුළ මගේ මුහුණේ තැන තැන මතු වී ඇත. සිගරට් කොට කාමරය පුරා මගේ දෙපයට පෑගේ. මත්පැන් මගේ ජීවිතයට සුදු නංගි තරම් ම සමීප වීමට තැත් කරයි. මගේ ප්‍රකෘති මනසින් සියල්ල විඳ දරා ගැනීමට නොහැකි වූ හැම විට ම මම මධු බඳුනක පහස සෙවීමි. එහෙත් මධු බිඳෙන් බිඳ මගේ උගුර හරහා කුස අරා ගත දවා පිච්චී යද්දී ගිනි ගොඩකට හසු වූ කුඩා සාමියකු මෙන් මම



සුදු නංගි නිසා අප [illegible] කෑමක් බීමක් පිළිබඳ හැඟීමක් මට තිබුණේ නැත. බොහෝ දිනවල දෙහිවල සිට ගල්කිස්ස දක්වා වෙරළේ හුදෙකලාව පිය මැනිමි. ඈත ක්ෂිතිජයේ දළ රළ පෙළ මහා සමුදුරු ඝෝෂාව නගමින් මා බිලි ගැනීමට සැරසේ. දන්නා හඳුනන්නෝ මා මග හැර ගිය අවස්ථා බොහෝ ය. දින කීපයක් මම රාත්‍රී අඳුර වැටී වී පහන් දැල්වෙන තෙක් ගල්කිස්ස සුසාන භූමියේ රැඳී සිටියෙමි. සොහොන් කොත්වල කවි හා සටහන් කියවීම මම පුරුද්දක් කොට ගතිමි. තිරි වැස්ස වැටෙන හැම මොහොතක ම මම බලහත්කාරයෙන් පොද වැස්සේ තෙමුණෙමි. දෙපත් කපාගෙන වැටෙන වැස්සේ මම තෙත බරිත වී කාමරයට ගොස් හිසවත් පිසද නොගෙන නින්දට ගියෙමි. පසු දින උදේ මට සහලවා උණ ගෙන තිබිණි. මම පාන්දර හයට පමණ අවදි වී කාමරයේ තිබූ බඩු මුට්ටු පොළොවේ ගසන්නට වීමි. සුදු නංගිගේ ඡායා රූ ගෙන සිප ගන්නට වීමි. ඇගේ සුවඳ මගේ ආත්මය තුළ ලියලා සිත කිළිපොළා යන්නට වී ය. මම ගැහි ගැහී ඇඳේ වාඩි වීමි. දණහිසට සිරස ඔබා දැතින් ම හිස බද ගතිමි. හදේ ඇතුළු ගැබේ සිට උඩට ඉලිප්පි ඉලිප්පී හද ගැස්සි ගැස්සී ආ සුසුම මහා ඉකි බිඳුමක්ව පිට පනින්නට වී ය. මම හිස බිත්තියේ ගසා ගනිමින් ඉකි ගසා විලාප දී හඬන්නට වීමි. නළලේ දෙපැත්ත ම ගෙඩි ගැසෙන්නට ඇත. මම ඇඳේ මුහුණින් තලා වීමි.

'පුදුම ලෙඩක්නේ මේ ළමයට හැදිලා තියෙන්නේ. ඇත්තටම කසුන්, මොකද්ද ඔය ළමයට වෙලා තියෙන්නේ? පිස්සෙක් වගේ හැසිරෙන්න එපා. ඔය ළමයා මොකක් හරි කරදරයක් කර ගත්තොත් අපිටත් වග කියන්න වෙනවනේ....'

බෝඩිමේ ඇන්ටි එසේ කියා මගේ කාමරයට පිවිස මගේ නළලට අත තැබුවා ය.

'සහලවලා උණ දෙයියනේ! සිරි.... සිරි.... සිරි....'

ඇන්ටි අනෙක් කාමරයට දිව ගියා ය. සිරි ත් සමඟ තවත් දෙදෙනෙක් කාමරයට පිවිස මට අලුත් කමිසයක් අන්දවා කාමරයෙන් එළියට ගත්තෝ ය. මා ත්‍රීරෝද රථයකට නංවා ගත් ඔවුහු නැවතත් රෝහලට ගෙන ගියෝ ය. මම වෛද්‍යවරයා දෙස හොරැහින් බැලීමි. සත්තකින් ම ඔහුට මා ගැන අනුකම්පාවක් ඇති වුණා දැයි මම නොදනිමි.

For E - Pusthakalaya

'ඔය ළමය කපුන් නේද? මෝඩයෙක් වගේ වැඩ කරන්න එපා ළමයෝ. මමත් ඉස්කෝලෙ යන කාලෙ ගෑණු ළමයෙක් හින්ද නාස්ති වෙන්න ගියා. ඒත් මං කළේ නාස්ති වෙච්ච එක නෙමෙයි. ඉගෙන ගන්න එක. මං වෛද්‍ය විද්‍යාලෙට ගිහිං විභාගෙ කරන කාලෙ වෙන කොට ඒ ගෑණු ළමයට ළමයි දෙන්නෙක් හිටිය. දැන් ඒ කෙනාට ළමයි පස් දෙනෙක් ඉන්නවා. බැඳල ඉන්නෙ ටැක්සි ඩ්‍රයිවර් කෙනෙක්. සමහර විට ඒ ළමය දැන් දුක්වෙනව ඇති.... මම ඕව කිව්වෙ ඔය ළමයට ටිකක් හිතට ගන්න. මට වාට්ටුවේ නර්ස් විස්තරේ කිව්වා... ටිකක් විවේක ගන්න. මේ බෙහෙත් වරද්දන්නෙ නැතුව ගන්න.'

මම අසා සිටිමි. බොහෝ වේලා හිස බිමට ඔබා අසා සිටිමි. නැත. ඒ කිසිවකින් සිතට සහනයක් නැත. සුදු නංගී ඉන්නෙක් කොට ගෙන ජීවිත හිනිමඟ තරණය කිරීමට මට අවැසිකමක් නැත. මගේ ජීවිතය ඇති විය යුත්තේ ඇය වෙනුවෙනි. මා අනාගත සිහින මැව්වෙ ඇය වෙනුවෙනි. මා ජීවත් වූයේ ඇය වෙනුවෙනි. අපට අපේ ම ජීවිතයක් උරුම නොවූ කල මට පැවැත්මක් වුවමනා නැත. මම සුදු නංගී වෙනුවෙන් ආත්ම පූජා කරමි.

'ඩොක්ටර්.... ඩොක්ටර් දන්නෙ නෑ ඩොක්ටර්....'

මට කියා ගන්නට බොහෝ දේ තිබේ. එහෙත් වෛද්‍යවරයා ඉදිරියේ මට ඉතිරි වූ දේ කියා ගත නොහැකි වි ය. මට හැඬුම් එයි. මම ඉකි ගැසීමි. මගේ දෙනෙත් උල්පත දිගේ හදවත දිය වී ගලා එන්නාක් මෙන් මට දැනෙන්නට වි ය.

සත්තකින් ම ජීවිතය අහිමි වෙමින් පවතී. නිරන්තරව මම සුදු නංගී සිහිනෙන් දකිමි. කාමරය තුළ මම හුදෙකලා වීමි. කාටත් හොරා මම සුදු නංගී සිහි කළෙමි. කාටත් හොරා මම පෙම් කවි ලිවීමි. සත්තකින් ම මගේ සුදු නංගී ඒ කවි දැක්කා නම් මගේ පය පාමුල හඬා වැටෙන බව ද මගේ දුක තේරුම් ගන්නා බව ද මම දනිමි.

යොවුන් පුවත්පතක නිදහස් ලේඛකයකු ලෙස මා කටයුතු කළ ද මට කාර්යාලයට දිනපතා යාමට නොහැකි වි ය. සුදු නංගී පිළිබඳ ලියූ සියලු සටහන් කර්තෘ තුමාට භාර දී සටහනක් මේසය මත තබා මම කාර්යාලයෙන් බැහැර වීමි.



'මට වැඩි කලක් ජීවත් වෙන්න බැරි වෙයි. මම රස්සාවට ආයෙත් නෑ. මම නිතරම අසනීප වෙනවා. මම හදිසියේ මැරුණොත් එහෙම මේ සටහන් ටික පත්තරේට දාල දෙන්න.'

ඒ දින කාර්යාලයට මා නමින් ලැබුණු ලිපි සියල්ල ම ගෙන මම කාමරයට ආවෙමි. හරියටම සුදු නංගී ලංකාවට එන්නට නියමිත ව තිබුණේ එද ය. මම ගිනිගත් මනසින් එය සිහි කළෙමි. සිගරට් පැකට්ටුවක් ද ගෙන කාමරයට පිය නැඟිමි.

ලියුම් ගොඩේ තිබූ මධුෂානිගේ ලියුම මා කියවන්නට වූයේ එහි දී ය. ලිපිය කියවා ගිනිකූරක් ගසා මා එය ගිනි තැබීමි. කාමරය ගිනි ගත්තේ එහි දී ය. මගේ පතපොත ත් රෙදි ත් ගිනි ගන්නා තෙක් මම කිසිවක් නොදැන සිටිමි. ඇන්ටි ගින්න නිවන්නට සිරි ත් සමඟ කාමරයට පිවිසි අයුරු ත්, මා බීමට ගත් වතුර වීදුරුව කුඩු කර ගත් අයුරු ත්, මගේ දෑත ම තුවාල වී ඇඟිලි තුඩු අතර වීදුරු කටු එල්ලී තිබූ අයුරු ත් මට මතක ය. මගේ විකල මනස මා ඒ තත්ත්වයට පත් කරන්නට ඇත. ත්‍රීරෝද රථයක නංවා මා නැවතත් කළුබෝවිල රෝහලට ඇතුළු කළේ ඔවුන් ය. මේ ගෙවෙන්නේ රෝහල් ඇඳ මත තුන් වන දිනය යි. දැන් ඉතිං සුදු නංගී ලංකාවට පැමිණ දින තුනක් ගත වී ඇත. මා රෝහලේ බව ඈ දන්නේ නම්....

පෙර දින මා කෙරේ අනුකම්පා කළ වෛද්‍යවරයා දැන් මට ද්වේෂ කරනු යි මට සිතෙයි. පුංචි මිණී පමණක් මා අසළට විත් සිත සනසයි.

'මේ ළමය මනෝ චිකිත්සකයෙකුට පෙන්නන්න වෙයි. මේ දෙවෙනි පාරටනේ වාට්ටුවට ඇතුල් කළේ. ටිකක් සිහි මඳ ගතියක් තියනවා.'

වෛද්‍යවරයා මගේ අත බැන්ඩේජ් කරමින් කී අයුරු මට සිහි වේ.

'වැස්සේ තෙමි තෙමී සොහොන් කොත් ගානේ ඇවිදින පිස්සු ළමයෙක්.'

වෛද්‍යවරයාගේ හඬ මගේ කන් සිදුරු තුළ දෝංකාර දෙයි. දෑසේ දැනෙන වේදනාව මට සටහන් කර ගත හැකි ය. එහෙත් සිතේ දැවෙන ගින්න නිවා දැමිය නොහැකි ය.

For E - Pusthakalaya

මම හිස් සිවිලිම දෙස බලමි. මගේ දෑසින් වැටෙන කඳුළින් කොට්ටය තෙත් වේ. පුංචි මිසි පැමිණ නැවතත් සිරින්ජරය ගෙන මට විදින්නට සැරසුණා ය.

'ඇයි මට වද දෙන්නේ?'

මම විමසීමි. ඇය නැවතත් මාපටැඟිල්ලෙන් මගේ ඇසේ බෙරෙන කඳුළු පිස දැමුවා ය. මසිත දැවී යයි.

'අනේ මිසී....'

ඕ සිරින්ජරය ගෙන මගේ දකුණතට විද්ද ය.

'ඇයි දෙයියනේ මට මැරෙන්න නොදෙන්නේ?'

මම ඇසමි. පුංචි මිසී පුළුන් කැබැල්ලක් ගෙන මගේ අත පිස මදියි. මම පහනය පකා නිහඬ වීමි. දෑස පියා ගතිමි.



# 20

'අනේ මගේ කසුන්....'

හදවත තුළ කිඳා බැස එකී ආත්මීය හඬින් මම පිබිදියෙමි. දෑස විවර කළෙමි. ඒ සුදු නංගී ය. මගේ සුදු නංගී ය. මගේ රත්තරන් සුදු නංගී ය. මම නැඟී සිටින්නට තැත් කළෙමි. සුදු නංගී, මගේ සුදු නංගී මා බලන්නට ඇවිත් ය.

ලෝකය නැවතුණාක් මෙන් මට දැනිණ. මම මගේ නෙත් එහෙ මෙහෙ යා නොදී නතර කොට ගත්තෙමි. සිහින් මීදුමකින් මෙන් බොඳ වී තිබුණු සුදු නංගීගේ රුව අඳුරු තිමිර පට ඉරා මා ඉදිරියේ නැවතී ඇත. මගේ සුදු නංගී මා බලන්නට ඇවිත් ය.

මම ඇය දකින්නට ආශා කළෙමි. ඈ අස රැඳෙන්නට සිතිමි. නිහඬව ඇගේ හිස ගෙන දැහිලි යවමින් කතා බහකින් තොරව වුව ද සිටීමට ප්‍රිය වීමි. ඈ ගැන සිතමින් තනි යහනේ නිසොල්මන්ව සිහින මැවීමි. අනාගත පැතුම් ලෝකය ඈ වෙනුවෙන් ඉදි කොට එහි සැරි සැරිමි. සුදු නංගී මුමුණන ගී පද මම කැඳැල්ලට විත් සිහින්ව මුමුණමි. එ වන් ලොවක සුන්දර සිහිනය දැන් මා ඉදිරිපිට එක එල්ලේ දෑසට එබී සිටී. මා නින්ද ත් නොනින්ද ත් අතර සිටියදී ඇය මා ඇමතුව ත් මාගේ නෙත් විවර වූ සැණින් දෑසට එබී මහේ බලා සිටියා විනා වචනයකුදු කතා කළේ නැත. මම අලස ලෙස ගෙල

For E - Pusthakalaya

හරවා ජනෙල් විවරය තුළින් පිටත බැලීමි. හිස් අවකාශය මා නෙතට හමු වේ. ඒ දවස අපි දෙදෙනා ම හිස් අහස දෙස බලා සිටියෙමු. අහස අයත්කාන්තා සිනුවමකි. ඒත් එහි චමත්කාරය මා සිතේ සිතුවම් වන්නේ නැත. අවකාශය මෙන් ම මා සිත ද හිස් ය. ජීවිතයද හිස් ය. ආත්මය ද හිස් ය. හිස් තැන පිරවිය හැක්කේ සුදු නංගීට පමණි. දම් ලැල්ලක හිස්තැන් පුරවන ඉත්තකු වීමට සුදු නංගීට පුළුවන්කමක් තිබේ ද?

සුදු නංගීගේ අත ගෙන මගේ පපුවේ තබා තද කොට ගන්නට මට සිතේ. ඒ විට මගේ ආත්මයේ මරණීය වේගය ඇය තේරුම් ගන්නවා ඇත. එහෙත් මට සුදු නංගීගේ අත ගෙන පවිත්‍ර වූ සෙනෙහසින් සිප ගැනීමට දැන් පුළුවන්කමක් නැත. සුදු නංගීට මගේ ආත්මයේ සැතපීමට ද ඉඩ නැත. ඇය සිව් මසකටත් වැඩි කාලයක් රොහාන් සැතපු ඔහුගේ බිරිඳ නොවේ ද?

මගේ දෑසේ දැන් කඳුළු නැත. හවස් වරුවේ මගේ ආත්මය මිදී වියැළී තිබූ කඳුළු උල්පත ගලා හැළුණේ ය. දැන් මට හඬන්නට නො හැකි ය. කිසි සේත් සුදු නංගී ඉදිරියේ හඬා වැටීමට මට නුපුළුවන. ඈ ගිය පසු ඇති තරම් මම හඬමි. සත්තකින් ම මා වැඩි වශයෙන් හඬා වැටී ඇත්තේ මගේ සුදු නංගී වෙනුවෙන් ම ය.

මම පුරුදු පරිදි සුදු නංගී දෙස නැවතත් හැරුණේ අලසකමිනි ගෙල හරවන විට එත්නත් විදීම නිසා ඉදිමී තිබූ මගේ දකුණත රිදිණ. මා සෙදිරි නොගා සිටියේ ඉවසීමෙනි. සුදු නංගී නිසොල්මනේ සිටී. මම ඇහි පිල්ලම උඩ ඉදවා ඇය දෙස බැලීමි. ඕ නිහඬ ය. නිසල ය. ඇගේ සුන්දර සිරුර සුදුමැලි වී ඇතැ යි මට සිතේ. මට ඇය කෙරේ නොතිමි ආදරයක් උපදී. එහෙත් ආශාවක් නැත. දුක ද, වේදනාව ද, ද්වේෂය ද, ඊර්ෂ්‍යාව ද දැයි නොදත් හැඟීමක් හිතේ තෙරපේ. ප්‍රේම මිසී මා ළඟින් ඉවතට ගොසිනි. සුදු නංගී පැමිණ සිටියේ තනිව ම ය. මා රෝහලේ බව කවුරුන් හෝ ඇයට කියන්නට ඇත. මගේ දෙතොල වියැළී සුදුමැලි වී යනු මට දැනේ.



අයාලේ ගිය නොහික්මුණු සුළං රැල්ල විත් සුදු නංගීගේ කෙස් රොද අවුල් කළේ ය. ඇය කෙස්රොද සකසා ගන්නට උත්සාහ කළේ නැත. වෙන ද නම් මම හනික එය සුළඟේ යන්නට නොදී දෙකන් පෙති අතර සඟවමි. මම දෑස පියා ගනිමි. මගේ දෑත ම පොරෝනයට යට වී ඇත. සුදු නංගී තවම මගේ තුවාල වූ දෑත දුටුවේ නැත.

වාපා මගේ පියවුණු දෑස ත් තලල ත් අතර අත තැබුවා ය. මගේ පියවී තිබූ දෑස විවර වි ය. මම සුදු නංගීගේ අත ඉවත් කිරීමට පොරෝනය යට සැඟවී තිබූ මගෙ තුවාල වූ දෑත එළියට ගනිමි. සැණෙකින් ඕ බලහත්කාරයෙන් මෙන් මගේ දෑත අල්ලා මිරිකා ගත්තී ය. මට දෑත මුදා ගැනීමට පුළුවන්කමක් තිබුණේ නැත. කපා හෙළූ ගසක් මෙන් සුදු නංගී මගේ ගිලන් ඇඳ අසළ බිම දණහිස තබා ඇද වැටුණා ය. මගේ දෑත මත හිස තබා ඇඳට බර කර මුහුණ සඟවා ගත්තා ය. මට සුදු නංගීගේ මුහුණ පෙනෙන්නේ නැත. තනි කරලට ගොතා තිබූ සුදු නංගීගේ වරලස පිට දිගට බේරී ඇත. ඇය හඬනවා විය යුතු ය. ඇගේ පිට ගැස්සෙනු හීන් ඉකිය සමඟ මට පෙනේ. ඇයේ. මම මහා සුසුමක් පිට කළෙමි. අපේ සුසුම් සැඟවී ඉකි බිඳින්නට ඇත. දෑස රතු කර ගෙන කඳුළින් බර නයන් මා වෙතට යොමු කළ සුදු නංගී සිහින්ව කතා කළා ය.

'කසුන් අනේ කසුන් ඔයා මං නිසා නාස්ති වෙන්න එපා. මට ඔයා දැක්කට පස්සෙ දැන් ඉතින් ජීවත් වෙන්න ඕනෙ නෑ. මං නිසා ඔයා නැති වෙන්න එපා දෙයියනේ.... ඇයි මට වේදනා දෙන්නේ

මගේ පපුවට දෑත ම තබා මා සොලවමින් සුදු නංගී ඉකි ගසයි.

'මං නිසා දුක් වෙන්න එපා. මට හැම දෙයක්ම හුරුයි. වාපා. ඔයා මේ ගැන හිතන්න එපා. රොහාන් එක්ක සතුටින් ඉන්න.'

මම හිත හරහා ඔහේ වචන පිට කළෙමි. ඊවා පිට වුයේ කෙසේ දැයි මම නොදනිමි. දවසක්, දෙකක්, සතියක් පුරා සුදු නංගී ළඟ හිඳ ගෙන මේ සියල්ල ම කියන්නට මට ඕනෑකම තිබේ. එහෙත් මගේ දුක කියන්නට මා දැන් සුදු නංගීගේ නොවේ. ඇය මට අයිති නැත. මා ඇයට අයිති නැත. අපි අපේ නොවෙම

'ඔයාගේ ජීවිතේට මං ආශිර්වාද කරනවා. ඉරිසියාවකින් කුහකකමකින් තොරව. මට පුළුවන් ඔයා සතුටින් ඉන්නවා බලලා සැනසෙන්න. ජීවිතේ වල්මත් කර ගන්න එපා වාසා. රොහාන් මේ ගමන ඔයා ආපු බව දන්නේ නෑ නේද? මීට පස්සේ මාව බලන්න එන්න එපා. එහෙම වුණාම මට නෙමෙයි, ඔයාට හොඳ නෑ...'

මම එසේ කියා සුදු නංගී වෙතින් නෙත් ඉවත් කොට ගතිමි. ඒත් මට අහක බලා ගන්නට නොසිතේ. වාසා ගැහැණියක වී ඇතැයි සිතෙන විට මට පිළිකුලක් ද උපදේ. රොහාන්ගේ තුරුල්ලේ ඇ සැතපෙනවා නොවේ ද? සුදු නංගී නැගී සිට ඇඳ අසළට ම වි ටික වෙලාවක් සිටියා ය. ඉන් පසුව ඇඳේ පහළට ම වෙන්නට වාඩි වුවා ය. සුදු නංගීගේ ඇඟේ නොවැදෙන්නට මම දෙපා මෙහා කෙළවරට කොට ගතිමි.

'ඔයාට දැන් මාව පිළිකුල් වෙලා...'

සුදු නංගී බිම බලා ගෙන කීවා ය. ඉන් පසුව දෑස බිමට ඔබා ගත්තී ය. පුංචි මිසී මගේ ගිලන් ඇඳ ළඟට එනු මට පෙනිණ. මම ඇය දෙස නොබැලිමි. මහත් ලැජ්ජාවක් මගේ සිතට උපදී. හෙදිය තේ දෙකක් වත් කොට ටීපෝව මත තැබුවා ය.

ලෙඩුන් බලන්නට එන අයට තේ දීමේ සිරිතක් වාට්ටුවේ නැත. පුංචි මිසී මේ කරන්නේ මා වෙනුවෙන් අපේ සිත් සනසන හෙදකමකැයි මට සිතේ. සුදු නංගී පිවිතුරු බැල්මක් හෙදිය දෙසට හෙළුවා ය. හෙදිය ලෙන්ගතුව සිනාසුණා ය.

'මිසිස් බොන්න තේ එකක්.'

මම කීවෙමි.

'ඔය දෙන්නා බොන්නකෝ...'

එසේ කියමින් ඕ අසළ ඇඳක් ළඟට ගියා ය. මම හිසත් කොන්දත් යන්තම් උස්සා කඳ කෙළින් කොට ගතිමි. සුදු නංගී කොට්ටය ඇඳ වියලට තබා උදව් කළා ය.



'බොන්න.'

ඇසින් තේ එක දෙසට ඉඟි කොට මම කීවෙමි. සුදු නංගී තේ කෝප්පය ගෙන මගේ මුවට කිට්ටු කළා ය. මම එහි තොල නොගා ඇගේ දෑස දෙස බැලිමි. සත්තකින් ම සුදු නංගීගේ සිත්කළු දෑස දීප්තිමත් ය.

'බොන්න කසුන්'

ඕ ආදරයෙන් කීවා ය. මම තේ උගුරක් සුදු නංගී අතින් බීවෙමි. ඉන් පසුව ඇගේ දෑසට එබුණෙමි. කල්පනාවකින්, පැකිළීමකින්, කම්පනයකින් තොරව සුදු නංගී මට තේ එක පෙව්වා ය. මම දිව ඔසුවක් මෙන් එය තොල ගෑවෙමි.

'ඔයාට දෙවියන්ගේ පිහිටයි. ඉක්මනට සනීප වෙන්න.'

සුදු නංගී කීවා ය. ලේන්සුව ගෙන මගේ දෙතොල පිස දැමුවා ය. එහි නැවුම් සුවඳක් වී ය.

'සුවඳයි.'

මම කීවෙමි. එහෙත් මොහොතකින් එසේ කීම ගැන මම කම්පා වීමි. සුදු නංගී මගේ ලෙඩ ඇඳ අසළ තිබූ ලොකර් එක විවර කළා ය. අස්පස් කළා ය. පසු ගිය වතාවේ ලෙඩ ඇඳේ ඉන්නා විට ලියූ කවක් එහි වී ය. සුදු නංගී එය ගෙන කියවූවා ය. ඕ මගේ හුදෙකලාකම කියවූවා ය. සේලයින් පෙනිසිලින් හා මරණීය සෙවණැල්ල විසින් හික්මවනු ලැබ මසිත ගිලන් යහනේ සිට වෙවුළන දෑතින් එද අකුරු කළ කව සුදු නංගී කියවූවා ය.

ළඟ නැත කඳුරුවන්
දුකට නැති වෙලාවේ
මුතු කඳුළු අමුණනා මේ ඉමේ
සැදෑ සක්මන කරන
මගෙ කඳුළු මාවතේ
යන්න ඉඩ දෙන්න මගෙ පාඩුවේ

For E - Pusthakalaya

අනේ මගෙ යාළුවේ
යන්න ඉඩ දෙන්න ඔහෙ පාළුවේ
ඉල්මහේ කොපි මල්
හිනාවෙන හීතලේ
දුක් හිත් පනගහා සුව සෙනේ
සඳ අසෙනිය සුවඳ සනහවා කැදැල්ලේ
ඉන්න ඉඩ නොමැත මගේ පාළුවේ
අනේ මගෙ යාළුවේ
සෙනේ ගහ වියළිලා ඈ සිතේ...

හීන් පිනි මුතු පලස්
නොමැතියෙන් කැදැල්ලේ
සඳැල්ලට ගිය පුංචි කුමරියේ
රමණීය වතු සුද්ද පිසෙන විට ඔය ඉමේ
පිනි පොකුරු වැසි එවම් කවි ලොවේ
අනේ මගෙ යාළුවේ
සතුට සොරකම් කළා ඈ මගේ...'

'මට මේ වේදනාවෙන් මිදෙන්න තවමදවත් බැරිවෙයි. ඔයා හිතාන ඉන්නෙ මං ඔයාගෙ සතුට හොරකම් කළා කියල.'

සුදු නංගී කීවා ය.

'ලෝකයක් වටිනා දේවල් ලියන අත්දෙකම ඔයා තුවාල කරගෙන. කිසිදෙයක් මගේ කැමැත්තෙන් සිද්ධ වුණේ නෑ කසුන්. මං සතුට හොයාගෙන රොහාන්ගේ බිරිඳ වුණා නෙමෙයි. ඔයා ඉක්මනට සනීප වෙන්න. මට පුළුවන් ඔයාගෙ නැතිවෙච්ච සතුට ඔයාට ලබා දෙන්න..'

සුදු නංගී දැඩිව මෙන් ම ස්ථිරව කීවා ය. ඇගේ මුහුණේ මහත් බැරෑරුම් බවක් තිබිණ.

අයාලේ ගිය සුළං පොද දැන් කවුළුවෙන් හමන්නේ නැත. අවට සුළං රැල් පිටසින් හමා යයි. එහෙත් ඒ නොහිස්මුණු සුළඟ කොයි වේලේ හෝ මා අසලට විත් දැවටී සිත රිදවනු යි මට සිතේ.



'ඔයාගෙ හිත හදාගන්න මං එක දෙයක් කියන්නම්, කසුන්. මට පොරොන්දු වෙන්න ඒකෙන් ඔයා හිත රිදවා ගන්නෙ නෑ කියලා..'

චාපා කීවා ය. මම හිස නොසලා සිටිමි.

'රොහාන් මට පිරිමි ජාතියම අප්‍රිය කළා. රොහාන් මානසික රෝගියෙක් කියල මට හිතෙන්නේ. මං එයාගෙ බිරිඳ විදිහට නෙමෙයි රොහාන් සලකන්නෙ. මහ විකෘති මනසක් එයාට තියෙන්නෙ. සිද්ධ වෙන හැම දේම අප්‍රසන්නයි. නින්දිතයි. මට හැම දෙයක්ම විඳ ගන්න වෙලා.... මේ කිසි දෙයක් මං බලාපොරොත්තු වෙච්ච දේවල් නෙමෙයි. මේ දුක් විඳින්නෙ ඔයාගෙ සුදු නංගි කියල හිතෙන කොට ඔයාට දුක හිතෙයි. රත්තරං. ඔයා නාස්ති වෙන්න එපා. මගේ ජීවිතේ සතුට හදන්න ඔයාට පුළුවන්. ලෝකෙටම වැඩිය ඔයා මට ආදරෙයි නම් මං වෙනුවෙන් තව මොහොතක් හිතන්න. තව වැඩි කාලයක් මට මෙහෙම අප්‍රසන්න විදිහට ඉන්න බැරිවෙයි. කසුන් ඉක්මනින් සනීප වෙන්න. මං ඔයා ළඟට එනවා.'

කාලාන්තරයක් යටි සිතේ තෙරපා සිටියාක් මෙන් චාපා කියා ගෙන ගියා ය. එහෙත් මට දැන් ඇගෙන් ඇති සතුටක් නැත. දුකක් මිස සතුටක් උපදින්නේ කෙසේ ද? ඈ අපවිත්‍ර ගැහැණියකි. රොහාන්ගේ තුරුලේ සැනසුම සැදූ ඇය වෙතින් මම නොකිළිටි සෙනෙහසක් බලාපොරොත්තු වෙන්න ද? මට තව දුරට ත් ඇගෙන් කිසිවක් බලාපොරොත්තු විය නොහැකි ය.

'මං කාලකණ්ණියෙක් සුදු නංගී. ඒත් මං හින්ද ඔයා එහෙම වෙන්න ඕන නෑ. මට කිසි දෙයක් එපා. ඔයා ජීවිතය අවුල් කර ගන්නත් එපා. රොහාන් එක්ක සතුටින් ඉන්න. මට බලාපොරොත්තු වෙන්න කිසි දෙයක් නෑ.'

මම කීවෙමි. ඒ විට ම ඔසරි පටින් ඕ කඳුළු පිස ද ගත්තී ය. ඇගේ මුහුණ පිපිහළ වී සුදුමැලි වී ඇත. විවාහ වූ විට ගැහැණියක වෙසින් ඇතැම් විට සුන්දර වන මඩලේ සිරියාව පළා යයි. සත්තකින් ම ඈ දුක් විඳින්නී ද? මට තව දුරට ත් සුදු නංගී වෙනුවෙන් කළ

For E - Pusthakalaya

හැකි යමක් වේ ද? සිඹුවක් සිතා ගත නොහැකි ය. මම ඇගේ මුහුණ බැලීමි.

'එක සමාන පියාපත් තියෙන අය එකට පියාඹන්න ඕන කසුන්. අහරමගදී මාව ගිජුලිහිණියෙක් ඩැහැගත්තා. මට ගිජුලිහිණියෙක් එක්ක ජීවත් වෙන්න බෑ. ඔයාගෙ ලස්සන ජීවිතේ විනාශ වෙනව දැක දැක මට මොහොතක්වත් ඉන්න බෑ. මං දන්නව මං ඔයාගේ ජීවිතේට වන්දි ගෙවන්න ඕන කියල. මගේ ආත්මයෙන් මං ඒකට ලෑස්තියි. මට දැන් ජීවිතයක් ඕන නෑ.'

සුදු නංගි මගේ අත අතෑරියා ය. ජනෙල් කවුළුවෙන් පිටත බැලුවා ය. මේ සියල්ල පුංචි මිසී වාට්ටුවේ ඈත කෙළවර සිට බලා සිටිනවා විය හැකි ය.

'කසුන්.... අනේ කසුන්.... මට යන්න ඕන. මට උත්තරා ඇවිත් කිව්ව විස්තරේ. එයාට එන්න විදිහක් නෑ. එයාගේ අප්පච්චි නීති තහංචි ඔක්කොම දල. රොහාන් ඩියුටි ප්‍රී ගිය වෙලාවෙ මං ගෙදරින් පැන ගත්ත. එන්න ඉස්සර මං යන්න ඕන.'

'ඔයාට පිං සිද්ද වෙනවා චාපා මං බලන්න ආවට.'

මම කීවෙමි.

'දෙවියන්ගේ පිහිටෙන් ඔයාට ඉක්මනට සනීප වෙනවා කසුන්. මට පුළුවන්කමක් නෑ ඔයා ළඟ ඉඳගෙන සත්කාර කරන්න.... ඉතිං මට යන්න කියන්න...'

ඇය මගේ දෑසට එබුණා ය.

'හොඳයි සුදු නංගී. ගිහින් එන්න...'

මම අලස ලෙස කීවෙමි. සුදු නංගී පොරෝනය ගෙන මගේ පපුව දක්වා වැසුවා ය. නළලට බේරී තිබූ දහදිය බිංදු පිස දැමුවා ය. මොහොතක් එක එල්ලේ බලා සිටියා ය. දෙපා දක්වා පොරෝනය පහළට ඇද සීතල දෙපා වැසුවා ය. සුරතින් සිහින් ලෙස දෙපා ස්පර්ශ කළා ය. ඇඳ පාමුලට ගොස් නැවතත් මා දෙස බැලුවා ය. ඉන්



පසු වාට්ටුවෙන් එළියට ගියා ය. මගේ සිත අළ කිසිවක් පැහැදිලිව ගැටුණේ නැත. මුළු ආත්මය ම හිස් ය. නිසල ය. බොහෝ වේලාවක් මම එක ඉරියව්වෙන් ම සිටියෙමි. මට නින්ද යන්නට ඇත. හවස් වරුවේ මම ගිලන් යහනින් පිබිදුණේ අසළ ඇඳක රෝගියෙකුගේ මර හෝනියකිනි. අසල ඇඳක සිටි වයසක රෝගියා විලාප දී කෑගසනු මට පෙනේ. මම ඒ දෙසට ගෙල හරවා බලා සිටියෙමි.

ගිලන් යහනින් පිබිදුණු මම රෝහලේ දෙවන වාට්ටුව පැත්තට ගමන් කළෙමි. මගේ දෙපා පැකිළී, පැටළී, මා බිම හෙළීමට තැත් කරයි. මම කොට බිත්තියට වාරු වීමි. කොට බිත්තිය උඩට දෑත තබා පාර දෙස බලමි. නුගේගොඩ පැත්තට ත්, ගාලු පාර පැත්තට ත් රථ වාහන පෙරහැර ඇදී යනු මට පෙනේ. මේ නාගරික තරංගය විසින් මා උන්මන්තකයකු කළේ ද? මිරිඟුවක් පසු පස මෙන් මම පවිත්‍ර නිර්මල සෙනෙහසක් පතා දිව ගියේ වී ද? සුදු නංගී පිළිබඳ කිසිදු අහිතක් මට නොදැනේ. මට දැනෙන්නේ වේදනාවක් හා දුකක් පමණි. රාගයකින් තොරව මට සදාකාලිකව ඇගේ වත මඬල රස විඳිය හැකි ය. එහෙත් රොහාන් විසින් පිළිකුල් සහගත, අපවිත්‍ර විකෘති හැසිරීමකින් ඇ විනාශ කළේ නොවේ ද? මම මගේ දෑත දෙස බැලීමි. තවමත් වෙළුම් පටි ලිහා දැමීමට දොස්තර මහතා කීවේ නැත.

'තව දවස් දෙක තුනකින් බැන්ඩේජ් අයින් කරනහැකි. එතකොට කසුන්ට ආපහු ලියන්න පුළුවන්.'

පුංචි මිසී කීවා ය. ඈ අනවශ්‍ය පමණට ලෙන්ගතු වී ඇතැයි මට සිතේ.

'බැන්ඩේජ් නම් ලිහාගන්න පුළුවන් මිසී. ජීවිතේ අවුල තමයි ලිහාගන්න අමාරු.'

'ඔයා හිතින් අවුල් වැඩි කරගෙන කසුන්. මිනිස්සුන්ට කොච්චර ප්‍රශ්න තියෙනවද? දැන් ඉතිං සුදුනංගී ආවනේ කසුන් බලන්න. සතුටින් ඉන්න බලන්න. හිතට ප්‍රශ්න වැඩි කරගන්න එපා.'

For E - Pusthakalaya

මට හැම දේකටම මුහුණ දෙන්න පුළුවන් මිසී. ඒත් සුදු නංගී ගැන හිතන කොට මාව පිච්චෙනවා. අද සුදු නංගී ආවා, මිසී දැක්කා නේද? පුංචි සුවපොට්ටෙක් වගේ මගේ සුදු නංගී. එයා මගේ. එයා අයිති මට. මට හිතෙන්නේ අපිව වෙන් කළ උන්ගෙන් පළි ගන්න..

'ඔයා පළි ගන්නේ ඔයාගෙන්මනේ. හොඳම විදිහට පළි ගන්න පුළුවන් වැදගත් මනුස්සයෙක් වගේ රටේ ලස්සනට හිටියොත්..'

'සුදු නංගී නැති තැන මගේ ජීවිතේ අළු සොහොනක්. ඒක ලස්සන නෑ මිසී.'

මම මිසී දෙසට හතුරු බැල්මක් හෙළීමි. කෘෂ වී යම් සමණකට වියරු වී ඇති මගේ සිරුර දකින මිසී බිය ගන්නා දැයි මම නොදනිමි. එහෙත් ඈ මොහොතක් වත් නොඉඳ මෙසේ කියා යන්නට ගියා ය.

'හුළං වදින්න එළියේ ඉන්න එපා. ඇඳට යන්න. මම ඉන්ජෙක්ෂන් එක අරං එන්නම්.'



# 21

මම දෑතට මුහුණ ඔබා ඉහළට හුස්ම ඇද්දෙමි. බෙහෙත් ගඳ මිස ආත්මයට දැනෙන සිසිලසක් නැත. මම දෑත නැවතත් කොට්ට බිත්තියට තබා දිග හැරීයෙමි. කුණු බක්කිය අසළ කපුටු රැංචුවක් පොරකනු මට පෙනේ. මම බොහෝ වේලාවක් ඒ දෙස බලා සිට හතර වටින් කළු කර ගෙන එද්දී ගිලන් යහනට ගියෙමි. අද ඉතින් හින්ද සමඟ මහත් පෙරළියක් කරන්නට සිදු වන බව මම දනිමි. රාත්‍රිය පුරා සුදු නංගීගේ සුවඳ මට කරදර කරනු ඇත.

'අයියේ..... කසුන් අයියේ...'

මම දෑස හැර බැලීමි. උත්තරා යහන අද්දරට වී සිටින්නී ය.

'මොනවද දෙයියනේ ඔයාට වෙලා තියෙන්නේ? ඇයි කසුන් අයියේ ජීවිතෙත් එක්ක සෙල්ලම් කරන්න හදන්නේ.'

'නංගියේ, උත්තරා, ඔයා දන්නවා මගේ ජීවිතෙත් එක්ක සෙල්ලම් කළේ කවුද කියලා. මම කාගෙවත් ජීවිත සෙල්ලමක් විදිහට හැසිරුණේ නෑ.'

උත්තරා බිම බලා සිටී. දෑස නොසලා බලා සිටී. ඒ දෑසේ කාන්තිය මට ඉවසුම් නොදේ.

'ම්. ඔයගොල්ලන්ට කරදරයක් ද නංගී?'

'ම්. එහෙම දෙයක් නොවෙයි කිව්වේ'

උත්තරා කෝපි එකක් වක්කරන ගමන් කීවා ය

For E - Pusthakalaya

'මට ඔයාව බලන්න එන්න දෙන්නේ නෑ කසුන් අයියේ. නැත්නම් මං ඔයා බලා ගන්නවා. මං දන්නවා හවස චාපා ආවා කියල. අනේ මින්දු ඕට හිතා ගන්න බෑ කසුන් අයියේ ඔයා සනීප වෙන්නකෝ... අපි ඊට පස්සෙ බලමු.'

උත්තරා කීවා ය. මම උත්තරා දෙස බැලීමි. සත්තකින් ම උත්තරා කෙරේ මසිතේ සහෝදර සෙනෙහස උතුරා නැගෙමින් තිබේ.

'ඇයි දෙයියනේ ඔයා නැති නාස්ති වෙන්න හදන්නේ? මිනිස්සුන්ට දුක් දෙන්න එපා කසුන් අයියේ. ඔයාට අපි ළඟ තියෙන ආදරේ ඔයා දන්නෙ නෑ.'

'මං ඔයාලට කරදරයක්ද උත්තරා?'

'අනේ නෑ දෙයියනේ. ඔයාට මෙහෙම වෙනව මට දරාගන්න බෑ.'

මම බලා සිටියෙමි. බොහෝ වේලා සිටියෙමි. දෑත උඩට ගෙන මොහොතක් බලා සිටියෙමි. ලා එළිය බිත්තිය මතට වැටේ.

'ඇයි මට මැරෙන්න නොදී මං බේර ගත්තෙ? ඇයි මගේ සුදු නංගී මාව බලන්න ආවෙ. මං ඌ ඔක්කොමෙන්ම පළිගන්නවා. සත්තයි! මං පළිගන්නවා.'

මම දෑතින් ම බිත්තියට පහර දුනිමි. දෑත පරඬැල් වී යනු මට දැනේ. මම හැකි වේගයෙන් බිත්තියට දෑතින් ම පහර දුනිමි. කෑ ගැසුවෙමි. බැන්ඩේජ් මතුපිට ලේ පැල්ලම් විත් බිත්තිය තෙත් කළේ ය. මගේ දෑතේ වෙළා තිබූ සුදු බැන්ඩේජ් රතු පැහැ ගැන්විණ. මම පරඬැල් වී ගිය රතුපාට ලේ පැල්ලම් දෑත මුහුණට තබා තද කොට ඇඳට වැටුණෙමි.

නිරංග ද ශිහාන් ද කළුබෝවිල රෝහලට පැමිණෙන විට මම සුළඟට වැනෙන පරඬැල් පතක් මෙන් නිනව්වක් නැතුව සිටියෙමි. අත නැවතත් තුවාල කර ගැනීම නිසා මගේ රෝහල් නේවාසික දින ගණන වෛද්‍යවරයා විසින් දිගු කරන ලදී. මම විකම්පිත වූ මනැසින් ද මද්දල් වූ කයින් ද සුඛව යහනේ දිග ඇදී උඩු බැලිව නිදන්නට වීමි. මිතුරන් දෙදෙනා වාට්ටුවට එනු කොට තාප්පයට උඩින් [illegible]



මම මුහුණ හරවා අනික් ඇලයට හැරුණෙමි. ඇස් ඇර ඔවුන් දෙස බලා සිනාවක් නොයන මම ආයාසයෙන් ඒ මේ අත ඇඹරුණෙමි. ඉඟියකින් වත් ඔවුන් නොපිළිගත් මම අවදියෙන් සිටින බව හඟවා කොට්ටයේ මුහුණ තද කොට එහි එක් කෙළවරක් සපා ගතිමි.

'උඹ එහෙනම් නිදා ගනින්. අපි යනවා.'

නිරංග මගෙන් පිළිගැනීමක් නොලද තැන කීවේ ය. මගේ තනිකම හෝ කෝපය සඝනීකව නැගී මම වියරු වැටුණෙමි. දැඩි අසරණ කමත් ද හුදෙකලාවක් ද මා වෙළා ගනිමින් කිසිදු බලාපොරොත්තුවක් නැති ශූන්‍ය මිනිසෙකු මෙන් මම දෑස වියරු කොට ඔවුන් දෙස බැලීමි. මසිත ආවේශ වී තිබිණ.

'පලයල්ලා. දෙන්නම පලයල්ලා. උඹලට වැඩ ඇතිනේ. මොකට ආවේ මාව බලන්න. උඹලා එකෙකුටවත් මාව තේරෙන්නේ නෑ...'

ඔවුහු විපිළිසර දෙනෙත්වලින් මා දෙස ම බලා සිටිති.

'උඹට පිස්සුද කසුන්? උඹ උඹෙන් පළිඅරන් දැන් අපිවත් වැරදිකාරයෝ කරන්නද හදන්නෙ?'

මම දෑත ම ඇඳට තබා තද කොට දත්මිට සපා සිරුර දෑතට තද කලෙමි. ඇඟ කිලි පොලා යන වේදනාවකින් මගේ සිරුර දැවී ගියේ ය.

'උඹ ආයෙත් අත තුවාල කරගන්නද හදන්නෙ?'

මගේ සිරුර උඩින් අතක් දමා ඇඳ උඩින් වාඩි වූ නිරංග මා වෙතට සමීප වෙමින් විමසී ය.

'විඳෙන්නේ මට නම් තුවාල වුණාට කමක් නෑ. අඩන්න කවුරුවත් නැත්නම් මම මැරුණට කමක් නෑ.'

මම කීවෙමි.

'දෙබලක ඉන්න දිමියෙක් වගේ පස්ස පැත්ත කඩලා දාකම් උඹ අඬුවලින් අල්ලගෙන ඉන්න හදනවා. විනාශ වෙන්නේ උඹ. කවුරුවත් නෙමෙයි.'

For E - Pusthakalaya

'විඳෙන්නෙයි වේදනා විඳින්නෙයි දෙකම දැනෙන්නේ මටයි. මං දැන් මගේ ආත්මේ උඹලා ඉස්සරහා උනත් දිගාරින්න බයයි. උඹලා මම හිතුවම මොළද මිනිහෙක්. බොරු කතුලක් ද ගත්ත මිනිහෙක් ඒක බොරු කතුලක් කියලා තමන්ගේ යාළුවටවත් කියන්නේ නෑ. 'නොසන්ඩියා' කියලා උං විහිළු කරයි කියලා. මං දැං සුදු නංගී ගැනත් උඹලට කියන්නේ නෑ. කියලා වැඩක් නැති හින්ද.'

'උඹ ගැන අපේ හිතේ අභිතක් නෑ කපුන්. ඒත් උඹ කෙල්ලෙක් හින්ද නැති වෙනව අපිට බලං ඉන්න බෑ. බලපං. එක පාරක් වත් බිව්වා. දෙපාරක් අත තුවාල කරගත්තා. උඹ ඩිංගක් හිතපං දැන් වාසා වෙන මිනිහෙක්ගේ කීරිද වෙලා කියලා. කසාද බැඳපු ගෑනියෙක් හින්ද මැරෙන්න හදන්නේ උඹට ලැජ්ජ නැද්ද?'

'මට කිසි ලැජ්ජාවක් නෑ. උඹලා ඔහොම කිව්වට හැම මිනිහෙක්ම ආදරේ ඉස්සරහා බොළඳයි. ඒක පෙන්නන්නේ නෑ. තමන්ගේ ආත්ම ගෞරවයට හානි වෙයි කියලා. ඒත් මට ඒක හංගගෙන ඉන්න බෑ.'

වාද විවාද කරමින් ඔවුහු මා සැනසීමට උත්සාහ ගනිති. පසු ද විසාට් තැපීමට සූදනම්ව පුංචි මිසී ද මා අසළට විත් දැවටෙමින් කිව්වේ ජීවිතය නැති නාස්ති කොට නොගත යුතු බව යි. වෛද්‍යවරයා වෙත ද මෙන් අවවාද උන්නේ නැත. මම ඔවුනට ආචාර කොට නිරංග සමඟ ඔහුගේ බෝඩිමට ගියෙමි.



## 22

නිරංග උදේ දේශනාවලට යද්දී මම ඔහුගේ බෝඩිමේ තනි වෙමි. කෝපය, හුදෙකලාව, තනිකම හා ඊර්ෂ්‍යාව ද මගේ මනසේ වැඩෙන කල පළිගැනීමේ චේතනාව නැවතත් මසිතේ දලු ලා නැගිණ. එහෙත් සුදු නංගීගේ මුහුණ සිහි වීමෙන් මම සියල්ල යටපත් කොට ගැනීමට වෙහෙසෙමි. දැන් ඉතින් ඇගේ සියලු දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නට සිටින එක ම නැනැත්තා මා නොවේ ද? ස්ථිර ලෙස ම වෙන් වුණ ත් අස්ථිර වූ අනාගතයක සද්කාලිකව ම අපි අපේ වෙමු. මිතුරන් පමණක් ම නොව මගේ කතාව දන්නා සියල්ලෝ ම පතන්නේ මගේ සතුට නම් සුදු නංගීගෙන් තොරව එකී සතුට නොලැබෙන බව ඔවුන් දත යුතු ය.

බලාපොරොත්තුව?

එය මිනිස් සිතේ කවුරුන් කව ද ඇති කළ දෙයක් දැයි මම නොදනිමි. එහෙත් තවමත් සිතේ එක් පැත්තක පරම සත්‍ය වූ පවිත්‍ර සෙනෙහසක් බලා පිබිදී තිබෙනු මම සිත් ඇසින් දකිමි. නිරංගගේ බෝඩිමේ සිට මම නිශ්චිත තීරණ කීපයක් ගැනීමට තරම් එඩිතර වූයෙමි. පෞද්ගලික පන්ති නැවත ආරම්භ කළ යුතු බව ත්, සරසවි ගොස් උපාධිය සඳහා සූදනම් විය යුතු බව ත් යන තීරණ දෙක ඒ අතර මූලික වී ය. එහෙත් එකී අරමුණු දෙක අතරට සුදු නංගී පිළිබඳ බලාපොරොත්තුව චලනය වෙමින් සිතට වද දුන්න ත් නිරංග හා ගිහාන් ම'සිත එක එල්ලයක් කරා යොමු කිරීමට වෙහෙසුණ හ. සුදු නංගී මුණ ගැසීමට මා නොයා යුතු බව ත්, උත්කරා හමු වූ

For E - Pusthakalaya

ඊට ඒ පිළිබඳව කතා නොකළ යුතු බව ත් මිතුරන්ගේ අදහස වී ය. මම සියල්ලට ම එකඟ වීමි.

කොළඹ නගරය අත හැර ගම් පියස බලා පියමං කිරීමට නිරන්තරව මට සිතේ. සරසවියට ආයුබෝවන් කියා ජීවිතය ඉල්ලා හඬ නගා ගමට පියෑඹීමට මම සිතමි. එහෙත් මගෙන් ශිල්ප ලබන්නවුන් වෙනුවෙන් කළ යුතු බොහෝ වැදගත් කාර්ය භාරයක් හිස මත වැටීම නිසා මම සිහිවිලිවලින් මිදී ඔවුන් වෙනුවෙන් කාලය කැප කළෙමි. ජීවිතය දෙරකඩට වීසි වූවාක් මෙන් ම, නිරංගගේ නවාතැනේ දෙරකඩට වී මම හිස් අවකාශයට දෑස යොමු කරමි. ඊයේ රාත්‍රියේ ත් මම මේ දෙරකඩට වී බලා සිටියෙමි. පියාඹන තාරකා රංචු මට කතා කරතැ යි සිතුව ත් හිස් අහසේ මට නිදහසේ ඇවිද යාමට ඉඩ තිබුණේ නැත. මධුපානි නිරන්තරව මට ලිපි එවමින් මගෙන් ජීවිතය ඉල්ලා සිටියා ය. එහෙත් එකී මුවැත්තියට දෙන්නට තරම් ජීවිතයක් මට තිබුණේ නැත. දින කීපයකට පෙර නුගේගොඩ 'ටැලිහෝ' අවන්හල අසලදී මට මධු හමු වී ය. ජීවිතය අනියතව ගලා හැලෙන මා සමඟ සසර සරා පාරමී දම් පුරන්නට ඕ වරම් යැද්ද ය.

'ඔය ජීවිතේ ලස්සන කරන්න පුළුවන් හින්දයි මං හැම දෙයක්ම කියන්නේ. සමුගන්න මට අවසර ඕන නෑ. කියන්න මට ළං වෙන්න අවසරද කියල?'

මධුපානි විභාගය ලියා අවසන් වී මගේ සිසුවියකව සිටි බැම්මෙන් මිදී සිටි හෙයින් ඇගේ සිත නොරිදී කතා කිරීමට තරම් මම ළෙන්ගතු වීමි.

'මධු හිතන තරම් ජීවිතේ ලස්සන කරන්න ලේසි නෑ. අනික ලස්සන කරන්න තරම් ජීවිතයක් මට නෑ.'

මම මධුගේ දෑසට කතා කළෙමි. ඇය බිම බලා ගත්තේ නැත. දෑසට එබී කතා කළ ඕ සතුටු වූවා දැයි මම නොදනිමි.

'අනේ එහෙම කියන්න එපා. ඔය ජීවිතේ හරි ලස්සනයි. මට උහුලගෙන ඉන්න බැරි නිසාමයි මම මේ කියන්නෙ. මං දන්නෑ මට මොනවද වෙලා තියෙන්නෙ කියල. මාව පිස්සියක් කරන්න එපා. මං හින්ද ඔයා පිස්සෙක් වෙන්නත් එපා.'



මම ඒ බසට යටි සිහින් සිනාසුණෙමි.

'මධු හරි දියුණු වෙලානෙ. මට 'ඔයා' කියල කතා කරන්නෙ..'

සමච්චල් සිහින් සරින් කියා මම මධු දෙස බැලීමි.

'තරහ ගියාද?'

'නෑ'

'මට සමාවෙන්න'

යටැසින් මගේ ගිලුණු දෑසට මධු කතා කළා ය.

'සමනළයෝ පියඹන්නේ තුරුලතා පිරිච්ච මල් පිපෙන වන රොද වලට විතරයි මධු. මගේ ජීවිතේ නියගෙට අනුවෙච්ච, සෙවණ සදන්න බැරි වනාන්තරයක් වගේ. මාවත් ඒකෙ අතරමං වෙලා. මධුව මුලා කරන්න මට බෑ. හසරක් දකින්න බැරි ගමනක මං සුදු නංගීත් එක්ක ගියේ'

'මං කැමතියි අතරමං වෙන්න.'

'අරමුණක් නැතිව?'

'ඔව්.'

'බලාපොරොත්තුවක් නැතුව?'

'නෑ, බලාපොරොත්තු තියාගෙන'

'මොනව ගැනද?'

'ඔයාගෙ ජීවිතේ ගැන'

'මට සුදු නංගී නැතුව ජීවිතයක් නෑ.'

'මට පුළුවන් සුදු නංගීගෙන් නොලැබිච්ච හැම දෙයක්ම ඔය ජීවිතේට ළංකර දෙන්න.'

'ඒත් මට සුදු නංගී ලැබෙන්නෙ නෑ.'

'එයාට දැන් වෙන කෙනෙකුට ලැබිල ඉවරයි.'

'මධු හදන්නෙ මගේ හිත හදන්නද? තවත් රිදවන්නද?'

'සමාවෙන්න. මම හිත රිද්දන්න නෙවෙයි එහෙම කිව්වෙ.

For E - Pusthakalaya

මධු බිම බලා ගත්තේ නැත. සඳුර සැරසුවේ ද නැත. මුහුණ රැක්කේ ද නැත. දෙනෝ දහස් ගමන් ගන්නා මාවත අයිනේ නගරයේ සියලු නාස්ටික සිදුවීම් වියළි දූවිල්ලේ තරඟකාරීව සිදු වෙද්දී ඕ සංයමයෙන් කතා කළා ය.

'මගේ හදවතේ තවානැත් ගත්තෙ මගේ සුදු නංගී. මං මගේ හදවතට දෙරගුළු දල ඉවරයි. ඒව කඩල බිඳල දල හදවතට ඇතුල් වෙන්න හදන්න එපා!'

'මං බලෙන් ඇගේ එල්ලෙන්න හදනව නෙමෙයි.'

'මං දන්නව ඒක.'

'මං ඔයාට පිස්සු වැටිල ඉන්නව නෙමෙයි. වෙලාවකට මිරිඟුවක් පස්සෙ දුවනවද කියලත් මට හිතෙනව. ඒත් මට ආසයි හති වැටිල ඔය දෙපා මුල ඇද වැටෙන්න.'

'මගේ හිතේ අනුකම්පාවක් උපදින එකක් නෑ.'

'ඒත් ආදරයක් උපදීවි.'

මධුපානී එය කතා කොට කිවා නොව මිමිණුවා ය. ඇගේ ... ත් ඉරියව්වල සුදු නංගීගේ සෙවණැල්ලක් මම දකිමි. නිර්ව්‍යාජ ත්, සංයමය ත්, දිගු වරලස ත්, මුවැත්තියකගේ මෙන් බොඳ වූ ... පෙම් බර දෑස ත් මා සලිත කිරීමට සැරසෙද්දී බොහෝ විට සුසුමකින් ... වන සැහැල්ලු කොට සිහිවිලි පළවා හරිමි. එද බොහෝ වේලා යනතුරු, ගොම්මං කළුවර වලාකුළු නගරය මැද්දට පතිත වන තුරු අපි කතා කළෙමු. සිනා සරින් සමු ගෙන මධු නාවල පැත්තට ගමන් කළ ත් මම තිරංගගේ තවානැතට ගියේ ශූන්‍ය වූ හදවත තවත් වේදනාවට පත් කොට ගනිමිනි. දින කීපයක් මේ හුදකලා ජීවිතය ගෙවූ විට ලැබෙතැ යි සිතූ සහනය වෙනුවට මසිත තව තවත් පීඩාවෙන් බර වන්නට වි ය. ළහිරු නැඟෙද්දී කාමරයට හමන සිහිල් සුළං ... රොදකින් පවා මම මහත් කම්පනයට පත් වීමි. නිදහසේ සැරි සරා ... ... යුන් මෙන් අනන්ත සෙනෙහසකින් මං මාවත දිග ... පෙම්වතුන් දුටු විට සුදු නංගී ත් පෙම් සිහිනය ත් අවදි ... දැහැන් බිඳීමට සමත් වේ. එකී සුදු සිහිනය මගේ සිතේ



දැවටී නැවරෙන විට මසිත සොම්නසින් ඉපිළෙන්නේ නැත. සීතල අයිස් කැටයක් මෙන් එය හදවත පතුලට කිඳා බැස ආත්මය තළා පෙළයි. මධුපානී, අප හමු වී දින දෙකකින් පමණ කෙටි හසුන් පතක් එවා තිබුණි.

දයාබර කසුන්,

මගේ හිත ඔබට දයාබරයි. හැමදාමත් දයාබරයි. ජාති ජාතිත් සෙනෙහෙවන්නයි. ඔයා කලාකාරයෙක් වෙන්න හදනවද කොහෙද... ඒකයි ජීවිතේ ගැන ඔහොම හිතන්නේ. මට දුක හිතෙන්නෙ ඔයාගෙ අද දවස ගැන නෙමෙයි. හෙට දවස ගැන. ඔයා තනිවෙයි. ඒ දවස උද නොවේවා කියල මං පතන්නම්. ඔයා විතරක් නෙමෙයි අපි ඔක්කොම ජාති ජාතිත් සංසාරේ මහ පාප කර්මයක් කරලා. දුරස් වෙන්න නම් මොකටද දෙයියනේ අපි මේ ජාතියෙත් හමු වුණේ කියල මට හිතෙනවා. දෛවය අපිට හැමදාම හිනාවෙන එකක් නෑ. පැතුම් පුරවනව මං හැමදම ඔය ලස්සන හිතට හිමිකාරිය වේවා! කියල. මතු සසරේ ඔයාගෙ නැගණිය වෙලාවත් ඔය රිදුණු හිත සනසන්න මං පිංකාරියක් වේවා කියල.

පාරමී දම් පුරමු අපි දෙන්නා
මටම අයියණ්ඩියක වී ඔබ
නැගණි වී මා එකම මව් කුස
සසර මතු ද උපත ලබනට
පාරමී දම් පුරමු අපි දෙන්නා

..........................................................

ජාති ජාතින් සංසාරේ....................

For E - Pusthakalaya

මධු පිළිබඳව මසිතේ දයා සිතක් ඉපදුණේ නැතුවා නොවේ. එහෙත් නිද නොනිද සොයන සිහිනය අවදි කොට යථාර්ථයට මුහුණ දෙන්නට මම අකමැති වීමි. මගේ ආත්මය සයුර ඉම සොයන සිහිජ ඡේබාව දැක දැක තැවී තැවී දැවී දැවී යයි. ඉන් මා ලැබුවේ දුක්මුසු සංතාපයකි.



# 23

තනි යහනේ ගුලි ගැහෙන හැම තතපරය ම මම විස්සෝපයෙන් මෙන් සුදු නංගී ගෙවන ජීවිතය ගැන සිතමි. රොහාන්ගේ තුරුළෙහි ගුලි වී නිදන සා පැටියකු මෙන් සුදු නංගී ගැන සිතූ මම, සා පැටවෙකු වෙළා ගත් ඉත්තෑවකු සේ රොහාන් ගැන සිතුවෙමි. මෙකී දැහැන් බිඳෙන මගේ නොසන්සුන් සිරුර වැතිරුණේ මල් යහන් කලාවක නොවේ. කටු යහනක මෙන් ජීවිතය තවාතැනේ වතුරුවා ලන මම කටු ඉඹුලට නැගීමට ආසන්න කලක මෙන් දනඩිය මුගුරු දමා ගෙන යහනින් පිබිදෙමි. ඈත දිදුලනුයේ, සිතිජයේ සිට උද වෙන්නට පෙරුම් පුරන හිරු අත වනනවාක් මෙනි. සුදු නංගීගේ පිබිදුණු පෙම්වත් මුහුණ මැවී මොහොතකින් එය වියරු වී කෙහෙරැල් අවුල් කොට ගෙන මා මනසේ පිස්සියක මෙන් නැගී සිටියි.

'මොකද උඹ නැගිටගෙන. හීනයක්වත් දැක්කද?'

'නෑ...'

'එහෙනං?'

'ඔළුව කකියන්න ගත්ත.'

'ඔය මේසෙ ලාච්චුවේ පැනඩෝල් ඇති.'

නිරංග එසේ කියා යහනේ අනෙක් ඇලයට හැරේ. මම අත් මිදිය නොහැකි පෙම් දම සිතේ වෙළා ගෙන නින්ද නොකැඳවා කල්පනා කරමි. උත්තරා නංගී හමු වීමට බොරැල්ලට යාමෙන් ද වැඩක් නැත. ඇ විභාගයට ලියා අවසන් හෙයින් දැන් 'ගේට් වේ' එකට පංති එන්නේ

For E - Pusthakalaya

නැත. සිකුරාද දිනවල උත්තරා නංගී British Council එකට එන බව ආරංචි වූ විගසින් මම උත්තරා හමු වීමට එහි ගියෙමි.

'නංගියේ'

ඈ දුටු සැනින් මම සෙනෙහස අවදි කළෙමි. මේ තරා ගමනේ දී හමු වූ ලෙන්ගතු නැගණිය 'උත්තරා' පිළිබඳ මට ඇත්තේ ආඩම්බර සිතකි. වැඩිහිටියන්ගේ මළමොට්ටලකම් හමුවේ කොන් කළ අප, එක් කළ සහෝදරත්වයේ බැම්ම උත්තරා නොවේ ද?

'කසුන් අයියේ?'

උත්තරා මගේ ළඟට දිව එමින් කීවා ය.

'වාපා ගැන ආරංචියක් නැද්ද නංගියේ?'

'මං වාපා බලන්න ගියා...'

'ඉතිං?'

දැන ගත යුතු නැති දෙයක් ඇසූ බව මට සිතුණේ දෙවනුව ය. දැන් දැන් උත්තරා කියන්නට තතනන්නේ මට ඉතා දුක්බර විය හැකි වාපා හා රොහාන්ගේ සුන්දර නිවහනේ ලස්සන සිදුවීම් පෙළ විය හැකි යැයි මම සිතිමි. මම අහක බලා ගතිමි. මතක සුවඳට පෙම් කරනවා හැර පරමල් පුදසුන මත තබා සුරැකීමට නොහැකි බව මම දැන සිටියෙමි. එහෙත් ඒ යථාර්ථයට මුහුණ දීමට මගේ සිත ඉඩ නොදෙයි. බස් නැවතුමේ වකරමකට කකුලක් වාරු කළ මම මුහුද පැත්තට හැරුණෙමි. ගාලු පාරේ ගමනාන්තය සම්පූර්ණ කිරීමට තරඟ වදින යාන වාහනවල තද බදය හා ඝෝෂාව පරයමින් මුහුදේ සෝ හෝ හඬ මගේ සවන් වැකේ. එය අපේ හදවත්වල විලාපය මෙනැ යි මට සිතේ.

'මට හැම දෙයක්ම, හැමදම කියන්නත් බෑ. මම දන්න දේවල් ඔයාට නොකියත් බෑ. අතර මැදියෙක් වෙලා ඔය දෙන්නාගෙම හිත් රිදවන්න මට හවුල් වෙන්නත් බෑ කසුන් අයියේ.'



'ඒත් මං හැමදේකම කෙලවරක් දකින්න ඕන උත්තරා.'

හිතේ සදකල් තෙරපෙන වේදනාවෙන් අත් මිදීමට මට ද අවැසිව තිබිණ. ජීවිතය නොනිමි ගමනකි. එහි සැබෑ අරමුණු බොහෝ ය. එහෙත් ඒ සියල්ලක් ම පැහැදිලි මඟක තිබිය දී මම මිරිඟුවක් පසු පස හඹා යමින් සිටිමි. සුදු නංගී වෙනුවෙන් දිගින් දිගට ම වේදනා විඳීමේ තේරුමක් නැත. එහෙත් මා නිසා, මා වෙනුවෙන් සුදු නංගී කඳුළු බිඳක් හෝ හෙළන්නේ නම්.... අපේ පෙම් සිහි ගන්වා ඕ දුක් ගන්නී නම්.... මට හිත හදා ගෙන ජීවිතයට මුහුණ දිය නොහැකි ය. ඒ කඳුළු, ඒ දුක ඇගේ නොව අපේ ය. ඉතිං එය අප දෙදෙනා බෙදා ගත යුතු නොවේ ද?

'වාපා එයාගේ ජීවිතේ ගෙනියයි. ඔයා හිත හදගන්න කසුන් අයියේ. අපි ඒකට ඇඟිලි නොගහ ඉමු. මමත් මීට පස්සේ එහේ යන්නේ නෑ. වාපා එයාගේ අම්මත් ගෙදරට එක්ක ඇවිල්ලලු. රොහාන් එයාට වද දෙනව කියලලු අම්මව ගෙන්න ගත්තේ. ඔයාව බලන්න වාපා කළුබෝවිල ඉස්පිරිතාලෙට ආ බව රොහාන් දැනගෙන. ඒක වාපා අතින්ම කියවුණා ද දන්නෙත් නෑ. එද ගෙදර හොදටම රණ්ඩු වෙලා වාපාට රොහාන් දෙක තුනක් ගහලා තියෙනවා. ඔපරේෂන් කරපු අසනීපෙන් ඉන්න දරුවා කියලා අම්මා මැද්දට පැනලා බේරගෙන තියෙන්නේ. වාපා තවමත් තෝන්තුවාවෙන් වගේ ඉන්නෙ. මට බය දැන් එයා කල්පනා කරලා වෙන ලෙඩක් හදා ගනීවිද කියලා. බලාගත්ත අතේ බලාගෙන ඉන්නවා. එයා තවමත් ඔයා හින්දා අඬනවා කසුන් අයියේ. එයාව තවත් අඬවන්න අපි මොකටද හවුල් වෙන්නෙ? වාපා ගැන නොහිතා ඔයා ඔයාගේ ජීවිතේ ගැන හිතන්න. කසුන් අයියා හොඳින් සතුටින් ඉන්න බව දැන ගත්තොත් වාපා සතුටු වේවි.. නැත්නම් ඔය දෙන්නටම පව්.'

'මං හිතුව රොහාන් වාපායි එක්ක සතුටින් ඉඳීවි කියලා. සුදු නංගී වගේ කෙනෙකුට ඔහොම සලකනවා නම් ඌ තිරිසනෙක්. උගේ ඔය තිරිසන්කමෙන් මිදෙන්නම තමයි එයා මට සමීප වුණේත්. මට මතකයි ඒ දවස්වල පබ්ලික් ලයිබ්‍රරිය ළඟදීත් ඌ සුදු නංගීගේ කම්මුලට ගැහුව.... ජඩයා...'

For E - Pusthakalaya

තියා ගන්නට ආ ඉපිරිය මම වළක්වා ගතිමි. රොහාන් වෙනුවෙන් සිහි දකුත් වඩා වෛරයක් ම'සිතේ ලියලා එමින් තිබේ.

'එහෙම කියල දැ' ඉතින් ඔයාට කරන්න දෙයක ... ඇදි වුණාම ප්‍රශ්න තවතවත් වැඩි වෙනවා.'

තරවටුවක ස්වරූපයෙන් උත්තරා කීවා ය. එද උත්තරා මහතෙ සමු ගත්තේ එ තරම් පැහැදීමකින් නොවන බව මම දනිමි. උත්තරා පාරේ අනෙක් පැත්තට පැන යන්නට ගිය න් මම නිසොල්මනව සිටියා විනා සෙනෙහසින් ඇයට සමු නොදුනිමි. පෙනෙන නොපෙනෙන ඉසව්වකට ඈ පියමං කළ විට මම බම්බලපිටිය පැත්තට හුදෙකලාව ගමන් කරන්නට වීමි. මේ මාවත අප එ දවස අත්වැල් බැඳ ගිය මාවත නොවේ දැයි මට සිතේ. සියලු වැට කඩොලු බිඳ දමා මට වාපා වෙත සමීප වීමට සිතේ. එක් අතකින් ඔවුන් දෙදෙනා සතුටින් සිටී නම් මට හිත හද ගන්නට තිබිණ. බම්බලපිටිය දක්වා ගමන් කළ මම 'ප්‍රින්ස්' අවන් හලට ගොඩ වැදුණෙමි. අතේ ඇති මුදලට සැර ම මත්පැන් වර්ගයක් ඇනවුම් කළෙමි. ලෝකය බමන්නාක් මෙන් දැනෙන විට මම සතුටු වීමි. ලෝකය මා දමා ගමන් කරනවා නොව මා ලෝකය දමා ගමන් කරනවා යැයි සිතීමෙන් මම සතුටු වීමි. දම්වැලක් මෙන් දුම්වැටි පෙරහැරේ දල්වමින් මම මධු බඳුන් එකිනෙක හිස් කළෙමි. අවන් හලේ මධු බඳුන් ගැටෙනා හඬ නොඇසෙන තරම් ය. මුල දී ඇසුණු නොනවතින ගාලගෝට්ටිය දැන් නොඇසේ. සුදු නංගීගේ සුදු මුහුණ මා දෙස බලා ඉහි කරනවා මෙන් මට දැනේ. ඇගේ ආත්මය මගේ හදවත තදින් මිරිකා සිටිනවා වැනි රිදුමක් හද ගැබින් මතු වේ. සත්තකින් ම සුදු නංගී ළඟ පාතක සිටියා නම් 'බොන්න එපා... මගේ කපුන්' කියා මා සනසාලනු ඇත. පුංචි වටකුරු දෑස බිමට බර කොට මගේ දෑතේ එල්ලී දැසට කතා කරනු ඇත. සුදු නංගී ඇස ගැසෙන්නට නොහිමි ආශාවක් හිතේ උපදී. මම ගාලුපාරට පිවිස පාර පනින්නට සැරසුණෙමි. තඩි බෙන්ස් රථයක් මා අසල පිරිංග තද කළේ ය. බිම ඇද වැටෙන්නට ගිය හෙයින් මම රථයට අත තබා වාරු වීමි. රතුපු මුහුණක් එළියට දමා රියැදුරා මා දෙසට කඩා පැන්නේ ය.



'බුරුවා! මැරෙන්න හදනවද යකෝ?... කාලකන්නි...!'

'ඔව්... ඔව්... මොකද ඉතිං තමුසෙට අමාරුද?'

මා ප්‍රති උත්තර දෙද්දී රථය ඉගිළිණි. එහෙත් මට කෙලින් සිටීමට නොහැකි ය. මම ත්‍රිරෝද රථයකට අත දමා නතර කළෙමි.

'සිරිමල් උයනෙ..... ලුම්බිණි මාවතට...'

මම රියදුරුට කීවෙමි. රථය ගාලුපාර දිගේ රත්මලාන පැත්තට ඉගිලෙන්නට වි ය. විකල් වූ මනසේ නොයෙක් බියකරු සිහින මවන්නට වි ය. විස්සෝපයෙන් මෙන් මම වටපිට බලන්නට වීමි. කුසේ කෙරපෙන මත්පැන් උගුර හරහා එළියට යන්නට වෙර දරයි. ඔක්කාරයට එයි. එහා මෙහා දිවෙන වාහන පේළිවල රිංග රිංගා ත්‍රිරෝද රථය ඇදේ. විදුලි වේගයට ත් වඩා රථය වේගවත්ව ඉගිලෙයි. බස් රථයක හැපෙන්නට ගිය රථය ඔන්න මෙන්න කියා රියැදුරා නැවැත්වී ය. මම රියදුරාට යටිගිරියෙන් බැණ වැදුණෙමි.

'මාව මරන්න හදනවද යකෝ? හිමීට හිමීට එළවනවා. රෝද හතරක් නොමෙයි, රෝද තුනක් තියෙන්නේ.'

රියැදුරා යටි සිතින් සිනාසුණා දැයි මම නොදනිමි. එහෙත් ඔහු සන්සුන් මනසින් මෙසේ කී ය.

'මහත්තයට ටිකක් වැඩියි වගේ. ඔය වයසට ඔහොම බිව්වොත් ආයුෂ බොහෝම කෙටියි මහත්තයෝ.'

සිරිමල් උයනට යන තෙක් ම රියදුරා මට මත්පැන් බීමේ ආදීනව කියන්නට වි ය. මම ඔහුට සිගරැට්ටුවක් දුනිමි.

'මම ආපහු එනවා. විනාඩි පහක් ඔහොම ඉන්නවා.'

මම ගේට්ටුව විවර කර සුදු නංගීගේ නිවසට පිවිසෙන්නට මිදුලට ගියෙමි. දොර විවර වි ය. වාපාගේ මව කොරිඩෝරයට ආවා ය.

'ස.... සමාවෙන්න අම්මේ. මට වාපව බලන්න ඕන.....'

මම ඇගේ සමීපයට ගොස් කීවෙමි. බිම නොවැටීමට අසළ

For E - Pusthakalaya

කළුවකට හර එමි. විස්මිත දෑසින් චාපාගේ මව මදෙස බලත් ම සුදු නංගී ද දොරකඩට ආවා ය. රාත්‍රී ඇඳුම පිටින් ම සාලයට පිවිසි සුදු නංගී මොකක් දෝ නොතේරෙන හැඟීමකින් මදෙස නෙත් නොහෙළා බලා සිටී.

'සෝ රොහාන්... මං ආවෙ එයා හමුවෙන්න. උඹට කිසි අයිතියක් නෑ මගේ සුදු නංගීට ගහන්න බනින්න...'

මම ඇඟිල්ල දිගු කරමින් කීවෙමි. අම්මා මට ඉස්සර වූවා ය.

'ඔය ළමයා මොකාටද එන්න හදන්නේ?'

'කලබල වෙන්න එපා අම්මේ... අම්මල තමයි අපිට මේ දේ කළේ. සුදු නංගීත් දුක් විඳිනවා. මමත් දුක විඳිනවා. මේව බලබල අම්මලට පුළුවන්ද සතුටු වෙන්න? දැන් අහනව මොකාටද එන්නෙ කියල.'

මම විකක් සැරෙන් කීවෙමි.

'එපා සසුන් මෙතන කෑ ගහන්න එපා. දැන් රොහාන් එන වෙලාව, ඔයා යන්න.'

සුදු නංගී බියේ ගැහෙමින් කීවා ය.

'මට ඔයා නැතුව යන්න බෑ සුදු නංගී. ඔයාම නේද කිව්වෙ මගේ ජීවිතේට වන්දි ගෙවනවා කියල. ඔයා වන්දි ගෙවන්න එපා. මං වන්දි ගෙවන්න දෑං ලෑස්තියි.'

'අනේ රත්තරං. ඔයා හොඳටම බීලා. මෙහෙම ප්‍රශ්න විසඳන්න බෑ. මං මේ සෙරම දල ඔයත් එක්ක එනවා. ඒත් දැන් නෙමෙයි.'

'උඹ කොහේ යන්නද? පලයං ගෙට'

යැයි චාපා කල්ලු කළ මව ගෙට වැදී දොර වැසුවා ය. මට යන්නම් ඇසුණේ ඉකි හඬක් පමණි. මව ජනේලය හැර නැවතත් හිස එළියට දමා කතා කළා ය.

'කරුණාකරල ඔය මෙය යන්න. නැත්නම් මම පොලීසියට කියනවා.'



'පොලීසියට කියල මට රිදවන්නද? එහෙම කරන්න එපා අම්මේ. පොලීසියට කියල දික්කසාද නඩුවක් දාන්න. මට නෙමෙයි රොහාන්ට.'

ඔ ජනේලය වැරෙන් වසා ගත්තා ය.

'යං යං මහත්තයා - මාර ලෙඩකටනේ මාව ගෙනාවේ'

රියදුරා මා ඇද රථයට දමා ගුරු පාර දිගේ ඉදිරියට ඇදෙන්නට වී ය. ගුරු පාරෙන් වමට හැරවූ රථයක් දැක මම රියැදුරුට රථය නවතන මෙන් කීවෙමි. ඔහු රථය නතර කළේ නැත. ඉදිරියෙන් ආවේ රොහාන්ගේ කැලිෆෝනියා රථය යි. වේගය මඳක් අඩු වූ රථයෙන් බිමට පැන්න මා පාර හරහා ඇදී ගොස් දිගැදිණි. කැලිෆෝනියා රථය මා ඉදිරියේ නැවතිණ. එහි රොහාන් සිටින බව මම දනිමි. රථය දෙසට ඇදෙමින් මම යටි ගිරියෙන් කෑගැසුවෙමි. එහි නොනිවන ලද ලයිට් එළියට මගේ දෑස දැවේ.

'ගෑණුන්ට ගහන මෝඩයා. බැහැපන් ඩෝ බිමට. මගෙන් නළලෑ මැහුම් දාන්න උඹ මට ටවුන් හෝල් එකේදි බත් බැලයන් දාල ගැහුවා. මගේ සුදු නංගී උඹ ඩැහැ ගත්තා. මං ආවෙ උඹෙන් වන්දි ඉල්ලන්න. රෝද හතරක් උඩ හිටියට කමක් නෑ. බැහැපන් මේ ගෙන්දගම් පොළවට. මට පොඩි ගනුදෙනුවක් තියෙනවා උඹත් එක්ක බේර ගන්න.

මා එසේ කියා කාරය දෙසට ඇදෙත් ම ත්‍රිරෝද රථය පණ ගැන්වූ රියැදුරා මහත් වේගයකින් අතුරු පාර දිගේ ගොස් නොපෙනී ගියේ ය. රොහාන් රථයෙන් බැස 'දඩස්' ගා කාරයේ දොර වැසුවේ ය. මම නැඟී සිටීමට තැත් කළෙමි. මම වෛරයකින් හා ක්‍රෝධයකින් යුතුව රොහාන් දෙසට නෙත් යොමු කළෙමි. ඔහුගේ කාරයේ තවත් තරුණයන් දෙදෙනෙකු සිටින බව මා දුටුවේ එ විට යි.

'තමුසෙ ද මේ පාක්වෙලා ඉන්න චණ්ඩියා?'

ඔහු මට සමීප වෙමින් විමැසී ය.

'ඔව් මං ආවෙ උඹෙන් වන්දි ඉල්ලන්න. ඒත් උඹ වගේ හාල් පාරු බත් බැලයන් ගෙනාවේ නෑ මම. මං උඹෙන් අපේ ජීවිත දෙකටම වන්දි ගන්නවා.'

For E - Pusthakalaya

'ඊට ඉස්සෙල්ලා මං උඹව යට කරනවා මළුව කුඩු වෙන්න.'

'මොණරා වගේ දැගළුවට බලපං හැපිලා පස්ස පැත්ත. උඹෙ තියෙන්නේ නිරුවත් ආත්මයක්.'

'උඹට පුළුවන් දැන් චණ්ඩිකම් පෙන්නන්න'

ඔහු දෙපා විහිදුවා සටනට සූදානම් වී ය. මට සියල්ල ම පෙනුණේ නිලංකාරව ය. පිටු පස අසුනේ සිටි පුද්ගලයන් දෙදෙනා හිමින් සීරුවේ රථයෙන් බසිනු මම ඒ අතරින් දිටිමි. ක්ෂණිකව ඉදිරියට පැන්න මම රොහාන්ගේ මුහුණට පහර කිහිපයක් දුනිමි. එහෙත් ඒවා වැදුණේ ඔහුගේ මුහුණට ම නොවේ. දැනට ශක්තිය ගෙන මා පහර දුන් විට ඒවා හිස් ආකාශයට එල්ල වී ය.

'දැන් මගේ වාරේ...'

රොහාන් ඉදිරියට පැන්නේ ය.

'උඹව සල්ලි උඩ තියලා පුච්චනවා මං.'

ඔහු ඇඟිල්ල දිගු කොට කීවේ ය.

'අඩ ගාගනින් නළලේ. ඊළඟ ආත්මෙටත් මට මතක තියෙන්න.'

'උඹව හිල් කුඩයක් වෙන්න වෙඩි තියනව මම.'

'මම ජීවිතේ ණයට ගෙනාවේ නෑ මිනිහෝ!'

මම හැකි වේගයෙන් රොහාන් වෙතට පැන පහර දුනිමි. වේගය, ක්‍රෝධය, ශෝකය, වෛරය සන්සිඳෙන තරම් මම පහර දුනිමි. කොතෙක් වෙලා කාට කොහොම පහර දුන්නා දැයි සත්තකින් ම මම නොදනිමි. සියල්ල හමුවේ මා දුටුවේ සුදු නංගීගේ පෙම්වත් මුහුණ පමණි. එහෙත් අවසානයේ මම බිම පතිත වීමි.

'බොස් මිනිහට හොඳටම වැඩ්. මොකද කරන්නේ?'

'පිටිපස්සට ද ගහනවා. කාලකන්නියෙක්! කණමදයා වගේ ඇවිලා චැලේන්ජ් කරන්න ආවා.'



එවන් සංවාද කිපයක් මට යාන්තමින් ඇසුණා මතක ය. දඩ දඩාස් ගා වාහනයේ දොරවල් වසා ගත් ඔවුහු රථය ඉදිරියට ගෙන ගොස් හිරිංග නද කළ හ. රථයෙන් බිමට බැස රොහාන් මිදුලේ කොරිඩෝරයට පැන කතා කරනු මට යන්තමට ඇසේ.

'අන්න මං තමුසෙගේ පරණ පෙම්වතා ගෙනාවා කාර් එකේම එවම්මගෙන. ඌට ඉක්මනට කනක්කට යන්න ඕන වෙලා. අන්තිම පාරට ඕන නම් මූණ බලා ගන්නවා.'

රොහාන් එසේ කියත් ම මම දෙපාවලට ශක්තිය ගෙන රථයේ වීදුරුවට පහර දුනිමි. 'ස්ලාං' යන හඬින් එය බිඳී ගියේ ය. වාපා ත් මව ත් කාරය ඉදිරියට පැන විලාප තබන්නට වූ හ.

'අපරාධ වැඩ කරන්න එපා පුතා ඔය ළමයට යන්න ඇරලා ගෙට එන්න.'

වාපාගේ මව රොහාන්ගේ අතින් අදිමින් කියයි.

'එපා දෙයියනේ එපා. කසුන් මගේ. මං ඔයාගේ නෙමෙයි මට යන්න දෙන්න. අපි දෙන්නට එකට යන්න දෙන්න. ඇයි මට වද දෙන්නේ. මං අයිති රොහාන්ට නෙමෙයි. කසුන් මගේ. අම්මලා තමයි මේ විනාශය කළේ. දෙයියනේ මගේ කසුන්. මට – මට කසුන් එක්ක යන්න දෙන්න. මට මගේ කසුන් ඕන දෙයියනේ!'

සුදු නංගී කාරය දෙසට එත් ම බිම ඇද වැටුණා ය. රොහාන් රථයට නැග වීදුරුව පහත් කොට වාපා දෙසට ඇඟිල්ල දිගු කොට මෙසේ කීවේ ය.

'හොඳයි උඹ මෙච්චර දවස් කළේ බොරුව කියල මං දන්නවා. හිටපං මූගේ හත් දවස ලෑස්ති කරල මං එන්නම්.'

රථය ඉගිලිණ. කුමකින් කුමක් සිදු වූවා දැයි මා නොදනිතත් වැල්ලවත්ත 'හැවොයි' අවන් -හලේ උඩ තට්ටුවට ඔවුන් මා වාරු කොට ගෙන යනවා මට මතක ය. 'විස්කි' බෝතලයක් ඇතුවුම් කළ ඔවුහු මගේ ඉදිරියෙන් ද වීදුරුවක් තැබූ හ. මම වෙරි මතින් නිසොල්මනේ බලා සිටියෙමි. රොහාන් මගේ ළඟින් ම වාඩි වී ය. වීදුරු තුන හතරක් හිස් කළ ඔහු මට වීදුරුවක් වත් කළේ ය.

'තමුසෙ මට වහ දෙන්න හදන්නෙ?'

'නෑ තමුසෙට වැඩිය කාලකන්නියෙක් මම. කසුන් තමුසෙ මේක බොනවා. තමුසෙට ඉස්සෙල්ල මැරෙන්න වෙන්නෙ මට...'

රොහාන් මගේ කරට අත දමා කීවේ ය. මම ඔහු දෙස විශ්මිත දෑසින් බලන්නට වීමි.

'රොහාන් ඇයි මගේ සුදු නංගී උදුර ගත්තේ? මොකටද මගේ සුදු නංගීට වද දෙන්නේ? තමුසෙ මහ තිරිසනෙක්.'

'හැම මිනිහෙක්ගේම හිත ඇතුළේ තිරිසනෙක් ඉන්නවා.'

'තමුසෙ තිරිසනෙක් නිසා එකකොට තිරිසන්නු දෙන්නෙක්?'

'කසුන්ට වැඩිය මං වාපට ආදරේ...'

'බලුකමට'

'නෑ...'

'තමුසෙගෙ ආශාවන් ඉෂ්ට කරගන්න.'

'නෑ'

'මගේ සුදු නංගීට තමුසෙ වෛර කරනවා.'

'නෑ.'

'එයාට වද දෙනවා.'

'නෑ.'

තිරිසනෙකුට තේරෙන්නෑ තමන් කරන්නේ තිරිසන් වැඩ කියලා.'

'නෑ... නෑ.... නෑ.... මට කතා කරන්න දීපං...'

පුරවා ගත් තවත් මත්පැන් වීදුරු දෙකක් බී ඔහු කතා කළේ ය.

'වාපා පොඩිකාලේ ඉඳලම හැදුණේ අපි ළඟ. පුංචිකාලේ ඉඳලම ඒකි හරි ආඩම්බරයි. ගෙදර හිත්දි සින්දු කියල මං දැක්කම ඒක නවත්තනවා. නට නට ඉඳල මං දැක්කම ඒක නවත්තලා දුවනවා. පොඩි කාලෙවත් නිකමට මගෙත් එක්ක සෙල්ලම් කළේ නෑ. මං කතා



For E - Pusthakalaya

කළොම රෙනවා. මට ඕන වුණා එහෙම කල එකිව මගෙ බිරිඳ කර ගන්න...

මම නිහඬව සවන් දුනිමි. අනෙක් සගයෝ වෙනත් අසුනකට ගොස් මත්පැන් බොති.

'මම ඉස්කෝලෙට ගියා. ඒකිව ආරක්ෂා කළා. ඒත් වාපා මට ආදරේ කළේ නෑ. මගේ යාළුවෝ මට හිනාවුණා. මට දෙවැනි වෙන්න බෑ. කසුන් එක්ක දවසක් කතා කරනව දැකල මං කම්මුලට ගැහුව. සල්ලි වියදම් කළා. දැන් මගේ යටතේ. ඒත් ඒකි මට ආදරේ කරන්නේ නෑ. මං ගැණු දැකලා තියෙනවා. උන්ව ආශ්‍රය කරල තියෙනවා. මාව තිරිසනෙක් කළේ වාපා.'

මම තව දුරට ත් නිහඬව සිටියෙමි.

'දැන් මගේ. වෙන් වෙන්න දෙන්න බෑ. මං ලක්ෂ ගාණක් වියදම් කළා. මගේ සල්ලි. තමුසෙ නෙමෙයි මගෙ යාළුවොත් කියන්නෙ මං ලෙඩෙක් කියල. මට වාප දැක්කම දැන් මහ විකෘති හිතක් ඇති වෙන්නේ. ඒකි නෙමෙයි ලෙඩා මම. මට ජීවිතේට තාත්තා කෙනෙක් වෙන්න බෑ. මං ලෙඩෙක්. උඹ දන්නවද මං ලෙඩෙක්. ඒත් මට ජීවිතයට ඕන. මං මගේ ජීවිතේට වාපට මගෙන් ඈත් වෙන්න දෙන්නේ නෑ. ඒකි මගේ. ඒ හින්ද මගේ ළඟ ඉන්න ඕන.'

මම හිස මේසය මත තබා ගතිමි.

'තමුසෙ නෙමෙයි පිච්චෙන්නෙ මම. මට සල්ලි තියෙනවා. සම්පත් තියෙනවා. ඒත් මං තාත්ත කෙනෙක් වෙන්න පිං කරලා නෑ. මට පොඩි කාලේ කම්මුල් ගාය හැදුණා. මට ජීවිතේට ළමයෙක් හදන්න බෑ. මට තාත්තා කෙනෙක් වෙන්න බෑ.'

මම හිස එසවීමි.

'මාව මරන්න ගෙනෙල්ල.... ඇයි දැන් රොහාන් මරලකෝනි දෙන්නේ?'

For E - Pusthakalaya

තමුසෙ [illegible] ගන්න බැරුව. මම තනියම හදනවා ජීවිතේ යතුර නැතුව.

රාත්‍රී තුනට පමණ ඔහු මා සමඟ පාරට විත් බොරැල්ල දෙසට රිය පැදවී ය. නිරංගගේ බෝඩිම අසල දී රොහාන් මෙසේ කීවේ ය.

'මීට පස්සෙ කසුන් අපිට කරදර කරන්න එපා. මට ජීවිතෙන් දැන් පලක් නෑ. බිස්නස්වලින් ලැබෙන සල්ලි විතරයි මට තියෙන්නෙ. මම තමුසෙලා දෙන්නගේම ජීවිත නැති කරල දනව. මං හිතන්නෙ මේ අපේ අන්තිම හමුවීම. මීට පස්සෙ අපි හමුවුණේ නැත්නම් හොඳයි. එහෙම වුණොත් ජීවිත තුන හතරකින් වන්දි ගෙවන්න වෙයි.'



# 24

හිමිදිරිය පාලු ය. මුසල ය. ගුප්ත ය. අඳුරු ය. මම යහනේ සිට ම ඇහැරියෙමි. මේ නැගෙනහිර දෙසින් හිරු අහස් අගාධයට එබෙන හිමිදිරිය යි. ළහිරු පිබිදියේ ත් අකමැත්තෙන් මෙනි. බලහත්කාරයෙන් මෙන් හිරු අහස් අගාධයට තල්ලු කරනවා යැයි මට සිතේ. සුදු නංගි ඊයේ රාත්‍රිය කෙසේ පහන් කරන්නට ඇද්ද? පත්තකින් ම මා මරා දමන්නට රොහාන් සැරසුණා යැයි ඈ සිතන්නට ඇත. මසිත ද චලනය නොවූවා නොවේ. බිමතින් හෙම්බත්ව වෙරි වී සිටි මට පැහැදිලි හිනව්වක් තිබුණේ නැත. ඊයේ රාත්‍රී රොහාන් ගෙල මිරිකා මා මිය ගියා නම් වඩා යෙහෙකැ යි මට සිතේ. නිරංග කාමරයේ එහෙ මෙහෙ සක්මන් කරයි. මා වෙතට දමා ගැසීමට තරම් කේන්තියක්, ආවේගයක් ඔහු තුළ නළියන බව මම දනිමි. ඇහ මැලි කැඩීමට තරම් වත් ප්‍රාණයක් නොතිබූ හෙයින් මම සරම එහෙ මෙහෙ පටලවා ගෙන බිමට බැස්සෙමි.

'අන්න ප්ලේන්ටියක් ඇති මේසෙ උඩ.'

නිරංග ඕනෑවට එපාවට මෙන් කීවේ ය.

'ඇයි උඹ අද ලෙක්චර්ස් යන්නෙ නැද්ද?'

මම තේ එක අතට ගනිමින් විමසීමි.

'ප්‍රතිපත්තියක් ඇතුව වැඩ කරපන් කසුන්. බලපං උඹ උඹගෙ වැඩ ඔක්කොම අවුල් කරගෙන. කැම්පස් එක පැත්තට යන්නේ නැ- විපුෂත් පංතිවලට හැමදම පොලු. ලියන කියන දෙයක් හරියට

For E - Pusthakalaya

කරන්නෙත් නෑ. දවල් තිස්සෙ සුදු නංගී, සුදු නංගී කිය කියා මැරෙන්න යනවා. අපි ඒ තිස්සෙ ඉතිං උඹ එනකං මෙතන තපින්න ඕනෑ. ඒ දෙගොඩ හරියක් වෙනකල් අර කාලකන්නියත් එක්ක බිබී ඇවිදිනවා. උඹට ලැජ්ජ නැද්ද බං රොහාන්ගෙ කාර් එකේ එල්ලීගෙන මෙහෙන්ට එන්න. තව ටික දවසක් යනකොට උඹ උගේ- ඉත්තෙක් වෙයි.

මම ජනේලයෙන් පිටත බලා ගෙන ම නිරංගට සවන් දුනිමි. දැන් ඉතිං තව දුරට ත් මේ ගෙවන ජීවිත රටාව ගෙන යාමට නුපුළුවන් බව මම දනිමි.

'මට පොඩි උදව්වක් කරපං. හැම දෙයක්ම මට දැං කියන්න බෑ. මට රුපියල් පන්සිය ක් හොයලා දීපං. මං තීරණයක් ගන්න මං සුදු නංගී එක්ක එනවා.'

'උඹට පිස්සුද බැදපු ගෑණියෙක්ට එක්ක එන්නෙ?'

'වෙන දෙයක් වෙන්නෙ අපි දෙන්නටම. පිස්සු හැදෙන්න ඉස්සෙල්ල මං කරන දේ කරන්න ඕනෑ. උඹ දන්නෙ නෑ, මං හිතනවට වැඩිය සුදු නංගි දුක් විඳිනවා. රොහාන් ඊයේ මගෙ ඉස්සරහ පේරම පාපොච්චාරණය කළා. උඹ කියනව සුදු නංගීගෙන් පළිගන්න කසාද බැන්ද කියල. මං මගේ සුදු නංගි මගේ ළඟට ගන්න ඕනෑ.'

'මොඩ වැඩ කරපං පිමාවක් ඇතුව. උඹේ ගෙදර, අම්මා තාත්තා, විසුණෙන්, කැම්පස් එක...

'හතර කේන්දරේ බල බල වැඩ කරන්න බෑ. මං ඒ දවස්වලත් පරක්කු නොවී තීරණයක් ගත්තා නම් ඉවරයි.'

'උඹ හොඳ සිහියෙන්ද මය වැඩ කරන්න හදන්නේ?'

'ඔව්. උඹත් ඕනනම් වරෙන් මගෙත් එක්ක. මං රත්මලානේ යන්නේ. මං අද සුදු නංගී එක්ක එනවා.'



'පස්මහ බැලුම බලන්න මට බෑ. මං එන විදිහකට මූණ දෙනවා.'

'රොහාන් සර්පයෙක් වගේ උඹේ පස්සේ එළවයි.'

'මං මැරෙන්න බය නෑ.'

'ඊත් උඹ වාපාව අමාරුවේ දන්න එපා.'

'උඹට තේරෙන්නේ නැද්ද සුදු නංගි බේරගන්න මං හදන්නේ කියලා?'

මම නිරංග සමඟ රත්මලානේ සිරිමල් උයනට ගියෙමි. ලුම්බිණි මාවත දිගේ ගිය මම රොහාන්ගේ නිවසට ගොඩ වැදුණෙමි. විදුලි සීනුව නාද කරත් ම සුදු නංගී දොර විවර කළා ය. මම මොහොතක් ගල් ගැසී ඇය දෙස බලා සිටියෙමි. මිනිස් දුවක එ තරම් පීඩාවකින් සිටිනු මා ඊට පෙර කිසි දක දැක නැත. සුදු නංගී වචනයකුදු කතා කළේ නැත. ඕ දැස අයා මා දෙස බලා සිටී. මම හිස සිට දෙපතුල දක්වා විමසා පසුව ඇගේ දෑසට එබුණෙමි. මගේ සුදු නංගීට මේ වේදනාව උරුම කිරීමට මා හවුල්කරුවකු විය යුතු නැත. නිදි ඇඳුම පිටින් ම ඕ නොසැළී සිටියා ය. මගේ සුදු නංගී කතා කළේ නැත. හාත්පස නිහඬ ය. ඇගේ ගෙලේ නියපොතු පහර කිහිපයක් තැන තැන සටහන්ව ඇත. නළලේ පුංචි සිරිමි තුවාලයකි. ඇහි බැම ඉදිරියට නෙරා විත් ය. ඇය ගිලී ගොස් ය. ඇගේ දෑත හෙමින් හෙමින් වෙව්ලනු මම බලා සිටියෙමි. මම අඩියක් ඉදිරියට තබා ඇගේ දෑත ගෙන තරයේ අල්ලා ගත්තෙමි. දෑසට එබී සිහින්ව කතා කළෙමි.

'ඇයි සුදු නංගී?'

ඇය කතා කළේ නැත. අකල් වැස්සක් මෙන් ලොකු කඳුළු බිඳු කීපයක් පමණක් බිමට වැටිණ.

'ඔයා දුක් විඳිනවා.'

මම කීවෙමි. දෑත ගෙන සෙළවීමි. ඒ දෑත සීතල ය. මළ මිනියක මෙන් සීතල ය. අයිස් කැටයක් මෙන් සීතල ය.

For E - Pusthakalaya

'ඔයා දුක් විඳිනවා සුදු නංගී. මේ සේරම විඳවන්නේ ඔයා.'

ඇගේ දෑත අත් නොහැර ම මම කීවෙමි. විස්සෝපයෙන් මෙන් නෙත් නොහෙළා බලා සිටි වාපා හිස මගේ උරහිසට හේත්තු කළා ය. නිරංග පුටුවේ වාඩි වී ය. මම ඇගේ හිස පිරි මැද්දෙමි. හිසේ තැන තැන ගෙඩි ගැසී ඇත. සදකාලිකව නුරාවෙන් තොරව රස විඳිය නැති මගේ සුදු නංගීට රොහාන් තිරිසන් ලෙස පහර දී ඇති බව මම පසක් කොට ගතිමි.

'කෝ අම්මා?...'

මම විමසීමි. සුදු නංගී කතා කළේ නැත. මම ඇය පුටුවට බර කොට සමීපයේ වාඩි වීමි. හිස ගෙන මගේ ළමැදේ හොවා ගතිමි.

'කෝ සුදු නංගී අම්මා?.... ඇයි දෙයියනේ ඔයා කතා කරන්නේ නැත්තේ?'

මම ඇගේ මුහුණ උඩුබැලි අතට හරවා කම්මුල මා වෙතට හරවා ගනිමින් සෙලවූයෙමි.

'ඊයේ රෑ එළිවෙන කල් රොහාන් මට වද දුන්නා. අම්මා උදේම බැංකුවට ගියා. සල්ලි අරන් මගෙත් එක්ක වෙන ගේක පදිංචියට යනවා කියලා. රොහාන් උදේම ගියා. අම්මා කිව්වා දික්කසාද වෙන්න තඩු දානවා කියලා. මගේ ජීවිතේ නැති වුණා දෙයියනේ!'

මම නිරංග දෙස බැලීමි. වඩාත් බැරෑරුම් පෙනුමකින් ඔහු මා දෙස බලා සිටී. මම ඇඟිලි තුඩුවලින් සුදු නංගීගේ දෑස් යට ඉතිරී වී තිබූ කඳුළු පිස දැමුවෙමි.

'මං ආවේ සුදු නංගී එක්ක යන්න.'

මම ඇගේ හිස කෙළින් කොට අවුල් වී තිබුණු කෙස්රොදක් දෙකක් පෙති අතර සඟවා ලමින් කීවෙමි. ක්ෂණයකින් ඕ පුටුවෙන් බිමට බැස මා ඉදිරියේ මුහිින් වැටී දණ හිසට දෑත තබා හිස ඔසවා ... කීවා ...



'මං අහන්නේ නැ ඇයි කියලා කොහාටද යන්නේ කියලා. මොකද්ද අපි දෙන්නට වෙන්නේ කියලා. ඒත්...

'මට ඔයත් එකක් මියැදෙන්න පුළුවන් වාපා. දෙපැත්තකට වෙලා මැරිමැරී ඉන්න ඕන නෑ.'

මගේ දෙපා අල්ලා මොහොතක් සිටි ඕ දිලිසෙන දෑසින් මා දෙස බලා යමක් කියන්නට සැරසුණා ය.

'ගවුමක් දගෙන එන්න. අම්ම ආවොත්...'

ශං' ිරිය කියන්නට ඇය ඉඩ දුන්නේ නැත.

'මගේ අම්ම කසුත්...'

'දෙහිඩියාවෙන් තීරණ ගන්න එපා. ඉක්මන් කරන්න.'

මම නැඟී සිටියෙමි. සුදු නංගී ඉකි බිඳිමින් කාමරයට ගොස් ගවුමක් ඇඟ ලා විත් මදෙස බැලුවා ය.

'යමු'

නිරංග ඉක්මන් වී ය. සුදු නංගී දොර වසා එයට ම හිස ගසා හඬන්නට වූවා ය.

'අඬන්න එපා වාපා ඉක්මන් කරන්න.'

ගල්කිස්සේ සිට කොටුව දක්වා කතා බහකින් තොරව ගමන් ගත් අපි කොටුව දුම්රිය පොළට ඇතුළු වීමු. හපුතලේට ටිකට් පත් දෙකක් ගත් මම දුම්රිය පොළ ඇතුළට ගියෙමි. නිරංග අපෙන් සමු ගත්තේ ය. බදුල්ල බලා යන උඩරට මැණිකේ දුම්රියේ අසුනක වාඩි වී මම සුදු නංගී දෙසට බැලුම් හෙළීමි.

'අපි මොකද්ද ඉරණම් ගමනක් යන්න ලෑස්ති වෙනවා සුදු නංගී.'

මම කීවෙමි. සුදු නංගී කිසිදු කතා බහක් කළේ නැත. මම දෑත දමා ඇය මගේ සමීපයට ගත්තෙමි. වාපා එයට ද කිසිදු ප්‍රතිචාරයක්

දැක්වූයේ නැත. විටින් විට ඕ දැසට එන කඳුළු පමණක් පිසදා ගත්තී ය. මම මහත් සෙනෙහසින් ඇගේ හිස ගෙන මඩොක්කුවේ තබා ගතිමි. ඉකි හඬේ වේගයට ඇගේ පිට ගැස්සෙනු මට දැනේ. මම එක් අතක් ගෙන පිට දිගේ පිරිමදිමි. අනෙක් අත ගෙන සුදු නංගීගේ අතේ ඇඟිලි සමග වෙළා ගතිමි.

'අනේ සීතල'

මට කියැවිණ. විගසින් සුදු නංගී නැගිට අත මුදා ගත්තී ය.

'මාව උණුසුම් කරන්න හදන්න එපා. මට මැරෙනකල් ඔයා ළඟට වෙලා ඉන්න ඕනෙ. මං ඔයාගේ ජීවිතේට වනදි ගෙවනවා කසුන්. ඒත් මගේ ආත්මෙ ඔයා ඉස්සරහ පූජා කරන්න මට බැරිවුණා. මං ඔයා ළඟින් ඉන්නම්. ඒත් ඔයා මගේ ළඟින් ඉන්න එපා.'

සුදු නංගී ජනේලයෙන් පිටත බැලුවා ය. දුම්රිය ගම්පහ දුම්රිය පොළ ද ඉක්මවමින් වේගයෙන් ඇදී යන බව මට සිහි ගැන්වූයේ එ විට ය.

පොල්ගහවෙල පසු කර දුම්රිය රඹුක්කන පැත්තට ඇදෙද්දී මම සුදු නංගීට කතා කළෙමි. ඇයට හොඳට ම නින්ද ගොසිනි. හිමි හිමින් බලන දුර්ගය පසු කරද්දී අකුණු පැත්තේ මාවනැල්ල මිටියාවත ඇයට පෙන්වා ඉන් සිත චමත්කාර කර ගන්නට මට ඕනෑ වි ය. නුවර ගම්පොළ මාර්ගය ඇතින් දිස් වෙද්දී එහි සුදු නංගී ද කැටුව තනි මඟ ඇවිද යන්නට මට සිතේ. පේරාදෙණිය සරසවියේ මෙහා කෙළවර දුටු විට මගේ පපුව හෝස් ගා දැවිණ. මගේ ඒකායන පැතුම වූ සුදු නංගී හමුවේ සරසවි සිහිනය නිදි ගන්වන්නට මට සිදු වේ ද? කෙමෙන් කෙමෙන් පේරාදෙණිය සරසවි උයන පැත්තට දුම්රිය ඇදෙද්දී මම සුදු නංගීට කතා කිරීමට සිතා ඇය දෙසට හිස හැරවීමි. සඳ මඬලේ නිදන සා පැටවකු මෙන් ඕ තව තවත් මා වෙතට තුරුල් වූවා ය. උණුසුම හොය හොයා ඇදෙන බිළිඳියක සේ ඇය මගේ උරහිසේ සැතපී සිටීම නිසා ඇය පිබිදවීමේ නොහික්මුණු ආශාව මම මැඩ ගතිමි. කිසිවක බැරෑරුම් බවක් නොදක්නා මුවැත්තියක සේ සුදු නංගී



නිදි දෙව්දුව තුරුලේ [illegible] සිහිනයේ සැතපෙද්දී මම මහත් ආදෙකලාවකින් පෙළුණෙමි. නෙක විසිතුරු දසුන් වෙනුවට මහත් බියකරු දසුන් මසිතේ සිත්තම් වන්නට වි ය. දුම්රිය හෙමි හෙමින් කඳුකරය සිසාරා ඇදෙද්දී රොහාන් ගන්නා වූ ඒ ළඟ පියවර පිළිබඳ භයංකර තීරණ මගේ සිත් පතුලේ වැදී මා සිත බිය ගන්වන්නට වි ය. දුම්රියේ වේගය මෙන් දෙතුන් ගුණයක වේගයකින් එකී කුරිරු නපුරු සිදුවීම් පිළිබඳ සිතුම් මා මනසේ සැරි සරන්නට වි ය. සීතලේ හිරිපොළන වත උණුසුම් කරන්නට මගේ සුදු නංගී මා වෙතට තව තවත් සමීප වෙත් ම යුද පිටියක් මෙන් මගේ සිරුර වියළි ලේ නහර ගිනි වැදී දහඩිය වැටෙන්නට වි ය. මම සුදු නංගීගේ උරහිසින් අල්ලා දෙතුන් විටක් සොළවා ඇය අවදි කළෙමි. මල් බිස්සක සැඟවී නිදි සිටි මුව පොව්වකුට ගල් ගැසුවාක් මෙන් සුදු නංගී දැස හිගස්සා මා වෙතට හැරුණා ය.

'සුදු නංගී...'

මම ඇගේ හිගැස්සුණු දැසට කතා කළෙමි. කතා කිරීමට තරම් පියවි බවක් ඈ ලබා සිටියේ නැත.

'සුදු නංගී මාව තනි කරන්නේ නෑ නේද?'

මොහොතක් මා දෙස බලා සිටි චාපා නැවතත් උරහිසට හිස ඔබා දැස් ජනේලයෙන් පිටතට හෙළුවා ය. පෙනෙන නෙක් මානයේ සීතල කඳුකරයේ ආනන්දනීය සොඳුරු බව ඇගේ දැසට සිසිල සදන්නට ඇත. මම ඇගේ හිස පිරි මැදීමි.

'කසුන්...'

'ඇයි...?'

මා එසේ විමසත් ම ඕ නැවතත් නිහඬ වූවා ය. ඇය රොහාන් ගැන, මව ගැන සිතනවා විය හැකි ය. අපගේ ඉදිරිය හමුවේ ඇති බියකරු සිදුවීම් පෙළ ඈ සිතේ ද නළියනවා විය හැකි ය.

For E - Pusthakalaya

'මං ඔයාව තනි කරන්නේ නෑ හසුන්. ඒත් මගේ පිළුණු වෙච්ච ජීවිතේ ඔයාට සමීප කරන්න මට බෑ. මම ළඟින් ඉන්නම්. ජීවිත කාලයම ඔයා වෙනුවෙන් කැප කරන්නම්. ඒත් ඔයා ළඟ ඔයාගේ බිරිඳ වෙන්න මට බෑ. ඔයාට පුද දෙන්න ආත්මයක් මගේ ළඟ නෑ.'

'ඔයා පසුතැවෙනව සුදු නංගී...'

'සත්තකින්ම...'

'ජීවිතේ හැම බලාපොරොත්තුවක්ම ඉටු වුණොත් එතන සතුටක් නෑ. ජීවත් වෙනව කියන්නෙ ප්‍රශ්නවලට මුහුණ දෙනව කියන එක...'

'තවත් ඉස්සරහට අපිට ගොඩක් ප්‍රශ්න එයි. මං ඒවා සේරම දන්නවා. ඒත් මං දැන් බය නෑ. සුදු සෙබලෙක් ළඟ ඉන්නව වගේ මගේ හිත හයියයි...'

ජනෙල් කවුළුවෙන් එන කඳුකරයේ සීතල කියලු ලතාවල පැටළී මා මුහුණේ විසිරී යන්නට වී ය. සුදු නංගී ළඟ තවමත් නැවුම් සුවඳ ය. දැන් ඉතිං මරණ මංචකය දක්වා ඈ සුරකිය යුතු ය. කිසි ද ඉතිං අතට ඇත් විය හැකි නොවේ.

අපි නානුඔය දුම්රිය පොළෙන් බැස ගතිමු. කොහොම ද? මොක ද? ආදී කිසිදු පැණයක් මගෙන් නැඟීමට තරම් සුදු නංගී නිකරු වූවා ය. ඇය කළේ එක දෙයකි. සීතල දැඩි දැඩිව දැණෙන්. තව තවත් මා වෙතට තුරුලු වීමට තරම් සුදු නංගී පෙම්වත් වූවා ය. මෑදු වූවා ය. මම ඉර හඳ තරු ලැබුණාක් මෙන් ඇගේ අතින් තරයේ අල්ලා ගෙන සිටියෙමි. නානුඔය දුම්රිය පළ අසල සයිවර් කඩයකට ගොඩ වුණු අපි වඩේ හා කිරි තේ බීවෙමු. අනතුරුව නුවරඑළිය බලා යන වෑන් රථයකට ගොඩ වී පසු පස ම අසුනේ වාඩි වීමු.

සුදු නංගී. අපේ ලොකු අක්කා ඉන්නව නුවරඑළියේ. හග්ගලට පොඩ්ඩක් එහා බැයුම්ගල හරියේ. අපි එහෙ යමු. මමත් හරියටම තීරණයක් අරගෙන නෙමෙයි ඔයාට එන්න කීවේ. අපිට ටික දවසක්



එහෙ ඉන්න පුළුවන් වෙයි. ටික දවසක් එහෙ ඉමු. ගෙදර ගියොත් අම්මා අප්පච්චි බය වෙයි...'

මට කතා කරන්නට ඉඩ දී බලා සිටියා විනා සුදු නංගී අකුරු ප්‍රශ්න නැඟීමට තරම් එඩිතර නොවූවා ය. රාත්‍රී හතට පමණ අපි බැයුම්ගල ලොකු අක්කලා ගෙදරට ගොඩ වීමු. හිගැස්සුණු දෙනෙතින් ද, නිකරු වතින් ද සොහොහෙ පෑ සුදු නංගී මා පසු පසින් ම ගෙට ගොඩ වූවා ය.

හතර පස් වතාවක් අපගේ හිස සිට දෙපතුල් දක්වා විමසිලිමත් බැල්මක් හෙළූ ලොකු අක්කා...

'වාඩි වෙන්න'

යැයි කියා ගේ ඇතුළට පිය නැඟුවා ය. මම අක්කා පසු පස වැටී මැද කාමරයට ගියෙමි.

'ලොකු අක්කේ...'

මම ඇයට කතා කළෙමි.

'උඹට පිස්සුද මල්ලියෙ? කවුද මේ ගෑණු ළමය? එකපාරක් ඉස්පිරිතාලේ හිටියා. දැන් පොලිසියේ ඉන්නද හදන්නේ?'

'වෙන කරන්න දෙයක් නෑ ලොකු අක්කේ. අපි දෙන්න ලොකු කරදරේක වැටිලා ඉන්නේ. ටික දවසකට මෙහෙ ඉන්න දෙන්න. කලබල කරල කෑ ගහන්න එපා. මට උදව් කරන්න...'

සුදු නංගීට කාමරයට ගොස් ඇඳුම් අහවර කරන්නැ යි කී ලොකු අක්කා අපට තේ කෝප්ප දෙකක් වත් කළා ය. කිතුල් හකුරු හා අපි උණුසුම් තේ බීවෙමු.

'මල්ලිත් එක්කල ආ බව අම්මලා දන්නවද නංගියේ?'

අක්කා සුදු නංගීගෙන් ප්‍රශ්න කළා ය.

For E - Pusthakalaya

'නෑ...'

සුදු නංගී බිම බලා ගෙන කීවා ය. බොහෝ දේ ලොකු අක්කා ඇගෙන් ප්‍රශ්න කළ ත් ඒවාට උත්තර දුන්නේ සුදු නංගී නොව මා ය.

රාත්‍රී අපි කැකුළු හාලේ බත් කා සාලයට ගියෙමු. ලොකු අක්කා සුදු නංගී ළඟට වී වාඩි වී සිටියා ය. මම එළිමහන් සීතලෙන් මිදීමට දෑත පපුව මත බැඳ ගෙන බලා සිටියෙමි. මොහොතකින් සුදු නංගී සිරස කඩා හෙලා අක්කාගේ උකුලට ඔබා ගත්තී ය. හිගැස්සී ගිය ලොකු අක්කා කරුණාබර වදනින් මෙසේ කීවා ය.

'කමක් නෑ නංගියේ. මට බෑනේ මගේ මල්ලිව එළව ගන්න. මල්ලිගේ කැමැත්තනේ. ඒත් ඉතිං ඔය දෙන්නට කරදරයක් වුණොත්? ඔය වයසට තීරණ ගන්න වගේ නොමෙයි. මට බය ඔය දෙන්න ලොකු අමාරුවක වැටෙයි කියල.'

මම කිසිවක් නොකීවෙමි. සුදු නංගී ලොකු අක්කාගේ ඔඩොක්කෙ හිස ඔබා සිටිනු දකින මම මවගේ ළමැදේ සැතපෙන ළදරුවකු දක්නා කලෙක මෙන් සොම්නස් සහගත වීමි. එහෙත් ඉකි ගැසුමේ රිද්මයට ඇගේ පපුව හිගැස්සෙනවා දුටු මම දුක් වීමි. අක්කා සුදු නංගීගේ හිස පිරි මදිමින් මෙසේ කීවා ය.

'අඬන්න එපා නංගියේ. දැන් ඉතිං අඬන්නේ නැතුව ඉස්සරහ ගැන හිතන්න...'

අක්කා සුදු නංගී ද කැටුව ඉස්සරහ කාමරයට ගොස් ටික වේලාවක් කතා කරමින් සිට පැමිණ නින්දට ගියා ය. අක්කා කාමරයෙන් නික්ම මොහොතකට පසු මම සුදු නංගී අසලට ගියෙමි. අඩ අඳුරේ ඇගේ ඉකි බිඳුම මහා පාලුවකින් මගේ හදවත පතුළේ වැදී නිනාද වන්නට වී ය.

'අඬන්න එපා සුදු නංගී.'



'අද විතරයි කසුන්. මම කවමදාකවත් ආයෙ අඬන්නේ නෑ. මම බිමට යන්නම්. ඔයා ඇඳේ නිදගන්න.'

සුදු නංගී කඳුළු පිසිමින් කීවා ය. මම කෙස් රොදක් ඇගේ දෙකන් පෙති අතර සඟවා දෙකම්මුල දිගේ අත සිනිඳු ලෙස පහළට අද්දා නිකටෙන් උඩට ඉස්සීමි. මගෙන් මිදුණු සුදු නංගී මුනින් අතට ඇඳේ පෙරළී කොට්ටය බද නැවතත් අඬන්නට වූවා ය. අඳුරු ගුහාවක තනි වූ කලෙක මෙන් මම චකිතයෙන් හා දුකින් බලා සිටියෙමි.

For E - Pusthakalaya

# 25

බොහෝවිත් සුන්දර රාත්‍රියකට අපි හිමිකම් කීවු. මා උදේ අවදි වන විට සුදු නංගි ළඟ පාතක සිටියේ නැත. කුස්සිය පැත්තෙන් ලොකු අක්කාගේ ත්, සුදු නංගිගේ ත් කටහඬවල් මට ඇසේ. මම යහනේ උඩු අතට හැරී සිටියෙමි. හිමිදිරිය නැවුම් ය. සුවඳ ය. පියකරු ය. යහනේ හැම තැන ම මට සුදු නංගිගේ සුවඳ දැනේ. ඒ පෙම් සුවඳ ය. සදකාලිකව ඉතින් ඒ සුවඳ මට ය. ජීවිතයේ අලුත් ප්‍රබෝධයක් ඇති වූවාක් මෙන් මට දැනේ. සුදු නංගි දෙර රෙද්ද යාන්තම් ඉවත් කොට කාමරයට කොකම් පෑවා ය. මම දෑස දල්වා බැලීමි. උදේ තේ එක ත් රැගෙන ඇය හෙමින් හෙමින් මා දෙසට ආවා ය. මම සිනාසීමි. සුදු නංගි බිම බලා ගෙන යටැසින් මදෙස බලන්නට උත්සාහ කළා ය. සිනාසෙන්ට තැත් කළා ය.

'මං හිතුවෙ නැ ඔයා නැගිටලා කියලා. මං අක්කත් එක්ක කුස්සියට ගියා.'

එසේ කියා සුදු නංගි ඇඳේ වාඩි වුණේ මගේ ඇහේ ඇතිල්ලෙමිනි. මම දෑත දමා ඇගේ ඉහ පෙදෙස තද කොට සමීපයට තෙරපා ගතිමි.

'තේ එක බොන්න.'

සුදු නංගි කිවා ය. උරහිසින් අල්ලා මම සුදු නංගි යහනේ වැතිර වීමි. කවම කවදක වත් නැති තරම් සෙනෙහසකින් දැඟිලි කෙස් රොද අතර යවමින් ඇගේ පපුවේ මුහුණ සඟවා ගතිමි.

'තේ එක නිමෙනව කසුන්...'



සුදු නංගි උරහිස පිරි මදිමින් කිවා ය. ඇගේ විකසිත දෑසින් දහයක් වවන ලියවෙනු මට පෙනේ. ඇගේ දෑස කැඩපතක් කොට මම සුදු නංගිගේ ආත්මයට එබීමි. එහි සුවඳින් මගේ ආත්මය පෙම්වත් වනු මට දැනේ. මම තේ එක බී ඉතිරිය සුදු නංගි දෙසට දිගු කළෙමි. මහත් වූ ආනන්දයකින් එය සුරතට ගත් සුදු නංගි තේ එක බිවා ය

සුදු නංගි ඇඳේ කෙළවරකින් හිඳුවා ගත් මම ඇගේ නිකටෙන මුහුණ ඔසවා නෙත් දැල මා වෙත යොමු කොට ගතිමි.

'ඔයා අක්කත් එක්ක ඉන්න. මම හපුතලේ ගෙදරට ගිහිං අම්මටයි අප්පච්චිටයි විස්තරේ කියල එන්නම්. මට ගෙදර ගිහිං හවස් වෙන්න ඉස්සර එන්න පුළුවන්. රොහාන්ල මොනව කරයිද දන්නැනේ. පොලිසියෙන් ගෙදරට ආවොත් අම්මල බය වෙයි. ඔයා ඉන්න. වෙන දවසක අපි දෙන්නම යමු.'

'අනේ කසුන්...'

සුදු නංගි මගේ උරහිසට මුහුණ තද කොට කඳුළු බිඳු එහි තැවරුවා ය. කුමක් අරබයා ඒ කඳුළු හෙළුවා දැයි මම නොදන්නෙමි.

'තවත් අඬන්න එපා සුදු නංගි. ඔය කඳුළු අපි දෙන්නටම අකැපයි. මම මේ තීරණේ ගත්තේ ඔයා අඬවන්න නෙමෙයි. මට අඬන්නත් නෙමෙයි.'

'දුකට නෙමෙයි කසුන්...'

සුදු නංගි හිස නොඔසවා ම කිවා ය. මම සුදු නංගි සනසා උදේ ම හපුතලේ ගෙදරට ගියෙමි.

අම්මා ත් අප්පච්චී ත් මා දුටු විගස හඬා වැටුණෝ ය. මම සිදු වූ සියල්ල අම්මාට කීවෙමි. අම්මා එක් කඳුළුබිඳු හෙළුවේ නැත. අප්පච්චී කිසිවක් කීවේ ද නැත. එහෙත් මා ගෙදරින් පිට වීමට පෙර අම්මාගේ ත්, අප්පච්චිගේ ත් දෙපා නමද්දී අප්පච්චී මෙසේ කීවේ ය.

'අම්මයි මමයි හිතුවෙ පුතේ උඹවත් මිනිහෙක් වෙයි කියල. අමාරුවෙන් හරි උඹ කොළඹ ඉස්කෝලෙකට දැම්මෙ ඒකයි. ඉඩමක් කඩමක් හරි විකුණලා උඹට උගන්වන්න අපිට උවමනාව තිබුණා. කෙල්ලෙක් උඹ කටේ කිරි සුවඳ යන්නත් ඉස්සර කසාදයක් බැඳගන්නා.

For E - Pusthakalaya

නොමෙයි බැඳපු ගෑණියෙක් දැං ඉතිං පොලිසි ගානෙයි, උසාවි ගානෙයි යන්න එපායැ. බලපං උඹ දැන් මොනව කරන්නද? විශ්ව විද්‍යාලෙට ගිය ළමයෙක් නේද උඹ? එක විභාගයක්වත් කලේ නැ. තවම පලවෙනි අවුරුද්දෙ. දැන් උඹ විතරක් නෙමෙයිනෙ. ගෑණු ළමයෙකුත් ඉන්නවනේ. උඹේ කැමැත්තක් පුතේ. උඹලට උපදෙස් දෙන්න දැං අපිට බැ. වැලිමඩ පොලිසියට ගිහිං ඇන්ට්‍රියක් දපං. ඊට පස්සේ මොනව හරි පිලිවෙළක් වෙයං. කාලකන්නියෙක් නොවී. උඹල මය කරන වැඩවලින් අපට ගින්දර නම් දෙන්න එපා පුතේ. අම්මටයි මටයි දුක් දෙන්න එපා."

තවම දක වත් නැති විදිහට අප්පච්චි කියා ගෙන ගියේ ය. අප්පච්චි කියවනු බලා සිටීමට නොහැකිව මම අම්මා දෙස බැලීමි. අම්මා හඬනු මා දුටුවේ එ විට ය. හවස දෙකට පමණ මම නැවතත් අක්කලාගේ ගෙදරට ආයෙමි. අක්කා ත්, සුදු නංගී ත් මා එන විට පිල්ලට ගොස් තිබිණ. කෑම මේසයේ කෑම බෙද තිබුණු අතර සුදු නංගී කෑම කා තිබුණේ ද නැත. ගෙදර යෑම නිසා මසිත තරමක් විංඩුල්ව තිබු හෙයින් කාමරයට ගොස් ඇඳේ හාන්සි වීමට සිතීමි. ඇඳුම් ද අහවර නොකර මම ඇඳට පැන කොට්ටය ඇඳ වියලට හේත්තු කලෙමි. කොට්ටය යට ලියුමක් තිබෙනු දැක මම ඇසිල්ලකින් එය කියවා ගෙන ගියෙමි.

මගේ කසුන්,

මගේ හිත සතුටින් පිරිලා. ඒත් ආත්මය අඬනවා හොඳටෝම. හැමදේම හීනයක් වගේ. ඒත් ඔක්කොම දැන් සිද්ද වෙලා ඉවරයි. ඔයා උදේම හසුතලේ ගියාම මට පාලුයි. කාමරයට වෙලා මේ ලියුම ලියන්නේ ඒකයි. කුස්සියට ගියාම අක්කා මට උයන්න උදව් වෙන්න එපා කිව්වා. අපි දෙන්නා ගැන අක්කා හරි දුකෙන් කතා කරන්නේ. අපි මුළු ලෝකෙටම ප්‍රශ්නයක් කරදරයක් වෙලා ද මන්ද.

ඔයා ගියාම පාලුවක් දැනුණා. සාන්සියක් දැනෙනවා. මට ඔයාට ගොඩාක් දේ කියන්න ඕනැ. ඒත් මය ඇස් දෙක දිහා බලාගෙන මට කියන්න බැ. මම කොහොමද දෙයියනේ මගෙ හිතේ තියෙන දේවල් ඔයාට කියන්නෙ.

ඊයේ රාත්‍රී අපි දෙන්න එක යහනකට වුණා. මං කසාද බැඳපු ගෑණියෙක් නේද දෙයියනේ. මගේ පපුව හෝස් ගාලා පත්තු වෙනවා.



ඔයා ගැන හිතලා. ඔයා අහිංසකයි. ඔයාගේ ආදරෙත් අහිංසකයි. හිතත් අහිංසකයි. මං බියකරු අපායකින් මුද ගත්තා වගේ මගේ හිත නිදහස්.

රොහාන් කලේ මගෙන් පලි ගැනීම. ඉස්කෝලේ යන දවස්වල ඉඳලා මට කරදර කළා. මං ගණන් ගත්තේ නැ. මං හින්දි සිංදු කියන කොට එයා අහගෙන ඉන්නවා. මම එතකොට නවත්තනවා. රජිනි මිස්ගේ ඩාන්සිං ක්ලාස් එකේ ඉගෙන ගන්න කොට එයා ඇවිත් බලං ඉන්නවා. ගෙදර කාමරේ නටන කොට එයා බලනවා. මම නටන එක නවත්තනවා. ඒ දවස්වල කෑම මේසෙට ආවත් මම මේසෙන් නැගිටිනවා. මට රොහාන් ගැන බයක් තිබුණා. ඒත් මං රොහාන්ගේ බිරිඳ වුණා. රත්තරං, මට කාත් කවුරුත් නැති රටක කරන්න දෙයක් තිබුණේ නැ.

කුළුදුලේම මගේ දෙතොල් සිප ගත්තේ ඔයා, කුළුදුලේම... මං කොච්චර සතුටු වුණාද? ඉතිං ඉස් ඉස්සෙල්ලාම මං ඔයාගේ තුරුලට උණාම කොච්චර සොම්නස් වුණාද... මං කියවපු හැම පොතකම ඔයා හිටියා. හැම ගීතයකම ඔයා හිටියා. හැම හීනෙකම ඔයා හිටියා. මං හිතුවෙ මගේ හීනය ඔයා කියලා. දහසක් පැතුම් හිතේ තෙරපගෙන හිටියේ මගේ ආත්මේ ඔයා ළඟ පුදන්න. ඔයා සිප ගත්තේ... සෙනෙහසින් වැළඳ ගත්තේ මගේ නැවුම් හිත. ඒත් ඔයා තුරුලු වුණේ මගේ පිළුණු වෙච්ච ආත්මෙට. මාව රොහාන් කිළුටු කළා. හිත නෙමෙයි. මට දුකයි කසුන්. මැරෙන්න තරම් දුකයි. ඒත් ඒ දුක යටපත් වෙලා මහිත සතුටින් පිරිලා. ඔයා මාව ආත්ම ගණිකාකට ජීවත් කළා රත්තරං.

අනේ මගේ කසුන්, මගේ හිතේ තියෙන ඔක්කොම මට කියන්න බැ. ඔයා ගැන දුකයි. සන්තයි. මගේ හිත පිච්චෙනවා. ඔයා දෙවි කෙනෙක් මගේ කසුන්. ඒත් මට මගේ ආත්මය ඔයාගේ පාමුල පුජා කරන්න බැරිව ගියා. මට සමාවෙන්න සමාවෙන්න දහස් වාරයක්. අපි මුණ දෙමු ජීවිතේට. මං ළඟින් ඉන්නවා මැරෙන කල්ම. හැම ආත්මෙම මම වන්දි ගෙවනවා කසුන්. සහතිකයි.

මං ඔයාගේ ආදරණීය,

සිරි නංගී.

For E - Pusthakalaya

සති දෙකක් පමණ අපි බැලුම්ගල ලොකු අක්කලාගේ ගෙදර ගත කළෙමු. ඒ අතර තුර සුදු නංගී අප පිළිබඳ යම් යම් දේ සටහන් කොට තිබී මට හමු වී ය. අම්මා සිහි කර දිනකට දෙතුන් වරක් වැළපෙනවා හැරෙන්නට ඇයට වෙනත් කම්පනයක් තිබුණේ නැත. මුළු දවස පුරා ම සුදු නංගී සතුටින් සිටී. සති දෙකක කාලයක් අපි ගෙදරට ම සීමා වී සිටිමු. අක්කා මේ කාලයේ බොහෝ වෙහෙස මහන්සි වී අපට සතුටින් සිටීමට ඉඩ සලසා දුන්නා ය. අම්මා දෙවරක් ම අප බලන්නට ඇවිත් ගියා ය. මා සුදු නංගී සමඟ කොළඹින් පැන ඒමේ සිද්ධිය අප්පච්චිගේ හිත බිඳ වැටීමට හේතු වී ඇති බව මට කීවේ අම්මා ය. සුදු නංගී ත්, අක්කා ත් ගවුමක් මසමින් කාමරයේ ඉන්නා විට අම්මා මා සමඟ මැද කාමරයට වී හිත් රිදීම හෙළි කළා ය. මම අසා සිටියෙමි.

'අප්පච්චි කියන එක ඇත්තනේ පුතේ. බලපං දැන් උඹ මොනවද කරන්නේ කියලා. මේ ළමයත් එක්ක ඉතිං ජීවත් වෙන්න එපාය. උඹට ගැණු ගන්න වයසක් ද කියලා අප්පච්චි බනිනවා. මම අද මෙහේ එනවටත් බැන්නා. මං හිතන්නේ ලොකු අප්පච්චිටත් ලියුමක් දලා. උඹ එදා ගිහිං ආවට පස්සේ මට ඉන්නත් නෑ. හුරතල් කරලා මම උඹ නරක් කළාලු.'

'දැං ඉතිං වෙච්ච දේ ගැන කතා කරලා වැඩක් ඇතෑ අම්මේ. මං එයාව එක්ක ආවේ මට හොඳ හින්දා. ටික දවසකින් ප්‍රශ්න ඉවර වෙයි. එතකොට අපි දෙන්නම කොළඹ යනවා.'

'මම උඹට දොස් කියනවා නෙමෙයි පුතේ. මට දුක උඹලා දුක් විඳියි කියලා. මං උඹේ අම්මනේ. උඹ දුක් විඳිනවා මට බලා ඉන්ඩ බෑ.'

'මම අම්මලට හතුරුකමක්වත් වරදක්වත් කළා නෙමෙයි අම්මේ. අම්මයි අප්පච්චියි මං නිසා විඳින දුක් මං දන්නවා. මට පුළුවන් විදිහට මම කවදාහරි අම්මලට සලකනවා. එත් ඉතිං මේ වෙච්ච දේට දැන් කරන්න දෙයක් නෑ. කාටවත් කරදර නොවී අපිම මේකට මූණ දෙන්නම්.'



'උඹට අපි නැමදම නිදහස දුන්නා. රොටි කුප්පායමකින් හරි, සක්කිලි දෙමළ කෙල්ලෙක් හරි ගන්න උඹට නිදහස දීලා තිබුණේ. එත් පුතේ ඔය ලොකු ලොකු පවුල් එක්ක මොවද උඹ සම්බන්ධ වෙන්න ගියේ කළුගලේ ඔළුව ගහගන්න වගේ. ඔය ළමයි සැප විඳපු උදවිය නේ. උඹට පුළුවන් ද ඕවා කරන්න? අනික ඒ මිනිස්සු දැනටමත් මොනවා කරයිද දන්නෙත් නෑ. අන්තිමට උඹ අමාරුවේ වැටෙයි කියලයි අප්පච්චි කියන්නේ.'

අම්මා තවත් බොහෝ දේ කීවා ය. අම්මාට දුක මා ගැන ය. ඊට දුක සුදු නංගී ගැන ය. අම්මා, අප්පච්චි සැපවත් කිරීමට මම දිවි හිමියෙන් බලාපොරොත්තුව සිටියෙමි. එහෙත් දැන් මා සුදු නංගී ද සැපවත් කළ යුතු ය. ආරක්ෂා කළ යුතු ය. අම්මා නැවත පිටත්වන විට මටත් පෙර සුදු නංගී අම්මාගේ දෙපා මුල වැඳ වැටී හඬා වැටුණා ය.

'අඩන්න එපා දුවේ'

කියා අම්මා ඇගේ හිස අත ගා සිම්බා ය. අම්මාට කියා ගන්නට ඕනෑ බොහෝ දේ ඉත් කියවිණෑ යි මට සිතිණ. සුදු නංගී ලවා ඇගේ මවට ත් දින තුනකට වරක් වත් ලිපි ලියැවීමට මම පෙරැත්ත කළෙමි. අප ඉන්නේ කොහේ දැයි සඳහන් නොකර, කළ වරද පිළිබඳව හා අප සතුටින් ඉන්නා බව ඈ නිරන්තරව ලියා යැව්වා ය. සුදු නංගී ඉත් මඳක් සැනසුණා ය.

මම නිරංගට සියලු විස්තර දන්වා ලිපි යැවීමි. රොහාන් හා සුදු නංගීගේ මවගේ තොරතුරු ද දන්වන ලෙසත් ගිහාත්ට මම ලියා යැවීමි. ගෙදරට වී සිටීමට ඇති කම්මැලිකම නිසා ම ඊ ළඟ සෙනසුරාද උදේ ම මම සුදු නංගී ත් සමඟ හග්ගල මල්වත්ත බැලීමට ගියෙමි. උදේ ම කෑම දෙකක් ද පාර්සල් කර ගත් අපි සීතලයෙන් බේරීමට ජර්සි දෙකක් ද ඇඟ ලා ගෙන හග්ගල ගියෙමු. මා දන්නා කාලයේ සුදු නංගී ඒ දවස පුදුමාකාර සැහැල්ලුවකින් ගෙව්වා ය. ඈත බලා ගෙන බොහෝ සුන්දර දෑ අපි කතා කළෙමු.

ඈත ඈත මිටියාවත අපට පෙනේ. ඒ සුදු මීදුම් කුට්ටි සතා පර්වත මෙන් වැලිමඩ සානුව මත්තේ පතිත වී ඇත. නිල්ල වැසුණු කඳු ඉහත්තාවල් පෙළ සුන්දර දේශයක අප තනි කළාක් මෙන් වී ය. රෝස මල් සුවඳේ අපි තනි වීමු. මිනිස් හඬින් තොර,

For E - Pusthakalaya

නොමිනිසුන්ගෙන් මිදුණු වන අඩවියක තනි වූ කිරිල්ලියක මෙන් සුදු නංගී මා සමීපයේ දැවටුණා ය. රෝස මල් සුවඳ සමඟ සුදු නංගීගේ ආදරණීය පෙම් සුවඳ මට දැනේ.

'අර පේන්නෙ බණ්ඩාරවෙල පැත්තෙ කඳු. ඔය ළඟම පේන කන්ද පාමුලේ තමයි විදුරුපොල පන්සල තියෙන්නේ. එතනින් පුංචිටක් උඩට ආවම පාලුගම, කැප්පෙටිපොළ. එතනින් එහා වැලිමඩ. අපේ ගෙවල් හරියට උඩින් තියෙන කඳුවලට නැග්ගම මීටත් වඩා හොඳට පේනවා. ඒ හරියේ තියෙනවා 'ලක්‍ෂ බංගලාව' කියල සුද්දෙක්ගේ මාලිගයක්. ඒක ළඟට ගියාම එංගලන්තෙ ගියා වගෙ. ඇපල් හදලා, ස්ට්‍රෝබෙරි හදලා. ඇතුළේ බිත්ති ඔක්කොම නැටයම් කරලා ප්ලාස්ටර් ඔෆ් පැරිස් වලින්. කාමර සීයක් තියෙනවා. ඉදල්ගස්හින්න, ඉස්ටේසමට එතන ඉඳල ළඟයි. එතනින් ඔහියට ගියාම ලෝකාන්තෙ යන්න පුළුවන්. ඔයා දන්නවනේ අර 'මොනිකා' 'බිටෝ' කියන ජෝඩුව පැනල මැරුණෙ ලෝකාන්තෙන් පහළට...'

සුරාංගනා කතාවක් අසා සිටින බිළිඳියක මෙන් සුදු නංගී අසා සිටී.

'ජීවිතේ ලස්සනයි කසුන්.'

'සත්තකින්ම'

'ඒත් මට බයයි.'

'ඒ ලස්සන රස විඳින්න මිනිස්සු ඉඩ දෙන්නෙ නෑ, ඒකයි.'

'මට ඕනෑකම තිබුණෙ ඔයාගෙ හිත ළඟ ඉන්න. දැන් ඒක වෙනස් වෙලා. ඔයා මාව දැන් ළඟටම ළං කරගෙන ඉවරයි.'

'දැන් ඉතිං ඈත් වෙන්න දෙන්න බෑ.'

'මං මැරෙන කල්ම ඔයා ළඟ ඉන්නවා.'

'ඉස්සෙල්ල මං මළොත්?'

'කවමදාකවත් වෙන්නේ නෑ. මම මොහොතක්වත් එහෙම වුණොත් ඉන්නේ නෑ. එච්චර අවාසනාවන්ත දෙයක් දකින්න මගේ ඇස් පවු කරල නෑ කසුන්.'



හිරුලයට පෙඟුණු තිල් දෑස මා වෙතට හරවමින් සුදු නංගී කීවා ය. දවල් යිතල උල්පතකින් වතුර බී අපි තණ බිස්සේ සිට ම බත් කැවෙමු. බත් කට කට සුදු නංගී පොඩි දරුවකුට මෙන් මට කැවුවා විනා බත් කන්නට ඕ මට ඉඩ දුන්නේ නැත.

'පොඩි ළමයෙකුට වගේ'

මම කීවෙමි.

'ඔව්. මං හරි ආසයි ඔයා වගේම පොඩි ළමයෙකුට, පුංචි හුරතල් පැටියෙකුට බත් කවන්න.'

සුදු නංගී කීවා ය. මම මුනිවත රැක්කෙමි. මට මතක් වූයේ රෝහාන්ට පියෙකු වීමට නොහැකි බව කියමින් වැළපුණු අයුරු යි.

'ඔයා දැනගෙන හිටියද සුදු නංගී රෝහාන්ට කවමදාකවත් තාත්තා කෙනෙක් වෙන්න බැරි බව?'

'ඔව්.'

'ඔයාව කසාද බැඳල වද දුන්නේ, විකෘති විදිහට රිදෙව්වේ. පළි ගත්තේ ඒ හින්ද කියලත් ඔයා දන්නවද?'

'ඔව් කසුන්. ඒත් ඇයි ඔයා මට අප්‍රසන්න දේ මතක් කරන්නේ?'

'ඔයාව රිදවන්න නෙමෙයි.'

'ඒත් මගේ හිත රිදෙනවා. මම රෝහාන් අතින් කිළිටි වුණා. මාස ගාණක් එයාගෙ වහලෙ යට හිටියා. ඔයාට මං ගැන පිළිකුලක් ඇති. දෙයියනේ එහෙම වෙන්න එපා. පසුගිය දේ මතක් කරන්න එපා කසුන්...'

සුදු නංගී කීවා ය. හැඬුම්බරව කීවත් ඕ හැඬුවේ නැත. එහෙත් මගේ හිත හැඬී ය. ඒ සුදු නංගීගේ හිත රිදුණු බව සිහි වීමෙනි.

For E - Pusthakalaya

# 26

දුක්, කරදර, සංතාප මැද්දේ ජීවිතයේ පරමානන්දය අපි ලබමින් සිටියෙමු. නුවරඑළියේ ගත කළ කාලය තුළ ලිපි කිහිපයක් ම නිරංගට ත්, ගිහාන්ට ත්, උත්තරාට ත්, වාසාගේ මවට ත් තැපැල් කිරීමට අපි සැලකිලිමත් වීමු. හිත සසල වන හැම මොහොතක ම සුදු නංගී මා අුරුලෙහි සැනසෙමින් සෙනෙහස පෙව්වා ය. මම නොවළහා ඇය සිප සැනසීමි. සන්තකින් ම ඇගේ මුවට උඩින් පාත් වී මගේ සුසුමින් ඇගේ දෙනෙත පිය සනහන හැම මොහොතක ම මම රජිඳකු මෙන් සැනසීමි. ඇගේ ජීවිතයේ රජ වීමි. අපි අපේ ලොවේ තනි වී සිටියෙමු. ලේ, මස්, ඇට, නහර මෙන් අපේ ආත්ම මේ කාලයේ දී තදින් බැඳී තිබෙන්නට ඇත. බිරිඳක හා ස්වාමියෙකු මෙන් මේ කාලය අප ගත කළ ත් ලඳමොළඳ පෙම්වතුන් මෙන් හැසිරීමට සුදු නංගිට ඕනෑ වී ය. මම ඇගේ සිතුම් වලට ඉඩ දුනිමි. එහෙත් සිත තනි වන ඇසිල්ලෙක අනියත හෙට දින පිළිබඳ බියකරු සිතුවම් මා තළා පෙළන්නට වී ය. හැම දා ම මේ නාගානන්තර පැවැත්ම ගත කළ නොහැකි ය. අඩු ම තරමින් රැකියාවක් සොයා ගත යුතු ය. මගේ සුදු නංගිට ජීවත් කළ යුතු ය. සතුට සඳන්නට කාලකණ්ණියෙකුට පුළුවන්කමක් නැත. මේ කිසිවක් ම සුදු නංගිට නොකීයෙමි. සියල්ල දරා ගත යුත්තේ මා විසිනි. නිරංග වෙතින් ලද ලිපිය අපගේ මෙම මුහිව්ත බිඳීමට මෙන් ම ජීවිතය නැවතත් පියවරක් ඉදිරියට තල්ලු කිරීමට තරම් මා කම්පනය කරවන්නක් වී ය.



කාමර අංක 08,
බලොම් ෆොන්ටෙන් නේවාසිකාගාරය,
නොරිස් ඇල වීදිය, කොළඹ 08.

හිතවත් සහෘත්,

උඹ එවපු ලියුම් දෙක තුනම ලැබුණා. උත්තරයක් එවන්න පමා කලේ මෙච්චර උඹට පිළිවෙළක් ඇතුව ලියන්න ඕනෑ හින්දා. මට පුළුවන් විදිහට. දන්නා දේ උඹට ලියනවා. සිහි බුද්ධියෙන් තේරුම් ගන්න තරම් උඹේ මනස දැන් සන්සුන් ඇති. උඹ ගැන තියෙන කැක්කුම ගැන නෙමෙයි මම මේ ලියන්නේ. මේ සති හතරට මෙහෙදී සිද්ධ වෙච්ච උඹ නොදන්නා දේ ගැන විතරයි. ඇත්තටම මම හිතුවේ නෑ වාසා ගැන උඹ ඔහොම තීරණයක් ගනීවි කියලා. උඹ කෝච්චියට නැගලා ගියාමයි මට තේරුණේ වැඩේ තිබුණු බරපතලකම. මම එන ගමන් ටවුන් හෝල් එකෙන් බැහැලා උත්තරා හොයාගෙන ගියා. වෙන කාට මේවා කියන්නද? මම යනකොට මධුපානි එහේ ඇවිත්. මම කිව්වා උඹ වාසා එක්ක ගියා කියලා. උත්තරා ඇස් උඩ ඉන්දවාගෙන බලන් හිටියා. මධුපානි විනාඩියක් වත් නොඉඳ යන්න ගියා. පහුවදා උදේම උත්තරා මාව හමුවෙන්න ආවා. මෙච්චර දවසක් උඹට නොකී දේකුත් තිබුණා අපි දෙන්නා අතර. උත්තරා ගැන මගේ ලොකු පැහැදීමක් පසුගිය කාලේ තිබුණා. මේ සති දෙක තුළේ උත්තරා මට හුඟාක් සමීප වෙලා. කොටින්ම උත්තරා මගේ පෙම්වතිය වෙලා. දැන් දැන් මට උඹේ හිතේ වේදනාව තේරෙන්නේ ඒ නිසාමද මන්දා. කොහොම වුණත් මම ඒ ගැන උඹට ලියන්නෙ නෑ වැඩිපුර.

ඒ සතියෙම ආරංචි වුණා ගිහාන් තුවාලයක් වෙලා මහ ඉස්පිරිතාලේ 9 වාට්ටුවට ඇතුල් කළා කියලා. මම උත්තරා එක්ක ගියා . ඩොක්ටර් එතකොටත් ගිහාන් මහරගම ඉස්පිරිතාලෙට මාරු කරලා. උඹට මතකද වේල්ස් කුමරි එකට ගිය රේණු, අර සුදු ගෑණු ළමයා. එයා වැඩ කරන්නෙත් මහරගම පිළිකා රෝහලේ. ගිහාන්ගේ පුංචි සම්බන්ධයකුත් තියෙනවා. කොහොම උණත් දෙකේ වාට්ටුවට ගිහාන්ව දාලා තියෙන්නේ. අපි මහරගමට යන කොටත් රේණු වාට්ටුවේ දොරකඩ. රේණු මහ පුදුම කතාවක් කිව්වේ. උඹට විශ්වාස කරන්නත් බැරි වෙයි. ගිහාන්ට පිළිකාවක්ලු. කකුලේ තුවාලේ තිබිලා තියෙන්නේ එකට. රේණු කිව්වා එයාට මොනවා උණත් ගිහාන්ව අමතක

For E - Pusthakalaya

කරන්න බෑ කියලා. මට පුදුමයි අපි තුන්දෙනා තුන් පැත්තක ගත කරන ජීවිතේ ගැන. උත්තරයි මමයි මාරුවෙන් මාරුවට මහරගම යනව ගිහාන් බලන්න. මට නම් උගේ මූණ බලන්න බෑ. කුමාරයෙක් වගෙ හිටපු කොල්ලෙක් නේද කියලා හිතෙනවා. අපි ගියාම නම් හිනාවෙලා කතා කරනවා. ඒත් ඌ හිනා වෙනකොට කඳුළු ගංගාවක් ඇස් යට නලියනවා. දෛවය පුදුම හාස්කමක් කරලා. රේණු ඒ ඉස්පිරිතාලෙම හෙදියක් කරලා. මම ගිහාන්ට කිව්වා උඹ වාසා එක්ක ගිය විත්තිය. ගිහාන්ට ඊටපසු ලියුමක් ලැබුණා. බොහෝම කනස්සල්ලෙන් ඌ උඹට උත්තරයක් ලියලා. ඒක තැපැල් නොකර රේණු තියාගෙන ඉන්නවා. රේණු හොඳ කෙල්ල. ගිහාන් කියනවා සේරම හරි මට මොනවා උණත් කමක් නෑ රේණු ගැන දුකයි කියලා. රේණු කියනවා ආත්මයක් ආත්මයක් ගානේ ගිහාන් ළඟ ඉන්නවා කියලා. කසුන්, දෛවය පුදුම විදිහට වෙනස් වෙච් අපිට බලපෑම් කරනවා. ගිහාන්ගේ ප්‍රශ්නේ නිසා අපිට රොහාන්ලා ගැන හොයන්න වෙලාවක් තිබුණෙ නෑ. පස්සේ දැන ගත්තේ වාසාගේ අම්මා ගල්කිස්සේ ගේන පාරේ ඇනෙක්ස් එකක පදිංචියට ඇවිල්ලා කියලා. පණිවිඩේ ගෙනාවෙ උත්තරා. මම උත්තරා එක්ක එහෙ ගියා.

'මම හැමදේම කළේ මගේ දුවට. රට ගියේ දුවට බෙහෙත් කරන්න සල්ලි හොයන්න. මහත්තයා අකාලේ මැරුණේ ඒ ගමන නිසා. ඒත් දුව සතුටින් තියන්න අපිට බැරි වුණා. දුවගේ ජීවිතේ හොඳටම නාස්ති වුණා. මම රොහාන්ට රැවටුණා. එයා සල්ලිවලින් හැම දේම ලස්සන කරන්න බැලුවේ. අනේ පුතේ? මට මගේ කෙල්ල ඉන්න තැනක් දන්නවා නම් කියන්න. එයාගේ කැමැත්ත. එයාගේ සතුට. මට තවදුරටත් ඒ අයට අකුල් හෙළන්න බෑ. ඒත් දුව අසනීපකාරී. මං දුවගේ ළඟ ඉන්න ඕනෑ. මං දන්නවා කසුන් ළමයා එයාට ආදරේ විත්තිය. ඒත් එයාට සැප සම්පත් දෙන්න ඕනෑ. මගේ දුව දුක් විඳිනවා බලන්න මට බෑ. මහත්තයා හැම මොහොතෙම කිව්වේ දුව ගැන, එයාගේ බලාපොරොත්තු මම ඉෂ්ට කරන්න ඕනෑ. මං දන්නවා මහත්තයා ඒ ලෝකේ ඉඳලා දුව ඉන්න තැන බලාගෙන ඇති. මම සිරිමල් උයනෙන් ආවේ ඒකයි. කසුන් ළමයට දුවත් එක්ක මෙහෙ ඉන්න පුළුවන්. රස්සාවක් හොයා ගන්න කල් හැංකු පොතේ සල්ලි ඇති අපිට ජීවත් වෙන්න. මට මේවා විඳවන්න බෑ පුතේ..'



මන්න ඔහොමයි වාසාගේ අම්මා කතා කළේ.

රොහාන් හමුවෙන්න යන්න වුවමනාව තිබුණත් අපි ඒ සුමානේ ගියේ නෑ. ඒත් දැනට දවස් තුනකට ඉස්සර රොහාන් මෙහෙ ආවා. කනාමදියා වගේ කීලා. කාර් එක එළවගෙන ආවේ 'බර්ටි' කියලා රත්මලානේ චණ්ඩියෙක්. රොහාන් උදේ ඉඳලා රෑ දවල් නැතුව අරක්කු බොනවා කියලා මට කිව්වේ බර්ටි.

'හරහ වෙන්න එපා බොස්. රත්තරං වටින ජීවිතයක් මේ බලා නැති වෙන්නේ. අපේ මහත්තයට කරදරයක් වුණොත් පරම්පරා ගාණකට සුදු කොඩි දලා තමයි අපි පස්ස බලන්නෙ' ඒ මිනිහා කතා කළේ එහෙම . ඒත් රොහාන් බොහොම නිහඬව කතා කළේ.

'මේක මගේ කරුමේ නිරංග. මට බැරි වුණා වාසා තියා ගන්න. පුංචිම කාලේ ඉඳලා මම ඕකිට ආදරේ කළේ. බම්බලපිටියේ වජිරාරාම දහම් පාසැල් යනකොට මම උදේම නැගිටලා බලා ඉන්නවා. ළමා සාරිය ඇඳලා කොණ්ඩේ හිහියට ගොතලා අම්මණ්ඩි වගේ තැඹිලිව කමට ගස්සල යනකොට මට උකුලේ තියාගෙන ඉන්න හිතිල තිබුණා. ඊහිගේ තිබුණු හුරතලේ? පිස්සු හැදෙනව බං. ඔළුව පද්ද පද්ද හින්දි සිංදු කියන කොට ආසාවේ බෑ බලා ඉන්න. අභිමාන් එකේ තෙරේ මෙරේ සින්දුව ඒ විදිහටම කියනවා. අභිමාන් එකේ 'උමා' කළේ අරං 'නදියා' සින්දුව කියනව වගේ සෙම්බුව අරං වත්තෙන් ඉඳල සින්දු කියනවා. හරන නැටුම් නටනවා දෙව්ඟනක් වගේ. එහෙව් එකීට මං ආදරේ කළේ. ඒත් වාසා පුරුවේ කරුමෙකට මට වෛර කළා. මට කරුමෙ දෙගුණ වෙන්න කම්මුල්ගාය හැදිල වඳ මිනිහෙක් වුණා. ඒ දෙකෙන්ම පළි ගන්න මං විකෘති මිනිහෙක් වුණා. ජරා වීඩියෝ බලල බලල මං වාසා එක්ක හැසිරුණේ. ඒත් මගේ යටි හිත කැක්කුම් දෙනවා. මේව කවුද දන්නෙ.'

එහෙම කියලා රොහාන් අරක්කු බෝතලේ ඉතිරි වෙලා තිබුණු කාලක් විතර බෝතලෙන්ම කටේ හළා ගත්තා. ආපහු යනකොට මෙලෝ සිහියක් නෑ. කාවෙන් වහලවූ සුමාන දෙකක්.

මේව සේරම උඹට ලිව්වෙ මං දන්නා කරමින්. නොදන්නා දේ තව බොහෝ විය හැකියි. කඩලෙන් ලියට වැටෙන්නේ නැතුව දැන්වත්

කල්පනාවෙන් වැඩ කරපං. දැනටත් උඹේ වයසට පැනල තියෙන පිම්ම හොඳටම ඇති. උඹට පුළුවන්නම් ලියුමක් විස්තර ඇතුව එවපං. වාසාගේ අම්මට විශේෂයෙන්. මම සුවෙන්. උඹටත් වාසාටත් දෙවි පිහිට!

මං,

හිතවත්,

නිරංග.

නිරංග එවූ පළමු ලිපිය මා කම්පනය කළ පමණ මම සුදු නංගිට නොකීවෙමි. එහෙත් ඇය එය තේරුම් ගත්තී ය.

'වෙන්න තියෙන දේවල් වළක්වන්න බෑ කසුන්.'

මම කතා නොකළෙමි. කතා කරන්න දෙයක් මට තිබුණේ නැත. නිරංග උත්තරා සමඟ පෙම් සබඳතාවක් පටන් ගැනීම හැර නැවුම් ආරංචි එකක් වත් එහි නොතිබිණි. උත්තරා පිළිබඳව නිරංග පෙමින් වෙළී ඇතැ යි සිතීම පවා මට යම් සතුටක් ළඟා කර දෙන්නක් වී ය. එහෙත් ඒ සිතිවිල්ල කුමක් අරබයා මා සතුටු කළා දැයි මම නොදනිමි. ලොකු අප්පච්චිගේ උද්ධච්ච හිත රිදවීමට උත්තරාගේ ප්‍රේමය සමත් වෙතැ යි යන අසත්පුරුෂ සිත මා තුළ නොතිබුණා ම නොවේ. ත්‍රිකෝණයක පාද මෙන් සිටි මම ත්, නිරංග ත්, ගිහානු ත් පිළිබඳ වර්තමානය දෛවෝපගත ලෙස විසඳෙමින් ද, විටෙක රිදවමින් ද ක්‍රියාත්මක වන්නේ නොවේ ද? ගිහාන් රෝගියෙකු ලෙස මහරගම පිළිකා රෝහලේ නේවාසික කිරීම සියල්ලට ම වඩා මා රිදවූ ආරංචිය වී ය. මම නිරංග බාරේ ගිහාන්ට දීර්ඝ ලිපියක් ලිවෙමි. නිරෝගී සුව පැතීමි. රේණුට ද ඒ සමඟම ලියුම් කැබැල්ලක් ලිවෙමි. ඔ එකී රෝහලේ ම හෙදියක ලෙස පත් වී සිටීම දෛවයේ සරදමක් නොවේ ද? සුදු නංගී මේ සියල්ල ම පරයා අම්මා පිළිබඳව වැළපෙන්නට වූවා ය.

'කසුන්, අම්මට ලියුම් දැම්මම තවත් මං එයාට රිදවනා එක හොඳ කරන්නෙ?'

'අපි ඉක්මනින් පිළිවෙලක් වෙලා අම්මා බලන්න යමු.'



එහෙත් අප පිළිවෙලක වීමට සූදානම් වී බදුල්ලේ පුංචි ගෙයක් ද බැලීමට සූදානම් වූ දිනයේ සුදු නංගී මා අසලට වීත් දැවටි දැවටී සෙනෙහස පෑවා ය. සෙනෙහස ඉල්ලා සමීපයට වීත් ඇය මගේ මුහුණ ඇගේ පැත්තට හරවා ගත්තී ය. මාස දෙක හමාරක් පමණ ලොකු අක්කලාට කරදර කරමින් අප ගෙවන ජීවිතය කෙරේ සුදු නංගී සිත රිදවා ගෙන ඇතැ යි මම සිතිමි.

'අක්කලාට කරදර කරන්නත් බැහේ සුදු නංගී. බදුල්ලේ ගේ කුලියට අරන් එහෙ යමු.'

'ඒත් ඉතිං කසුන්ට ඉක්මනින් රස්සාව ලැබුණොත්නෙ?'

මට රැකියාවක් හොයා දෙන බවට ලොකු අක්කාගේ සැමියා පොරොන්දු වී තිබිණ. එළවළු මුදලාලි කෙනෙකු ළඟ ලියන්නෙකු මෙන් වැඩ කිරීමට හැකි බව ත්, ටික කලක් එය කිරීම සුදුසු බව ත් ඉන් පසු කොළඹ ගොස් නැවත සරසවි අධ්‍යාපනය ඇරඹීම සුදුසු බව ත් ඔහුගේ අදහස වී ය.

'කසුන්?'

සුදු නංගී නැවතත් දෑසට එබී කතා කළා ය.

'ඇයි? ඔයා බදුල්ලේ යනවට අකැමතිද? වෙන කරන්න දෙයක් නෑ. ගෙයක් කිව්වට ඒක පුංචි ඇනෙක්ස් එකක්ලු. රුපියල් හාරසිය පනහ කට ලාබයි. ටික දවසක් එහෙ ඉමු. කාලයට ඉස්සර ප්‍රශ්න ඔළුවට ගන්න ඕනත් නැහෙ.'

'කසුන්?'

සුදු නංගී මගේ අත අල්ලා මිරිකා ගත්තී ය. මම දෑසට එබී සිටියා විනා කතා නොකළෙමි. වැළමිට දක්වා මම ඇගේ අත පිරි මැද්දෙමි. ඉන් පසුව ඒ අතින් ම ඇ මගේ පැත්තට ඇද ගෙන උරහිසට හේත්තු කොට ගත්තෙමි.

'කල්පනා කරන්න එපා. ඔයාට රහසක් තියෙනව කියන්න.'

'ඇයි? ඔයාට කොළඹ යන්නවත් හිතුණද?'

For E - Pusthakalaya

'ඔයා තාත්තා කෙනෙක් වෙන්න වගේ'

මහත් සතුටින් ඉපිලෙමින් සුදු නංගී මිමිණුවා ය. මට කතා කරන්නට දෙයක් තිබුණේ නැත. මම මිදුලේ කොරිඩෝරය දෙසට නෙත් හෙළිමි. 'ලබ් ඩබ්... ලබ් ඩබ්' යන හඬින් හද ගැස්ම වේගවත් වනු මට දැනේ. මුහුණේ දහදිය බිංදු එක දෙක මතු වන්නට ඇත. සියල්ල අවබෝධ කර ගත්තා මෙන් සුදු නංගී මුහුණ අඳුරු කර ගත්තා ය. ඇගේ මුහුණ ටිකින් ටික අඳුරු වනු මම බලා සිටිමි. කඳුළක් ගිලිහෙන්නට ආසන්නව තිබියදී මම ඇය සිප ගතිමි.

'ඔයා කල්පනා කරනව රත්තරං.'

සුදු නංගී මගේ මුහුණ ත් උරහිස ත් අතර ගෙලේ මුහුණ ඔබා ගනිමින් කෙඳිරි ගෑවා ය.

'නෑ මට අදහාගන්න බැරුව ගියා.'

මම සුදු නංගී තරමක් ඈතට වන්නට දෑතින් ම උරහිසට තල්ලු වක් දී මුහුණ බැලිමි. සතුට ත් කඳුල ත් එක්වූ කළ සුදු නංගීගේ දෑස තව නවත් ලස්සන ය. මම හිමින් පහත් වී ඇගේ කුස සිප ගතිමි. අප දෙදෙනාගේ ම මුහුණුවල බැරෑරුම් බවක් රෝපණය වී තිබෙන්නට ඇත.

'ඔයා ලොකු අක්කට කිව්වද?'

'අද කියන්න ඕන. ඒත් මට ලැජ්ජයි.'

'ඔයා ලොකු අක්කට කියන්න සුදු නංගී. දැන් ඉතින් නොකියා ඉන්න එපා. අපි දන්නෙත් නැනේ.'

සුදු නංගී මගේ ළඟින් නැඟී සාලයට ගියා ය. මම වෙන දට වඩා විමසිලිමත් ලෙස සුදු නංගී දෙස බැලිමි. ඇගේ කුස දෙස බැලිමි. මට නම් වෙනසක් නොපෙනේ. සතුට ත් සමඟ ගිනි කන්දක උණුසුමක් ද, හිමාලයක සීතලක් ද, එකතුව මගේ හදවත වේගයෙන් ගැහෙයි. වෙන දට ත් වඩා දැන් ඉතින් සුදු නංගී බලා ගත යුතු නොවේ ද? රැකියාවක් හෝ ඉන්න තැනක් නැති කාලකන්නියෙකුට තාත්තා කෙනෙකු විය හැකි ද? මම පසුව ද උදේ ම රැකියාව හා ඇනෙක්සිය



පිළිබඳ විමසීමට බදුල්ලේ යාමට සිතා ගතිමි. සුදු නංගී ද සමඟ වෙලේ පිල්ලට ගොස් දිය නා ගතිමි. පිල්ලට යන එන තෙක් ම මම ඇගේ අත මුදා හැරීමට අකැමති විමි. අමාරුවෙන් පල්ලම් බහින කල සුදු නංගී හොරැහින් බලා මෙසේ කියයි.

'එපා කපුන්. මට අඩිය තිබ්බැකි.'

'ඒ උණාට ඔය ගලක්වත් පෙරළිලා වැටෙයි.'

අපි සීතල වතුර නා ගෙන ගෙට ගොඩ වන විට තිරංගගේ අත් අකුරින් නවත් ලිපියක් මේසය මත වී ය. ලියාපදිංචි තැපැලෙන් තිබූ ලිපිය මම අතට ගතිමි.

'මල්ලී... රෙජිස්ටර් ලියුමක් තිබුණා.'

අක්කා කුස්සියේ සිට කෑ ගැසුවා ය. මම ලිපිය කඩා කඩිනමින් එය කියවිමි. සුදු නංගී මා අසළ පුටුවේ වාඩි වී තෙත කොණ්ඩය මුදා හරිමින් සිටියා ය. මගේ මුහුණේ නැඟුණු දඩිය බිඳුවලට සුදු නංගීගේ වරලසින් නික්මුණු දිය පොදවල් සිසිලසක් එක් කරන්නට ඇත. මම ලිපිය සුදු නංගීට දුනිමි. එක් අතකින් වරලස ගස්සා පිට මැදට හළා ගත් ඇය ලිපිය කියවන්නට වූවා ය. අම්මා සාංකාවෙන් පසුවන බව ත් රොහාන්ට ඇල්කොහොල් වැඩි වී 'සිරෝසිස්' රෝගය වැළදීමේ පෙර නිමිති පෙන්වන බව ත් ලිපියේ සඳහන් වී තිබිණි. ලිපිය කියවා සුදු නංගී හිස පුටුවට බර කොට ගත්ති ය.

# 27

සති අන්තයේ දී බදුල්ලේ ඇහොප්ස් එක පිළිබඳ ආරංචිය අපට ලැබිණ. මම බදුල්ලේ යෑමට සූදානම් වීමි. උදේ ම සුදු නංගි පිච්ච වැල අසට වී වීදුරුපොළ කන්ද පැත්ත බලා සිටියා ය. හිම කැටයක් මෙන් මුළු මිදුල ම සීත ය. කඳුකරයේ පාන්දර සීතල!

'සීතලේ ඉන්න එපා. අර ජර්සි එකක් දාගන්න.'

මම ජනෙල් පියනක් අතරින් එබී කීවෙමි. සුදු නංගි ගෙල පැත්තට හරවා යාන්තමට සිනාසුණා ය. ඇයට හොරෙන් මම මිදුලේ අනෙක් පැත්තට ගොස් ඇ දෙස බලා සිටියෙමි. සමන් පිච්ච වැලේ සුදු ම සුදු මල් පොකුරු සිය ගණනක් පිපී ඇත. එය පිච්ච මල් ගාලකි. සුදු නංගි සීතල දෑත පපුවට බැඳ තද කර ගෙන පිච්ච පොකුරකට මුහුණ ඔබා සිටියා ය. පුංචි හිනි පිනි බිංදු ඇගේ මුහුණේ තැවරේ. කුඩා දෙබරියක මෙන් ඕ මල් පොකුරින් පොකුරට එබෙයි. ඇයගේ මුහුණේ උදේ පින්න තැවරී තිගැඩූ පිපී ඇත. මම පිටු පසින් ගොස් උරහිසින් අල්ලා ඇය මගේ පපුවට තද කොට ගතිමි.

'සුදු පිච්ච ගොඩේ ඉන්න කොට මට සුදු නංගි අඳුරන්න බැරි වුණා. මල් ගාලේ යන්න එපා. මලක් කියල රවටෙයි.'

මම පිටු පස සිට ම ගෙලට උඩින් කම්මුල ඉදිරියට දමා ඇගේ දෙකම්මුලේ තවරා ගතිමි. සීතල තැවුම් පිනි සීතල මගේ කම්මුලේ තැවරේ.

'හරි තැපයි කසුන්...'



මගේ මුහුණ ත් උරහිස ත් අතර හෙළේ. සුදු මුහුණ සඟවා ගත් සුදු නංගි හොසෙල්වී සිටියා ය. මම හිමි හිමින් ඇගේ ලමිඳු මුව තුස දෙසට අතින් පිරි මැද්දීමි. ඕ යටැසින් මා දෙස බැලුවා ය.

'එපා කසුන්. පුංචි පැටියෙක් ඉන්නවානෙ වගෙයි.'

සුදු නංගි මුදු ලෙස මිමිණුවා ය. මම ඇගේ ඇහි බැමි සිවුණු හිනි පිනි බිඳු දෙතොලින් උරා ගතිමි.

'ඒයි... අත්ත දකිවි...'

මගෙන් මිදෙමින් සුදු නංගි ඈතට පැන කීවා ය. මම ඈතට ගිය සුදු නංගි දෙස දුකින් බැලීමි. ඇය දෙසට අත දිගු කර සමීපයට එන ලෙස දෑසින් කීවෙමි. කවු ලැලිණියක් මෙන් ඕ අතේ එල්ලුණා ය. ඇගේ උරහිසට උඩින් දෑත දමා මම ඇය ත් සමඟ ළිඳ ළඟට ගියෙමි. ඇය බාල්දිය ළිඳට දමන්නට පෙර නිසල ජල තලය දෙස බලා සිටියා ය. අපේ ඡායාවල් ළිං පතුලේ පෙනේ.

'ළිඳේ අඩිය හිරු නොබලන පින්නේ

එබී ළිඳට ඇයි නුඹ හිනැහෙන්නේ'

මම ගීයක පද පෙළක් මව්වමට කීවෙමි.

'බාල්දිය ළිඳට දැම්මම අපේ ඡායාවල් දෙකම මැකිල යාවි. මට දුකයි ළිඳට බාල්දිය දන්න.'

ළිං පතුල දෙස බලමින් ඇය කියයි. මම සුදු නංගිට මුහුණ සේදීමට වතුර බාල්දි දෙකක් ඇද බේසමට වත් කළෙමි. සුදු නංගී මුව දෝවනය කරන තෙක් මම ළිං බැම්මේ වාඩි වීමි. වරලස ගස්සා පිට මැද්දට හළා ගත් ඕ මුහුණ සේදුවා ය.

'බදුල්ලේ ගියාම අපිට මෙච්චරවත් පහසුකම් ලැබෙන එකක් නෑ සුදු නංගී.'

'කමක් නෑ කසුන්. මට පුළුවන් ඔයත් එක්ක ලැබෙන දෙයින් සතුටු වෙලා ඉන්න.'

'ඔයා කලකිරේවි මං ගැන...'



For E - Pusthakalaya

For E - Pusthakalaya

'කවමදාකවත් නෑ කසුන්. මට දුක ඇත්තටම ඔයා ගැන. කොයිතරම් මං වෙනුවෙන් පරිත්‍යාග කළාද කියලා?'

මම මුහුණ සෝදන අතර කුවාය උරහිස වැසෙන සේ වෙළා ගත් සුදු නංගී පේයාස් ගස යටට වී සිටියා ය. අපි උදේ තිල් බත් කා අක්කා සමඟ බදුල්ලේ ගමන පිළිබඳ කතා කළෙමු.

'මට පොඩි මල්ලි කොච්චර කල් මෙහෙ හිටියත් ප්‍රශ්නයක් නෑ. ඒත් අපරාදේ කැම්පස් එක දාල මෙහෙම ගෙවන ජීවිතේ තේරුමක් නෑනේ. බදුල්ලේ ටික දවසක් රස්සාවක් කරල කොළඹ ගිහිං උපාධිය කර ගත්තනම් හොඳ රස්සාවක් කරන්න පුළුවන්.'

ලොකු අක්කා කීවා ය. එහි යම් ඇත්තක් තිබුණ ත් සත්‍යයක් වුව ත් පියවරෙන් පියවර මිස ජීවිත තීරණ ගැනීමට මම දැන් බිය වෙමි. සුදු නංගී පමණක් නොව තවත් ජීවිතයක් ද අප අතරට ඒමට සූදානම්ව සිටී. සුදු නංගී සිටියේ මා අසළ නොව අක්කා සමීපයේ ය. මම කාමරයට ගොස් බදුලු ගමනට සූදානම් වීමි. අවශ්‍ය දෑ සුදු නංගී මට සකස් කොට දුන්නා ය. කමිසය ත් කලිසම ත් මැද සපත්තු දෙකේ දූවිලි ද පිස දැමුවා ය. මම ඇඳුම් ඇඟ ලා ගන්නවා ඇඳේ වියලට හේත්තු වී ඕ බලා සිටියා ය. මම ඇගේ හිස අත ගා නලල සිප ගතිමි.

'පරිස්සමින් කසුන්.'

නොවැරදීම සුදු නංගීගේ මුවින් පිටවෙන වදන් මම එදත් ඇසීමි. මම කඩුල්ල ළඟට යන තෙක් අක්කා ත් සුදු නංගී ත් මිදුලට වී මා දෙස බලා සිටියා ය. මම අත ඔසවා සමු ගනිද්දී දෙදෙනා ම මට සමාචාර දැක්වූ හ. බැලුම්ගල කඩය ළඟට වී නුවරඑළියේ සිට බදුල්ල දක්වා එන බසයක් බලමින් මම හුදෙකලාවේ සිටියෙමි. වැලිමඩ පැත්තේ සිට ආ බසයකින් දන්නා හඳුනන දෙදෙනෙකු බිමට බසිනු දැක මං ගල් ගැසුණෙමි. සැඟවීමට තබා අඩියක් එහා මෙහා කිරීමට ඉඩ ලැබුණේ නැත. නිරංග චාපාගේ මව ත් සමඟ මා අසළට පැමිණ කතා කළේ ය.

'කොහෙද පාන්දරම? අපිම එන්න ඕන උඹල හොයාගෙන.'



නිරංග මා සමීපයට එමින් කීවේ ය. මම විස්මිත වීමි. මම චාපාගේ මව දෙස බැලීමි. ඇය සිනාසුණා ය. මට ලෙන්ගතු වී ය. බදුල්ලේ ගමන නතර කළ මම ඔවුන් දෙදෙනා ද සමඟ නැවතත් ගෙදර ආවෙමි. සුදු නංගී ඩැහැගෙන යාමට පැමිණි ගිජුලිහිණියන් ලෙස මට නිරංග ත් මව ත් පිළිබඳ සිතිවිලි මතු වෙන්නට වී ය. ඔවුහු සුදු නංගී රැගෙන යතැ යි මම සත්තකින් ම සිතීමි. නිරංග කෙරේ මා සිතේ ඉපදුණු තරහ පිටාර යාමට ආසන්න වෙමින් තිබිණ. ගෙදර මිදුලට පැමිණීමට පෙර ම මම නිරංගට එය අවධාරණය කළෙමි.

'උඹ මොකක්ද මේ කරන්න හදන කෙහෙල්මල? නිරංග. සුදු නංගී එක්ක යන්න එක වචනයක් හරි චාපාගේ අම්ම කතා කළොත් මං මහ දරුණු පියවරක් ගන්නවා. උඹ ඒකට වග කියන්න ඕන.'

මම නිරංගට කීවෙමි. ඔහු මගේ පිටට තට්ටු කොට සිනාසුණේ ය.

මම කුස්සිය පැත්තෙන් ගෙට ඇතුළු වී කාමරයට ගොස් සුදු නංගීට කතා කළෙමි.

'ඒයි.... අම්ම ඇවිල්ලා...'

මම සාලයට ගොස් දොර හැරියෙමි.

'එන්න අම්මෙ....'

යැයි චාපාගේ මවට ආමන්ත්‍රණය කළ මම නිරංගට වාඩි වන ලෙස හිසින් සන් කළෙමි. නිරංග වැඩි හඬකින් මෙසේ කීවා ය. ගෙදර ඇතුළේ යමෙකු සිටී නම් ඔවුනට ද ඇසෙන සේ කතා කිරීමට නිරංගට අවැසිව තිබිණ.

'අපි උඩරට මැණිකේ රෑ කෝච්චියේ ආවේ. හපුතලේ ගෙදරටත් ගිහිං ආවේ.'

ඒ සමඟ ම ලොකු අක්කා කුස්සියේ වැඩ කරමින් සිට තෙත් වූ අත පිසිමින් සාලයට වී දොරට හේත්තු වූවා ය.

'මේ අපේ ලොකු අක්කා. අක්කේ.... මේ චාපාගේ අම්මා. මේ නිරංග. මෙඩිකල් ෆැකල්ටියේ මගේ යාළුවෙක්.'

චාපාගේ මව සිනාසුණා ය. චාපා සාලයට පැමිණියේ නැත. අම්මා කාමරවලට එහෙන් මෙහෙන් කොකම් පෑවා ය.

For E - Pusthakalaya

'නංගියේ...'

ලොකු අක්කා කාමරය දෙසට එබී කතා කළා ය. පසුව වාසාගේ මවට මෙසේ කීවා ය.

'ඉන්න මං නංගීට එන්න කියන්නම්.'

අක්කා ත් මම ත් කාමරයට ගියෙමු. සුදු නංගී කාමරයේ සිටියේ නැත. ඇතුළු කාමරයට ද අපි ගියෙමු. සුදු නංගී එහි ද නැත. අක්කා මගේ මුහුණ බැලුවා ය. මම සාලයට ගියෙමි.

හදවතේ ගැස්ම හිර කර ගත් මම සාලයට මුහුණ දැම්මෙමි. සුදු නංගී මවගේ දෙපා මුල දණ ගසා හිස උකුළට බර කර ගනිමින් සිටියා ය. ඇය හඬන බව මම දනිමි. නිරංග ජනේලයෙන් ඈත එපිට බලමින් සිත පමණක් සාලයේ රඳවා සිටියේ ය. ලොකු අක්කා කුස්සිය පැත්තට ගියේ තේ හදන්නට බව දත් මම ඇය දෙස හැරී නොබැලීමි. වාසා කිසිදු වචනයක් කතා නොකර හැඬීමෙන් පමණක් හැඟීම් පිට කළා ය. මවට කියන්නට බොහෝ දේ සුදු නංගිගේ හිතේ තෙරපෙන්නට ඇත. තමා මවක් වන්නට යන බව අම්මා ඉදිරියේ කියා ගන්නට වාසාට ඕනෑ වන්නට ඇත. මම මහා දුකකින් ඇය දෙස බැලීමි. එත් මගේ මුහුණේ තිබුණු හැඟීම තේරුම් ගන්නට වාසා මා දෙස බැලුවේ නැත. දුවගේ හිස සෙනෙහසින් පිරි මදිමින් කඳුළු කැට දෙක තුනක් හැළුවා මිසා මව ද කතා කළේ නැත. අක්කා තේ සාද සාලයට පැමිණි විට මම කතා කළෙමි.

'තේ බොන්න...'

මා තේ කෝප්පය අතට ගන්නා විට වාසා නැගිට දෙර ළඟට ගියා ය. ඇගේ ත්, මගේ ත් දෑස් ගැටුණේ එ විට යි. ඕ බිම බලා ගත්තී ය. ඇය ඩැහැ ගෙන යෑමට ඇගේ පංතියේ හිමිකරුවන් පැමිණ ඇතැ යි සිතූ මම ඇසිපිය නොහෙළා ඈ දෙස බලා සිටියෙමි. මා තුළ තිබූ හැඟීම ගිනි පතුලේ වැදී පුපුරු ගසන්නට වී ය. මගේ පපුවේ තිබූ වේදනාව සුදු නංගී තේරුම් ගත්තා දැයි මම නොදනිමි.

'මූණ සෝදලා ඇඳුම් මාරුකර ගන්න. කෝච්චියේ ඇවිල්ලා මහන්සිත් ඇතිනේ.'



ලොකු අක්කා ඉස්සරහ කාමරයට යන ගමන් කීවා ය. සුදු නංගී මව ත් සමඟ ඉදිරි කාමරයට ගිය අතර මම නිරංග ත් සමඟ ඇතුළු කාමරයට ගියෙමි.

'උඹ නිකං හොම්බට අනින්න වගේ ඉන්නෙ. නැන්දම්ම ආවෙ දුව එක්ක යන්න කියල හිතුවද?'

නිරංග සපත්තු දෙක ගළවා ඇඳ යටට තල්ලු කරන ගමන් විමැසී ය.

'ඇයි උඹ හිතුවද මං වාසාව බලෙන් ගෙනාව කියලා. දැන් ඉතිං අපි වෙන් කරන්න අපේ මිනී පෙට්ටිවලට ඇණ ගහන්න ඕන. මම හැම දේකින්ම දිනුම්. උඹ ඒක දන්නවද?'

'උඹට මන්දන්නෑ – උඹේ දුෂ්ඨයාට නම් සුදු කොඩි දන්ව වෙයි වගේ?'

'උඹ රොහාන් ගැනද කියන්නෙ?'

'ඔව්.'

'ඌ දුෂ්ඨයා නෙමෙයි නිරංග. මට දැන් රොහාන් ගැන දුකකුත් හිතෙනවා. පිරිමියෙක්නෙ.'

'රොහාන් අද ඊයෙක නෙමෙයි බොන්ඩ පටන් අරන් තියෙන්නෙ. උඩින් පේන පෞරුෂය රොහාන්ගේ ආත්මෙ නෑ. දුර්වලයෙක්.'

සරම වලල්ලක් කොට හිසට උඩින් දමා ගනිමින් ම නිරංග කී ය.

'දුෂ්ඨයෙක් වගේ හැසිරුණේ ඒ හින්ද කියල මං දැන් දන්නවා.'

'වාසා ගැන උගේ හිතේ තිබ්බ හැඟිම ආදරෙන් කියන්න බැරිකමට තිරිසනෙක් වගේ වෙලාවකට හැසිරිලා. දැන් ඉතිං මෙලොව සිහියක් නැතුව බොනවා. ඩොක්ටර් කියලා සිරෝසිස්වලට එයි කියලා. දැනටමත් බඩ ටිකක් ඉදිමිලා ඉස්සරහට ඇවිල්ලා.'

තව දුරට ත් රොහාන් පිළිබඳ කතා කිරීමෙන් වැළකුණු මම ගිහාන් පිළිබඳව විමැසීමි.

For E - Pusthakalaya

කැන්සර් එකක්ද කියල තවම හරියටම දන්නේ නෑ. ඒත් සැකයි. කොළඹ ඉඳලා මහරගමට මාරු කළේ ඒ හින්ද කියල තමයි කියන්නෙ. වෙලාව කියන්නේ රේණුත් වැඩ කරන්නේ මහරගම.'

නිරංග ඇඳේ අසළින් වාඩි වී බෑගයට අත දමා මෙසේ කීවේ ය.

'දැන් ඉතිං වාසාගේ අම්මා කරගන්න දෙයක් නැතුව ඉන්නෙ. ජේනපාරේ ඇනෙක්ස් එකක් අරං ඉන්නේ. ප්‍රශ්න අස්සේ උඹ මෙහෙ ඉන්න එකේ තේරුමක් නැනේ. එහෙ ගිහිල්ලා වාසාගේ අම්මත් බලාගෙනම හිටපං. කැම්පස් එකේ ලෙක්චර්ස් උණත් යන්න පුළුවන්.'

'දැන් එහෙම ලේසියෙන් තීරණ ගන්න බෑ නිරංග'

මම එසේ කියා නිරංගගේ මුහුණේ පිළිබිඹුව දෙස නෙත් හෙළීමි. ඉන්පසු මෙසේ කීවෙමි.

'මං තාත්තා කෙනෙක් වෙන්න යනවා.'

'නැක්....'

නිරංග මගේ උරහිසින් අල්ලා කී ය.

'ඇයි උඹට පුවර් නැද්ද?'

'මට නෙමෙයි අර ඉස්සරහ ඉන්න නැන්දම්මට කියපං.'

නිරංග සිනා සළමින් නැගිට්ටේ ය.

'උඹට උත්තරාගෙනුයි මධුගෙනුයි ලියුම් දෙකක් ඇති.'

නිරංග ඇඳේ තිබූ බෑගය පෙන්වමින් කී ය. මම පළමුව මධුගේ ලිපිය ගෙන කියවීමි.

දයාබර කසුන්:

සඳ ඇති රැයක සිහිනෙන් හෝ හමුවෙන්නම්
ඔබ පැතුමන් ඉටුවෙනු දැක සැනසෙන්නම්
මේ අත් බැවේ මෙලෙසින් ඔබ වෙන්වූණිනම්
ඔතු අත් බැවේ හමුවෙන තුරු තනිවෙන්නම්.



ආයෙත් කවමදකවත් මෙහෙම අමතන්නේ නෑ.' මේ අන්තිම ලියුම. දයාබර කසුන් කියල ඇමතුවෙ ඇත්තටම මං ඔයාට දයාබර හින්ද.

ඒත් දෙවියනේ මිරිඟුවක් පස්සෙ දිවව මුවපොව්වෙක් වගේ මං අතර මං වුණා. කමක් නෑ. මේක මගේ ලැබීම. ඒත් මං ඉස් ඉස්සෙල්ලාම හිතේ පෙම් හැඟීමක් ඇති කරගත්තේ ඔයා හින්ද. මගේ හිතේ පිරිල තියෙන දයාබරකම ඔයා දන්නවනම්, මට ඔයා වෙනුවෙන් මැරෙන්න උණත් පුළුවන්. මං මහා පිස්සු කෙල්ලෙක් නෙමෙයි. මං ඔය හිත දන්නව දෙයියනේ. ඒක කොච්චර හැඟීම්වලින් බරයිද කියල මං දන්නවා. පුංචි පෙම්වතියකගේ හිතේ තියෙන නොඉඳුල් නැවුම්කම දකින්න තරම් ඔය හිත පිං කරල තියෙනවා. අනන්ත සංසාරේ පෙරුම් පිරුවත් ඔය වගේ හිතක් නොලැබෙන බවත් මං දන්නවා. ඒත් මං කොච්චර අවාසනාවන්තද? මං දන්නව දැන් ඉතිං මට කවමදකවත් ඔය මූණ ආයෙත් බලන්න බෑ. ඔයාගේ සුදුනංගී කොච්චර වාසනාවන්තයිද කියල මට හිතෙන්නෙ දැන්. වෙලාවකට මට හිතෙනවා මං ඔයාගේ සුදු නංගී උනානම් කියල. මං එහෙනම් කොච්චර සතුටින් දුක සතුට බෙද ගන්නවාද? ඒත් මං සුදු නංගීට සුභ පතනවා. ඔයාගේ රත්තරං ජීවිතේ වාසනාවන්ත කරන්න හවුල් වුණාට. ඒත් මගේ මේ වේදනාව මට නොකියා බෑ. ඉතිං අහන්න මං කවමදකවත් නොකිව මගෙ කතාව.

මං මේව කියන්න ඕන. අඩුම ගානේ ඔයාටවත්. මගේ ගුරුවරයෙක් වගේ ඉන්න කාලෙම මං දැනගත්ත ඔය සංවේදී හිත ගැන. මට මාස දෙකක් වෙද්දි පුංචිම කාලේ අපේ අම්ම මැරිලා. මං මේව මීට පෙර නොකිවෙ අනුකම්පාව ලබන්න බැරි හින්ද? මට ඕනකම තිබුණෙ අනුකම්පාව නෙමෙයි. ආදරය, සෙනෙහස. ඊට පස්සෙ මං ආච්චි ළඟ හැදිල තියෙන්න නුවර. මාව නුවර කොන්වන්ට් එකට දාල තියෙන්නෙ ආච්චි. තාත්තා හිටියේ නාවල, රාජගිරියේ. තාත්තා මාස දෙකතුනකට සැරයක් මාව බලන්න ආව. මේ කාලේ ආච්චිත් මළා. මාව හොස්ටල් එකේ නැවැත්තුවා. එතකොට මට යන්තම් තේරෙන වයස. මම දහයේ විභාගේ හොඳට පාස්වුණා. දවසක් තාත්තා ගිහිං කිව්ව දැන් ඉතිං කොළඹ යමු. එහෙ දැන් දුවට අම්ම කෙනෙක් ඉන්නව කියල. මම තාත්තත් එක්ක ආවා. මගදී තාත්තා මෙහෙම කිව්ව. දුව

For E - Pusthakalaya

ඔයා මගේ දුව කියල කව්රුත් දන්නේ නෑ... මම දැන් ටික කාලෙකට ඉස්සර කසාදයක් බැන්දා. පොඩි පුතෙකුත් ඉන්නවා, මල්ලියෙක්. වටපිට අයවත් ගෙදර අයවත් දන්නේ නෑ ඔයා මගේ දුව කියලා. ඉතිං කොළඹ ගියාම මට තාත්තා කියන්න එපා. බාප්පා කියන්න. මම කියන්නම් ඔයා මගේ අයියගේ දුව, ඉස්කෝලේ යන්න එක්ක ආව කියලා.

ඉතිං මං අදත් මගෙ තාත්තට කියන්නේ බාප්පා කියලා. තාත්තා බව දැන දැනත් මං බාප්පා කියනවා. රහස රැකගෙන ඉන්නවා. මං අහසින් වැටුණු ළමයෙක් වගේ. අම්මා, තාත්තා, සෙනෙහස, ආදරය මං ජීවිතේට ලබල නෑ. ප්‍රශ්න, ගෙදර කරදර මං ලියන එකේ තේරුමක් නෑ. මගේ හිත තේරුම් ගන්න මගේ හිත ඔබ ඉදිරියේ ආදරය ඉල්ලා හඬා වැටුණේ ඇයිද කියල තේරුම් ගන්න.

මගේ හෙට දවස මං දන්නේ නෑ. ඒත් මට මේ ආත්මෙ ඔබේ සුදු මුහුණ බලන්න බෑ.

දෙවි පිහිටයි !

මං,

ආදර මධු.

මම ලිපිය කියවා අහවර කරනවාත් සමඟම සුදු නංගී කාමරයට ආවා ය.

'අම්මා කතා කරනවා.'

මම ලිපිය සුදු නංගීට දී කාමරයෙන් එළියට පැමිණියෙමි. චාපාගේ මව සාලයේ වාඩි වී සිටියා ය.

'පහුගිය දේවල් අවුස්ස අවුස්ස ජීවිතේ තවත් අවුල් කරන්න මට බෑ. හැමදේම සිද්ධවෙලා ඉවරයි. මට දැන් කාත් කවුරුත් නෑ. දැන් ඉතිං කොළඹ යමු. කසුන් පුතාට උපාධිය කරගන්නත් පුළුවන්. රෝහාන් දික්කසාද තාම දන්නේ නෑ. ප්‍රශ්නෙ බේරගමු.'

මම කිසිත් නොකීවෙමි. සුදු නංගී ද නිහඬව සිටියා ය.



'අපි කසුන්ලගේ ගෙදරත් ගිහිල්ලා ආවේ.'

ඉන් මම මඳක් තිගැස්සුණෙමි. අම්මා, අප්පච්චි කුමක් කතා කරන්ට ඇද්දැ යි යන සැකය මා සිත ව්‍යාකූල කළ අතර තව දුරට ත් මුනිවත රැකීමි.

'මොකක් හරි පිළිවෙළක් වෙනකම් කොළඹ එන්න මගෙ අදහසක් නැහැ.'

මම උත්තර දුනිමි.

චාපාගේ මව මා සමීපයට විත් මගේ දෑතින් අල්ලා ගත්තී ය. මම බිම බලා ගතිමි. බොහෝ හැඟුම්බර ලෙස මව කතා කළා ය.

'පුතේ දැන් ඉතිං මගේ දුවත් අසරණ කරලා මේ සේරම ප්‍රශ්න ගොඩක් කරගන්න එපා.'

'නෑ අම්මේ.... චාපා අසරණ වෙලා නෑ. එයා සතුටින් ඉන්නේ. අම්මලා එයාගේ සතුටට බාධ කරන්න එපා. මුලදීම හරි තීරණයක් ගත්තා නම් අපි මෙච්චර ඉක්මන් වෙන්නෙවත්, දුක් වෙන්නෙවත් නෑ...'

'පහුගිය දේවල් නෙමෙයි. මං කතා කරන්නේ අද ගැන. මගේ දුවගේ හෙට දවස ගැන...'

'අපේ හෙට දවස මට ඉරහඳ වගේ විශ්වාසයි අම්මේ. අම්ම ඕන නම් ටික දවසකින් අපේ ළඟට එන්න. මං හැමදම අනුන්ගේ තැනක ඉන්නේ නෑ. අපි අපේ ජීවිතේ ගොඩ නඟා ගන්නවා. උපදින කොට මිනිස්සු සේරම දේවල් අරගෙන උපදින්නේ නැතේ...'

'මගේ දුව අතරමං කරලා මට යන්නද කියන්නේ.'

'චාපා අතරමං වෙලා නෑ. ඒත් අම්මල චාපාව අතරමං කරන්න හැදුවා.'

'අනේ පුතේ දෙන්නත් එක්ක කොළඹ වරෙල්ලා. දුව ඉන්න තත්වය මං දන්නවා. මගේ රත්තරන් දුව අම්ම කෙනෙක් වෙනකොට මගේ ළඟ ඉන්න ඕන.'

For E - Pusthakalaya

මම ඉන් එහාට කතා නොකළෙමි. කතා කරන්න දෙයක් මට තිබුණේ නැත. මට අම්ම කෙනෙක් ඉන්නවා යැයි කියා ගන්නට මට ඕනෑ වී ය. එහෙත් මම ඇගේ සිත රිදවීමට මැලි වීමි.

'රොහාන් අපිට සතුටින් ඉන්න දෙයි කියල අම්ම හිතනවද?'

'ඒ ළමය අරක්කු බීල මැරෙන්න හදනවා. උඹල මේ ඇති කර ගන්න දේවල් හින්ද ජීවිත කියක් බිලිදෙන්නද හදන්නෙ?'

'චාපාගේ ජීවිතේ බේරා ගන්න මං ඕන දෙයක් පූජා කරන්න ලෑස්තියි අම්මෙ. අපි දෙන්නා පුරුදුවෙ ආත්ම ගාණක් පතාගෙන ආපු හැටි මේ.'

'උඹල කොළඹ යමල්ලා. එහෙ ඉඳල මගේ ඇහැට පේන්න ජීවත් වෙයල්ලා. දුවගෙ තාත්තයි මමයි අවුරුදු ගාණක් පිටරටක ගිහිල්ල ජීවත් වුණේ දුව හින්ද. හැමදේම කළේ දුවට. දුව අසනීපකාරයා. මේ සීතල පලාතේ ඉඳල අසනීපෙ වැඩි වුණොත්. දුව ඉන්න තත්වෙ පුතා දන්නවනේ. මම මගේ දුවගේ අම්ම. මං වැරැද්දක් කරන්න කතා කරනව නෙමෙයි.'

මම මොහොතකට බොහෝ දේ කල්පනා කළෙමි. ලොකු අක්කා, නිරංග, සුදු නංගී නිහඬව මගේ තීරණය බලා සිටියෝ ය. මම පුටුවෙන් නැඟී සිටියෙමි. සුදු නංගී දොරකඩට වී පිච්ච ගාලට එහායින් විදුරුපොළ කන්ද දෙස බලා ගෙන සිටියා ය. සීතල කඳුකර හිරිකඩ කඳු ශිඛර හරහා සාලයට පිවිසේ. මම සුදු නංගී ළඟට ගියෙමි. මගේ සිහිවිලි දැහැන බිඳ දැම්මේ නිරංග ය.

'කසුන්! උඹට කැම්පස් යන ගමන් මොනව හරි කරන්නත් පුළුවන්. අම්මත් ඉන්න එකේ උඹ කොළඹ වරෙන්.'

මම සුදු නංගී දෙස බැලුමට ත් පෙර ඇය මා දෙස බලන්නට ඇත. ඇගේ දෑසේ කොළඹ ගමන පිළිබඳ අනුමැතිය සටහන්ව තිබිණ. මම ඇගේ කෙහෙ රැලි මතුපිටින් හිස අත ගෑවෙමි. ආරක්ෂාව පිළිබඳ හැඟීමක් සුදු නංගීට ඇති වන්නට ඇත. ඇය සුරැකිය යුතු බව මගේ සිතේ ද තදබල ලෙස සටහන් වී ය.



'අපි තව මාසෙකින් විතර එන්නම්...'

මම කීවෙමි. සුදු නංගී බිම බලා ගෙන ම සිටි අතර චාපාගේ මවගේ දෑස තුළ සංතෘප්තිය සටහන්ව තිබිණ. චාපාගේ මව ත්, නිරංග ත් තවත් දිනක් අප සමඟ ගත කළ අතර නිරංග මා සමඟ අනාගතය පිළිබඳ බොහෝ දේ කතා කළේ ය. පසු ද මම ත් සුදු නංගී ත් නානුඔය දුම්රිය පොළ දක්වා ම ගොස් උඩරට මැණිකේ දුම්රියට ඔවුන් ඇරලුවෙමු. චාපාගේ මව ඇය බදා ගෙන වැළපුණු අතර සුදු නංගී ද කඳුළු බිඳු කීපයක් හෙළුවා ය.

For E - Pusthakalaya

## 28

දුම්රිය පොළේ සිට සුදු නංගි වඩාත් මගේ අතේ වෙළී සම්පව බස් නැවතුමට ගමන් කළා ය.

'ඔයා අකමැතිද කොළඹ යන්න?'

මම ඇගෙන් විමසුවෙමි.

'නෑ කසුන් අකමැත්තට නෙමෙයි. මට මගේ අම්ම ගැන දුකයි. අම්මව තනි කරන්නේ කොහොමද කසුන්. මමත් අම්ම කෙනෙක් වෙන්න යද්දී...'

'මම ඔයාගේ හිත රිදෙන දේවල් කරන්නේ නෑ...'

'මම දන්නව ඒක...'

අපි නිවසට එන තෙක් බොහෝ දේ කතා කළෙමු. නුවරඑළියෙන් උණුසුම් ඇඟලුම් කීපයක් ද මිල දී ගතිමු.

'මට බයයි කසුන්...'

'ඇයි?'

'අනේ මන්ද?'

කෙටි පිළිතුරු දුන්නා විනා සුදු නංගි වැඩිපුර කතා බහ කළේ නැත. මම ඇගේ හිත සතුටින් තැබීමට කළ හැකි හැම දේ ම කළෙමි. මේ කාලයේ දී නාට්‍ය දෙකක් ද චිත්‍රපටයක් ද අපි දෙදෙනා නැරඹීමු. සුදු නංගිට අවශ්‍ය ඇඳුම් පැළඳුම් අක්කා සකස් කොට දුන්නා ය. පලතුරු එළවලු සහ ඇය කැමට රුචි බොහෝ දේ ද සපයා දුනිමි.



වරින් වර හැදෙන සුදු නංගිගේ පපුවේ වේදනාව හා හිසරදය පිළිබඳ වෛද්‍යවරුන්ට කියා බෙහෙත් ගතිමි.

වැලිමඩ ප්‍රදේශයේ නමගිය වෛද්‍යවරයකු වූ එරික් මෙන්ඩිස් මහතාට සෑම බදද ම සුදු නංගී පෙන්වා වෛද්‍ය උපදෙස් ගැනීමට කටයුතු කළෙමි. බෙහෙත් බීමේ අරුචිය නිසා දෝ සුදු නංගී සතියකට කිප වරක් ම ඔක්කාරය කළා ය. මම ඇගේ සමීපයට වී සිටියෙමි. හිසරදය හා පපුවේ වේදනාව දැනුණු දිනවල සුදු නංගී තොකා නොබී සිටීම මට ඉහිලුම් නොදෙන්නක් වී ය. උදේ ම හිසරදය කියා කාමරයට වදින ඇය බොහෝ වේලා කොට්ටයට හිස ඔබා නිහඬව ම සිටින්නී ය. ඇය නැගිටින විට කොට්ටය කඳුළින් තෙත් වී ඇත. මම මහත් සෙනෙහසින් ඇය ඇමතිමි.

'ප්‍රශ්නයක් තියෙනව නම් කියන්න සුදු නංගි. ඔයාට මොකක්ද තියෙන අමාරුව?'

'මොකුත් නෑ කසුන් නිකං හිසරදේ වගේ.'

සුදු නංගී එ විට උත්තර දෙයි. ඇය මොකක් දෝ අමාරුවක් මගෙන් වසන් කරතැ යි බියක් ම'සිතේ වී ය.

එ විට සුදු නංගී ක්ෂණයකින් මගෙ උකුලේ හිස ඔබා ගනී. නිල් වන් දෑසින් මගේ දෑසට එබී සිටී. වචනයෙන් නොකියන දහසක් දේ ඇගේ දෑසේ ලියැවේ. මම නෙත් නොසළා බලා සිටිමි.

'ඇයි රත්තරන්?'

මම අනන්ත සෙනෙහසින් විමසිමි. එ විට ඇය දෙනෙතේ කඳුළු පුරවා ගනී.

'මට මොනව උණත් කමක් නෑ කසුන්. මට ආත්මෙන් ආත්මෙට ඔයා ළඟ ඉන්න තිබුණොත් ඇති.'

'මම හැමදම ඔයා ළඟ ඉන්නවා.'

'මට ඒ හින්දම තමයි දුක.'

'ළඟ හිටියම සතුටින් ඉන්න ඕනනේ, දුක නොහිතා...'

මම ඇගේ නළලේ සිට ගෙල දක්වා මුහුණ මත දැහිලි කවරමි.

For E - Pusthakalaya

තැවුම් මලක මෙලෙක් පෙති මෙන් ඒ දෙකම්මුල් සිනිඳු ය. මෘදු ය. මගේ දකුණත කොට්ටය ත් හිස ත් අතර සුහවා මම ඇගේ හිස මගේ පැත්තට එල්ල කොට ගතිමි.

'වැඩිය ආදරේ කරන්න එපා කසුන්. ආදරේ වැඩිවුණාම වෙන් වුණාම දුක වැඩි....'

'මම කවදාකවත් ඔයාගෙන් වෙන් වෙන්නේ නෑ සුදු නංගී.'

මම ඇගේ හිස උරහිස මත තබා සයනයේ වැතිරුණෙමි.

'අපිට හැමදාම මෙහෙම සතුටින් ඉන්න ලැබේවිද කසුන්.'

'මව් සපතකින්ම. මම කවම කවදාකවත් ඔයාට දුකක් දෙන්නේ නෑ. අසුබ දේවල් කියන්න, හිතන්න එපා. හොඳ නෑ...'

'මට බයයි.'

'බය වෙන්න එපා මම ඔයා ළඟ ඉන්නවානේ....'

හැම විට ම හැම මොහොතක ම සුදු නංගී සැනසීමට සතුටු කිරීමට තව තවත් ඇය තේරුම් ගැනීමට මම උත්සාහ කළෙමි. ඒත් මොකක් දෝ දුකකින්, බියකින් ඇය නිතර ම කල් ගෙව්වා ය. කොළඹ ගමනට අපි සූදානම් වූයේ මේ කාලයේ ය. කොළඹ යෑමට පෙර කඳුරට සුන්දර තැන් කීපයක ඇවිදිමට අපි තීරණය කළෙමු. මොනිකා - බිටෝ පිළිබඳ ශෝචනීය පෙම් පුවත නිරන්තරව මම සුදු නංගීට කීව නිසා දෝ ලෝකාන්තය බැලීමට යමු යි සුදු නංගී මට කීවා ය. දුන්හිඳ තැරණීම ඊට වඩා ප්‍රීතිදායක බව මම සුදු නංගීට කීවෙමි.

'ඉස්සෙල්ල ලෝකාන්තෙ බලන්න යමු. පස්සෙ දුන්හිඳ යමු.'

'ගමන් දෙකේම වැඩි හරියක් පයින්. ඉතිං ඔයාට අමාරුනේ...'

'කමක් නෑ යමු. කොළඹ ගියාම ආයෙ කවදාකවත් එන්න ලැබෙයිද දන්නේ නැනේ.'

'අමාරුවක් නැතිනම් යමු.'

'නෑ කසුන් අපි යමු.'



'මාව සතුටු කරන්න හිතාගෙන හා කියන්න එපා.'

'අපි දෙන්නාගේ ම සතුටනේ කසුන් ලෝකාන්තයයි දුන්හිඳයි දෙකේම යමු. ඊට පස්සේ දෙන්නාම කොළඹ යමු.'

අප දුන්හිඳ හා ලෝකාන්තය බැලීමට යාමට සූදානම් වෙද්දී ලොකු අක්කා සියල්ල ම සූදානම් කර දුන්න ත් වැඩි කැමැත්තක් පෙන්නුවේ නැත.

'මල්ලියේ පරිස්සමින්. වැඩි හරිය යන්න තියෙන්නෙ පයින්ම. නංගිව පරිස්සම් කරන්න.'

'ඇයි අක්කා හිතුවද මං මෙයාව ලෝකාන්තේ දලා එයි කියලා.'

මම විහිළුවක් ද කළෙමි. අක්කා සමඟ සුදු නංගී බොහෝ වේලාවක් ඒ කතාවට සිනාසුණා ය. පසුව හිසරදය යැයි කියා කාමරයට ගියා ය. මම කාමරයට එන විට සුදු නංගී ඔක්කාරය කරමින් සිටියා ය.

ලෝකාන්තය බැලීමට ගොස් පැමිණි පසුව සුදු නංගීගේ රෝගී බව වැඩි වෙතැ යි මම සිතිමි. නැත. කිසිදු වෙනසක් නොපෙනවා ඕ වැඩි සතුටකින් සිටියා ය. මට කරදරයක් වේ යැයි සිතා සුදු නංගී නොකියා ඉන්නේ දැයි සැක කළ මම හැම විටෙක ම ඇගෙන් ඒ පිළිබඳ විමැසීමි.

'ඔයා මං ගැන හිතල දුක් වෙන්න එපා කසුන්. මට අමාරුවක් තියෙනව නම් මම කියනවනේ. ඔයා නිකං හිත රිදෝගන්න එපා.'

සුදු නංගී මට එ වැනි උත්තරයක් දී මා සැනසීමට වෙහෙසේ. ලෝකාන්ත ගමනින් පසු නිතර නිතර සුදු නංගී දුන්හිඳ බැලීමට යා යුතු යැයි මට පෙරැත්ත කළා ය.

'ලෝකාන්තෙ ගමනට වඩා අමාරුයි.'

මම කීවෙමි.

'කමක් නෑ කසුන්. කොළඹ යන්න ඉස්සර අපි යමු. ආයේ ඉතිං අපිට එන්න වේද දන්නෙත් නෑනේ.'

ඇගේ සතුට වෙනුවෙන් මම එකඟ වීමි. සුදු නංගී අම්මාට ලියුමක් ද දැම්මා ය. ඊ ළඟ සතියේ කොළඹ එන බව ත්, සතුටින් සැපෙන්

For E - Pusthakalaya

ඉන්නා බව ත් ඕ එහි සඳහන් කළා ය. ලෝකාන්තයේ ගමන පිළිබඳ අප ලැබූ සතුට ලියූමේ බොහෝ තැන්වල සුදු නංගී සඳහන් කොට තිබිණ. මොනිකා හා බීටෝ යන පෙම්වතුන් ලෝකාන්තයෙන් පහළට පැන දිවි නසා ගැනීමේ පුවත මහත් දුකකින් නිතර ම මෙනෙහි කළ සුදු නංගී ලිපියේ ද කීප තැනක ම එය සඳහන් කොට තිබුණි.

'ඔයා හිතන්නෙ වැඩිපුර පව් මොනිකාද? බීටෝද?'

මම හවස් වරුවක ඇගෙන් විමසීමි.

'දෙන්නම පව් කසුන්. අහිංසකයෝ. ආදරේ හින්දා කොච්චර වේදනා විඳින්න ඇද්ද.'

'ඒ දෙන්න ඊළඟ ආත්මෙදි හමුවේවි'

මම නිකමට කීවෙමි.

'සංසාරේ කවදකහරි හමුවේවි.'

සුසුමක් හෙළමින් සුදු නංගී කීවා ය. අනුන් වෙනුවෙන් දුක් වෙන විඳෙන සිතක් අපට උරුම වීම එක් අතකින් භාග්‍යයක් වුවා පමණක් නොව අනෙක් අතින් අපේ ම සිත් රිදවා ගැනීම නිසා මහත් අභාග්‍යයක් වි ය. ඒ සති අන්තය එළඹෙන තෙක් අප බොහෝ දේ කතා කළ අතර කවි පොත්, ගීත, නාට්‍ය පිළිබඳ නිතර ම කතා කිරීම අපේ සතුටට හේතු වි ය. මම කවි කීපයක් ද මරණය පිළිබඳ කෙටිකතාවක් ද ඒ දිනවල ලියා පුවත් පත්වලට තැපැල් කළෙමි.

'දුක හිතෙන දේ ලියන්න එපා. අපේ ආදරේ මියැදුණේ නැතේ කසුන්. ඔයාගේ සුදු නංගී හැමදම ඔයා ළඟ ඉන්නවා.'

පුළුඟ බිඳක් මෙන් මා අස දැවටෙමින් විටෙක සුදු නංගී කියයි. මගේ පරණ දිනපොත් කීපයක් ද සුදු නංගී මේ දිනවල නිතර නිතර කියවා එහි ඇති කටු සටහන් පාඩම් කර ඇතැම් විට මට ඔච්චම් ද කළා ය. එසේ ඔච්චම් කරමින් සිටින අතර ඩෝල්ටන් අල්විස්ගේ කවි පද හතරක් කියවා සිනහව සඟවා ගත් ඕ දෑස් නොපියා මදෙස බලා හඬන්නට වූවා ය. මම දින පොත පෙරළා කවිය දෙස බැලීමි.



මහ ගොළුවගේ කාටත් ඉඩ ඇති
ඇයටත් ලබා දුනි සිව්රියනක — ඉඩම
සෙරපෙන්නට එපා ඔය හැටි වල — උරුම
ඇගෙ දෑම රිදෙයි ඇහුණද සුදු මල් — උඩම
— වඩම

'අනේ එහෙම වුණාම මරණය ඒ අහිංසක පෙම්වතාව කොච්චර කම්පා කරන්න ඇද්ද කසුන්.'

'එයාගේ හිත කොච්චර නොරිද තිබ්බද කියල පේනව 'ඇගෙ දෑම රිදෙයි ඇහුණද සුදු මල් වඩම' කියල කිව්වම.'

සුදු නංගීගේ මේ සංවේදිකම ඇතැම් විටෙක මට මහත් කම්පා වක් වි ය. මේ සිදුවීමෙන් පසු මම කම්පනය වන දෑ ඇ සමඟ කතා කිරීමෙන් වැළකුණෙමි. එහෙත් බොහෝ සතුටින් දෙඩමලු වූ සැඳෑවල පවා සුදු නංගී දුක හිතෙන කතාවන් මට කියා හිත රිදවා ගනී.

'දුක හිතෙන දේ කියලා ඔයාමනේ හිත රිදව ගන්නේ.'

මම තරමක් තරහින් කීවෙමි.

'දුක ඇතුළේ තියෙන සතුට දුක විඳලම ඉගෙන ගන්න. ඔයාමනේ මට එහෙම කියල දුන්නේ.'

විහිළුවක් කර එ විට සුදු නංගී සිනාසෙයි. දෑස අග ඇකිළෙමින් ඇගේ සිනාසෙන දෑස දෙස මම බලා සිටිමි.

'ඔච්චර ආදරෙන් ඇස්වලට එබිල බලන්න එපා. මේ ඇස් දෙක පියවුණොත්...'

'මුසල කතා කියන්න එපා.'

මම එ විට වේදනාවෙන් ඇයට තරවටු කරමි.

ඉරිද අපි දුන්හිඳ යෑමට සූදානම් වීමු. සෙනසුරාද උදේ ලියාපදිංචි තැපැලෙන් මගේ නමට ලිපියක් ලැබිණ. මම වහා එය විවර කළෙමි. ලිපිය එවා තිබුණේ නිරංග ය.

For E - Pusthakalaya

.... ඉක්මනින් කොළඹ ආවොත් හොඳයි. උඹගේ කැම්පස් එකේ පළවෙනි අවුරුද්දේ විභාගෙට ඔසයයි. විභාගෙ කරපං මෙහෙන් පොඩි රස්සාවක් උඹෙත් හොයා ගන්න පුළුවන්. ඔහොට වෙලා ඉන්න එකේ තේරුමක් නෑ නේද? මේ ලියුම ලියන්නේ උඹලට ඉක්මනින් කොළඹ එන්න කියන්න. පෙරේද රොහාතව නාරාහේන්පිට ආසිරි හොස්පිටල් එකේ නැවැත්තුවා. හොඳටම අමාරු වෙලා. සිරෝසිස් හැදෙයි කියල කලිනුත් දොස්තරලා කියල තිබුණේ. ආමාශයේ ප්‍රදාහයක් තියෙනව මං හිතන්නේ. ආමාශයේ ඕප්පිත් තුවාල වෙලාලු. දැන් තරමක් හොඳයි. පනුගිය විසේ පුදුම අරක්කු බීමක් බීල තියෙන්නේ. අද නම් තත්වෙ හොඳටම සුවයි වගේ. මම ගියා බලන්න. උඹට එන්න කියනවා. උඹට මොනවද කියන්න තියෙනවලු. මං හිතන්නේ උඹ ආවොත් හොඳයි. බලපං ගියානුත් ඉස්පිරිතාලේ. වාපාගේ අම්ම කියනව එනව කියල නිවිටට එන පාටක් නෑ කියලා. අන්තිමට ඔක්කොම වැරදි උඹේ කර පිටට වැටෙයි. දැනටත් ඉතින් කොළඹ ඇවිත් පිළිවෙළක් වෙයං...'

මම සුදු නංගීට ලිපිය දුන්නෙමි. ඕ දෙවතාවක් එය කියවා මගේ අතට දුන්නා ය.

'අපි සදුද කොළඹ යමු'

මම සුදු නංගීට කීවෙමි. ඕ කිසිවක් නොකීවා ය.

'හිතේ තියාගෙන ඉන්න එපා සුදු නංගී. ඔයා කොළඹ යන්න අකමැතිද?'

'මට තීරණ ගන්න පවරන්න එපා කසුන්.'

සුදු නංගී කිවේ එ පමණකි. ඉරිද දුන්හිඳ ගොස් සඳුද උදේ කොළඹ යන බව මම ලොකු අක්කාට කීවෙමි. මගේ තීරණයට ඕ කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ කළේ නැත.

ඉරිද උදේ ම අරුණලු නැගෙන්නට ත් පෙර අපි බදුල්ල දක්වා පිටත් වීමු. කැම පාර්සල් දෙක ද, පළතුරු ද මම බෑගයකට දමා කරේ එල්ලා ගතිමි. මහියංගන රජමහා විහාරයට ගිය අපි බුදුන් වැඳ වෙහෙර වටා ද කීප විටක් සක්මන් කළෙමු. සුදු නංගී දෙහොත් මුදුන් දී වැඳ ගෙන ම සිටියා ය. මම සුදු නංගීගේ එක්ව තිබූ දෑත අල්ලා ගතිමි.



'මොනවද සුදු නංගී වැඳගෙන තොල් මතුරන්නේ.'

'හැම ආත්මයකම මට ඔයා ලැබෙන්න කියල.'

මම කතා නොකොට ඇයට ඉඩ දුනිමි. දහවල් දහය වන්නට ත් පෙර අපි මහියංගන බසයක නැගී දුන්හිඳ හංදියට ගියෙමු. ඔයේ හෝ හෝ හඬ දෙසවනට වැටෙත් ම හා පැටියෙකු අවදි වූවාක් මෙන් සුදු නංගී විමසිලිමත්ව වටපිට බලන්නට වූවා ය.

'මේ ළහම සද්දෙ ඇහෙන්නෙ.'

සතුටින් ඉපිලෙමින් ඕ කීවා ය.

'ඒ වුණාට ඇල්ල බලන්න හැතැප්මක් විතර පල්ලම් බහින්න ඕන.'

'යමු.'

ඕ ඉස්සර වූවා ය. මම අතින් අල්ලා ගතිමි.

'මට යන්න පුළුවන් කසුන්.'

'ඔය ගලක්වත් ලිස්සුවොත්...'

මම ඇය ඊකවල් ලමින් කිවෙමි. හිමි හිමින් අපි දුන්හිඳ පල්ලම බැස්සෙමු. මේ වන වදුළු ගිරි දුර්ගයේ අපි තනිව ම ගමන් කළෙමු. බොහෝ සොම්නසින් සුදු නංගී සතුට සදන්නට වූවා ය.

'අන්න පේනව ඔය.'

'හංදියට ඇහුණේ ඔයේ සද්දෙ. ඇල්ලෙ සද්දෙ නෙමෙයි.'

බොහෝ දුරක් යන තෙක් ඇයට තෙහෙට්ටුව දැනුණේ නැත. මග දෙතුන් විටක් ගිමන් හරිමින් හරිත වන ඡේඛාවේ අපි ගිමන් නිවුවෙමු. ගල්කුළක වාඩි වී සුදු නංගී මෙසේ කීවා ය.

'මට මතක් වෙන්නෙ අර අපි ඇතට ඇතට පා තගලා, කියන සිංදුව, බලන්නකො කසුන් ඒක කොච්චර ගැලපෙනවද කියල.'

'ඇයි ප්‍රේමයෙන් මන රංජිතවේ කියනෙක ගැළපෙන්නේ නැද්ද' මම පිළිවිසීමි.

For E- Pusthakalaya

දුන්හිඳ ආසන්නයට යන විට දහවල් දොළහ පමණ වී ය. ඇය සිමෙන්ති පඩියේ සිටියදී මම පහළට බැස වතුර බෝතලයක් ගෙනාවෙමි. මම පහළට බසින විට සුදු නංගී ඉහළ සිට අත ඔසවා සිනා නැඟුවා ය. මම සමාචාර කළෙමි. දුන්හිඳ සිසි නරඹමින් අපි දහවල් කෑම කෑවෙමු. පුරුදු පරිදි සුදු නංගී මට බත් කටවල් දෙක තුනක් ම කවා මුහුණ දෙස බැලුවා ය. පැහැපත්ව තිබූ අහස කළුවන් වී දුන්හිඳට දේදුන්නක් ද වැටී තිබිණ.

'අන්න වංකා දුක්කද ඉන්ද්‍රචාපය....'

මම ඇයට දේදුන්න පෙන්වමින් කීවෙමි. සුදු නංගී කෑම කා බොහෝ වේලාවක් දේදුන්න දෙස බලා සිටියා ය. මොර ගෙඩි තරම් වැහි ගෙඩි දෙක තුනක් බිමට කඩා වැටුණේ එ විට යි. ගසක හෝ ගල් පොත්තක සෙවණක් හැර කිසිදු පිළිසරණක් නැති බව තේරුම් ගත් මම ඉක්මනින් ආපසු එන්නට පිටත් වීමි. එහෙත් යාර කීපයක් එන්නටත් පෙර ඝෝර පූරණ ධාරානිපාත වැස්ස කඩා වැටිණ. ගස් අඹරමින් ඇද හැළෙන අකල් වැස්සේ අපි තෙත බරිත වීමු.

'මතකද දවසක් බොරැල්ලෙදි තෙමුණා.'

සුදු නංගී දෙකොලේ බේරෙන වැහි බිඳු පිස ද ගනිමින් කීවා ය.

'එදනම් තෙමුණෙ විනෝදෙට. දැන් ඔයාට තෙමෙන්න හොඳ නැද්ද දන්නෙ නෑ.'

මම කීවෙමි.

'දැන් ඉතිං පාරටම යමු.'

එහෙත් එන්න එන්න ම අකල් වැස්ස දෙපත් කපා ඇද හැළෙන්නට වී ය. කරවර කරමින් හතර වටින් ම විදුලි කොටමින් වැසි වැටිණ. දුන්හිඳ කන්ද මුදුනින් හෙණ ගෙඩි අකුණු ගසද්දී සුදු නංගී මට තුරුලු වෙයි. එහෙත් අපි නොනැවතී ම ගමන් කළෙමු. ඇය සීතලේ වෙවුලන්නට වූවා ය. සට සට ගා ඇගේ දත් ඇඳි එකට ගැටෙන්නට වී ය. පාර සමීපයට එද්දී ඇය නවත්තන්නට බැරි තරමට වෙවුළුවා ය.

'කසුන්...'



ඇය මහත් අමාරුවකින් මෙන් කීවා ය. දුන්හිඳ හංදියේ කඩයකට ගොස් මම සාලුවක් ඉල්ලා ඇගේ හිස පිස දැමීමි. එහෙත් නොනවත්වා ඇය වෙවුලන්නට වූවා ය. පසුව දත් ඇඳි එකට ගැටී කතා කරන්නට බැරි වී ය. වාහනයක් නතර කළ ඒ කඩයේ සිටි ගැහැණිය සුදු නංගී රෝහලට ගෙන යන ලෙස මගේ කණට කොට කීවා ය. මම සුදු නංගී බදුල්ලට ගෙන ආවෙමි. බදුල්ල රෝහලට ඇතුළු කළ විට වෛද්‍යවරයා වහා ම ඇය හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළු කළේ ය.

මගේ දෑතින් සුදු නංගී ගිලිහී ගියා වැනි හැඟීමක් මට ඇති වී ය. හෙදියන් කිහිප දෙනෙක් කඩිසරව වාට්ටුවේ එහෙට මෙහෙට යද්දී මම අහිංසක ලෙස ඔවුන් දෙස බැලුවෙමි. එහෙත් මට පිළිතුරක් නැත. වෛද්‍යවරයා ළඟට ගිය මම කලින් වාපා ලන්ඩන්වල දී ශල්‍යකර්මයකට භාජනය කළ බව ත්, ඇය දැන් මවක් වන්නට යන බව ත් කීවෙමි. වෛද්‍යවරයා මහත් උපේක්ෂාවෙන් ම'දෙස බලා සුදු නංගීට එන්නත් දෙකක් විද්දේ ය. එහෙත් ඇය පියවි සිහිය නොලද්දියක මෙන් නිසල ය. තවත් වෛද්‍යවරු දෙදෙනෙක් සමඟ කතා බහ කළ වාට්ටුව භාර වෛද්‍යවරයා කාමරයෙන් පිටට යාමට සැරසුණේ ය. මම ඉක්මන් වීමි. අඩි කීපයක් වෛද්‍යවරයා පසු පස ගමන් කළෙමි.

'ඩොක්ටර්....'

මට හැඬුම් එන්නට ආසන්න ය. මම යටිතොල සපා ගතිමි.

'බය වෙන්න දෙයක් නෑ. ලෙඩාට නියුමෝනියාවට එන්න වගේ. දැන් කොළඹ මහ ඉස්පිරිතාලෙට අරිනවා.'

ඔහු කාර්යාලයට ඇතුළු වී ය. මම නැවතත් වාට්ටුව දෙසට ගියෙමි. මගේ හද ගැබ කැළතෙන්නට වී ය. ක්ෂණියකින් ගිලන් රථයේ සයිරන් නළා හඬ කොරිඩෝව දෙසින් ඇසෙන්නට වී ය. මම සුදු නංගී අසළට ගියෙමි.

'ප්ලීස්.... ඔයා පොඩ්ඩක් මෙහාට වෙනවද?...'

හෙදියෝ කඩිනමින් අවශ්‍ය ප්‍රතිකාර කොට සුදු නංගී ගිලන් රථයට ඇතුළු කළ හ. මහත් හිස් බවකින් මම අවට බැලීමි. බදුලු නගරයේ කඩිසර බව මට නොදැනේ. මා එසැනැ සිටියදී මුළු ලෝකය

ම ක්‍රියාත්මක වෙමින් පවතී. ඔළු පසු පස දොරටුවෙන් ගිලන් රථයට නැඟුණෙමි. හඳ පවුර වැදී ගියාක් මෙන් 'දඩාස්...' ගා ගිලන් රථයේ දොර වැසිණ. සුදු නංගීගේ අතක් අල්ලා ගත් ඉරියව්වෙන් ම මම නිසල වීමි. කාලය හා වේගය අතර අනන්ත සටනක් සිදු වන්නට ඇත. සිහිවටි දහස් ගණනක් විවිධ වෙස් ගෙන නොරසෙද්දී රථය කොළඹට ළඟා වී ය. සුදු නංගී කොළඹ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළු කෙරිණ.

සුදු නංගීගේ අසනීපය හමුවේ දෙදිනක් මම අප්‍රමාණ දුක් වේදනා වින්දෙමි. එහි පීඩාව දන්නේ මගේ සිත ම පමණි. ජීවිතය පිළිබඳ අවිනිශ්චිත හැඟීම රකුසු වෙස් ගෙන මා දවන්නට, තවන්නට වී ය. එහෙත් දෙදිනකට පසු සුදු නංගී යම් සහනයක් ලද්දියක මෙන් හැසිරුණා ය. මම මහත් වූ සැනසුම් සුසුම් හෙළීමි. ගිහාන් මේ බව දැන ගෙන ජේනු රෝහලට එවා තිබිණ. දන්නා හඳුනන හෙදියන් හමුවී ජේනු අපට බෙහෙවින් උදව් කළා ය. නිරංග හා උත්තරා නිරන්තරව ම වාට්ටුවට පැමිණ අපේ සිත් සැනසීමට, අස්වසා ලීමට උපකාර වූ හ. රොහාන් මේ කිසිත් දැන සිටියේ නැත. ඔහු මඳින් මඳ සුවය ලබන බව කීවේ නිරංග ය. වාපාගේ මට මා සමඟ කිසිත් කතා කළේ නැත. වාපා බැලීමට පැමිණි කල ඕ කළේ සාරියේ පොටකින් කඳුළු පිස ගැනීම පමණි.

අන් වන දින පසුවෙද්දී කතා බහ කිරීමට තරම් වාපාට සුවය ලැබිණ. උදේ ම වාපා බලන්නට ගිය මම ඇය සමඟ කතා බහ කළෙමි.

'මාව සනීප කරන්න පුළුවන් කසුන්. ඔයා බයවෙන්න එපා.'

'ඔව්. මං දන්නවා. ඔයා ඉක්මනට සනීප වෙනවා.'

'මීට වැඩිය අමාරු ලෙඩක්නේ මගේ සනීප කළේ?'

මම නොහඬා අසා සිටියෙමි. එහෙත් ම'සිතේ බිය, කම්පනය හා වේදනාව තුරන් කිරීමට සුදු නංගීගේ වචන අපෝසත් වී ය. මගේ මුහුණ දෙස බලා සිටින සුදු නංගීගේ මුහුණ නැවතත් මොහොතින් මැළවී යයි. එ විට මම වියළී මේ වෙව්ලන දෙතොලින් සිනාසීමට උත්සාහ කළෙමි. සුදු නංගී හෙමිහිට නැවතත් කතා කළේ ඉන් අනතුරුව



ය.

'හැම දේටම මුහුණ දෙන්න පුරුදු වෙන්න ඕන. මට මේ කිසි දෙයක් වේදනාවක් නොමෙයි. දුක කියල හරි සතුට කියල හරි දෙයක් තියෙන්නෙ හිතේ. මම දුකයි සතුටයි දෙකම දන්නවා. ඔයාගේ හිත සතුටින් පුරවා ගන්න කසුන්. අපි හැම ආත්මෙකම හමුවෙව්, මට සනීප වුණාම ආයෙත් ජීවිතේ පටන් ගනිමු. දවස් දෙක තුනකින් මට හොඳ වේවි.'

'දෙවියන්ගේ පිහිටෙන් ඔයාට ඉක්මනට සනීප වෙනව.'

මම එසේ කියත් ම ඇදහිය නොහැකි දෑසින් ඇය ම'දෙස බලයි. කිසිදු හැඟීමක් ඒ දෑසේ ලියවී තිබුණා දැයි මම නොදනිමි. එහි තිබුණේ ශුද්ධ වූ යමක් අත්පත් කර ගන්නට සැරසෙන මෙහෙණියකගේ මෙන් උපේක්ෂාවකි. එහෙත් කායිකව මෙන් ම මානසිකව සුදු නංගී වේදනා විඳින බව සිහි වීමෙන් මම නිරුත්තර වීමි. මම කොරිඩෝරයේ පුටුවකට බර දී කල්පනා කරමින් සිටිමි. නොදැනුවත් ම එ විට මට නින්ද යයි. අසාධ්‍ය රෝගියෙකුගේ මර ළතෝනියකට හෝ සයිරන් නලා හඬකට හෝ මම තිගැස්සී අවදි වෙමි.

හතර වන දිනයේ දී සුදු නංගීගේ තත්ත්වය වඩාත් යහපත් වී තිබිණ. මම ගිහාන් බැලීමට මහරගමට ත් රොහාන් බැලීමට තාරාගේන්පිටට ත් ගියෙමි. අපි අපගේ දෛවයට මුහුණ දෙමින් සිටියෙමු. ගිහාන් තුළ කිසිදු වකිතයක් නොතිබුණු අතර ඔහු කතා කළේ ම'සිත ත් සැහැල්ලු වන පරිදි ය. රොහාන් බොහෝ වේලාවක් එක එල්ලේ ම'දෙස බලා සිට ක්ෂණයකින් පැන මගේ උරහිස් දෙකෙන් අල්ලා ගත්තේ ය.

'හැමදේම සිද්ධවුණා. උඹ මගෙත් එක්ක තරහා වෙන්න එපා කසුන්. ප්‍රශ්නයක් නෑ. උඹලා සතුටින් ඉඳපල්ලා.'

මම රොහාන්ගෙන් සමු ගනිද්දී ඔහු අත උස්සා මට සමාචාර කිරීමට තරම් ශක්තිමත් වී තිබිණ. මහත් සැහැල්ලුවක් හා හෙට දවස පිළිබඳ සොම්නස් සහගත ප්‍රීතියක් මට දැනෙන්නට වී ය.

එද උදේ ම වාපාගේ මට ඇගේ මුහුණ සෝද පිරිසිදු කොට වෙනත් ඇඳුමක් අන්දවා තිබිණ. සුදු නංගී සමඟ සතුටින් කතා කළ



For E - Pusthakalaya

For E - Pusthakalaya

ඈ ප්‍රසන්නව හැසිරෙන්නට ද [illegible] දෙසට ද ලෙන්ගතු බැල්මක් හෙළුවා ය.

'මං බයවුණා දරුවෝ.'

ඈය සුසුම් ලමින් කීවා ය.

'දැන්නම් ඉතිං දෙවියන්ගේ පිහිටයි.' යනුවෙන් ඈය කීවේ ඉන් පසුව යි. එදා හවස මම ගල්කිස්සේ හෝතපාර නිවසට ගොස් වාපා රෝහලෙන් කැන්දන් එන්නට අවශ්‍ය සියල්ල සූදානම් කළෙමි. උත්තරා හා නිරංග මට උදව් වූ හ. ඒ ඇනෙක්සිය තරමක් විශාල එකකි. අපේ නිදන කාමරය ත්, පූංචි සාලය ත්, පොත්පත් තබන කාමරය ත් අපි පිළිවෙළකට තබා පිරිසිදු කළෙමු. තුටින් ඉපිළ ගිය වාපාගේ මව දවාලට අපට සංග්‍රහ කළේ හවරදට ත් වඩා සොම්නස් සිතිනි. උත්තරා හා නිරංග අතීත සිදුවීම් ගෙන නොයෙක් විහිළු තහළු කළ අතර වාපාගේ මව ද හට කොණකින් අපට සිනාසුණා ය. පූංචි බුදු පිළිමයක් ද, පොත්පත් හා පින්තූර කීපයක් ද උත්තරා ගෙනවිත් තිබිණ. මම හවස රෝහලට ගියෙමි.

සුදු නංගී යහන මත වාඩි වී සිටියා ය. මම ඈත දී ම සිනාසුණෙමි. බලාපොරොත්තුවේ මදහස ඈගේ ලවනත රැඳිණ.

'ඇනෙක්ස් එක අස් කළා.'

'කොහොමද? ඉඩ තියනවද?'

'අපි දෙන්නට වැඩිත් එක්ක.'

'තව ටික දවසකින් අපි තුන් දෙනෙක්නේ. පැටියට එහෙට මෙහෙට යන්නවත් ඉඩ එපායැ.'

සුදු නංගී මගේ අත ගනිමින් කීවා ය. මම මොහොතක් බලා සිටියෙමි. තව දුරට ත් කතා කළේ සුදු නංගී ය.

'මට දැන් හොඳටම සනීපයි කසුන්. ඔයාට තොකීවට මමත් බය වෙලා හිටියේ. මට කලින් ඔපරේෂන් එක කළාම කිව්ව උණ සෙම්ප්‍රතිශ්‍යාව හද ගන්න එපා. වැස්සට තෙමෙන්න එපා කියලා. එහෙම



වුණොම නියුමෝනියාවට එයි කියලා. දැන් ඉතිං මේ සාරත් ගොඩ ගියා.'

සුදු නංගී සුසුමක් හෙළුවා ය.

'අපි එච්චර අවාසනාවන්ත නෑ.'

'හෙට උදේ ටිකට් කපයි.'

මම එළවලු සුප් බෝතලයෙන් ඈයට කෝප්පයක් පෙව්වෙමි. ඈගේ හිස පිරි මදිමින් මොහොතක් නිහඬව ඈඳ අසල රැඳුණෙමි.

'හෙට උදේ ඔය රැවුලයි. කොණ්ඩෙයි කපාගෙන එන්න. බලන්න නිකං පිස්සා වගේ. දැන් මට හොඳටම හොඳයිනේ කසුන්. ඔයා දැන් ඉතිං කල්පනා කරන්න එපා. මං මේ බඩුටික උදේට ලෑස්තිකරලම තියන්නම්.'

සුදු නංගී සියල්ල මිම්ණුවේ මගේ දෑසට එබෙමින් ය.

'උත්තරා නංගියි නිරංගයි උදේ ඉඳලම මහන්සි වුණා. අම්මත් සතුටින් ඉන්නේ.'

'අපි ටික දවසකින් පූංචි පාටියක් දෙමු.'

සුදු නංගී මේ සියල්ල කියද්දී ජීවිතය මා විසින් ජය ගත්තා නේදැ යි මට සිතිණ. අපි මෙ තරම් සතුටින් අනාගතයට මුහුණ දෙන්නට බොහෝ පිං කරන්නට ඇත. ඉස්සර මට සිතුණේ අප බෙහෙවින් අවාසනාවන්ත බවකි.

'මොනවද කසුන් කල්පනා කරන්නේ?'

'හෙට ගැන.'

'අපිට ගොඩාක් සතුටින් ඉන්න පුළුවන් වෙයි.'

සමු ගැනීමට පෙර අපි අපේ ම දෑත් බොහෝ වේලා තරයේ අල්ලා ගෙන සිටියෙමු. නැවත නැවතත් ජීවිතය නැවුම් හෙටකට පුදින

For E - Pusthakalaya

ඔව සිනි මසිතට අමන්දානන්දයක් දැනිණ. සමු ගැනීමට පෙර මම සුදු නංගිගේ නළලත සිප ගතිමි.

'පරිස්සමින් කසුන්.'

පුරුදු වදන් පෙළ සුදු නංගී මිමිණුවා ය. ඇය මා සමඟ කොරිඩෝරය දිගේ තරමක් දුරට ඇවිද ගෙන ආවා ය. මා බොහෝ දුරට යන තෙක් ඇය අත ඔසවමින් මට ආචාර කළා ය. මම ත් නැවත නැවත පසු පස හැරෙමින් ඇයට ආචාර කළෙමි.

හිරු බැස යමින් තිබිණ. මම හෙට දින බලාපොරොත්තු පොදි බැඳ රාත්‍රියෙහි හුදෙකලා වූයෙමි.

කාලය හා ජීවිතය අපට සමච්චල් කළා නේදැ යි මම රාත්‍රියේ සිතුවෙමි. නිරතුරුව ම මම රාත්‍රියේ පිබිදෙමින් යහනත ඒ මේ අත පෙරළුණෙමි. හිමිදිරියේ අරුණලු මෙ තරම් ඈත ද?

උදේ ම මම රෝහලට ගියෙමි. ඉක්මනින් අපේ කැදැල්ලට කුඩු වීමේ ආශාව මගේ පියවර ඉක්මන් කරන්නට ඇත. සුදු නංගීගේ හසරැල්ල මසිතට මුසු වන තෙක් මට ඉවසුමක් නැත. ගෙවී ගිය දින කීපයක හුදෙකලාව මට කල්පයක් මෙනි.

සුදු නංගී සිටි යහනත සුදු පිරුවටයකින් වසා තිබිණ. ලෝකයේ තනි වූ කුරා කුහුඹුවකු මෙන් මම අසරණ වීමි. දෙපා වෙවුලා ඇද වැටෙන්නට පෙර මම පිරුවටය ඉවත් කළෙමි. මම මගේ සුදු නංගීගේ සීතල සිරුර බද වැළඳ ගතිමි. සියල්ල අත් වින්ද සේයාව පමණක් ඇගේ මුහුණේ ලියවී තිබිණ.



**පසු සටහන**

චාපා ගංගාදරී අබේනායක පෙර ද රාත්‍රියේ සොම්නසින් යුතුව ජීවිතයෙන් සමු ගත්තී ය. මරණය අප විදවමින්, පෙළමින්, හඬවමින් සුසානයේ සිට අත වනයි. කසුන්ගේ ජීවිතාත්මය රෝහල් භූමියේ සිට ක්‍රියා කළ අයුරු වඩ වඩාත් සංවේදී සිත් කම්පනය කළ සිදුවීම් පෙළක් වී ය. සුදු නංගී සසර පුරාවට ඔහුගේ විය යුතු ය. ආත්මයක් ආත්මයක් පාසා ඔහු ඇයට ය. ඇය ඔහුට ය. එහෙත් ඒ තැන් පටන් කසුන් සෙනෙවිරත්න නම් මානවකයාගේ ජීවිතය තීරණය කළ සාධක ඔබට ත් මට ත් අනුවේදනීය සිදුවීමක් විය හැකි ය. අද ත් ඔහු සොහොන් කොත් පුරා ඇවිදිමින්, මුහුදු වෙරළේ හුදෙකලාවේ සක්මන් කරමින් නිශාචර කුරුල්ලෙකු මෙන් සැරි සරනු ඔබගේ ඇස ගැටෙන්නට පුළුවන. ඔවුන් ජීවිත ඉරණම විසින් අන්ධකාරයට හෙළුවා නේදැ යි කිසිවකු සිතනු ඇත. කසුන්ගේ සටහන් පෙළේ සුදු නංගී පිළිබඳ ලියවී තිබුණු අවසන් පදවැල් කීපය පමණක් මෙහි සටහන් කරමි.

පිච්ච මල් පෙති දෙපෙති රටාවට
තිල්පාට රැලි ගවොම ඇඟලාන
වස්සාන නිද්‍රාවේ
මා ගාව කඳුළු පිනි වගුරාන
අහිංසක දෙකොල් අග
සුදු විකිරි සිනා සංහිඳියාවෙ
ප්‍රභාතය රැගෙන ආ
රත්තරං පුංචි සුදු කුමාරි . . .

සුසුමකින් දැහැන්ගත ඉදුනිල
පියන්පත් නොපියාම කියන් මට
ඔබ කොහෙද?

නෙත් පොකුණ පාගමින්
දුක ඇවිත් කර උඩින් අත දමා
මැදියමේ අඬ ගසයි නීනියට
නවාතැන් පොළ සද දෙන්නෙ මැයි
සදකාලික සුවෙන් නිදන්නට . . .

For E - Pusthakalaya

වස්සාන නිද්‍රාවේ
සිහිනු සුදු මල්වඩම් පෙරහැරේ
රැහි හඬ ඇවිත් අඬ ගසන්නට
පෙර ඇවිත් කියන් මට
'ආදරේ මියැදුණේ නෑ කසුන්
සුදු නංගි ඔයා ළඟ ඉන්නවා'
මුව උඩින් පාත්වී හිමි හිමින්
කියන් මට
රත්තරං පුංචි සුදු කුමාරි
පිං සිද්ධ වෙයි නුඹට. . . . .

දීප නිලුකා මට මං
රැකුම් ළඟා . . . . . . .

For E - Pusthakalaya

Upul Shantha Sannasgala

"ප්‍රේමයේ නිදහස හෙවත් ස්වයංවරයට එරෙහිව
පවතින සමාජයීය ආර්ථික කොන්දේසි
ප්‍රශ්න කිරීමක් මෙන් ම
ප්‍රේමයෙන් ආතුර වීම උදෙසා
මිනිසා තුළ වන
මානවීය ලලාසාව මූර්තිමත් කිරීමක් ද
"වස්සාන සිහිනය" තුළ දැකිය හැකි ය."

Copyright ©Upul Shantha Sannasgala

ISBN 955-95893-1-8

Rs. 300/=

Cover Design:
Samantha gamage
Print & Publishers